Mr. K.T.L.A. Chandrasiri (Deputy Principal Officer); Mr. U.D.M.M. Wijesinghe, Mr. A.G.R.K. Abeyrathne (Assistant Principal Officers); Mrs. N.A. Dharmadasa (Telephone Supervisor); Mrs. K.T.D. Sooriyabandara (Assistant Parliamentary Officer)

## ADMINISTRATION DEPARTMENT

**DIRECTOR (ADMINISTRATION)** - Mrs. K.T.C.K. Peiris

**DEPUTY DIRECTOR (ADMINISTRATION)** - Mrs. C.M. Bulathsinhala

**ESTABLISHMENTS OFFICE** - Mrs. U.N. Panditha (Assistant Director - Administration); Mrs. V.P.G.S. Vidanapathirana, Mr. J. Naseerdeen (Principal Officers); Mrs. B.W.K.J. Welaratne, Mrs. K.I.M. Perera, Mrs. L.D.H. Molligoda (Deputy Principal Officers); Mrs. R.R.G.D.K. Jayathilaka (Assistant Principal Officer); Mrs. U.G.T.P. Gunasekara, Miss. P.G.A. Rasanjanie, Mrs. I.U. Dewage (Parliamentary Officers); Mrs. H.A.R.R. Gunasekara (Assistant Parliamentary Officer)

**MEMBERS' SERVICES OFFICE** - Mr. P.H. Kumarasinghe (Assistant Director - Administration); Mr. W.P.J. Pushpakumara Pathirana (Principal Officer); Mr. A.G.M.M.M. Nusky (Parliamentary Officer)

**HUMAN RESOURCE DEVELOPMENT OFFICE -** Mrs. H.M.N.C.K. Herath (Assistant Director - Administration)

**FOREIGN RELATIONS AND PROTOCOL OFFICE -** Mr. G.G.C.L.B. Galanga (Parliamentary Officer); Mrs. G.V. Ama Sudanthi, Mrs. T.W.A. Jayaratne, Mr. H.N.D.R.B. Nanayakkara (Senior Assistant Parliamentary Protocol Officers)

**TRANSPORT OFFICE** - Mr. H.M.L.A. Samaranayake (Transport Officer); Mrs. R.C. Kulathilaka, Mr. D. A. M. Baddevithana (Assistant Principal Officers); Mr. R.P.H. Kularatne, Mr. G.M. Prasantha (Assistant Parliamentary Officers)

**RIGHT TO INFORMATION UNIT -** Mrs. A.N.D. Gunarathna (Deputy Parliamentary Officer); Mrs. N.N. Hettige (Assistant Principal Officer)

**SENIOR STENOGRAPHERS** - Mr. H.P.C.S. Tilakaratne, Mr. R.P. Rasika Rajapaksha

**STENOGRAPHERS** - Mrs. P.D.N.P. Kumari, Mrs. S. Rajanimala, Mrs. D.W.B.A. Jayanatha, Mrs. P.W.C. Priyadarshani

**BUNGALOW MANAGER** - Mr. D.M.P. Athukorala, Mr. Y. M. Chaminda

**RECORD KEEPER** - Mr. E.K.K.P. Pushpalal

**SUPERVISOR/BILLING CLERK -** Mr. H.M.N.T.T. Herath

**DOCUMENTATION SUPERVISOR** - Mr. S.V. Bokalawela

## HANSARD DEPARTMENT

**EDITOR OF HANSARD** - Mrs. C.N. Lokukodikara de Silva

**DEPUTY EDITORS OF HANSARD** - Mrs. S.K.M.W. Samarasekera, Mr. M.S.M. Linnas, Miss H.G. Pujika

**ASSISTANT EDITORS OF HANSARD** - Mrs. R.D.P. Sujeewani, Mrs. D.P.A.N.N. Weerasinghe, Mrs. K.G.N.P. Rabel, Mrs. K.D.S. Kularatne Aluthgamage, Miss Geethani Warnasuriya, Mr. H.G. Lakshitha, Mrs. P.M.G.P. Priyangika, Mrs. M.I.S. Nishra, Mrs. E.H.W. Irangika, Mrs. T.T. Kumanayake

**SENIOR HANSARD REPORTERS** - Mrs. P.V.T.V. Gamage Arumadura, Mrs. W.A.D.P. Wijekonda, Miss S.M.A. Kumuduni, Mrs. F.H.A.N. Silva, Mrs. H.R.P. Chandani, Miss C.R. Karunaratna, Mr. M.T.A.D. Millagastenna, Mr. H.G. Manjula, Mrs. D.R.D. Hettige, Miss M.M.C.K. Marasinghe, Mrs. M.P. Niroshi Sajeewani, Mrs. T.U. Weerasekara, Miss G.A. Hiruni Punsara, Mr. K.M.D. Lanka, Mrs. M. Pushpakumara, Mrs. T.N. Samarasinghe, Mrs. H.R.U.S. Nivarchana

**HANSARD REPORTERS** - Mrs. E.V.T.R. Edirisinghe, Mrs. Indunil Dhammika, Mrs. M.A. Jesmina, Miss A. Mirunalini, Mrs. W.G.P.R. Samanmali, Mrs. R.S. Alahapperuma, Mrs. H.G. Maduka Shithari, Mrs. M.B.T.N. Priyadarshani, Miss S.U. Ranasinghe, Mrs. K.M.S. Perera Mrs. M.A.K.S. Sanjeewani, Mrs. S.N. Kalawana

**SENIOR COMMITTEE REPORTERS -** Mrs. P.G.K.N. Mihiri, Mrs. J.A.T. Samanthika, Mrs. J.K.I. Nilmini

**COMMITTEE REPORTERS -** Mrs. L.P. Wadanambi, Miss T.P.R.T. Kumari, Mrs. D.S. Hewavithana, Miss R.P.G. Kumari

**SENIOR INDEXING OFFICERS** - Miss S.A.D. Manori, Mrs. M.B.V.N.T. Fernando, Mr. A.M.C.M. Adikari

**RECORDING SUPERVISOR** - Mr. S.D.S.K. Thilakasiri

## FINANCE AND SUPPLIES DEPARTMENT

**DIRECTOR (FINANCE)** - Mr. G. Sarath Kumara

**FINANCE AND ACCOUNTS OFFICE** - Mr. L.B.R. Padmasiri (Assistant Director - Administration); Mrs. D.V.O. Weerakoon (Principal Officer); Mr. R.C. Wijayathilake (Deputy Principal Officer); Miss H.M.D. Lakmali, Mrs. H.E.C. Silva, Mr. T.G. Balasooriya, Mr. K.M.G.K. Jayawardana (Assistant Principal Officers); Miss. L.B.L.I. Laddusinghe (Parliamentary Officer)

**SUPPLIES AND SERVICES OFFICE** - Mr. P.G.P. Priyankara, (Assistant Director - Administration); Mrs. J.A.D. Jayasinghe, Mrs. D.M.D. Alahakone (Principal Officers); Mrs. G.R.U. Gamage, Mr. W.K.D.S. Kumarasiri (Deputy Principal Officers); Mrs. E.A.N.M. Edirisinghe, Mrs. U.M.S. Prabhashini, Mrs. M.S. Bandulahewa (Assistant Principal Officers); Mrs. B.N.H. Tissera (Senior Help Desk Co-ordinator); Mr. M.D.T. Sampath (Parliamentary Officer); Miss T.N.C. Fernando (Assistant Principal Officer)

**CATERING ACCOUNTS OFFICE** - Mr. G. Susantha Kumara (Assistant Director - Administration); Mr. I.M.A.K. Idirisinghe (Assistant Parliamentary Officer)

**RECEIVING OFFICER -** Mr. B. K. Sampath

**SHROFF** - Mr. M.G.N.G. Dharmasena

**STOREKEEPER (TECHNICAL) -** Mr. M.P. G. Silva

**STORES OFFICER -** Mr. G.D.D. Amarasinghe

**PURCHASING OFFICER -** Mr. M.G.P.K. Dharmasena

## DEPARTMENT OF THE CO-ORDINATING ENGINEER

**CO-ORDINATING ENGINEER** - Mr. D.L.D. Adikari

**DEPUTY CO-ORDINATING ENGINEER** -

**CHIEF INSPECTOR (ELECTRICAL)** - Mr. W.R.A. De Mel

**CHIEF INSPECTOR (CIVIL)** - Mr. C.S. Balasooriya

**INSPECTOR (ELECTRICAL) -** Mr. P.A.S. Lalith Kumara

**INSPECTOR (CIVIL)** – Mr. C. U. B. Gamage

**TECHNICAL OFFICER (ELECTRICAL)** - Mr. N.M.S.S. Nawarathne

**TECHNICAL OFFICER (CIVIL)** - Mrs. H.D. Jayakody, Mr. P. R. Wickramaarachchi

**ASSISTANT PARLIAMENTARY OFFICER** - Mr. B.K. Chanaka

# CATERING AND HOUSEKEEPING DEPARTMENT

**DIRECTOR (CATERING AND HOUSEKEEPING SERVICES)** - Mr. R. H. Edirisinghe

**EXECUTIVE CHEF -** Mr. L.K.C.S. Gajanayaka

**EXECUTIVE HOUSEKEEPER** - Mr. D.D.I. Thushara

**F & B MANAGER** - Mr. G.D. Anil

**DEPUTY F & B MANAGER** - Mr. W.N.R. Wijewardena

**SOUS CHEF** - Mr. D.M.M.M.B. Ulapane

**ASSISTANT HOUSEKEEPER -** Mr. S.D. Rathnasiri

**RESTAURANT MANAGERS -** Mr. D.H.B.B. Pathmasiri, Mr. J.A.S.K. Jayakody, Mr. W.D.S.R. Kumara, Mr. U.A.D. Nishantha, Mr. A.D.D.S. Gunasekara, Mr. H.R.K.S.K. Peiris, Mr. W.H.R. Sherantha

**GARDEN SUPERVISOR** - Mr. R.M.J. Rajapaksha

**SENIOR HOUSEKEEPING SUPERVISOR** - Mr. M.D.E.M.N. Karunarathna

**HOUSEKEEPING SUPERVISORS** - Mr. G.R.S.K.D. Gamlath, Mr. B. D. Jagath Kumara, Mr. N.H.M. Janaka, Mr. R.P. Anura Shantha

**F & B SUPERVISORS -** Mr. N. W. M. Turin, Mr. S.J. Gamage, Mr. D.H.R. Thushara, Mr. S.A.D.I.R. Senanayake, Mr. K.D.D.A. Pushpa Kumara, Mr. S.N. Hettiarachchi, Mr. P.G. Hettiarachchi, Mr. I.G.C. Kumara, Mr. G.T.D.T. Kumara, Mr. P.A.D.P. Panditharatne, Mrs. D.P. Chandanayake

**KITCHEN STEWARDING SUPERVISOR** - Mr. G.A. Wijesinghe

**CHEF-DE-PARTIE** - Mr. P.R. Wijesinghe, Mr. B.T.R. Hewamana, Mr. R.P. Helambage, Mr. M.W.W.M.P.C.C. Walgama

**LEADING COOKS** - Mr. A.A.D. Suranga, Mr. K.V.A. Jayawardena, Mr. R.M.M. Srimal, Mr. G.S.P. Suraweera, Mr. B.A.P. Pushpakumara, Mr. D.A.A. Amarathunga, Mr. P.D.P. Pushpakumara, Mr. M.B.A.P. Muthukumarana, Mr. R.K.A.D.T. Roshan, Mr. R.L.A.C.P. Rajakaruna

# DEPARTMENT OF LEGISLATIVE SERVICES

**DIRECTOR (LEGISLATIVE SERVICES)** - Mr. M. J. Perera

**TABLE OFFICE** - Mr. K.R. Herath (Assistant Director - Administration); Mr. H.U.P. Kumara, Mr. S.A.M. Shaheed (Principal Officer); Mrs. T.M.N.P. Tennakoon, Mrs. W.S.Y. Zoysa (Deputy Principal Officers); Mr. U.P.B.M. Undugoda, Miss D.R.K. Ranasinghe, Miss E.H. Jayaweera, Mr. K.D.G.M. Krisantha (Assistant Principal Officers)

**BILLS OFFICE** - Mr. W.W.N.S.C. Fernando (Assistant Director - Administration); Mrs. B.J. Abeysinghe (Principal Officers); Mrs. K.C.K. Peiris, Mrs. M.E.K.K. Fernando (Deputy Principal Officers); Miss G.K.C. Thilakarathna (Assistant Principal Officer); Mrs. D.D.S. Wasana (Parliamentary Officer)

**COMMITTEE OFFICE** - Mrs. W.A.K.C. Udapola; Mrs. M.K.S.D. Alwis, (Assistant Directors - Administration); Mr. D.G.M.S.M. Dehigahalanda, Mrs. W.L.S.D. de Alwis, Mrs. W.M.L.M. Weerasinghe, (Deputy Principal Officers); Mrs. G.K.S. Priyadarshani, Mrs. H.N. Fernandopulle, Mr. T.H.S.U. Thirimanna (Assistant Principal Officers)

**COMMITTEE OFFICE II** - Mr. K.P. Chandana (Assistant Director - Administration); Mrs. S.W.T.R. de Silva (Principal Officer); Mrs. R. M. S. Samanjika (Deputy Principal Officer); Mrs. W.K.A.M.M.M. Arthanayake (Parliamentary Officer)

**PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE –** Mr. P.K.D.S.W. Wijegunawardhana (Assistant Director - Administration); Mrs. H.R. De Soyza, Mrs. D.C.S. Rupasinghe (Principal Officers); Mr. S.L. Wickrma, Mrs. R.A.D.N. Geyowanee (Deputy Principal Officers); Mr. J.T.L.P. Sameera (Assistant Principal Officer); Mrs. G.V.S.K. Kumari, Miss. G.D.J.D. Ayeshmanthi, Mrs. G.L.D. Fernando (Parliamentary Officers)

**PUBLIC PETITIONS COMMITTEE OFFICE -** Mrs. H.A.T.D. Hewaarachchi (Assistant Director - Administration); Mr. R.A.R.L. Ranawaka (Principal Officer); Mrs. R.P.Y.T. Warusavithana, Mr. M.R.D.T. Thilakasiri, Mrs. T.P. de Costa (Deputy Principal Officers); Ms. D.I.T. Munasinghe, Mr. A.V.G. Chathuranga (Parliamentary Officers)

**MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE -** Mrs. C.M. Subasinghe (Assistant Director - Administration); Mrs. G.N.D. Thilakarathna (Principal Officer); Mrs. A.C.F. Nushrath (Deputy Principal Officer); Mrs. D.R.A.M.D. Sewwanthi (Assistant Principal Officer); Mrs. W.M.M. Priyadarshani, Mrs. U.D.U.T. Weerasiri (Parliamentary Officers)

**LIBRARIAN** - Mr. S.L. Siyath Ahemed

**DEPUTY LIBRARIAN** - Miss K.D.S. Wijenayake

**ASSISTANT LIBRARIANS** - Mrs. J.P.M.P. Jayasinghe, Mrs. D.G. Wasana Madushani, Mr. A.H.L.A.R. Weerasiri

**JUNIOR ASSISTANT LIBRARIANS** - Mrs. W.K.H. Jayani, Mr. S.H.M.W. Samarakoon, Mr. W.A.A. Wekkasinghe

**CHIEF RESEARCH OFFICER** - Mrs. G.R.A. Godagama

**SENIOR RESEARCH OFFICERS -** Mr. M. Ajiwadeen, Mrs. P.L.T. Erandathi

**RESEARCH OFFICERS** - Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas, Mrs. D.S.P.A.K. De Silva, Miss A.G.J. Chathurika

**ASSISTANT RESEARCH OFFICER** - Ms. G. H. M. S. S. Ananda

**CHIEF PARLIAMENTARY INTERPRETER -** Mr. C.J. Karunarathna

**DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS -** Mr. A.G. Mohamed Fiqrhi, Mr. A. Saravanabavanandan, Mrs. N.B.C.J. Nissanga,

**SENIOR PARLIAMENTARY INTERPRETERS -** Mr. G.F.B. Sureshwaran, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis, Mrs. A.L.A.D. Thiumini, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mr. M.Z.M. Azka

**PARLIAMENTARY INTERPRETERS -** Mr. B.M. Razeel, Mr. M.I.M. Fazi, Mr. C. Manimaran, Mr. P.M.A. Hussain, Mr. S. Pradeep, Mrs. K.D.M. Kumarage, Mr. M.M. Najimudeen, Mrs. A.T.A.N. Hansani

**SENIOR TRANSLATORS -** Mr. S.M. Nazeer, Mr. M.M. Haleemdeen

## DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

**DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT) -** Mr. N.B.U. Nawagamuwa

**SYSTEMS ENGINEER -** Mr. C.J. Willoraarachchi

**SYSTEMS ANALYST -** Mr. M.N.C. Wickramasinghe

**COMMUNICATION / SECURITY ENGINEER -** Mr. G.N. Lakmahal

**SYSTEMS DESIGNER -**

**SYSTEMS ADMINISTRATOR -** Mr. A.S.D.M. Wickramaratne

**WEB AND NETWORK ADMINISTRATOR -** Mr. U.L. Geeganage

**SENIOR COMPUTER PROGRAMMERS-** Mr. D. Panditha, Miss P.M.M. Chandima

**COMPUTER PROGRAMMER -** Mrs. S.A.A.B. Athukorala

**SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) -**

**SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) -** Mr. M.N.M. Shifaq

**DEPUTY PRINCIPAL OFFICER -** Miss A.P.K.K.P. Thilakaratne

**SENIOR COMPUTER OPERATORS** - Mrs. P. Jehanya, Mr. J.S. Colambage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyathunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardhana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Aly, Mr. A.M. Fowsul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS -** Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

## DEPARTMENT OF COMMUNICATION

**DIRECTOR (COMMUNICATION) (ACTING) -** Mr. M. J. Perera

**PUBLIC OUTREACH MANAGER** – Miss R.M.B.R. Ramanayake

**MEDIA MANAGER** – Mrs. R.M.N.P.M. Hathiyaldeniya

**PUBLIC OUTREACH OFFICERS** – Mrs. H.D.I.E. Wickramasinghe, Mr. P. Rudrakumar, Mr. M.G.D.L. Wickramasinghe, Mrs. Y.L. Rishmiya Nootan, Mr. A.S.M. Yasry

**MEDIA OFFICERS -** Mr. H.A.K.A.M. Jayalath, Mr. M. Pirassath, Mr. B.S.K. Ekanayake

**MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) -** Mr. U.G. Nuwan Duminda

**PUBLIC OUTREACH OFFICE COORDINATORS -** Mr. A.G.P. Amarasinghe, Mr. S. Jeyaprakash

**MEDIA OFFICE COORDINATOR -** Mr. K.R.G. Jayathilaka

# පාර්ලිමේන්තු විවාද

## නිල වාර්තාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**දසවන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය**

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

பத்தாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

**OFFICIAL REPORT**

**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**TENTH PARLIAMENT - FIRST SESSION**

**326 වන කාණ්ඩය** | **தொகுதி 326** | **VOLUME 326**


## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2026 අප්‍රේල් 07වන අඟහරුවාදා*
*2026 ஏப்பிரல் 07, செவ்வாய்க்கிழமை*
*Tuesday, 07rd April, 2026*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පහත සඳහන් සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා:

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/21

2026 මාර්තු මස 28 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2026 මාර්තු මස 28 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මඟින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ දෙදහස් විසිහයක් වූ මාර්තු මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වියයුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ඇති වී ඇති පසු ආපදා තත්ත්වය සලකා රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

**II**

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2026 මාර්තු මස 27 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

## නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

### දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
INLAND REVENUE (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "දේශීය ආදායම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් පහක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 අප්‍රේල් 07වන අඟහරුවාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXXI හා XXXII කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය - ලක්විජය බලාගාරය සඳහා ලංකා ගල් අඟුරු සමාගම විසින් ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාවලිය සහ 2025/2026 වාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report of the Sri Lanka Insurance Corporation Limited for the year 2024; and

(ii) Annual Report of the National Lotteries Board for the year 2024

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Annual Report of the University of Sri Jayewardenepura for the year 2024;

(ii) Annual Report of the University of Colombo for the year 2024;

(iii) Annual Report of the University of Peradeniya for the year 2024;

(iv) Annual Report of the Buddhist and Pali University of Sri Lanka for the year 2024; and

(v) Annual Report of the Open University of Sri Lanka for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- Proclamation made and published in Gazette Extraordinary No. 2481/30 of 28th March, 2026 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979;

- Report on the details pertaining to "Transfers of Allocations through Virement Procedure" from 03rd October, 2025 to 31st December, 2025, in terms of the Section 24(4) of the Public Financial Management Act, No. 44 of 2024, and Section 5 of the Appropriation Act, No. 3 of 2025;

- Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 02.02.2026 to 27.02.2026 in terms of Section 6(1) of the Appropriation Act, No. 23 of 2025; and

- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1) read with Section 21 of the Universities Act, No. 16 of 1978 on the recommendation of the University Grants Commission with regard to the establishment of Departments of the Faculty of Arts and Culture of the Eastern University, Sri Lanka and published in Gazette Extraordinary No. 2465/11 of 03rd December, 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18, 24, 28 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 44 වගන්තියේ (ඌ) සහ (ඒ) ඡේද යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 17 දිනැති අංක 2471/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 05 දිනැති අංක 2470/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 2026 සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on the -

(i) Regulation under Section 4F read with Section 3 of the Strategic Development Projects Act, No. 14 of 2008 (Published in Gazette Extraordinary No. 2474/66 of 08th February, 2026);

(ii) Rules under Section 105 read with Section 7(1) (c) and Part VI of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023 (Published in Gazette Extraordinary No. 2473/30 of 30th January, 2026); and

(iii) Social Security Contribution Levy (Amendment) Bill,

which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
May I be given 30 seconds for a small explanation, Hon. Speaker.

The Committee initially did not approve the Regulation under the Strategic Development Projects Act. The Committee questioned why Category A, which includes infrastructure and tourism, received six years' Corporate Income Tax holidays. Regarding Category B also, which includes manufacturing - අපි නිෂ්පාදන ආර්ථිකයකට යන රටක් විධියට, ගරු කථානායකතුමනි - the Committee questioned. Since neither the Act nor the Regulation carried proper definitions on what "strategic" and "Strategic Development Plan" are, the Committee questioned on those issues as well, for which a sufficient explanation was not given. Because of that, the Committee did not initially approve the first Amendment. Later, however, the MoF - the Hon. Chathuranga Abeysinghe was also there - gave explanations on some issues, but they did not address all the issues we raised. However, subject to addressing those issues at further reviews, the Committee approved the first Amendment, Sir.

Thank you.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින්, "පසුගිය කාලයේ සිදු වූ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් රාජ්‍ය ආයතනවලට හා යටිතල පහසුකම්වලට සිදු වූ හානි සහ ඒ සඳහා යෙදිය යුතු පිළියම්" සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න මට විනාඩියක් දෙන්න.

මෙහිදී මේ කාරක සභාවේ බල සීමාවට අයත් වන ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මහාමාර්ග සහ ප්‍රවාහන අංශවලට අයත් සියලුම ආයතන ගෙන්වලා, ඔවුන්ගේ තිබෙන දත්තත් එක්ක තමයි මේ කටයුතු සිදු කළේ කියන එක විශේෂයෙන්ම මම කියන්නට ඕනෑ. විශේෂයෙන්ම දෙසැම්බර් මාසයේදී මේ කරුණු පිළිබඳව අනාවරණය කිරීම් කරලා, ඒකට අදාළව ඒ මොහොතේ තිබුණු තොරතුරු අනුව තමයි අපි මේ වාර්තාව සකස් කර තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිලන්ති කොට්ටහච්චි මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බුත්තල, උනාවටුන, මහානාග මාවත, 'සතුට' යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.පී.ආර්. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මහනුවර, අස්ගිරිය, වාරියපොල ශ්‍රී සුමංගල මාවත, අංක 29/4 යන ලිපිනයෙහි පදිංචි එස්.බී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු කථානායකතුමනි, ගාල්ල, පනංගල, ගල්ලන්දල, අංක 95/බී දරන ලිපිනයෙහි පදිංචි ජී.පී. මහතුන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, අවුලේගම - අවුලේගම, කොළඹ ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. ජයතිස්ස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, සිංහල දෙමළ අලුත් අවුරුද්ද අත ළඟටම ඇවිත් තිබෙනවා. මෙවැනි උත්සව සමයක් ආසන්නයේ ඉතිහාසයේ කවදාවත් නැති විධියට අත්‍යවශ්‍ය භාණ්ඩ හැම එකකම මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ හේතුවෙන් මේ මොහොතේ ජනතාව පීඩාවට පත් වෙලා ඉන්නවා. තෙල් මිල, ගෑස් මිල, විදුලි බිල වැඩි වෙලා. ඒ වාගේම හාල් මිල ඇතුළු සෑම භාණ්ඩයකම මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. එම නිසා, කරුණාකර මේ මොහොතේ ජනතාව වෙනුවෙන් ලබා දිය යුතු සහන පිළිබඳව අවධානය යොමු කර ජනතාවගේ පැත්තෙන් කටයුතු කරන්න කියලා අපි රජයෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ඊයේ කැබිනට් මණ්ඩලයේදී අලුත් ආර්ථික සහන පැකේජයක් යෝජනා කළා.

ඔබතුමාත් දන්නවා, තෙල් මිල ප්‍රශ්නයත් එක්ක ආර්ථික වශයෙන් ගැටලු එන්න පුළුවන් ජනතාව සම්බන්ධයෙන් කටයුතු කරන්න ජනාධිපතිතුමා විසින් උපාලි පන්නිලගේ ඇමතිතුමාගේ මූලිකත්වයෙන් විශේෂ කමිටුවකුත් පිහිටුවා තිබෙන බව. අද දවල් 12.00ට ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණිලා ඊයේ කැබිනට් මණ්ඩලයේදී අනුමත කර ගන්නා ලද සහන පැකේජය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ඒ එක්කම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු ජනාධිපතිතුමා දහවල් 12.00ට පැමිණෙන නිසා Parliamentary Business Committee එක දහවල් 12.30ට schedule කරන්න කියලා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවරයින්: ඉන්ධන සහනාධාරය
### புத்தளம் மாவட்ட கடற்றொழிலாளர்கள்: எரிபொருள் மானியம்
### FISHERMEN IN PUTTALAM DISTRICT: FUEL SUBSIDY

749/2025

1. **ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-(1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට ඉන්ධන සහනාධාරය ලබන ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) ඉන්ධන සහනාධාරය නිසි වේලාවට ධීවරයන්ට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் கடற்றொழிலில் ஈடுபட்டுள்ள கடற்றொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவர்களில் தற்போது எரிபொருள் மானியத்தைப் பெறும் கடற்றொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அதற்காக ஒதுக்கீடு செய்யப்பட்டுள்ள நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(iv) எரிபொருள் மானியத்தை உரிய நேரத்தில் கடற்றொழிலாளர்களுக்கு வழங்குவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House the -

(i) number of fishermen engaged in the fishing industry in the Puttalam District;

(ii) number of fishermen out of them, who currently receive the fuel subsidy;

(iii) amount of money allocated for the said purpose; and

(iv) measures taken to provide the fuel subsidy to the fishermen in a timely manner?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

පිළිතුර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. අදාළ ඇමතිවරුන් දෙදෙනා නැහැ. නමුත් මම පිළිතුර ඉදිරිපත් කරන්නම්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

අතුරු ප්‍රශ්නවලටත් පිළිතුරු දෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ප්‍රශ්නයක් නැහැ, ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න. අපි ඒවා අදාළ අමාත්‍යාංශයට යොමු කරලා පිළිතුරු ලබා දෙන්නම්.

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ කරදිය ධීවර කර්මාන්තයේ යෙදී සිටින සක්‍රිය ධීවරයන් සංඛ්‍යාව 13,130කි. (2024 වර්ෂයේ සංඛ්‍යාලේඛන වාර්තා අනුව)

(ii) ඉන්ධන සහනාධාරය සඳහා නිර්දේශිත බෝට්ටු සංඛ්‍යාව 14,903යි.

ඉන්ධන සහනාධාරය ලබා දෙනු ලබන්නේ ධීවර බෝට්ටු හිමියන් සඳහා වේ. ඒ අනුව එක් බෝට්ටු හිමියෙකුට බෝට්ටු කිහිපයක් තිබිය හැකි බැවින්, ඉන්ධන සහනාධාරය ලබන ධීවරයින් කොපමණද කියන එක සංඛ්‍යාවක් ලෙස දැක්විය නොහැක.

(iii) රුපියල් 148,714,450යි.

(iv) 2024 වර්ෂය සඳහා යාත්‍රා ලියාපදිංචිය හා මෙහෙයුම් බලපත්‍රය සහිත සක්‍රිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර දිස්ත්‍රික්ක 15ට අදාළ ධීවර යාත්‍රා පිළිබඳ තොරතුරු පරිගණක මෘදුකාංගය ඔස්සේ ලබා ගැනීම හා යාවත්කාලීන කරන ලදී. එම තොරතුරු පදනම් කරගෙන ඉන්ධන වැඩසටහන සඳහා යාත්‍රා ලියාපදිංචිය සිදු කරන ලදී. IMUL - බහුදින - හා one-day - එක්දින - ධීවර යාත්‍රා සඳහා ඔක්තෝබර් මාසයේ සිට මාර්තු මාසය දක්වා ඉන්ධන ලබා ගත් බිල්පත් සමඟ සහකාර අධ්‍යක්ෂ විසින් නිර්දේශ කරන ලද අදාළ අයදුම් පත් දිස්ත්‍රික් කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලදී. අයදුම් පත්‍රයේ සඳහන් යාත්‍රා සඳහා වවුචර් සකස් කර එම වවුචර්පත් ලැබීමෙන් අනතුරුව අදාළ දීමනාව යාත්‍රා හිමියන්ගේ ගිණුමටම බැර කරන ලදී. OFRP සහ MTRB ධීවර යාත්‍රා සඳහා ඔක්තෝබර් මාසයේදී පමණක් බිල්පත්වලට ගෙවීම් සිදු කළ අතර, ධීවර සංවිධානවල ඉල්ලීම මත වැඩි කාර්යක්ෂමතාවකින් එය සිදු කිරීමට නොවැම්බර් මාසයේ සිට මාර්තු මාසය දක්වා - මාස පහක කාලයක් - සහකාර අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද සක්‍රිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා ලේඛනයක් ගෙන්වා ගෙන මසකට රුපියල්

9,375ක් බැගින් වන ස්ථාවර මුදලක් යාත්‍රා හිමියන්ගේ ගිණුම්වලට බැර කිරීම සිදු විය.

ප්‍රධාන කාර්යාලයට අයදුම් පත් ලැබුණු වහාම පරීක්ෂා කර ගෙවීම් සඳහා අඩුපාඩු තොරතුරු වට්ස්ඇප් හා විද්‍යුත් තැපැල මඟින් ගෙන්වා ගෙන කාර්යක්ෂමතාව වැඩි කරගන්නා ලදී. උපරිම විනිවිදභාවයෙන් කටයුතු කළ යුතු වීම නිසා මෙම මුදල් ධීවරයින්ට ලබා දීම සිදු කරන ලද්දේ, ධීවරයා නමින් පිළිගත් වාණිජ බැංකුවක ඇති බැංකු ගිණුමකට බැර කිරීම මඟිනි. නමුත් ඇතැම් ධීවරයින් විසින් බැංකු ගිණුම් පිළිබඳ විස්තර ඉදිරිපත් කළද, එම ගිණුම් අංක නිවැරදි නොවීම හා ගිණුම් අක්‍රිය තත්ත්වයේ තිබීම හේතු කොටගෙන සහනාධාරය ලබා දීමේ ප්‍රමාදයන් සිදු වී තිබිය හැක. ධීවර ප්‍රජාව තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීමත්, විධිමත් මූල්‍ය පද්ධතියට අනුගත කර ගැනීමත් තවදුරටත් කළ යුතුව ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාට ස්තුතිවන්ත වනවා, අමාත්‍යවරුන් දෙදෙනාම බේරා ගත් එකට. එතුමන්ලා තමයි උත්තරය දෙන්න ඕනෑ, හැබැයි සභානායකතුමා ඉදිරිපත් වෙලා උත්තරය දුන්නා. නැත්නම් සාමාන්‍යයෙන් ඔය උත්තරය ලබා දෙන්නේ නැහැ. ගරු සභානායකතුමනි, මීට අදාළ අතුරු ප්‍රශ්න අහද්දි මමත් අසීරුතාවකට පත් වනවා. මොකද, ඔබතුමාට මේ සම්බන්ධව පිළිතුරු දෙන්න අපහසුයි. ඒ බව දැනගෙනම තමයි මට මේ අතුරු ප්‍රශ්න අහන්න සිද්ධ වන්නේ. නමුත් අහන්න කියපු නිසා මම අතුරු ප්‍රශ්න අහනවා.

අපි දන්නවා, සමහර වෙලාවට ධීවර ජනතාව ෂෙඩ් එකට ගිහින් තෙල් ලබා ගන්නා බව. හැබැයි, ධීවර ජනතාව ළඟට තෙල් ගෙනැත් දෙන ක්‍රමවේදයක් එදා ඉඳලා - කාලයක් තිස්සේ - රට තුළ තිබුණා. එම ක්‍රමවේදයට ඒ අය හුරු වෙලා තිබුණා. සමහර වෙලාවට ණයට තෙල් ලබා ගැනීම වාගේ වැඩ කටයුතුත් සිදු වනවා. ඒ නිසා ඒ අයට ඔය බිල්පත් ඉදිරිපත් කිරීමේදී බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය පිළිබඳව අපි ග්‍රාමීය වශයෙන් සාකච්ඡා කළාට ඒකට හරියට පිළිතුරක් ලැබුණේ නැහැ. ඒකට විසඳුමක් විධියට හය මාසයකට තමයි ඒ වෙලාවේ මේ සහනාධාරය ලබා දී තිබුණේ. ඊට පස්සේ ඒක දීර්ඝ කර තිබුණේ නැහැ.

වර්තමානය වනකොට ධීවර ජනතාව බරපතළ ප්‍රශ්න ටිකකට මුහුණ දෙනවා. එකක් තමයි, තෙල් මිල ඉහළ යෑමේ ප්‍රශ්නය. ඊළඟ එක, විශේෂයෙන්ම ධීවර ආම්පන්නවල මිල ඉහළ යෑමේ ප්‍රශ්නය. ඊළඟ එක, ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවන්නේ කොහොමද කියන ප්‍රශ්නය. මොකද, ඔවුන් ජීවත් වන ක්‍රමවේදය සඳහා ලොකු වියදමක් යනවා. ඒ හින්දා අපි pension එකක් ගැන, තව ලොකු දේවල් ගැන කථා කළා.

ගරු ඇමතිතුමනි, අද ලෝකයේ පවතින තත්ත්වයත් එක්ක අපේ රටේ උද්ගත වෙලා තිබෙන ගැටලු අනුව ධීවරයින්ට ඔවුන්ගේ රැකියාව කරගෙන යන්නත්, පවුල් ජීවිත ඉස්සරහට ගෙනියන්නත් හැකි විධියට ඔබතුමන්ලා අලුතෙන් ලබා දෙන යම්කිසි සහනාධාර වැඩ පිළිවෙළක් තිබෙනවාද, ඒක ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා මූලිකව මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන කාරණයට ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී සවිස්තරාත්මක පිළිතුරක් ලැබෙයි කියලා මම හිතනවා.

මම ප්‍රමාණ කියන්නේ නැතුව ඊට පිළිතුරු දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, නිශ්චිත වශයෙන් ගත්තොත්, හදිසියේ ඇති වෙලා තිබෙන තෙල් මිල ඉහළ යෑමත් එක්ක අද ගරු ජනාධිපතිතුමා ප්‍රකාශයට පත් කරනවා, ධීවරයින්ට ලබා දෙන අමතර ඉන්ධන සහනාධාරය පිළිබඳව. ඒ අනුව විශාල බෝට්ටු හිමියන් සහ කුඩා බෝට්ටු හිමියන් කියන වර්ග දෙකට වෙන වෙනම ඉන්ධන ලබා දීම පිළිබඳව අපි ඊයේ කැබිනට් මණ්ඩල රැස්වීමේදී තීන්දුවක් ගත්තා. ගරු මන්ත්‍රීතුමනි, අද ඔබතුමාට ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී ඒවා ප්‍රමාණාත්මකව දැනගන්න පුළුවන් වනවා.

දෙවැනි කාරණය මෙයයි. ධීවර ජනතාව අතර අස්වැසුම්ලාභීනුත් ඉන්නවා නම් ඔවුන්ටත් අපි යම්කිසි විශේෂ දීමනාවක් ලබා දෙනවා, අප්‍රේල් මාසයට අදාළව. එයටත් ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී සවිස්තරාත්මක පිළිතුරක් ලැබෙයි. ඊළඟට, සහනාධාර ලබා දීමේදී කුඩා බෝට්ටු මොනවාද, විශාල බෝට්ටු මොනවාද කියලා බලන්න පුළුවන්කම තිබෙනවා, ඒ බෝට්ටු ගිය දුර අනුව. ඒ සඳහා special machine එකක් තිබෙනවා. ඒකෙන්, එම බෝට්ටු කොච්චර navigate කළාද කියලා බලන්න පුළුවන්, track කරන්න පුළුවන්. ඒක මත පදනම් වෙලා තමයි ගෙවන්නේ. මොකද, අපි ගෙවන්නේ රජයේ බදු මුදල්වලින්. රජයේ බදු මුදල් දුප්පත්ම කෙනෙකුට ගියත් ඒකට වගවීමක් තිබෙන්න ඕනෑ. මම හිතන විධියට, ධීවර ජනතාව කියන්නේ, තාක්ෂණික වශයෙන් ඉහළ දේවල් පාවිච්චි කරන පිරිසක්. එම නිසා බිල්පතක් ඉදිරිපත් කිරීම වාගේ දෙයක් ඒගොල්ලන්ට කරන්න අමාරුයි කියලා මම හිතන්නේ නැහැ. අපි දැන් QR code එක දියුණු කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. කුඩා බෝට්ටු 32,000ත්, 38,000ත් අතර ප්‍රමාණයක් තිබෙනවාය කියනවා. ඒවා ඔක්කෝම register කරලා තිබෙන නිසා අපි දැන් ඒවාට QR code එක ලබා දෙන්නත් තීන්දු කරලා තිබෙනවා. මම හිතනවා, ලබා දෙන සහන පිළිබඳව ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී ඉදිරිපත් කරයි කියලා. නමුත්, මේ පිළිතුරේ නිශ්චිතව සඳහන් කර තිබෙනවා, ධීවර ප්‍රජාව තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීමත්, විධිමත් මූල්‍ය පද්ධතියට අනුගත කර ගැනීමත් අරමුණු කරගෙන තමයි ඉන්ධන සහනාධාරය ලබා දීමේදී සමහර ක්‍රියාමාර්ග හඳුන්වා දී තිබෙන්නේ කියන එක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට යම් මට්ටමින් පිළිතුරක් ලැබෙන්න ඇති කියලා මම හිතනවා. ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී ඉතුරු කාරණා ටික සම්පූර්ණ කරයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, හැම ගමකම ධීවර සමිති තිබෙන බව. කුඩා බෝට්ටු සම්බන්ධයෙන් තමයි දැන් බරපතළ ප්‍රශ්න ටික තිබෙන්නේ. විශාල බෝට්ටු ලියාපදිංචි කිරීමේ යම්කිසි ක්‍රමවේදයක් තිබෙනවා. විශාල බෝට්ටු හිමියන් එම ක්‍රමවේදය අනුව කටයුතු කරනවා. හැබැයි, කුඩා බෝට්ටු හිමියන්ට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම, කුඩා බෝට්ටුවල රැකියාවේ යෙදෙන අයටත් බරපතළ ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒ ප්‍රශ්න පිළිබඳව හොඳ විමර්ශනයකින් තමයි කටයුතු කරන්න ඕනෑ. හැබැයි, ඒ කටයුතු හරියට සිදු වෙන්නේ නැති බව අපි දන්නවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, ධීවර විෂය භාර කැබිනට් අමාත්‍යතුමා ධීවරයන්ට සලකන්නේ දෙවිධියකට බව. එතුමාගේ ප්‍රදේශයේ ධීවරයෝ නීතියෙන් තහනම් සමහර පන්න ක්‍රම භාවිත කරනවා. එතුමාගේ ඒ වැඩ පිළිවෙළට සහයෝගය ලබා දෙන්නේ ආණ්ඩුව විතරක් නොවෙයි, නාවික හමුදාව සහ අනෙක් සියලු ආයතන ටික සම්බන්ධීකරණය කරගෙන ඒ වැඩකටයුතු කරගෙන යනවා.

විශේෂයෙන්ම අපේ කල්පිටිය ප්‍රදේශයේ ධීවරයන්ට එතුමා බරපතළ විධියට කුඩම්මාගේ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ සම්බන්ධව අපි කථා කරමු. ඒ සම්බන්ධව පවතින ප්‍රශ්නය බේරා ගන්න පුළුවන් ප්‍රධානම කාර්යය තමයි, ධීවර පනත සකස් කිරීම. 2018-2019 කාලයේ ඉඳලා තමයි ධීවර පනත හදන්නේ. නමුත්, මේ පනත තවම හදා අවසන් කරලා නැහැ. මාදැල් ප්‍රශ්නය, ට්‍රෝලින් ක්‍රම සම්බන්ධයෙන් පවතින ප්‍රශ්න වාගේම අනෙක් ක්‍රම සියල්ල සම්බන්ධවත් NARA ආයතනයෙන් ගත්ත report එකත් පදනම් කරගෙන අලුතින් වැඩ පිළිවෙළක් හදලා, ධීවරයන්ට අවශ්‍ය කරන නිවැරදි ගමන් මඟ අපට මේ ධීවර පනත හරහා ලබා දෙන්න පුළුවන්. හැබැයි, තවම ඒ පනත එළියට ඇවිල්ලා නැහැ. එම නිසා ඉතා ඉක්මනින් ධීවරයාගේ රැකියාව සුරක්ෂිත කරන්න ඒ පනත කවදා, කොයි ආකාරයෙන්ද ලබා දෙන්නේ කියන එක මම දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම පනත ඉදිරිපත් කරන දිනය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන්න කියලා මම අමාත්‍යාංශය දැනුවත් කරන්නම්. නමුත්, එතුමා කළ පළමුවැනි චෝදනාව මම සහමුලින්ම ප්‍රතික්ෂේප කරනවා. ධීවර ඇමතිතුමා කිසිසේත්ම එතුමා නියෝජනය කරන ප්‍රදේශයට එක දෙයක්, තවත් ප්‍රදේශයකට තව දෙයක් කරන්නේ නැහැ. එතුමාගේ ධුර කාලය තුළ තමයි ඉන්දියානු ආක්‍රමණික බෝට්ටු වැඩිම ප්‍රමාණයක් අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ.

ඒ වාගේම පන්න ක්‍රම සම්බන්ධවත් මම කියන්නම්. ඔබතුමා දන්නවා, ධීවර නීතිය අනුව, ධීවර රෙගුලාසි අනුව විරුද්ධ දේවල්වලට විශාල ලෙස උද්සෝෂණ කරද්දීත් කුඩා ධීවරයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ඒවාට අවසර ලබා දුන්නේ නැහැ කියන එක. ඔබතුමා දන්නවා, ඒ සම්බන්ධයෙන් විශාල වශයෙන් උද්සෝෂණ කළ බව. අන්තිමේදී ඒ ධීවර සංගම් ගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා ඊට එකඟ වුණා.

ඒ වාගේම ඔබතුමා දන්නවා, විශේෂයෙන්ම මුලතිව්වල තහනම් පන්න ක්‍රම භාවිත කරන බව. ඒවාට අනුබල දුන් සමහර නිලධාරින්ව ධීවර ඇමතිතුමා මැදිහත් වෙලා මාරු කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා නීති විරෝධී පන්න ක්‍රම භාවිත කරන්න එතුමා කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. එම නිසා මම කියන්නේ ඔබතුමා ගරු ඇමතිතුමා සමඟ ඒ සම්බන්ධයෙන් constructively කථා කරන්න කියායි. කිසිසේත්ම ප්‍රදේශවාදයකට වැඩ කරන්නේ නැහැ. මොකද, ඒකේ වෙන ඇඟවුමක් තිබෙනවා. ඔබතුමා ඒ ගැන හිතන්න. එහෙම එකක් අපි කරන්නේ නැහැ. අපි ඩෙල්ෆ්ට් ඉඳලා දෙවුන්දර තුඩුව දක්වා එකම විධියට තමයි නීතිය ක්‍රියාත්මක කරන්නේ. වෙනත් කිසිම ආකාරයක මැදිහත් වීමක් වෙන්නේ නැහැ. පනත ඉදිරිපත් කරන දවස ගැන ඔබතුමාව දැනුවත් කරන්න කියලා මම ඇමතිතුමාට කියන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අද දින නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සම්බන්ධව විගණකාධිපතිතුමාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය යටතේ විශේෂ විගණන වාර්තාවක් ඉදිරිපත් කළා. අපි දන්නවා, ඒ වාර්තාව ඉතා සංවේදී සහ ඉතා බරපතළ කරුණු, නිගමන අන්තර්ගත වාර්තාවක් කියලා. හැබැයි, එතුමා ඒ වාර්තාව ඉදිරිපත් කරන මොහොතේ එය අපේ මේස මත තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඔබතුමා දන්නවා, සිකුරාදා මේ විෂයගත කාරණාව සම්බන්ධයෙන් ඇමතිතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමට තිබෙන බව. මේ තත්ත්වය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාටම මේ විශේෂ විගණන වාර්තාව ලබා දෙන්නේ නැත්තේ ඇයි? අපට ඒ විශේෂ විගණන වාර්තාව අවශ්‍යයි. අපට ඒ ගැන දැනගන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා විසින් ඒ වාර්තාව table කළාට පසුව තමයි ඔබතුමන්ලාගේ මේසය මතට එය ලැබෙන්නේ කියලා ලේකම් මණ්ඩලය කියනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අද ඒ වාර්තාව table කළා නම් දැන් අපේ මේසය මත එය තිබෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් table කිරීමට සමාන්තරව ඒ වාර්තාව ලබා දෙනවා නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, copy එකක් Library එකටත් ලබා දීලා තිබෙනවාය කියනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා එම විශේෂ විගණන වාර්තාව සභාගත කළා. නමුත්, තවම අපට එහි පිටපතක් ලැබිලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණාව තමයි අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් මතු කළේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක නේ, point එක.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
හෙට අපේ කාරක සභාව තිබෙනවා. අපට මේ විශේෂ විගණන වාර්තාව පිළිබඳව අධ්‍යයනය කරන්න ඕනෑ. අඩු ගණනේ සංක්ෂිප්තයක් හරි ලබා දීමට කටයුතු කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ඔබතුමා කාලයකට පස්සේ මට විනාඩියක කාලයක් ලබා දුන්නාට, ගරු කථානායකතුමනි. ඒ වාර්තාව print කරලා කවදාද අපට ලබා දෙන්නේ කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට කියන්න තිබෙන්නේත් ඒ කාරණාව තමයි. Print order එක අරගෙන තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, එය ලැබෙන්න සලස්වන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය වශයෙන් අපි මේවාට අදාළව කිසිදු මැදිහත් වීමක් කරන්නේ නැහැ. ඒවා වාර්තා කිරීම හෝ ඉදිරිපත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලය වගකිව යුතුයි. ඒක ලේකම් මණ්ඩලයෙන් කළ යුතු දෙයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහි පිටපත් ගරු මන්ත්‍රීවරු වෙත බෙදා හැරීම පිළිබඳ වගකීම ලේකම් මණ්ඩලය විසින් භාරගත යුතුයි.

## කරදියාන, අපද්‍රව්‍යවලින් විදුලිය ජනනය කරන බලාගාරයේ ඉදිකිරීම්: ප්‍රගතිය

கரதியான, கழிவுப்பொருள் மின் உற்பத்தி நிலையம்: முன்னேற்றம்

CONSTRUCTION OF WASTE-TO-ENERGY POWER PLANT IN KARADIYANA: PROGRESS

842/2025

2. **ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන රාශියක් විසින් අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කරදියාන ප්‍රදේශයේ අපද්‍රව්‍ය බලශක්ති බලාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) එමගින් ජනනය කිරීමට අපේක්ෂා කරන ලද විදුලි ඒකක ප්‍රමාණය කොපමණද;

(iii) එම බලාගාරය ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර තිබෙන මුදල කොපමණද;

(iv) එම බලාගාරය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்திலுள்ள பல உள்ளூராட்சி நிறுவனங்கள் தமது கழிவுகளை அகற்றும் கரதியான பிரதேசத்தில், கழிவுப்பொருள் மின் உற்பத்தி நிலையம் ஒன்றை நிர்மாணிப்பதற்குத் திட்டமிடப்பட்டிருந்தமை குறித்து அறிவாரா;

(ii) இதிலிருந்து உற்பத்தி செய்வதற்கு எதிர்பார்க்கப் பட்ட மின் அலகுகளின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி நிலையத்தை நிர்மாணிப்பதற்கு இதுவரை செலவிடப்பட்டுள்ள பணத்தொகை யாது;

(iv) மேற்படி நிலையத்தின் நிர்மாணப் பணிகளின் தற்போதைய முன்னேற்றம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that a waste-to-energy power plant had been planned to be constructed in the Karadiyana area, where waste is disposed of by a number of local government institutions in the Colombo District;

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

(ii) the number of units of electricity expected to be generated by the plant concerned;

(iii) the total amount spent so far on the construction of the plant; and

(iv) the current progress of the construction of the plant?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මෙගාවොට් 10යි.

(iii) මෙම බලාගාරය ඉදිකිරීමට සැලසුම් කළේ පෞද්ගලික අංශයේ සමාගමක් වන බැවින්, වැය කළ මුදල පිළිබඳව නිශ්චිත අගයක් ප්‍රකාශ කළ නොහැක. මේ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හෝ රජය කිසිදු මුදලක් වැය කර නොමැත.

(iv) උක්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2021.10.11 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව එහි ඉදිකිරීම් කටයුතු කරගෙන යාම අත්හිටුවා ඇත. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අපදුව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් අවශ්‍ය පියවර ගෙන ඇති බව මා වෙත වාර්තා වී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම කරදියාන ප්‍රදේශයේ මෙම බලශක්ති බලාගාරය ඉදි කිරීමේ මූලික අපේක්ෂාව වුණේ, අපේ රටේ විදුලිබල පද්ධතියට යම් ධාරිතාවක් එකතු කිරීමයි. නමුත්, ඇමතිතුමාගේ ප්‍රකාශය අනුව අපට පෙනෙනවා, එම බලාගාරයේ වැඩ දැන් ඇණ හිටලා තිබෙනවා කියලා. ඒත් එක්කම අද නිෂ්පාදනය කරනු ලබන විදුලිය ධාරිතාවේ යම්කිසි අඩු වීමක් තිබෙන බවත් පෙනෙනවා. විශේෂයෙන්ම බාල ගල් අඟුරු නිසාම නොරොච්චෝලේ බලාගාරය විසින් නිෂ්පාදනය කරනු ලබන විදුලි ධාරිතාව අඩු වෙලා තිබෙනවා. ඒ හින්දා දැන් අපට ඩීසල් වැඩියෙන් යොමු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අපට පෙනෙනවා, අප්‍රේල් මාසයේ 04වැනි දා ඉඳන් ලංකාව පුරාම යම්කිසි ආකාරයේ විදුලිය විසන්ධි කිරීමක් සිද්ධ වෙනවා කියලා, කිසිම දැනුම් දීමකින් තොරව. මේ වෙනකොට සමහර තැන්වල පැය දෙකක් විදුලිය විසන්ධි කරනවා; සමහර තැන්වල පැය භාගයක් විසන්ධි කරනවා. අද ලංකාව පුරාම ජනතාවට කිසිම දැනුම් දීමක් නොකර විදුලිය විසන්ධි කිරීමක් කරගෙන යනවා. ඇයි, ආණ්ඩුව ඒක ප්‍රකාශයට පත් කරන්නේ නැත්තේ? ඇමතිතුමනි, ඒක හරිම ප්‍රශ්නයක්. දැන් විදුලිය කප්පාදුව කරනවා, කිසිම announcement එකක් නැහැ.

අනෙක් පැත්තෙන් දැන් ජලය කප්පාදුවකුත් සිද්ධ වීගෙන යනවා. දැන් සමහර ස්ථානවල පැය 24ම ජලය නැහැ. කොළඹ දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවලට පැය 24ම ජලය නැති වුණා, පසුගිය දවස් කිහිපය තුළ. හොරෙන් හොරෙන් කපනවා. දැන් විදුලියත් හොරෙන් හොරෙන් කපනවා. ආණ්ඩුවක් හැටියට හොරෙන් හොරෙන් විදුලිය කපන්නේ ඇයි? එහෙම නම් ඒ පිළිබඳව ජනතාවට කලින් දැනුම් දීමක් කරලා විදුලිය කප්පාදු කරන්න පුළුවන්. නමුත් පසුගිය 04වැනි දා ඉඳන් ගරු කථානායකතුමනි, කිසිම දැනුම් දීමකින් තොරව රට පුරාම විදුලිය කප්පාදුවක් යනවා. නොරොච්චෝලේ බලාගාරයෙන් සිදුවෙන අලාභය අවම කරගන්න දැන් ඉතාම නරක තැනකට ජනතාව තල්ලු කරලා තිබෙනවා. විදුලිබල ඇමතිතුමනි, ඇයි එහෙම කරන්නේ කියලා තමයි මම අහන්නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම මේ අතුරු ප්‍රශ්නය ප්‍රධාන ප්‍රශ්නයට නම් අදාළ නැහැ. අපි schedule කරලා විදුලිය කපනවා නම්, අනිවාර්යයෙන් දැනුවත් කරලා විදුලිය කපනවා කියලා මම ප්‍රකාශ කරන්න කැමතියි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට ඇහුණේ නැහැ, ගරු කථානායකතුමනි, එතුමා අහක බලාගෙන උත්තරේ දුන්නේ, මයික් එකට නොවෙයි. මට ඇහුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ headphone එක දමා ගන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, මම ඔබතුමා දෙස බලාගෙන උත්තර දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Headphone එක දමා ගන්න, ගරු මන්ත්‍රීතුමනි. එතකොට හොඳට ඇහෙනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඉදිරියේදී schedule කරලා power cut එකක් සිදු කරනවා නම්, අනිවාර්යයෙන් දැනුම් දීමකින් පසුව කරන බව මේ සභාවට කියන්න කැමැතියි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම ස්තුතියි. අපි ඔබතුමාගේ උපදෙස් පිළිපදිනවා.

ගරු කථානායකතුමනි, දැන් නොදන්වා විදුලිය කපාගෙන යනවා. ඊයේත් කොළඹ නගරයේ යම් යම් ප්‍රදේශවල පැය දෙකක් විදුලිය කැපුවා; සමහර තැන්වල පැය භාගයක් කැපුවා. මා හිතන විධියට, ඊයේ කොළඹ 7ත්, විපක්ෂ නායක කාර්යාලය අවටත් පැය භාගයකටත් වඩා වැඩි කාලයක්, දවල් කාලයේ විදුලිය කප්පාදු කළා. ඉතින් ඇයි එහෙම දැනුවත් නොකර විදුලිය කපන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක අසාධාරණයි නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, මම හිතනවා මෙතුමන්ලාට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා කියලා. මේවා, ජනතාව නොමඟ යවන්න මතු කරන ප්‍රශ්න. විදුලි පද්ධතියේ යම් යම් බිඳ වැටීම් නිරන්තරව සිදු වෙනවා. ඒක අලුත් දෙයක් නොවෙයි. අපි ඒවා යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිත් ක්‍රියාත්මක කරගෙන යනවා. නමුත් යම් යම් වේලාවල පොඩි වෙලාවකට බිඳ වැටීම් සිදු වෙනවා. ක්ෂණිකව - ඉතා කෙටි කාලයක් ඇතුළත - ඒවා යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු අපි කරනවා. ඒ නිසා ඒක කපා හැරීමක් නොව, බිඳ වැටීමක් කියලා තේරුම් ගත්තොත් හොඳයි කියලා මම සඳහන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -884/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Hon. Speaker, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1014/2025 - (1), ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

## රිජ්වේ ආර්යා ළමා රෝහල: සැත්කම් සඳහා පොරොත්තු ලේඛන
### சீமாட்டி றிஜ்வே சிறுவர் வைத்தியசாலை: அறுவை சிகிச்சைகளுக்கான காத்திருப்புப் பட்டியல்
### LADY RIDGEWAY HOSPITAL FOR CHILDREN: WAITING LISTS FOR SURGERIES

1030/2025

5. **ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) විවිධ සැත්කම් සඳහා කොළඹ, රිජ්වේ ආර්යා ළමා රෝහලේ පොරොත්තු ලේඛනවල මේ වන විට සිටින ළමයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම රෝහලේ සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වයස අවුරුදු 16 දක්වා වූ ළමයින්ට පමණක් ප්‍රතිකාර ලබා ගත හැකි එම රෝහලේ විවිධ සැත්කම් සඳහා පොරොත්තු ලේඛනවල සිටිය යුතු කාලය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு, சீமாட்டி றிஜ்வே சிறுவர் வைத்தியசாலையில் பல்வேறு அறுவை சிகிச்சைகளை மேற்கொள்வதற்காக இன்றளவில் காத்திருப்புப் பட்டியலில் உள்ளடக்கப்பட்டுள்ள சிறுவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலையில் 2020ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை மேற்கொள்ளப் பட்டுள்ள அறுவை சிகிச்சைகளின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) 16 வயது வரையான சிறுவர்கள் மாத்திரமே சிகிச்சை பெற முடியுமான இவ்வைத்தியசாலை யில், பல்வேறு அறுவை சிகிச்சைகளை மேற்கொள்வதற்கான காத்திருப்புப் பட்டியலிலுள்ள காலத்தைக் குறைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of children currently on the waiting lists for various surgeries at the Lady Ridgeway Hospital for Children in Colombo;

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

(ii) number of surgeries performed in that Hospital in each year from the year 2020 up until now, separately; and

(iii) measures that will be taken to minimize the time that patients have to be on waiting lists for various surgeries at this hospital, which provides treatments only to the children up to the age of 16 years?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| ශල්‍ය සැත්කම් වර්ගය | පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව |
|---|---|
| ළමා ශල්‍ය සැත්කම් - general surgeries | 593 |
| උගුර, කන, නාසය ශල්‍යකර්ම | 266 (130 කර්ණශංඛ බද්ධය සඳහා) |
| විකලාංග ශල්‍යකර්ම | 48 |
| ස්නායු සම්බන්ධ ශල්‍යකර්ම | 19 |
| අක්ෂි ශල්‍යකර්ම | 388 |
| හෘද උරස් ශල්‍යකර්ම | 1,025 |
| ප්ලාස්ටික් ශල්‍යකර්ම | 240 |
| සුෂුම්නා ශල්‍යකර්ම | 133 |
| එකතුව | 2,712 |

(ii)

| වර්ෂය | ප්‍රධාන | සුළු | අතරමැදි | ප්‍රධාන හෘදය සැත්කම් | වාර්ෂික එකතුව |
|---|---|---|---|---|---|
| 2020 | 2,782 | 7,441 | 3,812 | - | 14,035 |
| 2021 | 2,634 | 5,695 | 3,155 | - | 11,484 |
| 2022 | 2,359 | 6,323 | 4,052 | 2,305 | 15,039 |
| 2023 | 2,399 | 8,624 | 4,766 | 2,116 | 17,905 |
| 2024 | 2,607 | 8,999 | 4,449 | 1,637 | 17,692 |
| 2025 | 2,706 | 9,239 | 4,533 | 2,122 | 18,600 |
| එකතුව | 15,487 | 46,321 | 24,767 | 8,180 | 94,755 |

(iii)
- 2022 වසරේ සිට විකලාංග, ප්ලාස්ටික් සහ කශේරුකාව ආශ්‍රිත සැත්කම් සිදු කිරීම සඳහා නව ශල්‍යාගාර පද්ධතියක් ස්ථාපිත කර ඇත.
- මෙම වසර අග වන විට Little Heart Complexහි වැඩ අවසන් වන බැවින් එමඟින් දැඩි සත්කාර ඒකක පහසුකම් වැඩිදියුණු වීම.

  ඒ නිසා සතියක් තුළ කරන්න පුළුවන් හෘදය සැත්කම් ප්‍රමාණය වැඩි කර ගන්න පුළුවන්.
- කොවිඩ් සමයේ පවා පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග මඟින් අවශ්‍ය කරන laparoscopic systems වැනි උපකරණ ලබාගෙන ශල්‍යකර්ම අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිණි.
- Day Surgery Unit එක නැවත ආරම්භ කිරීම.

  ඒ කියන්නේ, එදා කරලා එදාම යවන surgeries.
- Neurosurgery ඒකක රෝහලේ නොමැති වුවත් ශ්‍රී ලංකා ජාතික රෝහල සමඟ ඒකාබද්ධව එම ශල්‍යකර්ම සිදු කිරීම.
- වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම ද ශ්‍රී ලංකා ජාතික රෝහල සමඟ ඒකාබද්ධව ආරම්භ කර ඇත.
- ලිනන් සැපයුම වැඩි කර ගැනීමට කටයුතු කරන අතර, සේදුම් යන්ත්‍ර (100 kg) සහ වියළීම් යන්ත්‍ර (100 kg) දෙකක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇණවුම් නිකුත් කර ඇත. එම යන්ත්‍ර දෙක ඉදිරි මාස දෙක ඇතුළත ලැබීමට නියමිතව පවතී.
- අනුමත සේවක සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.
- විදේශ ශල්‍ය කණ්ඩායම් සමඟ එක්ව ශල්‍යකර්ම සිදු කිරීම ආරම්භ කර ඇත.
- නව ශල්‍යාගාර තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට ක්‍රියා කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රෝහල්වල අධික තදබදයක්, එහෙම නැත්නම් පොරොත්තු ලේඛනවල රෝගීන් විශාල ප්‍රමාණයක් රැඳී සිටින තත්ත්වයක් අපි දකිනවා. ඒකට එක් හේතුවක් තමයි, අපේ රට තුළ ළමා රෝහල් ඉතාම අඩු වීම. මහනුවර එක් ළමා රෝහලත්, කොළඹ ප්‍රදේශයේ තිබෙන කිහිපයත් හැරුණු කොට ළමයින් උදෙසාම වෙන් වෙච්ච රෝහල් ප්‍රමාණය ඉතාම සීමිතයි. ඒ වාගේම, අප ග්‍රාමීය රෝහල්වලට යනකොට අපට පෙනෙනවා, ඒවායේ ළමයින් සම්බන්ධයෙන් ඉන්න ළමා රෝග විශේෂඥවරුන්ගේ අඩුවක්.

මම ඔබතුමාට මේ වෙලාවේ මේ කාරණයත් මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම පසුගිය කාලය පුරාවට - දීර්ඝ කාලයක් තිස්සේ - පෞද්ගලිකවත් කථා කරලා තිබෙනවා, ලග්ගල රෝහලේ තත්ත්වය ගැන. ඒ රෝහල රිජ්වේ ආර්යා ළමා රෝහල සමඟ සම්බන්ධ නොවුණත්, රෝහලක් නිසා මම ඔබතුමාත් එක්ක ඒ ගැන කථා කරනවා. ලග්ගල රෝහල Type A රෝහලක්. එම රෝහලේ වෛද්‍යවරු 10දෙනෙක් ඉන්න ඕනෑ. නමුත්, හිටියේ වෛද්‍යවරු 5දෙනෙකු පමණයි. දැන් ඒ අයගෙනුත් දෙදෙනෙක් transfers අරන් ගිහිල්ලා තිබෙනවා. දැන් එම රෝහලේ ඉන්නේ වෛද්‍යවරු තුන්දෙනකු පමණයි. එම රෝහල වෙත එවීම සඳහා නම් කරපු වෛද්‍යවරු තව වනකල් එම රෝහල වෙත වාර්තා කරලා නැහැ. ඒ තත්ත්වය තුළ ලග්ගල රෝහල දැවැන්ත අසීරුතාවකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම, එම රෝහල Type C වර්ගයේ Base Hospital එකක් බවට පත් කරන බවටත් පොරොන්දුවක් වුණා. නමුත්, ඒකත් මේ වනතෙක් සිදු වෙලා නැහැ. ඒ කියපු විධියට එම රෝහල Type C තත්ත්වයට පත් වුණා නම් එම රෝහලට විශේෂඥ වෛද්‍යවරු 5දෙනෙක්

එන්න ඕනෑ. එම රෝහල ඒ තත්ත්වයට පත් කරන එකත් තව වනකල්ම සිදු වෙලා නැහැ. මම ඔබතුමාගෙන් අහන්නේ, ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලායි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹன்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ගරු මන්ත්‍රීතුමියනි, මේ වනකොට වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මොකද, අවුරුදු ගණනාවක් තිස්සේ වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරුවීම් නිසි පරිදි ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. ඒ නිසා වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරුවීම් 7,000කට ආසන්න ප්‍රමාණයක් දැනට ක්‍රියාත්මක වෙනවා. ඒ හේතුවෙන්, නොයෙක් තැන්වල හිර වෙලා හිටපු වෛද්‍යවරුන්ට තමන්ට නියමිත සේවා ස්ථානවලට යන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ නිසා යම් රෝහලක සිටින වෛද්‍යවරයකු වෙනත් රෝහලකට ගියාට පසුව ඒ වෙනුවට නියමිත වෛද්‍යවරයෙකු එනකල් යම් පොඩි කාලයකට වෛද්‍යවරුන්ගේ අඩුවීමක් දකින්න පුළුවන්. නමුත්, එම ස්ථාන මාරු ක්‍රියාවලිය ඉක්මනින්ම සිදු වෙනවා. මැයි මාසයේ අග වනකොට ඒ අදාළ වෛද්‍යවරුන් ප්‍රමාණය එම රෝහල්වලට ලැබෙනවා. ඒ වාගේම, ලග්ගල රෝහල ගත්තාම, ඒකේ grade එක පහළට දමන්න කිසිම වෙලාවක ක්‍රියා කරන්නේ නැහැ කියන එකත් අපි ඔබතුමියට කියා තිබෙනවා. එවැනි ක්‍රියාත්මක වීමක් සිද්ධ වෙන්නේ නැහැ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නැහැ, එම රෝහල මූලික රෝහලක තත්ත්වයකට පත් කරන යෝජනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. එහිදී ඒ වෙනුවෙන් එම රෝහලට විශේෂඥ වෛද්‍යවරුන් 5දෙනෙකු ලබා දෙනවා කියලාත් යෝජනා වෙලා තිබෙනවා. ඒක සිද්ධ වෙලා නැහැ කියන එකයි මම කිව්වේ. ඒ වාගේම, ස්ථාන මාරු ලබා ගිය වෛද්‍යවරුන් දෙදෙනා වෙනුවට බකමූණ රෝහලේ වෛද්‍යවරයෙකු දැනට නම් කර තිබෙනවා. ඒ වෛද්‍යවරයාත් තවම සේවයට වාර්තා කරලා නැහැ. දැන් මාසයකට වැඩියි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹன்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
දැනටත් ඒ වෛද්‍යවරුන්ගේ අතට ඒ තොරතුරු ලැබිලා තිබෙනවා. ඒ හැම වෛද්‍යවරයෙකුටම අපි දන්වලා තිබෙනවා, නියමිත සේවා ස්ථානවලට යන්න කියලා. මේ මාසයේ අග වෙනකොටත් නියමිත සේවා ස්ථානවලට නොයන වෛද්‍යවරුන්ගේ වැටුප් නැවැත්වීමට ඇත්තටම ක්‍රියා කරනවා. ඒක නිසා අපි හිතන්නේ මේ මාසය ඇතුළත අනිවාර්යයෙන්ම ඒ වෛද්‍යවරයා ඒවි. නමුත් ඒ පිළිබඳව අපි පෞද්ගලිකවත් සොයා බලන්නම්. සොයා බලා ඒ පිළිබඳ පියවර ගන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6, ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමිය දෙවන අතුරු ප්‍රශ්නයත් ඇහුවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නැහැ, නැහැ. පැහැදිලි කිරීමක් කළේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ලිපිලේඛනාදිය මුද්‍රණය කිරීම ගැන ස්ථාවර නියෝග ප්‍රශ්නයක් මීට කලින් ඉදිරිපත් කළා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඒක චෝදනාවක් ලෙස තමයි ඉදිරිපත් කළේ, ගල් අඟුරු වංචාව පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තාව ලබා දීලා නැහැ, ඒක සභාගත කරලා නැහැ කියලා.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 26(1) යටතේ ලිපිලේඛනාදිය ගැන සඳහන් කරලා තිබෙනවා. මම එය ඉක්මනින් කියවන්නම්.

එහි මෙසේ සඳහන් වෙනවා:

> "26. (1) කථානායකවරයා, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් පමණක් ලිපිලේඛනාදිය පිළිගන්වනු ලැබිය යුත්තේ ය.
>
> (2) සෑම ලිපිලේඛන පිළිගැන්වීමක් ම පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වල ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.
>
> (3) කිසියම් ලිපිලේඛනයක් පිළිගැන්වීමේ දී එහි අන්තර්ගතය පිළිබඳ කෙටි විස්තරාත්මක ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය. එහෙත් පිළිගන්වනු ලබන අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් විවාදයක් පවත්වනු නොලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, 26 (4)හි නිශ්චිතවම මෙසේ සඳහන් වනවා:

> "පිළිගන්වනු ලබන ලිපිලේඛන සියල්ලක්ම සභා මේසය මත තිබිය යුතු යැයි නියෝග කරන ලද්දක් මෙන් සලකනු ලැබිය යුතු අතර, එම ලිපිලේඛන මුද්‍රණය කිරීමට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් වෙතොත්, සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව නිර්ණය කරනු ලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, මෙතැන පැහැදිලිව ඒ කරුණු තිබෙනවා. ලිපිලේඛන print කරලා මෙතැන තිබෙන්න ඕනෑ. නමුත් සමහර ලිපිලේඛන සභාවේ අවසරයක් අරගෙන තමයි මුද්‍රණය කළ හැක්කේ. ඒ නිසා තමයි ඔබතුමා ඒක ඉදිරිපත් කළේ. මේ නිශ්චිත කරුණ ගත්තොත්, එනම් අද දින වැඩ කටයුතුවල 3. (ii) යටතේ, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය යටතේ ලක්විජය බලාගාරය සඳහා ලංකා ගල් අඟුරු සමාගම විසින් ගල්

[ගරු බිමල් රත්නායක මහතා]

අහුරු මිලදී ගැනීමේ ක්‍රියාවලිය සහ 2025/2026 වාරය සඳහා ගල් අහුරු ප්‍රසම්පාදනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව" ඔබතුමා ඉදිරිපත් කළාම, මේ සභාව වෙනුවෙන් තමයි මම, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය යැයි මම යෝජනා කරමි" කියලා කියන්නේ. ඉන්පසුව තමයි බලය ලැබෙන්නේ මෙය මුද්‍රණය කරන්න. නමුත් සෑම වාර්තාවක්ම මුද්‍රණය කරන්න කියලා මෙතැනදී සම්මත කර ගන්නේ නැහැ. සමහර ඒවා automatically මෙතැන ඔබතුමාගේ නියෝග මත print වෙනවා. සමහර ඒවා "මුද්‍රණය කළ යුතු යැයි" කියන විශේෂ යෝජනාවකින් තමයි මුද්‍රණය කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා කිසිම ආකාරයකින් මේ වාර්තාව මුද්‍රණය කිරීමට බාධා කිරීමක් කොහෙන්වත් සිදු වෙලා නැහැ. මේක පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල තිබෙන ක්‍රමයක්.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය පළමුවෙනි ප්‍රශ්නය අහනවා, වෛද්‍ය ඌනතාවක් ගැන. දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, Laggala Hospital එක මූලික රෝහලක් ලෙස පවත්වාගෙන යෑම ගැන. ඉතින් ඔබතුමිය ප්‍රශ්න දෙකක්,-*[බාධා කිරීම්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නැහැ, නැහැ. ඔබතුමා ඒක ආපහු අහලා බලන්න. මම ලග්ගල රෝහලට වෛද්‍යවරු ඇවිල්ලා නැහැ කියන එක ගැනයි කථා කළේ. ඒකට ඇමතිතුමා දීපු උත්තරයේ තිබුණු අඩුවක් ගැන තමයි මම පැහැදිලි කිරීම කළේ. දෙවැනි අතුරු ප්‍රශ්නය මම ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමිය දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මූලික රෝහලක් විධියට පවත්වාගෙන,-

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නැහැ, නැහැ, නැහැ. එහෙම වුණා නම් මෙච්චරක් ඉන්නත්,-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් අහන්නකෝ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
එහෙම වුණා නම් ඉන්න ඕනෑ ප්‍රමාණය ගැනයි මම කිව්වේ. ඒත් අඩුවක් තිබෙනවා කියලායි මම කිව්වේ. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමියට ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඔබතුමාට තිබෙන්නේ පුදුම කලබලයක් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, ගරු මන්ත්‍රීතුමිය. ඉස්පිරිතාල ගැන මට කියන්න අවශ්‍ය නැහැ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද වනකොට මධ්‍යම පළාතේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගිලන් රථ රියැදුරන් වැඩ වර්ජනයක ඉන්නේ. ඒකට හේතුව, ඒ අය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පිට දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කර තිබීම. ඔබතුමා දන්නවා, ගිලන් රථ රියැදුරකු හැටියට පත් කරන්න කලින් ඔවුන්ට විශේෂ පුහුණුවක් දෙන බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ප්‍රශ්නයට අදාළව,-

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
හරි, ප්‍රශ්නය තමයි මේ. ගරු කථානායකතුමනි, ගිලන් රථ රියැදුරුවරුන් නේ, රිජ්වේ ආර්යා එකටත් ළමයි අරගෙන එන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක මැක්කාගේ කථාව වාගේ නේ, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ විධියට වුණාම ගෙන එන රෝගීන් ලොකු අනතුරකට පත් වෙනවා. ඒ වාගේම අවදානමක් තිබෙනවා. ආණ්ඩුකාරතුමා ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රය අරගෙන තිබෙන මේ තීන්දුව උඩ අද ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් අහනවා, ඔබතුමා ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඇත්තටම මෙහෙමයි. අපේ ගිලන් රථ රියැදුරන් ගත්තොත්, දෙපිරිසක් ඉන්නවා. අපි එක කණ්ඩායමක් මධ්‍යම රජය යටතේ ගිලන් රථ රියැදුරන් ලෙස බඳවාගෙන තිබෙනවා. ඔවුන් ගිලන් රථ රියැදුරන් විධියට තමයි බඳවා ගන්නේ. පළාත් සභා යටතේ පවතින රෝහල් තිබෙනවා. ඒකාබද්ධ සේවයේ අය තමයි ගිලන් රථ රියැදුරන් විධියට ඒ රෝහල්වල වැඩ කරන්නේ. ඇත්තටම රාජ්‍ය සේවයේ වැඩ කරන රියදුරන්ට ඒ සඳහා වූ පරිචය තිබෙනවා, ඒ සඳහා වූ සුදුසුකම් තිබෙනවා. ගිලන් රථ රියැදුරෙකු වීමේ සුදුසුකම ඔවුන්ට තිබෙනවා. මධ්‍යම පළාත් සභාව ඔවුන්ගේ මාරුවීම් ක්‍රියාත්මක කරලා තිබෙනවා. රජයක් විධියට අපට ඒකට කරන්න දෙයක් නැහැ, අපි පළාත් සභා ක්‍රමය පිළිගන්නවා නම්. ඒ පළාත් සභාව මඟින් සිදු කරන අභ්‍යන්තර මාරු කිරීම් අපට පිළිගන්න සිද්ධ වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි හිතනවා, අපට ඒකෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නයට අදාළ ස්ථාවර නියෝගයේ අංකය කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, நிலையியற் கட்டளை இல. 92(2). நான் தமிழில் கேட்க விரும்புகின்றேன். நிலக்கரி தொடர்பான குறித்த reportஐ எங்களுக்குத் தமிழில் தர முடியுமா? நீங்கள் இந்த reportஐச் சிங்களத்திலும் ஆங்கிலத்திலும் மாத்திரம் வழங்கினால், நாங்கள் தமிழில் எங்கே போய் தேடுவது? எனவே, நிலக்கரி தொடர்பான - எங்களுடைய அமைச்சருடைய ஊழல் தொடர்பான - reportஐத் தமிழில் தரச் சொல்லி கேட்கிறோம். அவ்வளவுதான். அதாவது, இதைத் தனியே சிங்களத்தில் வழங்காமல், தமிழிலும் தருமாறுதான் கேட்கின்றோம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහනවාද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, සභානායකතුමා කිව්වා, "ගල් අඟුරු වංචාව" කියලා. ඒ විගණන වාර්තාව ඉදිරිපත් කරපු සභානායකතුමාගේ කටින් එහෙම පිටවීම පිළිබඳව අපේ ප්‍රශංසාව පළ කරමින් ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නය මම ඇමතිතුමාගෙන් අහනවා.

## ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්: A330-200 wide-body ගුවන් යානය ලබා ගැනීම

### ஸ்ரீ லங்கன் விமான சேவைகள்: பெற்றுக்கொள்ளப்பட்ட A330-200 wide-body விமானம்

### SRILANKAN AIRLINES: ACQUISITION OF A330-200 WIDE-BODY AIRCRAFT

1089/2025

**6.ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය සඳහා අලුතින් ලබා ගත් A330-200 wide-body ගුවන් යානය ලබා ගත් සමාගමේ නම කවරේද;

(ii) එම සමාගම නිර්දේශ කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) ඉහත ගුවන්යානයේ නිෂ්පාදිත දිනය කවරේද;

(iv) එම ගුවන්යානය ලබා ගෙන ඇත්තේ කුලී පදනම මතද;

(v) නොඑසේ නම්, බදු වාරික ගෙවීමේ පදනම මතද;

(vi) එසේ නම්, මාසික බදු වාරිකය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ லங்கன் விமான சேவைகள் கம்பனிக்காகப் புதிதாகப் பெறப்பட்ட A330-200 wide-body விமானம் பெற்றுக்கொள்ளப்பட்ட கம்பனியின் பெயர் யாது என்பதையும்;

(ii) அந்தக் கம்பனியைப் பரிந்துரை செய்தது யார் என்பதையும்;

(iii) மேற்படி விமானம் உற்பத்தி செய்யப்பட்ட திகதி யாது என்பதையும்;

(iv) அந்த விமானம் வாடகை அடிப்படையில் பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(v) இன்றேல், குத்தகை தவணைக் கொடுப்பனவு அடிப்படையில் பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், மாதாந்தக் குத்தகை தவணைக் கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the name of the company from which the SriLankan Airlines acquired the newly acquired A330-200 wide-body aircraft;

(ii) the party that recommended the aforementioned company;

(iii) the date of manufacture of the aircraft mentioned above;

(iv) whether the said aircraft has been acquired on a rental basis;

(v) if not, whether it has been acquired on a lease basis; and

(vi) if so, the monthly lease rental installment?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බදුකරු ලෙස ක්‍රියාත්මක වෙන්නේ, SASOF IV (AI) AVIATION IRELAND DAC සමාගම.

[ගරු අනුර කරුණාතිලක මහතා]

සේවා සම්පාදක හැටියට කටයුතු කරන්නේ, Carlyle Aviation Management Limited.

(ii) 2024 පෙබරවාරි මාසය වනවිට ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමට අයිතිවෙන A330 ගුවන් යානා 05ක් ඉවත්වීමට නියමිතව තිබුණා. 2022 අග භාගයේදී ආරම්භ කළා, ගුවන් යානා ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළක්. A330 ගුවන් යානා ලබා ගැනීමේ වැඩ පිළිවෙළ තමයි එතැනදී ක්‍රියාත්මක වුණේ. ඒ අනුව වසර 4ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා A330 ගුවන් යානා 05ක් බදු පදනම මත ලබා ගැනීම සඳහා 2023 වසරේදී කටයුතු ආරම්භ කළා, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව. අදාළ ලන්සුකරු තෝරාගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට සහ අදාළ ගුවන් යානා බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබෙනවා. ඒ අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ තමයි මේ කල්බදු ගිවිසුම ඇතිකරලා තිබෙන්නේ.

(iii) 2011 නොවැම්බර් මාසයේදී.

(iv) ගුවන් යානය ලබාගෙන තිබෙන්නේ කුලී පදනම මත නොවෙයි.

(v) ගුවන් යානය අරගෙන තිබෙන්නේ, බදු වාරික ගෙවීමේ පදනම මත.

(vi) මාසික බදු වාරිකය ඇමෙරිකානු ඩොලර් 275,000යි.

(ආ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි පසුගිය දවස්වල ශ්‍රීලන්කන් ගුවන් සමාගම අපේ කමිටුවට ගෙන්වලා මේ ගැන කථා කළා. මේ අවශ්‍යතාව අපට තේරෙනවා. රජය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන පවත්වාගෙන යනවා නම්, මේ වාගේ ගුවන් යානාවල අවශ්‍යතාවක් තිබෙනවා. 2014ට පෙර අධික ණය වාරික මත මෙවැනි ගුවන් යානා මිලදී ගැනීම, ශ්‍රීලන්කන් ගුවන් සමාගම ලබා ඇති පාඩුවට බලපා තිබෙනවා. එවැනි ගුවන් යානා ලබා ගනිද්දී, ඊට පෙර අධික බදුවලට අරගෙන තිබෙන ගුවන් යානාවලට කරන්න බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, සමහර ගුවන් යානා කල්බදු ක්‍රමයට ගනිද්දී ඒ සඳහා නිශ්චිත ගිවිසුමක් තිබෙනවා. බදු මුදල සම්බන්ධයෙන් අපි කැමැති වුණත්, අකමැති වුණත්, ඒ බදු ගිවිසුම අනුව තමයි කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ බදු ගිවිසුම කල් පිරෙන අවස්ථාවක් තිබෙනවා. ඒ අනුව අපි කටයුතු කරනවා. එහෙම නැත්නම් මේ මොහොතේ මිල වැඩියි කියලා ඒක අහෝසි කරන්න අපි කටයුතු කළොත්, ඒ සඳහා වැඩි වන්දි මුදලක් අදාළ සමාගම්වලට ගෙවන්න සිද්ධ වෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ පිළිතුර පිළිබඳව මම සෑහීමකට පත් වෙන්නේ නැහැ. මොකද, rearrangement එකකට යන්න පුළුවන්; renegotiation එකකට යන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මොකද, 2014 කාලයේ රාජපක්ෂ ආණ්ඩුව හොරා කාලා ඒවාට පගා ගහන්න add කරපු වාරික තිබෙනවා කියලා නේ කිව්වේ. ඒ නිසා යම් වගකීමක් තිබෙනවා, ඒ පිළිබඳව සොයා බැලීමක් කරලා rearrangement එකකට යන්න.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, දැන් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකට වැඩිම ආදායම ලැබෙන්නේ කොළඹ - ලන්ඩන් ගුවන් ගමනාන්තයෙන්. දෙවැනියට වැඩිම ආදායමක් ලැබෙන්නේ, කොළඹ - මෙල්බර්න් ගුවන් ගමනාන්තයෙන්. ඒ, ඩොලර් මිලියන 30ක් සහ ඩොලර් මිලියන 14ක් වශයෙන්. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකේ සභාපතිතුමා පසුගිය සතියේ එම තනතුරෙන් අස් වුණා. හැබැයි, සභාපතිතුමා අස්වෙනකොටම එතුමා සේවය කරපු සමාගම කොළඹ - මෙල්බර්න් ගුවන් ගමනාන්ත ආරම්භ කරනවා. එංගලන්තයේ ඉඳලා කොළඹටත් ගමනාන්ත ආරම්භ කළා. එතුමා සේවය කරපු සමාගම තමයි දේශීය නියෝජිතයා. එතකොට, ඔබතුමන්ලා පත් කරපු සභාපතිවරයා ගැන ගැටලුවක් මතු වෙනවා, තමන් වැඩ කරපු සමාගමට අවශ්‍ය රාජකාරිය කරලා a conflict of interest, බුද්ධිමය දේපළ පිළිබඳ ගැටලුවක් මතු කරලා තමයි මේ අයින් වෙන්නේ කියන එක සම්බන්ධයෙන්. ඇමතිවරයා හැටියට ඔබතුමාට මේ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න පුළුවන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, මම පළමුවෙනි අතුරු ප්‍රශ්නයේදීත් කිව්වා, එයාර්බස් ගනුදෙනුව නියමිත පටිපාටිය අනුගමනය නොකරමින් අවලංගු කිරීම නිසා කොච්චර වන්දි මුදලක් ගෙවන්න වුණාද කියන එක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ පිළිබඳව හොයා බලන්න. අපි ඒ විධියේ අවලංගු කිරීම් සඳහා කටයුතු කරන්නේ නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය යොමු වෙන්නේ, එයාර්බස් සම්බන්ධයෙන්. නමුත් එතුමා අහන්නේ සභාපතිවරයා සම්බන්ධයෙන්, ගරු කථානායකතුමනි. මෙතැනදී මට කියන්න තිබෙන්නේ මෙයයි. සමහර ව්‍යාපාරිකයන් ඉන්නවා, ඒ අය සමඟ කටයුතු කරද්දී a conflict of interest දැනෙනවා නම් අපි ඒ අනුව කටයුතු කරනවා. එතුමා දැන් සභාපතිත්වයෙන් ඉල්ලා අස්වෙලා තිබෙනවා. ඉල්ලීම් කළාට පසුව ඕනෑම ගුවන් සමාගමකට ඕනෑම රටක ඉඳලා ලංකාවට ගුවන් සේවා ආරම්භ කරන්න අපට අවස්ථාව ලබා දෙන්න වෙනවා. ඒ පිළිබඳව අපි සලකා බලනවා. අපට සලකා බලන්න වෙන්නේ, ශ්‍රීලන්කන් ගුවන් සේවයේ තිබෙන කටයුතුත් එක්ක ළබැඳියාවන් අතර ගැටුමක් තිබෙනවාද නැද්ද කියන එකයි. ඒ අනුව කටයුතු කර තිබෙනවා.

## තඹුත්තේගම ගොවිජන සේවා මධ්‍යස්ථානය: ගබඩා කර ඇති පොහොර තොගය

தம்புத்தேகம கமநல சேவைகள் நிலையம்: களஞ்சியப்படுத்தப்பட்டுள்ள உரத்தொகை

TAMBUTTEGAMA AGRARIAN SERVICE CENTRE: STOCK OF FERTILIZER STORED

1246/2025

**7. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) තඹුත්තේගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර තොගයක් ගබඩා කර තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එම පොහොර ගබඩා කර ඇත්තේ කවර වර්ෂයක සිටද;

(iv) ඉහත පොහොර තොගය මේ වනතෙක් ගොවීන්ට බෙදා නොදීමට හේතු කවරේද;

(v) එම පොහොර තොගය ගොවීන් වෙත බෙදා දීමට සැලසුම් කර තිබේද;

(vi) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(vii) ඉහත පොහොර තොගය ගොවීන්ට බෙදා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புத்தேகம கமநல சேவைகள் நிலையத்தில் ஒரு தொகை உரம் களஞ்சியப்படுத்தப்பட்டு உள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி உரத்தின் அளவு யாது என்பதையும்;

(iii) மேற்படி உரம் எந்த ஆண்டிலிருந்து களஞ்சியப்படுத்தப்பட்டுள்ளது என்பதையும்;

(iv) மேற்படி உரத்தொகையை இதுவரையில் விவசாயிகளுக்கு விநியோகிக்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி உரத்தொகையை விவசாயிகளுக்கு விநியோகிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அதற்காகப் பின்பற்றப்படும் நடைமுறை யாது என்பதையும்;

(vii) மேற்படி உரத்தொகையை விவசாயிகளுக்கு விநியோகிக்கும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House-

(i) whether he is aware that a stock of fertilizer is stored at the Tambuttegama Agrarian Service Centre;

(ii) if so, the quantity of the said fertilizer stock;

(iii) the year since which the said fertilizer had been stored;

(iv) the reasons for not distributing the said stock of fertilizer to the farmers so far;

(v) whether there is a plan to distribute the said stock of fertilizer to the farmers;

(vi) if so, the procedure to be followed in that regard; and

(vii) the date on which the said stock of fertilizer will be distributed to the farmers?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා කාලෝචිත, ඉතා වැදගත් ප්‍රශ්නයක් යොමු කර තිබෙනවා. මේක පොහොර සම්බන්ධ ප්‍රශ්නයක්.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) MOP - කි.ග්‍රෑ. 41,828.95

Urea - මෙට්‍රික් ටොන් 0.307

(iii) MOP 2023 ජූනි මාසයේ සිටය.

Urea 2022/2023 මහ කන්නයේ සිටය.

(iv) මෙම පොහොර තොග ගොවිජන සේවා මධ්‍යස්ථානවල අළෙවි කිරීම සඳහා මිලදී ගත් තොග නොවන අතර, 2023 යල කන්නයේ ආසියානු සංවර්ධන බැංකුවේ සහනාධාර පොහොර වැඩසටහන යටතේ ගොවීන් වෙත සහනාධාර මිලට බෙදා දීම සඳහා රජයේ පොහොර සමාගම් වෙතින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදා හරින ලද පොහොර තොගයකි.

එසේම මෙම පොහොර තොග 2023 ජූනි මාසයේ 21, 25, 27 හා 29 යන දිනවල ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලැබී ඇති අතර, ඒ වන විට 2023 යල කන්නයේ වගා කටයුතු අවසන් වී ඇති බැවින් ගොවීන්ගේ MOP පොහොර අවශ්‍යතාව සම්පූර්ණ වී තිබුණි. 2023 යල කන්නයෙන් පසු ඉතිරි පොහොර මුදල් අය කර අළෙවි කිරීමට උපදෙස් ලැබී ඇත.

එබැවින් කලින් කලට මිල ගණන් වෙනස් කර MOP පොහොර අළෙවි කිරීමට ලද උපදෙස් අනුව විවිධ මිල ගණන් යටතේ පොහොර අළෙවි කිරීම පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

2023 යල කන්නය ආරම්භයේ ගබඩාවේ පැවති පොහොර තොගය කි.ග්‍රෑ. 5,260.95

2023 යල කන්නයේ පොහොර ලැබීම් කි.ග්‍රෑ. 50,000.00

ගබඩාවේ පැවති මුළු පොහොර තොගයේ එකතුව කි.ග්‍රෑ. 55,260.95

පොහොර අළෙවියට අදාළ විස්තර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ විස්තරත් මම කියන්නම්.

2023 යල කන්නයේ වවුවර් පත් සඳහා බෙදා දුන් පොහොර තොගය කි.ග්‍රෑ. 5,582.00

2023/2024 මහ කන්නයේ කි.ග්‍රෑ. 50ක පොහොර මිටිය රුපියල් 14,000.00 බැගින් කි.ග්‍රෑ. 210.00

2023/2024 මහ කන්නයේ කි.ග්‍රෑ. 50ක පොහොර මිටියක් රුපියල් 9,000.00 බැගින් කි.ග්‍රෑ. 2,705

2024 යල කන්නයේ කි.ග්‍රෑ. 50ක පොහොර මිටියක් රුපියල් 9,000.00 බැගින් කි.ග්‍රෑ. 2,080

2025 යල කන්නයේ කි.ග්‍රෑ. 50ක පොහොර මිටියක් රුපියල් 8,500.00 බැගින් කි.ග්‍රෑ. 30

2025/2026 මහ කන්නය කි.ග්‍රෑ. 50ක පොහොර මිටියක් රුපියල් 7,700.00 බැගින් කි.ග්‍රෑ. 2,825

දැනට ඉතිරි පොහොර තොගය කි.ග්‍රෑ. 41,828.95

ඒ වාගේම යූරියා මෙට්‍රික් ටොන් 0.307ක ප්‍රමාණයක් තිබෙනවා. ඒ, 2022-2023 මහ කන්නයේ වී වගාව සඳහා සහනාධාර පොහොර වැඩසටහන යටතේ කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙන් ලැබුණු පොහොරවලින් ඉතිරිය වේ.

තඹුත්තේගම ගොවිජන සේවා මධ්‍යස්ථානය තඹුත්තේගම නගරයට ඉතාම ආසන්නයේ පවතින බැවින් හා පෞද්ගලික පොහොර සැපයුම්කරුවන්ගේ තරගකාරී මිල ගණන්වලට ගැළපෙන ලෙස මිල වෙනස් කරමින් පොහොර අළෙවි කිරීමට ගොවිජන සේවා මධ්‍යස්ථානයට හැකියාව නොමැති බැවින්, තවදුරටත් විශාල පොහොර තොගයක් ඉතිරිව පවතී.

2023 ඉඳලා මේ තොග ඉතිරිව පවතිනවා කියලා තමයි සඳහන් වෙන්නේ.

(v) ඔව්.

(vi)
- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්, ගොවිජන සේවා කාරක සභාව හා ගොවි සංවිධාන හරහා දැනුවත් කිරීම.
- කන්න රැස්වීම්වලදී ගොවීන් දැනුවත් කිරීම.
- ගොවිජන බැංකුව හරහා ණය පදනම මත පොහොර ලබාදීමට කටයුතු කිරීම.

(vii) ගොවීන්ගේ ඉල්ලීම අනුව පොහොර අළෙවි කරනු ලබන බැවින්, තොග අවසන් වන දිනය නිශ්චිතව සඳහන් කළ නොහැකිය.

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව, වසර තුනකට ආසන්න කාලයක් කිලෝ 41,000කට වැඩි පොහොර සංචිතයක් මේ ගබඩාවේ තිබෙනවා. මේ තිබෙන පොහොර කිලෝ 41,000කට අධික ප්‍රමාණය බෙදා දෙන්න සූදානම් කියලා මම අහපු ප්‍රශ්නයට අදාළව උත්තරයක් දීලා තිබෙනවා. පොහොරවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන්, ප්‍රමිතිය සම්බන්ධයෙන් දිගින් දිගටම අපේ රටේ ප්‍රශ්නයක් තිබුණා. වසර තුනකට ආසන්න කාලයක් මේ ගබඩාවේ රඳවාගෙන තිබෙන මෙම පොහොරවල ගුණාත්මකභාවය සම්බන්ධව පරීක්ෂා කර තිබෙනවාද, කොහොමද මේ පොහොර බෙදා දෙන්නේ කියලා ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, පොහොර ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන තොරතුරු අනුව, යූරියාවල තත්ත්වයේ බාලවීමක් සඳහන් වෙන්නේ නැහැ. ඒවා මේ කන්නයේදී වගාවට යෙදවීම සඳහා භාවිත කරන්න පුළුවන් කියන සහතිකය ලැබිලා තිබෙනවා. MOP පොහොර වගාවට යෙදවීමට සුදුසුද කියලා යම් පරීක්ෂණයක් කරලා සොයා බලලා නිදහස් කරන්න තමයි තීන්දු කරලා තිබෙන්නේ. ඒ අනුව යූරියා නිකුත් කිරීම සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් ඇවිල්ලා නැහැ. තාක්ෂණිකව යූරියාවල තත්ත්වය හොඳයි කියන සහතිකය තිබෙනවා. ඒ නිසා ගොවීන්ට නිකුත් කරනවා. අනෙකුත් පොහොර සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වෙළෙඳ පොළට නිකුත් කිරීම සඳහා තමයි දැනට ආයතනය විධියට සූදානම් වෙමින් සිටින්නේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වසර තුනකට ආසන්න කාලයක් තිස්සේ ගොවීන්ට පොහොර ලබා ගැනීමේ විශාල අවශ්‍යතාවක් තිබුණත්, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ අක්කර ලක්ෂ විසිදහසකට ආසන්න ප්‍රමාණයක් මාස් කන්නයේ වගා කරනවා. යල කන්නයේදී ඒකෙන් දෙකෙන් පංගුවක් වගා කරනවා. හැබැයි, එච්චර අවශ්‍යතාවක් තිබියදී මෙච්චර පොහොර තොගයක් මේ ගබඩාවල රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරනවාද කියලා මම අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, වර්තමානයේ ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක පොහොර සැපයීමේ යම් ගැටලුවක් පැන නැඟිලා තිබුණා. දැනට ඒක සාමාන්‍ය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. කොහොම නමුත්, ගරු මන්ත්‍රීතුමා අහන විධියට මේ අර්බුදය ඇතුළේ එක් පොහොර ගබඩාවක මෙවැනි තොගයක් වසර ගණනාවක් පුරා තබා ගැනීම සම්බන්ධයෙන් ඇත්තටම සොයා බැලීම අවශ්‍ය වනවා. ඒ නිසා අපි අමාත්‍යාංශය විධියට ඒ පිළිබඳව යම් පරීක්ෂණයක් කරලා, ඒ පොහොර ගොවීන්ට බෙදා

නොදී ගබඩා කර තබා ගැනීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කරලා, මේ වන විට ඒ කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා අපට ඒ පොහොර නිකුත් නොකර ගබඩා කරගෙන තබා ගැනීම සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණය කරලා, කෙටි කාලයක් ඇතුළත ඒ සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ සඳහා කෙටි කාලයක් ගත වෙයි කියන එක තමයි නිලධාරීන්ගේ පැත්තෙන් කියන්නේ. ඒ සඳහා අවශ්‍ය උපදෙස් දීලා, ක්‍රියාමාර්ග ගන්න කියන මැදිහත්වීම අපි කරලා තිබෙනවා.

## 2015 සිට පාසල් පද්ධතිය තුළ සිදුවන අපයෝජන සහ හිංසන ක්‍රියා: විස්තර

### 2015 முதல் பாடசாலைக் கட்டமைப்பில் இடம்பெறும் துஷ்பிரயோகங்களும் துன்புறுத்தல்களும்: விபரம்

### ABUSE AND VIOLENCE WITHIN SCHOOL SYSTEM SINCE 2015: DETAILS

1369/2025

8. **ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් සහ පෞද්ගලික පාසල්වලින් වාර්තා වූ අපයෝජන සහ හිංසන ක්‍රියා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අපයෝජන සහ හිංසන ක්‍රියා හේතුවෙන් පාසල් හැර යෑම් සහ සිය දිවි නසාගැනීම් වාර්තා වී තිබේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල් හැර යෑම් සහ සිය දිවි නසාගැනීම් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ අපයෝජන සහ හිංසන ක්‍රියා සිදු වීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கை அரச பாடசாலைகளிலும் தனியார் பாடசாலைகளிலும் இடம்பெற்றுள்ளதாக அறிக்கையிடப்பட்டுள்ள துஷ்பிரயோகங்கள் மற்றும் துன்புறுத்தல்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி துஷ்பிரயோகங்கள் மற்றும் துன்புறுத்தல்களின் காரணமாக பாடசாலைகளிலிருந்து இடைவிலகிச் செல்லல் மற்றும் தற்கொலைகள் இடம்பெற்றுள்ளதாக அறிக்கையிடப்பட்டு இருப்பின், அவ்வெண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அவ்வாறு பாடசாலைகளிலிருந்து இடைவிலகிச் செல்லல் மற்றும் தற்கொலைகள் இடம்பெற்றமை தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) இலங்கை பாடசாலைக் கட்டமைப்பில் துஷ்பிரயோகங்கள் மற்றும் துன்புறுத்தல்கள் இடம்பெறுவதைத் தடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of reported cases of abuse and violence in government schools and private schools in Sri Lanka from 2015 up to now, separately for each year;

(ii) number of school dropouts and suicides that have been reported as a result of incidents of such abuse and violence separately, if any;

(iii) measures that have been taken regarding such cases of school dropouts and suicides; and

(iv) measures that will be taken to prevent the incidents of abuse and violence within the school system of Sri Lanka?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වර්ෂය | අපයෝජන සහ හිංසන |
|---|---|
| 2015 | 69 |
| 2016 | 67 |
| 2017 | 78 |
| 2018 | 86 |
| 2019 | 85 |
| 2020 | 66 |
| 2021 | 62 |
| 2022 | 82 |
| 2023 | 117 |
| 2024 | 155 |
| 2025 | 159 |
| **එකතුව** | **1,026** |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(ii) එම අපයෝජන සහ හිංසන ක්‍රියා හේතුවෙන් පාසල් හැර යෑම් 425ක් සහ සිය දිවි නසාගැනීම් 6ක් වාර්තා වී ඇත.

(iii)
- පාසල් තුළ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒවා ශක්තිමත් කිරීම.
- අනිවාර්ය අධ්‍යාපන නියෝග යටතේ පැමිණීමේ කමිටු සක්‍රිය කර පාසල් නොයන දරුවන් පාසල්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ගුරු-විදුහල්පති සේවාරම්භක පුහුණු සැසි පැවැත්වීමේදී ගුරු ආචාර ධර්ම පිළිබඳ දැනුවත් කිරීම.
- "Search for Common Ground" වැනි රාජ්‍ය නොවන සංවිධාන හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සම්බන්ධ කර ගනිමින් පළාත් මට්ටමින් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය.
- අධීක්ෂණය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරීම.
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් මෙවන් අනතුරුදායක තත්ත්වයන් කල් ඇතුව හඳුනා ගැනීම හා ඒ දරුවන් සම්බන්ධව දෙමව්පියන් වැඩිහිටියන් ලෙස ක්‍රියාකාරී විය යුතු ආකාරය සම්බන්ධව දැනුවත් කිරීම හරහා මෙවන් අපයෝජන හා හිංසනවලට මුහුණ දෙන පාර්ශ්ව නෛතික ක්‍රියාවලිය වෙත නොපැකිළව යොමු කරවීම.

(iv)
- පාසල් ප්‍රජාවට ළමා හිංසනය හා අපචාර සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ හිංසනයක්, අපචාරයක් හෝ අපයෝජනයක් සිදු වූ විට ඒ පිළිබඳව ගත හැකි ක්ෂණික ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ළමා පරපුර හා විදුහල්පතිවරු දැනුවත් කිරීම.
- ළමා හිංසනය හා අපයෝජනය සම්බන්ධයෙන් වූ දඬුවම් නිසි පරිදි කඩිනමින් ක්‍රියාත්මක කිරීම.
- පාසල තුළ සිදු වන හිංසනය සම්බන්ධයෙන් දෙමව්පියන් දැනුවත් කර, දරුවන් හා දෙමව්පියන් අතර මනා සම්බන්ධතාවක් ගොඩනැඟීමට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාසල් උපදේශන සේවා විධිමත් කිරීම.

තවද, පාසල තුළ විනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් මීට පෙර නිකුත් කරන ලද 2016.04.29 දිනැති අංක 12/2016 චක්‍රලේඛයේ සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 461/2012 (එෆ් ආර්)හි තීන්දුවේ කරුණු, එනම් "කිසිදු දරුවෙකුට දඬුවම් කිරීමේ ක්‍රමයක් ලෙස හෝ වෙනත් හේතුවක් නිසා හෝ කිසිදු ශාරීරික හෝ මානසික හෝ හානියක් සිදු නොකළ යුතුය. කිසිදු ආකාරයක ශාරීරික දඬුවමක් කවර මට්ටමකින්වත් සිදු කළ නොහැකි අතර, වැරදිකරුවන්ට නීතිය අනුව කටයුතු කරනු ලැබේ." යන්න කෙරෙහිද අවධානය යොමු කර කටයුතු කරන ලෙසට සියලුම අධ්‍යාපන බලධාරීන් වෙත දැනුම් දෙමින් 2026.03.30 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අංක 11/2026 දරන නව චක්‍රලේඛය නිකුත් කර ඇත.

ගරු කථානායකතුමනි, ඊට අමතරව සම්බන්ධීකරණ ආයතන ගණනාවක් තිබෙන නිසා මේ ප්‍රශ්න පිළිබඳව - එම ව්‍යුහාත්මක ගැටලු පිළිබඳව - අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් සැපයීම සඳහා ගිය අවුරුද්දේ අපි මහාචාර්ය අස්විනී ප්‍රනාන්දු සහ මහාචාර්ය ගමීලා සමරසිංහ පත් කළා. එම ව්‍යුහාත්මක ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිළිබඳව වන එම වාර්තාව ලබා ගෙන අපි පොදු වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ අනුව අපි කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය එක්ක වැඩ කරමින් ඉන්නවා.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම යම්කිසි සිසුවෙක් හෝ සිසුවියක් අපයෝජනයට හෝ හිංසනයට ලක් වූ පසුව පාසල් හැර යෑමට එහෙම නැත්නම් සිය දිවි නසා ගැනීමට එක හේතුවක් තමයි, ඒ අදාළ සිද්ධිය පිළිබඳව තොරතුරු සන්නිවේදනය වන ආකාරය, the way the particular information is communicated. විශේෂයෙන්ම ඒ පාසල ඇතුළත, එහෙම නැත්නම් ඒ සිද්ධිය පිළිබඳව මහජනතාව දැනුවත් කරන ආකාරය ඒ දරුවාගේ පවුලේ අය ඇතුළු අනෙකුත් පාසල් දරුවන්ට විශාල වශයෙන් බලපානවා. You must have heard of things like copycat suicide. ඒ කියන්නේ, අදාළ සිද්ධිය පිළිබඳ වාර්තාව නිකුත් කරනකොට අනෙකුත් සිසු සිසුවියන් ඒ සම්බන්ධයෙන් දැනුවත් වීම මත ඒ ආකාරයටම ක්‍රියා කිරීමේ ප්‍රවණතාව වැඩිවීම නිසාම විශේෂයෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානය, ඒ වාගේම UNICEF එක වැනි ආයතන මඟින් මේ සම්බන්ධව මාර්ගෝපදේශ - guidelines - නිකුත් කර තිබෙනවා. ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, ඔබතුමිය අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගැනීමෙන් පසුව මේ තොරතුරු සන්නිවේදනය සම්බන්ධයෙන් වූ guidelines වෙනස් කර තිබෙනවාද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි දැනට පවතින guidelines බැලුවා. පවතින guidelines අලුත් කිරීමක් අවශ්‍ය නැහැ. නමුත් අපි නැවත වතාවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ සම්බන්ධ වෙලා, සියලු මාධ්‍ය ආයතනත් එකතු කරලා මේවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුවත් කළා. ජනමාධ්‍ය අමාත්‍යාංශය එක්කත් අපි මේ පිළිබඳව දිගින් දිගටම කථා කරනවා. මෙවැනි තොරතුරු වාර්තා නොකර ඉන්න සහ වාර්තා කළත් දරුවන්ගේ පෞද්ගලිකත්වය රැකෙන විධියටත්, සිද්ධිය විස්තර නොකරන ලෙසත් ඒවා වාර්තා කරන්න කියලා ඒ guidelinesවල දැනටත් තිබෙනවා. ඒවා ක්‍රියාත්මක නොවන එක ප්‍රශ්නයක්. අපි ඒ පිළිබඳව දිගින් දිගටම මාධ්‍ය ආයතන සමඟ සාකච්ඡා කරනවා. අපට කරන්න පුළුවන් වන්නේ, ඔවුන් දැනුවත් කිරීම සහ ඉල්ලීම් කිරීමයි. අපි ජනමාධ්‍ය

අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබෙනවා, මේ කටයුත්ත තවදුරටත් නියාමනය කරලා ඒ අනුව ක්‍රියාත්මක වන ලෙස මාධ්‍ය ආයතන දැනුවත් කරන්න කියලා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

මාධ්‍ය ආයතන පමණක් නොවෙයි, එම පාසල් තුළිනුත් එය ක්‍රියාත්මක විය යුතුයි. මොකද, එම පාසල් තුළත් එම කාරණා communicate කිරීමේ ගැටලු තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් ඔබතුමිය යම් දැනුවත් කිරීමක් කරන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

එවැනි සිද්ධි තුළ නිරන්තරයෙන් ඇති වන ගැටලු පිළිබඳව අනිවාර්යයෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වෙනවා. මහාචාර්ය අස්විනී ප්‍රනාන්දු සහ මහාචාර්ය ගමීලා සමරසිංහ අපට ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවෙනුත් ඔවුන් protocol එකක් හඳුන්වා දී තිබෙනවා, එවැනි අවස්ථාවක පාසල ප්‍රතිචාර දැක්විය යුතු ක්‍රමය ගැන. ඒකත් අපි circular එකක් හැටියට, regulation එකක් හැටියට පාසල් පද්ධතියට නිකුත් කරලා තිබෙනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා අහනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, ஒரு குழந்தையின் அடிப்படைத் தேவைகளில் ஒன்றுதான் கல்வி. எமது நாட்டில் இருக்கின்ற 25 மாவட்டங்களில் கிளிநொச்சி மாவட்டமே கல்வியில் அதிகுறைந்த பெறுபேற்றை உடைய மாவட்டமாக இருக்கின்றது. வட மாகாணத்தைப் பொறுத்தவரைக்கும், யாழ்ப்பாணம் தவிர்ந்த ஏனைய நான்கு மாவட்டங்களுக்கும் ஆசிரியர்கள் யாழ்ப்பாணத்தில் இருந்துதான் வந்துபோகின்றார்கள். அண்மையில் உங்களுடைய ஆளுநரால் அவசியத் தேவை கருதிய இடமாற்றம் என்று சொல்லி, 190 ஆசிரியர்களுக்கு கிளிநொச்சியில் இடமாற்றம் வழங்கப்பட்டு இருந்தது. அதை இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு தற்சமயம் இடைநிறுத்தியிருக்கிறது. மேலும், கிளிநொச்சி பகுதியில் கடமையாற்றும் 360க்கும் மேற்பட்ட ஆசிரியர்களை யாழ்ப்பாணத்துக்கு transfer பண்ணி இருக்கிறார்கள். அந்த ஆசிரியர்கள் வந்திருக்கிறார்கள். இப்பொழுது குறைந்த பெறுபேற்றை உடைய கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா, மன்னார் போன்ற மாவட்டங்களில் மாணவர்களுக்கு ஆசிரியர்கள் இல்லாத நிலைமையை உங்களுடைய ஆளுநர் வேதநாயகன் அவர்கள் ஏற்படுத்தியிருக்கிறார். இவ்விடயம் தொடர்பான ஏதாவது தகவலை எங்களுக்குத் தெரிவிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි ස්ථාන මාරු කිරීම් එහෙම නිකම් හිතුමතේට සිදු කරන්නේ නැහැ. එය ක්‍රමවේදයක් අනුවයි සිද්ධ වෙන්නේ. අපි දන්නවා, ඇත්තවශයෙන්ම උතුරු පළාතේ ගුරු පුරප්පාඩු ගණනාවක් තිබෙන බව. විශේෂයෙන්ම කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව හා මුලතිව් දිස්ත්‍රික්කවල එය බරපතළ ප්‍රශ්නයක් විධියට පවතිනවා. ඒ වෙනුවෙන් යෝජනා ගණනාවක් තිබෙනවා වාගේම දැනට ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ අනුව මේ අවුරුද්දේ ගුරුවරුන් බඳවා ගැනීමට අපි සැලසුම් කරලා තිබෙනවා. මැයි මාසයේදී විභාගය පවත්වන්න අපි දින නියම කර තිබෙනවා. ඒ වාගේම විද්‍යාපීඨවලින් පිට වන ගුරුවරුනුත් මේ අවුරුද්දේ ස්ථානගත කරන්න අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම පුරප්පාඩු තිබෙන තැන්වලට ප්‍රමුඛතාව දෙන්න තමයි අපි සැලසුම් කරන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Human Rights Commission එකෙන් එය නවත්වලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

එහෙම නවත්වා තිබෙනවා නම් ඒක ක්‍රියාත්මක කළ හැකියි. ගරු කථානායකතුමනි, මෙතුමා කියන දේ හරි. සියලු ගුරුවරුන් කියන එක අසාධාරණයි. නමුත්, බොහෝ පිරිස් උත්සාහ කරන්නේ යාපනය දිස්ත්‍රික්කය තුළම ඉන්න. ස්ථානගත කරනකොට හෝ මාරු කිරීම් කරනකොට අකැමති තැනින් අයින් වෙන්න හෝ කැමති තැනට ආපහු යන්න උත්සාහ කරන එක යම්කිසි විධියකට සංස්කෘතියක් බවට පත් වෙලා තිබෙනවා. අපි දිගින් දිගටම කියන්නේ, ඒ විධියට කටයුතු කරන්න බැහැ කියලායි. ගුරු තුලනය සිදු වන විධියට තමයි අපි තීන්දු තීරණ ගන්නේ. එම තීන්දු තීරණ නැවත අභියෝගයට ලක් කරන්න එපා. ඒවා පිළිබඳව appeals දෙන්න එපා සහ ගුරු තුලනයට ප්‍රමුඛතාව දීලා ස්ථානගත කරන විධියට ඒවා භාර ගන්න කියන ඉල්ලීම කරන ලෙසත් අපි ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, යාපනය දිස්ත්‍රික්කය තුළත් ටිකක් දුර පැතිවලට, එහෙම නැත්නම් දූපත්වලට ගියාම නැවත වතාවක් ඔය ප්‍රශ්නයට අපි මුහුණ දෙනවා.

## "අස්වැසුම" වැඩසටහන: ප්‍රතිලාභීන්ගේ අභියාචනා සහ විරෝධතා

'அஸ்வெசும' நிகழ்ச்சித்திட்டம்: பயனாளிகளின் மேன்முறையீடுகள் மற்றும் ஆட்சேபனைகள்

"ASWESUMA" PROGRAMME: BENEFICIARIES' APPEALS AND OBJECTIONS

1679/2025

9. **ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "අස්වැසුම" වැඩසටහන සම්බන්ධයෙන් ලබා දී ඇති අභියාචනා සහ විරෝධතා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා අතරින් නිරාකරණය වෙමින් පවතින සහ නැවත ප්‍රතිලාභ ලබා දුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම නිරාකරණ ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

(ආ) (i) "අස්වැසුම" ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා විද්‍යාත්මක දත්ත පද්ධතියක් හඳුන්වා දීමට අපේක්ෂා කරන්නේද;

(ii) එමඟින් තහවුරු කර ගැනීමට අපේක්ෂා කරනු ලබන නව දත්ත කවරේද;

(iii) ව්‍යාජ තොරතුරු මත ප්‍රතිලාභ ලබා ගත් පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(iv) ඔවුන්ට ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට සහ ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, ආපසු අයකර ගත් මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ජීවන වියදම අනුව "අස්වැසුම" ප්‍රතිලාභ ගැළපීමට යෝජනා වී තිබේද;

(ii) ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන් ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(iii) ඒ සඳහා දේශීය හෝ විදේශීය අරමුදල් වෙන් කර තිබේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'அஸ்வெசும' நிகழ்ச்சித்திட்டம் தொடர்பாக முன்வைக்கப்பட்டுள்ள மேன்முறையீடுகள் மற்றும் ஆட்சேபனைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அவற்றுள் தீர்வு காணப்பட்டுவரும் மற்றும் மீள நலன்புரி நன்மைகள் வழங்கப்பட்ட எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி தீர்வு காணும் நடவடிக்கையை நிறைவு செய்ய எதிர்பார்க்கின்ற காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 'அஸ்வெசும' பயனாளிகளைத் தெரிவு செய்வதற்காக தர்க்க ரீதியிலான தரவு முறைமை ஒன்றை அறிமுகம் செய்ய எதிர்பார்க்கப்படுகின்றதா என்பதையும்;

(ii) அதனூடாக உறுதிப்படுத்திக்கொள்ள எதிர்பார்க்கின்ற புதிய தரவுகள் யாவை என்பதையும்;

(iii) போலியான தகவல்களை வழங்கி நலன்புரி நன்மைகளைப் பெற்றுக்கொண்ட நபர்கள் அடையாளம் காணப்பட்டுள்ளனரா என்பதையும்;

(iv) அவர்களுக்குச் செலுத்திய பணத்தை மீள அறவிட்டுக்கொள்வதற்கு மற்றும் அவர்களுக்கெதிராக சட்ட நடவடிக்கை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், மீள அறவிட்டுக்கொண்டுள்ள பணத் தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) வாழ்க்கைச் செலவின் அடிப்படையில் 'அஸ்வெசும' நலன்புரி நன்மைகளை ஒப்பீடு செய்வதற்கு முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(ii) பயனாளிகளின் குடும்பங்களை வலுவூட்டும் வேலைத்திட்டத்தை ஆரம்பிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அதற்காக உள்நாட்டு மற்றும் வெளிநாட்டு நிதியங்கள் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the number of appeals and objections that have been filed regarding the "Aswesuma" programme, separately;

(ii) out of them, the number of those that are being resolved and the number of those for which benefits have been re-granted, separately; and

(iii) the expected time frame for the completion of the settlement of them?

(b) Will he also inform this House -

(i) whether it is expected to introduce a scientific data system to select the "Aswesuma" beneficiaries;

(ii) the new data that is expected to be verified through it;

(iii) whether the persons who have obtained benefits based on false information have been identified;

(iv) whether steps have been taken to recover the money that has been paid to such persons and to take legal action against them; and

(v) if so, the amount of money that has been recovered?

(c) Will he further inform this House, whether -

(i) it has been proposed to adjust the "Aswesuma" benefits based on the cost of living;

(ii) steps have been taken to initiate programmes to empower the beneficiary families; and

(iii) local or foreign funds have been allocated for the said purpose?

(d) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අභියාචනා - 61,964

විරෝධතා - 6,295

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අභියාචනා කමිටු මඟින් විභාග කර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය සඳහා මේ වනවිට 57,770ක ප්‍රමාණයක් ලැබී ඇත.

(iii) 2026 මාර්තු 13වැනි දින සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ප්‍රතිලාභියා විසින් ගිණුම් විවෘත කළ වහාම ප්‍රතිලාභ ගෙවීමට කටයුතු සිදු කෙරේ.

(ආ) (i) දැනටමත් විද්‍යාත්මක පදනමක් මත තෝරා ගැනීමේ ක්‍රමවේදයක් හා ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ ඩිජිටල් පද්ධතියක් - IWMS - පවත්වා ගෙන යනු ලැබේ. ඉදිරියේදී තවදුරටත් එම පද්ධතිය හා තෝරා ගැනීමේ ක්‍රමවේද සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ii) අදාළ නොවේ.

(iii) ඔව්.

(iv) ඔව්. ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(v) නීතිමය ක්‍රියාමාර්ග මේ වනකොටත් අවසන් වෙලා නැහැ. ඒ නිසා නිශ්චිතව මේ ගැන සඳහන් කළ නොහැක.

(ඇ) (i) මේ වනවිට යෝජනා වී නැත. නමුත්, නව රජය පත් වුණාට පසුව අස්වැසුම ප්‍රතිලාභීන්ට පැහැදිලිවම එම දීමනා වැඩි කර දෙන්න අවශ්‍ය කටයුතු අපි සිදු කර තිබෙනවා.

(ii) ඔව්. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සවිබලගැන්වීම් ක්‍රියාත්මක කෙරේ.

(iii) ඔව්. 2026 වර්ෂය සඳහා දේශීය ප්‍රතිපාදන විධියට සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල රුපියල් මිලියන 346.36ක් වෙන් කරලා තිබෙනවා. අමාත්‍යාංශ අරමුදල විධියට රුපියල් මිලියන 3,700ක් වෙන් කරලා තිබෙනවා.

විදේශීය ප්‍රතිපාදන විධියට ලෝක බැංකුවෙන් රුපියල් මිලියන 1,106කුත්, ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 205කුත් වෙන් වෙලා තිබෙනවා.

(ඈ) පැන නොනඟී.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අස්වැසුම ව්‍යාපෘතිය බිම් මට්ටමේදී අපි මුහුණ දෙන ලොකු ගැටලුවක් බවට පත් වෙලා තිබුණා. දැනුත් ඒ තත්ත්වය ඒ විධියටම යම් ප්‍රමාණයකින් තිබෙනවා. එය ආණ්ඩුවක් හැටියට අපට පිරිමසා ගන්න බැරි තැනකට තල්ලු වෙලා තිබෙනවාය කියායි මට හිතෙන්නේ. ඒ නිසා මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරන්න කියලා. මේ මොහොතේදී අපට පාලනය කළ නොහැකි ආකාරයට ජාත්‍යන්තරය තුළ මතු වෙලා තිබෙන මේ යුද්මය තත්ත්වය නිසා සහන බලාපොරොත්තුවෙන් සිටින, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව වෙනුවෙන් ඔබ අමාත්‍යාංශය පැත්තෙන් ගත් පියවර පිළිබඳව පැහැදිලි කිරීමක් ඔබතුමාගෙන් මා බලාපොරොත්තු වෙනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. අස්වැසුම ප්‍රතිලාභීන් තෝරා ගන්නා අවස්ථාවේදී ඒ වෙනුවෙන් ලකුණු ලබා දෙනකොට බර තැබීමක් සිදු කරන්නේ නැහැ. ඒක නිසා පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් යෝජනා කරලා තිබෙනවා, ඒ ගැන අධ්‍යයනය කරලා, එය සංශෝධනය කරලා, නිසි පිරිස අස්වැසුම ප්‍රතිලාභ ලබන ලැයිස්තුවට ගන්න පුළුවන්ද කියලා සලකා බලා ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. අන්න ඒ නිර්දේශය අනුව මේ වනවිටත් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් විද්වත් මණ්ඩලයක් පත් කරලා තිබෙනවා. ඒ විද්වත් මණ්ඩලය විසින් ඒ අයගේ දළ නිර්දේශ මේ වනවිට ලබා දීලා තිබෙනවා. ඒ නිර්දේශ පදනම් කරගෙන මේ පද්ධතිය තවදුරටත් වෙනස් කරලා, සුදුසුකම් ලබන පිරිස් තවදුරටත් ඒ ප්‍රතිලාභ ලැයිස්තුවට ඇතුළත් වෙලා නැත්නම් ඒ පිරිස් නිවැරැදිව හඳුනා ගැනීමටත් අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

සමාජයේ තවත් චෝදනාවක් තිබෙනවා, අස්වැසුම ප්‍රතිලාභ නොලැබිය යුතු පිරිසකුත් ඒකට ඇතුළත් වෙලා ඉන්නවාය කියලා. ඒ සියලු නිවැරැදි කිරීම් සිදු කරලා අස්වැසුම ප්‍රතිලාභය ලබන්න සුදුසු නියම ප්‍රතිලාභීන් හඳුනාගෙන ඔවුන්ට එම ප්‍රතිලාභ ලබා දෙන්න ඉදිරියේදී කටයුතු කරන්න මේ වෙනකොට කටයුතු සිදු වෙමින් පවතිනවා.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඒ ජන කණ්ඩායම කියන්නේ, තාක්ෂණය පැත්තෙන් සහ අධ්‍යාපනය පැත්තෙන් ඉතාම පසුගාමී තැනක ඉන්න පිරිසක් බව අපි දන්නවා. එම නිසා නව රජයේ ඩිජිටල්කරණය සහ තාක්ෂණය භාවිත කිරීම තුළ ඒ අයට අවශ්‍ය තොරතුරු ලබා දෙන්න නොහැකි වීම නිසාත්, නිලධාරින් සමඟ එකී ගනුදෙනු හුවමාරු කර ගන්න බැරි තැන්වලදීත් ඒ අය යම් ප්‍රමාණයක අපහසුතාවලට ලක් වන අවස්ථා අපි දැක තිබෙනවා. අපට එවැනි විශාල පිරිසක් හමු වෙමින් තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවාද, ඒ සඳහා ඇති පිළියම් මොනවාද කියාත් මම දැනගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, අර විද්වත් කමිටුවේ නිර්දේශවලට අනුව පෙනෙනවා, මේවා හඳුනාගෙන තිබෙනවාය කියලා. එම නිර්දේශ ක්‍රියාත්මක කරමින් මේ පද්ධතිය තවදුරටත් සරල කරලා,

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ඒ කියන්නේ user-friendly තත්ත්වයට පත් කරලා ඒගොල්ලන්ට අවශ්‍ය කටයුතු පහසුවෙන් කර ගන්න හැකි වන පරිදි ඉදිරියේදී සකස් කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඊට අමතරව තාක්ෂණයත් එක්ක සම්බන්ධ නැති ඕනෑම කෙනෙකු අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම ඔවුන්ට මේ සඳහා සම්බන්ධ වෙන්න දත්ත ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා දැනුවත් කරන්න එහි සිටින නිලධාරින් මැදිහත් වෙනවා වාගේම ඒ සඳහා එම නිලධාරින් සියලුදෙනාට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ ආකාරයෙන් තමයි තාක්ෂණය සම්බන්ධ ගැටලු තිබෙන අයට උදවු කරන්න රජය විධියට මේ අවස්ථාවේදී මැදිහත් වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## 2020 සිට කාන්තාවන්ට අදාළ සයිබර් අපරාධ පැමිණිලි: විස්තර

2020 முதல் பெண்கள் தொடர்பான சைபர் குற்ற முறைப்பாடுகள்: விபரம்

CYBERCRIME COMPLAINTS RELATING TO WOMEN SINCE 2020: DETAILS

1014/2025

4. **ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Rajeevan Jeyachandramoorthy)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා සහ උතුරු පළාත තුළ කාන්තාවන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වාර්තා වූ මුළු සයිබර් අපරාධ පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රජයේ නිල සයිබර් අපරාධ වාර්තා කිරීමේ ද්වාර - portals - හෝ පොලිස් සයිබර් ඒකක හරහා ලැබුණු එවැනි පැමිණිලි සංඛ්‍යාව උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ග්‍රාමීය ප්‍රදේශවල, විශේෂයෙන්ම උතුරු පළාතේ කාන්තාවන් උදෙසා අපරාධ වාර්තා කිරීමේ යන්ත්‍රණවලට සහ වින්දිත සහාය සේවාවලට ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு முதல் இன்று வரையான காலப்பகுதியில் ஒவ்வோர் ஆண்டிலும், நாடு முழுவதிலும் மற்றும் வட மாகாணத்தினுள்ளும் வெவ்வேறாகப் பதியப்பட்ட பெண்களுக்கு எதிரான குற்றங்களுடன் தொடர்புடைய சைபர் குற்ற முறைப்பாடுகளின் மொத்த எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) உத்தியோகபூர்வ அரசாங்க சைபர் குற்றப் பதிவு இணையத்தளங்களூடாக - portals - அல்லது பொலிஸ் சைபர் அலகுகளினூடாக வட மாகாணத்திலிருந்து பெறப்பட்ட அத்தகைய முறைப்பாடுகளின் எண்ணிக்கை மாவட்ட ரீதியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) குறிப்பாக, வட மாகாண கிராமியப் பெண்களுக்கான சைபர் குற்றப் பதிவுப் பொறிமுறைகளையும் பாதிக்கப்பட்டோருக்கான உதவிச் சேவைகளுக்கான அணுகல் பொறிமுறையையும் மேம்படுத்துவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House the -

(i) total number of cybercrime complaints relating to offences against women reported in each year from 2020 to date, separately, on Island-wide basis and within the Northern Province;

(ii) number of such complaints received through official Government cybercrime reporting portals or police cyber units, separately in each district within the Northern Province; and

(iii) measures taken to enhance access to cybercrime reporting mechanisms and victim support services for women in rural areas, particularly in the Northern Province?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2021.03.24වන දින පරිගණක අපරාධ විමර්ශන අංශය ආරම්භ කර ඇති අතර, ඒ අනුව සයිබර් අපරාධ පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

| අනු අංකය | වර්ෂය | දිවයින පුරා වාර්තා වී ඇති සයිබර් අපරාධ පැමිණිලි සංඛ්‍යාව | උතුරු පළාත තුළ වාර්තා වී ඇති සයිබර් අපරාධ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 2021 | 3,187 | - |
| 2 | 2022 | 2,019 | 7 |
| 3 | 2023 | 3,292 | 13 |
| 4 | 2024 | 2,453 | 23 |
| 5 | 2025 | 1,302 | 12 |
| 6 | 2026.03.10 දිනට | 740 | 7 |
| එකතුව | | 12,993 | 62 |

(ii)

| අනු අංකය | වර්ෂය | පොලිස් කොට්ඨාසය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | යාපනය | කන්කසන්තුරෙයි | කිලිනොච්චිය | වවුනියාව | මන්නාරම | මුලතිව් | |
| 1 | 2021 | - | - | - | - | - | - | - |
| 2 | 2022 | - | - | - | 7 | - | - | 7 |
| 3 | 2023 | 2 | - | 1 | 10 | - | - | 13 |
| 4 | 2024 | 2 | - | - | 21 | - | - | 23 |
| 5 | 2025 | - | - | 5 | 7 | - | - | 12 |
| 6 | 2026 | - | - | - | 7 | - | - | 7 |
| එකතුව | | 4 | - | 6 | 52 | - | - | 62 |

(iii) 1. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව පරිගණක අපරාධ විමර්ශන උප ඒකක බස්නාහිර, මධ්‍යම, දකුණ, නැගෙනහිර, වයඹ, උතුරු මැද සහ උතුරු පළාත් ආවරණය වන පරිදි ස්ථාපිත කර ඇති අතර, සබරගමුව සහ ඌව පළාත වෙත වාර්තා වන පැමිණිලි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන ඒකකය මඟින් ආවරණය කරනු ලබයි.

2. කාන්තාවන්ට හා ළමුන්ට එරෙහිව සමාජ මාධ්‍ය හා පරිගණක ආශ්‍රිතව සිදු වන අපරාධ වළක්වාලීම සඳහා පොලිස් ස්ථාන සහ ළමා හා කාන්තා කාර්යාංශය එක්ව පාසල් ගුරුවරුන් සහ සිසුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. සයිබර් අපරාධවලට ගොදුරු වී මානසික පීඩාවන්ට ලක් වූවන් හඳුනාගෙන ඔවුන් වෛද්‍ය උපදේශන සඳහා යොමු කිරීම.

4. වර්තමානය වනවිට ශ්‍රී ලංකා පොලීසියේ කාන්තා නිලධාරිනියන් විශේෂ රාජකාරි පදනම මත උතුරු සහ නැගෙනහිර පළාත් වෙත අනුයුක්ත කර ඇති අතර, එමඟින් එම ප්‍රදේශවලින් වාර්තා වන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීමට පියවර ගෙන ඇත.

5. ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශ මූලස්ථානයට අනුයුක්ත දෙමළ භාෂාව කථා කළ හැකි නිලධාරින් සහ උතුරු පළාතේ රාජකාරි කරනු ලබන දෙමළ භාෂා නිපුණතාව සහිත නිලධාරින් සම්බන්ධ කර ගනිමින් එම පළාතේ දරුවන් සහ කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

6. ළමුන්ට හා කාන්තාවන්ට එරෙහිව සිදු වන සියලුම ආකාරයේ අපරාධ, අකටයුතුකම්, කෲරත්වයන්, ළමා අපචාර වැනි සිද්ධීන් පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා 011-2444444 දරන දුරකථන අංකය හඳුන්වා දී ඇත. ඉන්පසු 2024 වර්ෂයේ සිට ඉහත දුරකථන අංකයට අමතරව ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශය තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක වන ක්ෂණික දුරකථන ඇමතුම් මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කර 109 දරන ක්ෂණික දුරකථන අංකය හඳුන්වා දී ඇති අතර, එහිදී ස්ථාවර දුරකථන 05ක් මඟින් සේවය ලබා දෙමින් මෙහෙයුම් මැදිරියේ රාජකාරි සඳහා කාන්තා පොලිස් නිලධාරිනියන් පමණක් අනුයුක්ත කර ඇත. මීට අමතරව, 071-8595823 ජංගම දුරකථන අංකය මඟින් දුරකථන ඇමතුම් සහ වට්ස්ඇප් - WhatsApp - යෙදුම හරහා තොරතුරු ලබා දීම සඳහා අවස්ථාව සලසා ඇත. විද්‍යුත් ලිපිනයන් මඟින් තොරතුරු ලබා දීම සඳහා cwb.online@police.gov.lk සහ cwb.online109@police.gov.lk යන ලිපිනයන් හඳුන්වා දී ඇත. මෙම මෙහෙයුම් මැදිරිය වෙත වාර්තා වන සියලුම තොරතුරු සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා අදාළ පොලිස් ස්ථාන වෙත එසැණින් තොරතුරු ලබා දීම සිදු කරන අතර, පැය 48ක් ඇතුළත එහි ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.

7. ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කොට්ඨාසයේ, අතුරුදහන් වූ සහ සූරාකෑමට ලක් වූ ළමුන් සඳහා වූ ජාතික මධ්‍යස්ථාන (National Centre for Missing and Exploited Children - NCMEC) විමර්ශන අංශය මඟින්ද මෙම සයිබර් අපරාධ පැමිණිලි ලබාගෙන විමර්ශනය සිදු කරයි.

8. අනාරක්ෂිත ළමුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය මැදිහත්ව සිදු කරන වැඩසටහන්වලට අදාළව නැගෙනහිර පළාත තුළ පිහිටුවා ඇති "සරෝජා ව්‍යාපෘතිය" වැනි ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යෑම.

9. ප්‍රජා පොලිස් අංශ නිලධාරින් විසින් මාසිකව මහජන ආරක්ෂක කමිටු පැවැත්වීමේදී සයිබර් අපරාධ පිළිබඳව කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම.

10. සයිබර් අපරාධ හේතුවෙන් පීඩාවට පත් කාන්තාවන් වෙනුවෙන් ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරිනියන් සහ කොට්ඨාස මට්ටමින් ස්ථාපිත ඒකකවල නිලධාරිනියන් මැදිහත් වී අවශ්‍ය මනෝ උපදේශන සේවා සැපයීමට කටයුතු කිරීම.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### බොර තෙල් සහ පිරිපහදු කළ තෙල් ආනයනය
### கச்சா மற்றும் சுத்திகரிக்கப்பட்ட எண்ணெய் இறக்குமதி
### CRUDE AND REFINED OIL IMPORTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, වත්මන් ගෝලීය යුද්ධමය තත්ත්වය හේතුවෙන් මෙරට ඉන්ධන ආරක්ෂාව - fuel security - තහවුරු කිරීම, ප්‍රමාණවත් සංචිත පවත්වා ගැනීම සහ අනාගතයේ ඇති විය හැකි අර්බුදයකදී ඉන්ධන කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයේ වර්තමාන ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා බලශක්ති අමාත්‍යවරයාගෙන් පහත සඳහන් කරුණු පිළිබඳව විස්තරාත්මක පිළිතුරු අපේක්ෂා කරමි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

01. මෙරටට ඉන්ධන ආනයනය කර ගොඩබෑමේ අවස්ථාව දක්වාත්, පිරවුම්හල් වෙත ප්‍රවාහනය කිරීම දක්වාත් දැරීමට සිදු වන පිරිවැය එක් එක් ඉන්ධන වර්ග යටතේ කොපමණද? එම පිරිවැය පිළිබඳ තොරතුරු ඇතුළත් සවිස්තර වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ මේ හේතුව නිසායි. රජය විපක්ෂයේ ඉන්නකොට පොරොන්දු වුණා, වරායේ ගොඩබාන මිලටම රටේ ජනතාවට ඉන්ධන ලබා දෙනවා කියලා. නමුත් ඒක කෙරෙන්නේ නැහැ. අද හොඳම අවස්ථාව එළඹීලා තිබෙනවා, ඒක ක්‍රියාත්මක කරන්න. ඉතින් අපට දැනගන්න අවශ්‍යයි, එදා ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් පොරොන්දු වුණු ආකාරයට රටේ පාරිභෝගිකයන්ට ගොඩබාන මිලටම ඉන්ධන ටික ලබා නොදෙන්නේ ඇයි කියලා.

02. ඉන්ධන මත අය කෙරෙන බදු වර්ග හා ප්‍රමාණයන් එක් එක් ඉන්ධන වර්ග අනුව කොපමණද? වත්මන් ආණ්ඩුව යටතේ ඉන්ධන මිල ගණන් තීරණය කිරීමේදී යොදා ගැනෙන ඉන්ධන මිල සූත්‍රය කුමක්ද?

එදා ඡන්ද කාලයේ කිව්වා, පවතින සූත්‍ර අපි පිළිගන්නේ නැහැ, ජනතාවාදී ජනහිතකාමී සූත්‍රයක් ඉදිරිපත් කරනවාය කියලා. අපි දැනගන්න කැමතියි, අද රජය ක්‍රියාත්මක කරන ජනතාවාදී ජනහිතකාමී සූත්‍රය මොකක්ද කියලා.

ඉන්ධන මිල සූත්‍රය අනුව මිල ගණන් ගණනය වන ආකාරය පිළිබඳ සවිස්තර වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

03. මෙරට සමස්ත පරිභෝජනය සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත ඉන්ධන - බොර තෙල්, ඩීසල්, පෙට්‍රල්, භූමි තෙල්, දැවි තෙල් හා ගුවන් යානා ඉන්ධන - ප්‍රමාණයන් මාසිකව හා වාර්ෂික වශයෙන් කවරේද? පසුගිය මාස තුන තුළ මාසිකව බෙදා හැරීම සිදු කළ ඉහත ඉන්ධන වර්ගයන් මෙට්‍රික් ටොන් වශයෙන් කොපමණද? එම කාලය තුළ ඉන්ධන වර්ග අනුව වාර්තාගත පරිභෝජන ප්‍රමාණයන් කවරේද?

04. 2026 ජනවාරි සිට මාර්තු දක්වා මෙරටට ආනයනය කරන ලද සමස්ත ඉන්ධන ප්‍රමාණය බොර තෙල්, ඩීසල්, පෙට්‍රල්, භූමි තෙල්, දැවි තෙල් හා ගුවන් යානා ඉන්ධන ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද? ආනයනික ඉන්ධන නැව් වශයෙන් - shipment-wise - කොපමණ ප්‍රමාණයක්ද? එම නැව් මෙරටට පැමිණි දිනයන් කවරේද? එම ඉන්ධන මුතුරාජවෙල සහ කොලොන්නාව ගබඩා සංකීර්ණ වෙත ගොඩබාන ලද ප්‍රමාණයන් වෙන් වෙන්ව දක්වන්නේද?

05. මෙරට භාවිත වන ඉන්ධන වර්ග - පෙට්‍රල්, ඩීසල්, භූමි තෙල්, දැවි තෙල්, ගුවන් යානා ඉන්ධන - අතරින් පිරිපහදු කර සෘජුවම ආනයනය කරනු ලබන ඉන්ධන වර්ග කවරේද?

බොරතෙල් වශයෙන් ආනයනය කර මෙරට තුළ පිරිපහදු කර ලබා දෙන ඉන්ධන වර්ග කවරේද? ඉහත එක් එක් කාණ්ඩය යටතේ සිදු කරන සමස්ත පිරිපහදු ඉන්ධන ආනයන - refined imports - සහ දේශීය පිරිපහදුව මඟින් සපයන ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?

06. මෙරට ඉන්ධන පිරිපහදු කිරීමේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන්, සපුගස්කන්ද පිරිපහදුවේ වත්මන් ධාරිතාව - capacity එක - හා භාවිත වන සැබෑ ප්‍රමාණය - utilization - කොපමණද? එම පිරිපහදුව සම්පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මක නොවන්නේ නම්, ඒ සඳහා හේතු කවරේද?

07. රජය විසින් මේ වන විට ඇණවුම් කර ඇති සමස්ත ඉන්ධන ප්‍රමාණය කොපමණද? එම ඇණවුම් සැපයීමට භාරගෙන ඇති සමාගම් ගණන හා සමාගම් කවරේද? එම ඇණවුම් කර ඇති ඉන්ධන නැව් සඳහා එකඟ වී ඇති වාරික - premium - ප්‍රමාණය කවරේද? මේ වන විටත් ගොඩබාන ලද ඉන්ධන නැව් සඳහා ගෙවූ වාරික ප්‍රමාණය කවරේද?

ගරු කථානායකතුමනි, පෘතුගාලය, ස්පාඤ්ඤය, තුර්කිය, ඉන්දුනීසියාව, මලයාසියාව, ඉන්දියාව, ඉතාලිය, ජර්මනිය, එක්සත් රාජධානිය යන ඔක්කෝම රටවල් මේ මිළ ඉහළ යාමේ අර්බුදය තුළ ඇත්ත වශයෙන්ම මිල අඩු කරන්න කටයුතු කරලා තිබෙනවා. රජය කියනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරී යන්න සල්ලි තිබෙනවාය කියලා. ඇත්ත වශයෙන්ම තිබෙනවා. රුපියල් ට්‍රිලියන 1.4ක් තිබෙනවා. ඇයි, ඒ මුදල උපයෝගී කරගෙන මේ රටේ පාරිභෝගික ජනතාවට, සමස්ත ජනතාවට සහන සලසන්නේ නැත්තේ? මම කියන්නේ නැහැ සුපිරි ධනවතුන්ට, සුපිරි පොහොසතුන්ට සහන ලබා දෙන්න කියලා. නමුත් මැද පන්තිය ඇතුළු සාමාන්‍ය ජනතාව, දුප්පත් ජනතාව, උග්‍ර දුප්පත් ජනතාව කියන මේ ජන කොට්ඨාසවලට සහන සැලසීම සඳහා මිල අඩු කිරීමකට මේ රජය මුල පුරන්නේ නැත්තේ ඇයි කියන එක මම අහන්න කැමැතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. මාර්තු 21 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද ඉන්ධන මිල සඳහා වැය වූ පිරිවැය පහත පරිදි වේ.

| ඉන්ධන වර්ගය | ගොඩබෑමේ පිරිවැය (ලීටරයකට රුපියල්) | මෙහෙයුම් පිරිවැය (ලීටරයකට රුපියල්) |
|---|---|---|
| පෙට්‍රල් 92 | 272.65 | 21.78 |
| පෙට්‍රල් 95 | 321.96 | 23.68 |
| ලංකා සුදු ඩීසල් | 425.70 | 22.48 |
| ලංකා සුපිරි ඩීසල් | 198.74 | 18.35 |
| ලංකා භූමිතෙල් | 372.13 | 22.90 |

02. i.

| ඉන්ධන වර්ගය | රේගු බදු (ලීටරයකට රුපියල්) | නිෂ්පාදන බදු (ලීටරයකට රුපියල්) | එකතු කළ අගය මත බදු (ලීටරයකට රුපියල්) |
|---|---|---|---|
| පෙට්‍රල් 92 | | 72.00 | 64.29 |
| පෙට්‍රල් 95 | 21.00 | 72.00 | 77.21 |
| ලංකා සුදු ඩීසල් | | 50.00 | 88.39 |
| ලංකා සුපිරි ඩීසල් | 15.00 | 57.00 | 50.75 |
| ලංකා භූමිතෙල් | බදු අය නොකෙරේ. | | |

ii. ඉහත ප්‍රශ්න අංක 01 සහ 02හි අඩංගු පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

03.

| ඉන්ධන වර්ගය | ඇස්තමේන්තුගත (CPC) | | මාස තුන (03) බෙදා හැරීම (MT) | පරිභෝජන (MT) |
|---|---|---|---|---|
| | මාසික ප්‍රමාණයන් (MT) | වාර්ෂික ප්‍රමාණයන් (MT) | | |
| බොරතෙල් | 154,583 | 1,855,000 | - | - |
| ලංකා ඔටෝ ඩීසල් | 93,766 | 1,125,186 | 314,293 | 314,293 |
| ලංකා සුපර් ඩීසල් | 2,411 | 28,926 | 9,264 | 9,264 |
| පෙට්‍රල් 92 | 72,084 | 865,004 | 351,832 | 351,832 |
| පෙට්‍රල් 95 | 2,160 | 25,921 | 10,195 | 10,195 |
| දැව්තෙල් | 44,638 | 535,651 | 217,876 | 217,876 |
| ගුවන් යානා ඉන්ධන/ භූමිතෙල් | 53,794 | 645,529 | 134,842 | 134,842 |

04. ඇමුණුම A හි දැක්වේ.

| යොමු අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණයන් (MT) | පැමිණි දිනය | මුතුරාජවෙල (MT) | කොලොන්නාව (MT) | JCT (MT) | ඔරුගොඩ වත්ත (MT) |
|---|---|---|---|---|---|---|---|
| CR/02/2026 | බොරතෙල් | 95,437 | 14/01/2026 | - | - | - | 95,437 |
| CR/03/2026 | බොරතෙල් | 95,181 | 31/01/2026 | - | - | - | 95,181 |
| CR/04/2026 | බොරතෙල් | 93,181 | 19/02/2026 | - | - | - | 93,181 |
| CR/06/2026 | බොරතෙල් | 86,226 | 11/03/2026 | - | - | - | 86,226 |
| BK/05/2026 | ලංකා ඔටෝ ඩීසල් | 36,555 | 18/01/2026 | 31,578 | 1,727 | 3,250 | - |
| BK/06/2026 | ලංකා ඔටෝ ඩීසල් | 29,711 | 24/02/2026 | 6,518 | 16,443 | 6750 | - |
| BK/11/2026 | ලංකා ඔටෝ ඩීසල් | 35,521 | 25/03/2026 | 35,521 | - | - | - |
| BK/06/2026 | ලංකා සුපර් ඩීසල් | 6,705 | 24/02/2026 | - | 6,705 | - | - |
| BK/02/2026 | පෙට්‍රල් 92 | 37,295 | 09/01/2026 | 32,163 | 5,132 | - | - |
| BK/04/2026 | පෙට්‍රල් 92 | 28,651 | 05/02/2026 | 25,445 | 3,206 | - | - |
| BK/07/2026 | පෙට්‍රල් 92 | 36,277 | 22/02/2026 | 25,349 | 10,928 | - | - |
| BK/09/2026 | පෙට්‍රල් 92 | 36,759 | 07/03/2026 | 23,835 | 12,924 | - | - |
| BK/10/2026 | පෙට්‍රල් 92 | 30,541 | 27/03/2026 | 22,050 | 8,490 | - | - |
| BK/04/2026 | පෙට්‍රල් 95 | 4,826 | 05/02/2026 | - | 4,826 | - | - |
| BK/10/2026 | පෙට්‍රල් 95 | 5,241 | 27/03/2026 | - | 5,241 | - | - |
| BK/03/2026 | ගුවන්යානා ඉන්ධන | 37,201 | 30/01/2026 | - | 37,201 | - | - |
| BK/08/2026 | ගුවන්යානා ඉන්ධන | 37,052 | 05/03/2026 | - | 37,052 | - | - |

05.

- ලංකා ඔටෝ ඩීසල්
- ලංකා සුපර් ඩීසල්
- පෙට්‍රල් 92
- පෙට්‍රල් 95
- දැව්තෙල්
- ගුවන් යානා ඉන්ධන (jet A-1)

සපුගස්කන්ද පිරිපහදුව මඟින් මර්බන් බොරතෙල් භාවිත කරමින් සාමාන්‍ය ක්‍රියාත්මක ධාරිතාව වන දිනකට මෙට්‍රික් ටොන් 5,300 නිපදවන නිෂ්පාදන පහත පරිදි වේ.

| නිෂ්පාදනය | ප්‍රමාණය (දිනකට MT) |
|---|---|
| LPG | 70 |
| පෙට්‍රල් 92 | 540 |
| කෙමිකල් නැප්තා | 420 |
| JET A-1/කෙරෝසින් | 1,050 |
| ඔටෝ ඩීසල් | 1,600 |
| දැව්තෙල් | 1,400 |

2026 මාර්තු මාසය දක්වා

| ඉන්ධන වර්ගය | පිරිපහදු (MT) | ආනයන (MT) |
|---|---|---|
| ලංකා ඔටෝ ඩීසල් | 141,855 | 66,265 |
| ලංකා සුපර් ඩීසල් | - | 6,705 |
| පෙට්‍රල් 92 | 46,931 | 169,522 |
| පෙට්‍රල් 95 | - | 10,067 |
| දැව්තෙල් | 110,290 | - |
| භූමිතෙල් | 9,563 | - |
| ගුවන් යානා ඉන්ධන | 77,582 | 74,253 |

06. පිරිපහදුවේ සැලසුම් ධාරිතාව - දිනකට මෙට්‍රික් ටොන් 6,700

(ඉරාන ලයිට් - Iranian Light - බොරතෙල්)

වර්තමාන භාවිතය - දිනකට මෙට්‍රික් ටොන් 5,300

(මර්බන් - Murban - බොරතෙල්)

ඉරාන ලයිට් බොරතෙල් සම්බාධක හේතුවෙන් ලබා ගැනීමට නොහැකි වීමත්, ප්‍රධාන පාරිභෝගිකයා වන බටහිර වෙරළ විදුලි බලාගාරය -West Coast Power Plant - සඳහා භාවිත කරන දැව්තෙල් සල්ෆර් ප්‍රමාණය සියයට 2දක්වා අඩු කිරීමට සිදුවීමත්, අධික සල්ෆර් දැව්තෙල් - HSFO - භාවිත කළ බලාගාර බොහොමයක් වසා දැමීමත් හේතුවෙන් ඉරාන ලයිට් බොරතෙල් වෙනුවට මර්බන් බොරතෙල් භාවිතයට මාරුවීම සිදු වී ඇත.

07. ඇමුණුම B හි දැක්වේ.

| යොමු අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණයන් (MT) | සමාගම් | වාරික |
|---|---|---|---|---|
| CR/08/2026 | බොරතෙල් | 90,000 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 2.36 /BBL |
| CR/09/2026 | බොරතෙල් | 90,000 | Vitol Asia Pte. Ltd., Singapore | USD 2.54 /BBL |
| BK/14/2026 | ලංකා ඔටෝ ඩීසල් | 37,300 | Trafigura Pte. Ltd., Singapore | USD 4.080 /BBL |
| BK/15/2026 | ලංකා ඔටෝ ඩීසල් | 37,300 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 45.642 /BBL |
| BK/18/2026 | ලංකා ඔටෝ ඩීසල් | 32,500 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 50.691 /BBL |
| BK/21/2026 | ලංකා ඔටෝ ඩීසල් | 32,000 | Trafigura Pte. Ltd., Singapore | USD 48.000 /BBL |
| BK/18/2026 | ලංකා සුපර් ඩීසල් | 5,000 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 57.720/BBL |
| BK/17/2026 | පෙට්‍රල් 92 | 30,300 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 23.790/BBL |
| BK/20/2026 | පෙට්‍රල් 92 | 35,300 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 18.642 /BBL |
| BK/17/2026 | පෙට්‍රල් 95 | 5,000 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 20.810 /BBL |
| BK/16/2026 | දැව්තෙල් | 30,000 | Aditya Birla Global Trading (Singapore) Pte Ltd | USD 166.000 MT |
| BK/19/2026 | ගුවන්යානා ඉන්ධන | 35,000 | Vitol Asia Pte. Ltd., Singapore | USD 62.630 /BBL |
| BK/21/2026 | ගුවන්යානා ඉන්ධන | 8,000 | Trafigura Pte. Ltd., Singapore | USD 48.000 /BBL |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔක්ටේන් 92 පෙට්‍රල් මිල සියයට 25කින් වැඩි කළා. ඔක්ටේන් 95 පෙට්‍රල් මිල සියයට 24කින් වැඩි කළා. සුදු ඩීසල් මිල සියයට 26කින් වැඩි කළා. සුපර් ඩීසල් මිල සියයට 25කින් වැඩි කළා. භූමිතෙල් මිල සියයට 30කින් වැඩි කර තිබෙනවා.

ඊට අමතරව, අපි energy carriers හැටියට හිතලා බැලුවොත්, ලිට්රෝ ගෑස් මිලත් විශාල ප්‍රමාණයකින් වැඩි කර තිබෙනවා; ඒ වාගේම, ලාෆ් ගෑස් මිලත් විශාල ප්‍රමාණයකින් වැඩි කර තිබෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ලිට්රෝ ගෑස් මිල දළ වශයෙන් සියයට 19කිනුත්, ලාෆ් ගෑස් මිල දළ වශයෙන් සියයට 22ත්, 23ත් අතර ප්‍රමාණයකිනුත් වැඩි කර තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තුළ මම නැවත වරක් රජය නියෝජනය කරන අමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ඉන්දියාව, ඉතාලිය, ජර්මනිය, එක්සත් රාජධානිය, මැලේසියාව, ඉන්දුනීසියාව, තුර්කිය, ස්පාඤ්ඤය, පෘතුගාලය ඇතුළු තවත් රටවල් බොහොමයක් මේ මිල වැඩිවීම තුළ පාරිභෝගික ප්‍රජාවට මේ මොහොතේ යම් සහනයක් ලබා දෙනවා. නමුත්, ඔබතුමන්ලා මේ මොහොත වනකල් කිසිදු සහනයක් ලබා දීලා නැහැ. මම දන්නේ නැහැ, මේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ සහන දෙන්න පටන් ගනීවිද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
බය වෙලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, බය වෙලා නැහැ, සභානායකතුමා. ඇත්තටම මෙසේ සහන ලබා දෙන්න කියන කථාව මම අද කියපු එකක් නොවෙයි. අපි මේක සති ගණනාවක් පුරාවටම කියනවා. [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා ඒ ගැන කිව්වා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි. ගරු සභානායකතුමා කියනවා, මම මේ ගැන නිතරම කථා කළා කියන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ පැහැදිලි කර ගැනීම ගැන කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විශේෂයෙන්ම අපේ වගකීම තමයි, ලක්ෂ 220ක් පමණ වන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කිරීම. ගරු කථානායකතුමනි, කෘෂි කර්මාන්තය, ධීවර ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්, ස්වයංරැකියාලාභීන්, කුලී සේවාවේ නියැළී සිටින අය, භාණ්ඩ හා සේවා ආදි හැම අංශයක්ම අද බිඳ වැටිලා තිබෙනවා; කඩා වැටිලා තිබෙනවා. මට පෙනෙන විදියට විශේෂයෙන්ම රටවල් බොහොමයක් අතරින් අද වනකල් කිසිදු සහනයක් ලබා දීලා නැත්තේ මේ රටේ ජනතාවට පමණයි. ඒ නිසා මම ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ජනාධිපතිවරණයේදී පොරොන්දු වුණු පරිදි ගොඩබාන මිලටම ඉන්ධන ලබා දෙනවා කියපු ආකාරයටම පාරිභෝගිකයාගේ මිල ලබා දෙන්නේ කවදාද කියලා. ඒ කාලයේ කිව්වේ මොනවාද? ඇමතිවරයාට කොමිස් මුදලක් යනවා කිව්වා; නිලධාරීන්ට කොමිස් මුදලක් යනවා කිව්වා; භාණ්ඩාගාරයට වෙනම රුපියල් 50ක් දෙන බව කිව්වා; ඒ බදු ඔක්කෝම ඉවත් කරනවා කිව්වා. මේකට SSCL ගහනවා, Customs Duty ගහනවා; ගහන්න පුළුවන් හැම duty එකක්ම ගහනවා. අපි පොරොන්දු වුණේ නැහැ, ගොඩබාන මිලට ඉන්ධන ලබා දෙනවා කියලා. මේ රජය ඒක කියලා තමයි බලයට පත් වුණේ. ගොඩබාන මිලට තෙල් ටික ලබා දෙන්නේ කවදාද? ඇත්ත වශයෙන්ම ජනාධිපතිතුමාත් එහෙම පොරොන්දු වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසන් කරන්න? අවසන් කරන්න බැහැ, එහෙම ලේසියෙන්. ලක්ෂ 220ක් පමණ වන ජනතාව වෙනුවෙන් තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ. කවදාද ගොඩබාන මිලට,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ පැහැදිලි කර ගැනීමට විනාඩි 3ක් ගත වුණා. මේක විවාදයක් වෙන්න බැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ කථා කරන්නේ AI සජිත් ප්‍රේමදාස ද, නැත්නම් ඇත්ත සජිත් ප්‍රේමදාස ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, දැන් ඔය කාරණය අවසන් කරන්න. දැන් ඔබතුමා විනාඩි 3ක් ගත්තා කරුණු පැහැදිලි කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කවදාවත් හිතුවේ නැහැ සභානායකතුමාට පෙනීමේ දුර්වලකමක් තිබෙනවා කියලා. අග්‍රාමාත්‍යතුමියත් ළඟ ඉන්න නිසා මම යෝජනාවක් කරන්න කැමැතියි, කරුණාකරලා AI subject එකක් හැටියට අපේ රටේ විෂය නිර්දේශයට ඇතුළත් කරලා මේ රටේ දූ දරුවන්ට ඒ අධ්‍යාපනයත් ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

මම දැන් මගේ ප්‍රශ්නයට එන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි 4ක් ගත්තා, පැහැදිලි කර ගැනීම ගැන කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම දැන් මගේ ප්‍රශ්නයට, මගේ පැහැදිලි කර ගැනීමට එන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමා අපට එක දවසක් submarines ගැන lecture එකක් දුන්නා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා AI ගැන වෙනම lecture එකක් දෙන්න. ඔබතුමාට ඔච්චර කාලය ගන්න අවස්ථාවක් නැහැ, විපක්ෂ නායකතුමා. දැන් අවසන් කරන්න. තව වැඩ ගොඩක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ කරුණු පැහැදිලි කර ගැනීමට කාලය විනාඩි 4ක් ගත්තා. ඉක්මනින් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සභානායකතුමාට ලැබෙන වරප්‍රසාදයම මටත් ලැබෙන්න ඕනෑ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි 4ක් වෙනම අරන් තිබෙනවා කියන කාරණයයි මම මේ කියන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. ගරු කථානායකතුමනි, submarines ගැන ඇහුවේ අපේ රටේ මුහුදු තීරය ආරක්ෂා කර ගන්නට මේ ආණ්ඩුවට බැරි නිසායි. ඒකයි ඒ ගැන ඇහුවේ.

පැහැදිලි කර ගැනීමක් හැටියට මම ගරු ඇමතිතුමාගෙන් මෙන්න මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් කිව්වා, මේ රටේ පාරිභෝගික ජනතාවට ගොඩබාන මිලටම ඉන්ධන ලබා දෙනවා කියලා. ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නේ කවදාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා ඔය ප්‍රශ්නය අහන්න විනාඩි 4ක් ගත්තා.

ගරු බලශක්ති අමාත්‍යතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා පැහැදිලි කිරීමක් නේ බලාපොරොත්තු වන්නේ. ඇත්තටම එතුමාට කෝමා තත්ත්වයක් ඇති වෙලා වාගේ පැහැදිලි කර ගැනීම් ගැන ඇහුවාට, අපි මේ සම්බන්ධයෙන් රටේ ජනතාවට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ කියලා මම හිතනවා. මොකද, මාර්තු මාසයේ ඩීසල්, පෙට්‍රල් මිල සංශෝධනයේදී මේ යුද්ධය නිසා ලෝක වෙළෙඳ පොළේ ඇති වෙච්ච තත්ත්වය මත, විශේෂයෙන්ම ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 100ක දරා ගැනීමක් ආණ්ඩුව පැත්තෙන් අපි කරලා තිබෙනවා. ඒවා තමයි අපි සහන හැටියට දීලා තිබෙන්නේ.

ඒවා දන්නේ නැහැ වාගේ නින්දෙන් ඇහැඇරිලා වාගේ කථා කරන්නේ අර කිව්වා වාගේ AI ද කියලා, ඒකට feed කරලා නැද්ද කියලා මට සැකයක් තිබෙනවා. මොකද, feed කළොත් නේ AI වලින් වැඩ කරන්නේ. ඒ සැකයත් තිබෙනවා. අපි ඔක්වෙන් 92 පෙට්‍රල්වලටත් ලීටරයක් සඳහා රජය විසින් රුපියල් 20ක සහනයක් ලබා දීලා තිබෙනවා. මේ මිල වැඩි කිරීම තුළ ඒක පෙනෙන්නේ නැති වුණාට, රජය විසින් ඒ දරා ගැනීම කරලා තිබෙනවා. අපි එහෙම සහන දීලා තිබෙනවා. ඉදිරියටත් අපි ජනතාව වෙනුවෙන් අවශ්‍ය සහන ලබාදීම අනිවාර්යයෙන් කරනවා. Ceylon Petroleum Corporation එකට රුපියල් බිලියන 884ක ණය කන්දක් ඉතුරු කරලා ගිය කට්ටිය තමයි දැන් සහන ගැන කථා කරන්නේ. මම හිතනවා, ඒක ජනතාව බොහොම පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ බව.

අපි කිසිම විධියකින් ඛනිජ තෙල් හිඟයක් ඇති නොවෙන්නට රටේ තත්ත්වය කළමනාකරණය කරලා තිබෙනවා. එතකොට යම් මිල වැඩිවීමක් සිදු වෙනවා. නැත්නම් මේවා පවත්වාගෙන යන්න බැහැ. ඒ වාගේම සියයට 43ක් වන පුද්ගලික සැපයුම් පිරවුම්හල් හිමියෝ - කොම්පැනි තුනක් - ඉන්නවා. එතුමන්ලා රුපියල් 200කට එහා වැඩි කිරීමක් තමයි ඉල්ලුවේ. අපට තිබෙන්නේ සියයට 57යි. ඉතිරි ටික විකුණලා තිබෙන්නේ අපි නොවෙයි; කොම්පැනි තුනකට විකුණලා තිබෙන්නේ අපි නොවෙයි. ඒකේ risk එක දැන් තමයි තේරෙන්නේ. මේ ආයතන රජයට තියා ගැනීමේ වැදගත්කම දැන් තේරුම් ගන්න ඕනෑ. සහන දෙන්න ඕනෑ නම් ඒවා රජයට තිබෙන්න ඕනෑ. සියයට 57කින් පමණක් අපි තෙල් දෙන්න ගියොත් රටට මොකද වෙන්නේ? ඒ නිසා ඒ ඉල්ලීම් ගැනත් අපට සලකා බලන්න වෙනවා. ඒ ඉල්ලීම් සලකා බලා තමයි යම් වැඩිවීමක් කරන්න වෙලා තිබෙන්නේ. එතැනදී අපි රජය විධියට දරා ගැනීමක් කරලා, රජයේ මුදල් වැය කරලා ජනතාවට ඒ සහනය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියටත් අපි ඒ ගැන කටයුතු කරමින් යනවා, අපි ජනතාවගෙන් පත් වෙච්ච, ජනතාව වෙනුවෙන් වැඩ කරන ආණ්ඩුවක් විධියට.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

## II

## ජාතික සමාජ සංවර්ධන ආයතනය ජාතික විශ්වවිද්‍යාලයක් සමඟ ඒකාබද්ධ කිරීම
தேசிய சமூக அபிவிருத்தி நிறுவனத்தை தேசிய பல்கலைக்கழகம் ஒன்றுடன் இணைத்தல்
AFFILIATION OF NATIONAL INSTITUTE OF SOCIAL DEVELOPMENT WITH A NATIONAL UNIVERSITY

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் பின்வரும் விடயத்தை கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, தங்களது அமைச்சின்கீழ் இயங்கி வருகின்ற தேசிய சமூக அபிவிருத்தி நிறுவனமானது - NISD-1952ஆம் ஆண்டு இலங்கையில் "Ceylon Institute of Social Work" - CISW - என்ற பெயரில் கல்விக்கான முதல் தொழில்முறை பயிற்சி நிறுவனமொன்றை நிறுவியது. சமூகப் பணியாளர்களை தொழில்முறையாகப் பயிற்றுவிப்பதே இதன் பிரதான நோக்கமாக இருந்ததுடன், சமூகப் பணியில் டிப்ளோமா மற்றும் உயர் டிப்ளோமா பாடநெறிகளையும் நடாத்தி வந்தது. இந்நிறுவனம் படிப்படியாக வளர்ச்சியடைந்து, 1992ஆம் ஆண்டு இலங்கையின் National Institute of Social Development Act No. 41 of 1992 என்ற பாராளுமன்றச் சட்டத்தின்மூலம், அதிகாரபூர்வமாக "தேசிய சமூக அபிவிருத்தி நிறுவனம்" - "National Institute of Social Development" - NISD - என்ற பெயரில் உயர் கல்வி அமைப்பாக உருவாகியது. இந்நிறுவனம் சமூகப் பணியின் தொழில்முறைக் கல்வி, பயிற்சி மற்றும் ஆராய்ச்சி வடிவமாகச் செயற்படத் தொடங்கியதுடன், சமூகப் பணியில் உயர் கல்விக்கான பாதையையும் வகுத்துள்ளது.

பின்னர் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவின் பரிந்துரைக்கு இணங்க, 2005ஆம் ஆண்டு இலங்கை அரசானது, Universities Act No. 16 of 1978இன்கீழ் NISDஐப் பட்டம் வழங்கும் திறன்கொண்ட உயர் கல்வி நிறுவனமென அறிவித்தது. இதன்மூலம் இந்நிறுவனம் பிரபலமான சமூகப் பணித்துறையில் பட்டப்படிப்புகளை வழங்கும் உயர் கல்வி நிறுவனமாக மாற்றம் கண்டது. பின்னர், சமூகப் பணி இளமானிப் பட்டப்படிப்பு - Bachelor of Social Work - மற்றும் சமூகப் பணி முதுமானிப் பட்டப்படிப்பு - Master of Social Work - உள்ளிட்ட மேல்தர பட்டப்படிப்புகளை வழங்கும் வகையில் அதிகாரங்கள் விரிவுபடுத்தப்பட்டு, தற்போது வரை கல்விச் செயற்பாடுகள் மிகச் சிறப்பாக இடம்பெற்று வருகின்றன. குறிப்பாக, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாணத்தைச் சேர்ந்த அதிகளவான மாணவர்கள் இந்நிறுவனத்தில் சமூகப் பணி கற்கையில் இளமானி மற்றும் முதுமானி பட்டப்படிப்புகளைப் பூர்த்திசெய்து, உள்நாட்டிலும் வெளிநாட்டிலும் பல்வேறு துறைகளில் சேவைபுரிந்து வருகின்றனர் என்பதை நினைவுகூருவதுடன், இன்றும் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த அதிகளவான மாணவர்கள் கற்றல் நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றனர். இருப்பினும், இந்நிறுவனத்தை ஒரு தேசிய பல்கலைக்கழகத்துடன் இணைப்பதற்கான முன்னெடுப்புகள் பல வருடங்களாக நடைபெற்று வந்தாலும், இதுவரை எந்தவிதமான நடவடிக்கைகளும் இடம்பெறவில்லையென நான் அறிகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இது தொடர்பில் 2025 மார்ச் மாதம் 17ஆம் திகதி இடம்பெற்ற அமைச்சரவைக் கூட்டத்தின் தீர்மானத்தின்படியும், நீங்கள் தேசிய சமூக அபிவிருத்தி நிறுவனத்தின் நிருவாகக் குழுவினருக்கு வழங்கிய அறிவுறுத்தல்களின்படியும், இந்த நிறுவனத்தின் பணிப்பாளர் நாயகமான சிரேஷ்ட பேராசிரியர் பிரேம குமார டி சில்வா அவர்களின் தலைமையில் நீங்கள் நியமித்த தொழில்நுட்பக் குழுவினரால் முன்மொழிவொன்று தயாரிக்கப்பட்டு, அது உங்களிடம் வழங்கி வைக்கப்பட்டுள்ளதாகவும் நான் அறிகின்றேன். அத்தோடு, இந்நிறுவனத்தை தேசிய பல்கலைக்கழகம் ஒன்றுடன் இணைத்துத் தருமாறு கோரி, 2019 மற்றும் 2025ஆம் ஆண்டுகளில் மாணவர் போராட்டங்களும் இடம்பெற்றுள்ளதாக அறிகின்றேன். இந்நிறுவனத்தை தேசிய பல்கலைக்கழகம் ஒன்றுடன் இணைப்பதற்கு ஆவன செய்யுமாறு இந்த உயரிய சபையில் தங்களிடம் விநயமாகக் கேட்டுக் கொள்வதுடன், பின்வரும் வினாக்களையும் கேட்கின்றேன்.

1. எதிர்காலத்தில் இந்நிறுவனத்தை தேசிய பல்கலைக்கழகம் ஒன்றுடன் இணைப்பதற்கு உடன்படுகின்றீர்களா?
2. எதிர்காலத்தில் இந்நிறுவனத்தை தேசிய பல்கலைக்கழகம் ஒன்றுடன் இணைப்பதற்கான வாய்ப்புகள் உள்ளதா?
3. இந்நிறுவனத்தை தேசிய பல்கலைக்கழகம் ஒன்றுடன் இணைப்பதற்கு தற்போது வரை எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் என்ன?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, මෙවැනි ප්‍රශ්නයක් ඇසීම ගැන ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඔව්.
2. ඔව්.
3. ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳව සමාලෝචනය කර කැබිනට් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2025 මාර්තු 17වැනි දින කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ කමිටුව මඟින් මෙම ආයතනය පිළිබඳවත් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

ඒ අනුව, ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්වවිද්‍යාලයකට අනුබද්ධ ආයතනයක් බවට පත් කිරීමේ හැකියාව සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2025 ජූලි 30 දිනැති ලිපිය අනුව ස්ථාපිත කරන ලද කමිටුවට පැවරුණු කාර්යය අනුව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නෛතික, ව්‍යුහාත්මක, කළමනාකරණ හා කාර්ය මණ්ඩල තත්ත්වය පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයනයක්

සිදු කර, ආයතනය විශ්වවිද්‍යාලයකට අනුබද්ධ ආයතනයක් බවට පත් කිරීමේ හැකියාව පිළිබඳ නිර්දේශ සහිතව එහි අවසාන වාර්තාව 2025 දෙසැම්බර් 16 දින අග්‍රාමාත්‍ය කාර්යාලයට භාර දීලා තිබෙනවා.

ඒ අනුව, අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2026 පෙබරවාරි 09 දිනැති ලිපිය මඟින් අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය සම්බන්ධයෙන් ලබා දී ඇති 2025 මාර්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්දේශ සහිත ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අනුකමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටු වාර්තාව අනුව මෙම ආයතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කළ හැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා.

එම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා 2026 මාර්තු 24වැනි දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සහ පාලක සභාවේ අනුමැතිය ලබාගෙන තිබෙනවා. ඒ අනුව මේ වෙනකොට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරලා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඊට අමතරව අපි කැලණිය විශ්වවිද්‍යාලය සමඟත් මේ කරුණ පිළිබඳව මූලික වශයෙන් සාකච්ඡා පවත්වා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ කමිටුව විසින් යෝජනාවලිය සකස් කිරීමට පෙර දැනට ඉදිරිපත් කර ඇති ශක්‍යතා අධ්‍යයන වාර්තාව සඳහා අනුකූලතා වාර්තාවක් - compliance report එකක් - සකස් කරලා තිබෙනවා. ඒ compliance report එකටත් 2026 මාර්තු 27වැනි දින පැවැති ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පාලක සභාව විසින් අනුමැතිය ලබා දීලා තිබෙනවා.

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම එම ක්‍රියාකාරී සැලැස්ම ඇමුණුම 01 විධියට ඉදිරියේදී සභාගත කරනවා. අපි ඒ වාර්තාව අනුව ප්‍රධාන කරුණු 6ක් යටතේ ක්‍රියාකාරී සැලැස්මක් දැනට හදලා තිබෙනවා. ඒ ක්‍රියාකාරී සැලැස්ම 2026 පෙබරවාරි 23වැනි දින සිට ආරම්භ වුණා. අපි බලාපොරොත්තු වෙනවා, දැනට තිබෙන time frame එක අනුව 2026 මැයි මස 31වන දා වෙනකොට මේ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන - ගැසට් එක - ඉදිරිපත් කරන්න. මොකද, ඒ සම්බන්ධව දැනට තිබෙන පනතේ සංශෝධනයක් කරන්න අවශ්‍යයි. වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් ඇති Action Plan එක මම **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
පිළිතුරු ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

2026.01.21වැනි දින ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

## නිදහස් අරගළයේ මුස්ලිම් නායකයන් දේශප්‍රේමීන් ලෙස ප්‍රකාශයට පත් කිරීම: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

சுதந்திரப் போராட்ட முஸ்லிம் தலைவர்களைத் தேசப்பற்றாளர்களாகப் பிரகடனப்படுத்தல்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

DECLARATION OF MUSLIM LEADERS OF FREEDOM STRUGGLE AS PATRIOTS: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, 1796 සිට 1948 දක්වා වූ කාලය තුළ - බ්‍රිතාන්‍ය පාලන සමයේ - ශ්‍රී ලංකාව පාලනය කළ පාලකයන්ට එරෙහිව ක්‍රියා කළ නිසා ශ්‍රී ලාංකිකයන් රාජද්‍රෝහීන් ලෙස ලැයිස්තුගත කර ඔවුන්ගේ නම් ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳවත්, හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2016දී ඒක වෙනස් කරපු එක පිළිබඳවත් තමයි මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ.

උක්ත ප්‍රශ්නය මඟින් සඳහන් කර ඇති මුස්ලිම් නායකයින් 7දෙනාගේ නම්, එවකට බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1804 ජුනි 07 වන දිනැතිව නිකුත් කරන ලද අංක 123 දරන ගැසට් නිවේදනයේ ඇතුළත් වන අතර, එම නායකයින් 7දෙනාද ඇතුළුව නායකයින් 190දෙනෙකුගේ නම් එම ගැසට් නිවේදනයේ ඇතුළත් වෙලා තිබෙනවා. ඇමුණුමෙහි විස්තර සඳහන් කර තිබෙනවා. ඇමුණුම **සභාගත*** කරමි.

එමෙන්ම, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2016 දෙසැම්බර් මස 21වන දින නිකුත් කරන ලද අංක 1998/25 දරන හා 2017 සැප්තැම්බර් මස 11 වන දින නිකුත් කරන ලද අංක 2036/11 දරන ගැසට් නිවේදනවල බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1804 ජුනි 07වන දිනැතිව නිකුත් කරන ලද අංක 123 දරන ගැසට් නිවේදනයේ සඳහන් නායකයින් 190දෙනා අතුරින් කිසිවෙකුගේ නාමයක් ඇතුළත් කර ඇති බවක් නිරීක්ෂණය නොවේ. තවද, මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ඉතිහාසය පිළිබඳ විශේෂඥයින් මාර්ගයෙන් තහවුරු කර ගත් පසුව සුදුසු පියවර ගැනීමට කටයුතු කරනු ඇත.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කෙසේ වෙතත්, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් විමසා ඇති නායකයින් 7දෙනාද ඇතුළුව 1804 ජුනි 07වන දිනැතිව නිකුත් කරන ලද අංක 123 දරන ගැසට් නිවේදනයේ නම් සඳහන් වන නායකයින් 190දෙනාම සම්බන්ධව මෙතෙක් තීරණයක් ගෙන නොමැත.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, முன்னாள் சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள், 'தேசத் துரோகிகள்' என்ற பட்டியலில் உள்ளவர்களைத் தேசிய வீரர்களாகப் பிரகடனம் செய்தபோது, அந்தப் பட்டியலில் இருக்கின்ற சிறுபான்மைச் சமூகத்தைச் சேர்ந்தவர்களுடைய குறிப்பாக முஸ்லிம்கள், தமிழர்களுடைய பெயர்களை அகற்றி இருக்கவில்லை. அவர்களும் இந்த நாட்டுக்காகப் போராடியவர்கள்; பிரிட்டிஷ் அரசாங்கத்தால் 'தேசத் துரோகிகள்' என்று வர்த்தமானிமூலம் பிரகடனம் செய்யப்பட்டவர்கள். எனவே, அவர்களுடைய பெயர்களையும் எவ்வளவு விரைவாக நீக்க முடியுமோ, அவ்வளவு விரைவாக நீக்க வேண்டும். 'தேசத் துரோகிகள்' என்ற பட்டியலில் உள்ளவர்களை தேசிய வீரர்களாக gazette பண்ணியபோது, அந்தப் பட்டியலில் இருக்கும் எல்லோருடைய பெயர்களையும் நீக்கியிருக்க வேண்டும். எனவே, அப்போதைய அரசாங்கம் விட்ட தவறை உங்களுடைய அரசாங்கம் நிவர்த்தி செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි ඒක හරියට පරික්ෂා කර බලන්න ඕනෑ. මොකද, ඒ පසුබිම ගැන හොයලා බලනකොට, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2016 දෙසැම්බර් මස නිකුත් කරන ලද ගැසට් දෙකේ ඇතුළත් වෙලා තිබුණු නම් අතරේ, 1804දී බ්‍රිතාන්‍ය පාලන කාලයේ නිකුත් කරන ලද අංක 123 දරන ගැසට් නිවේදනයේ ඇතුළත් ලැයිස්තුවේ තිබුණු නම් එකක්වත් නැහැ, ගරු කථානායකතුමනි. මෙතුමා සඳහන් කරන නම් ඇතුළත් ගැසට් එකේ තවත් නම් ගොඩක් තිබෙනවා, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා නිකුත් කළ ගැසට් එකේ නැති. ඒ නිසා අපට මේ පිළිබඳව තවදුරටත් කරුණු සොයා බලලා තමයි තීරණයක් ගන්න සිදුවෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා.

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් 2025.08.21 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර.

## මන්නාරම සහ රාමේෂ්වරම් අතර සෘජු මගී නෞකා සේවාව: වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மன்னார் மற்றும் இராமேஸ்வரம் இடையேயான நேரடிப் பயணிகள் கப்பல் சேவை: துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று
## DIRECT FERRY SERVICE BETWEEN MANNAR AND RAMESWARAM: STATEMENT BY MINISTER OF PORTS AND CIVIL AVIATION

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් 2025.08.21 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. මේ මගී ප්‍රවාහන සේවය ආරම්භ කිරීම සඳහා මූලික අදියර විධියට පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් කරන්න කැබිනට් අනුමැතිය ලබාගෙන ඒ අනුව කටයුතු කරමින් ඉන්නවා.
2. දැනට නෞකා සේවාවක් පවතින්නේ නැහැ. නමුත් පූර්ව ශක්‍යතා අධ්‍යයනයෙන් පස්සේ අපට තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්.
3. මම කලින් සඳහන් කළා වාගේ මේ වෙනකොට පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් කිරීම සඳහා කටයුතු ආරම්භ කර තිබෙනවා. එම ශක්‍යතා අධ්‍යයනයෙන් පස්සේ අපට ඒ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්.
4. ගරු කථානායකතුමනි, 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුමක් ඇති වුණා. එම ගිවිසුමේ වගන්ති 4 - Article 4 - ප්‍රකාරව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීමට යෝජනා කරලා තිබෙනවා. එම කමිටුව විසින් උතුරේ තලෙයිමන්නාරම ඇතුළු තවත් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධව මීට පෙර කිහිප වතාවක් සාකච්ඡා කර තිබෙනවා. ඒ සාකච්ඡාවලින් පස්සේ ඇතිවෙන්න පුළුවන් අභියෝග සම්බන්ධයෙන් සැලසුම් හා යෝජනා සකස් කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.
5. ශක්‍යතා අධ්‍යයනයෙන් පස්සේ අවශ්‍ය තාක්ෂණික සහ පාරිසරික මූල්‍යමය ඇගයීම් කිරීමෙන් අනතුරුව නෞකා සේවාව ආරම්භ කිරීමට අපට අනුමැතිය ලැබුණොත්, මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය මුහුදු මාර්ගය හරහා අඩු වියදමකින් සිදු කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම ආගමික සංචාරකයින් සඳහාත් ප්‍රවාහන පහසුකම ඇති කිරීමට අවස්ථාවක් ලැබෙයි කියලාත් අපි විශ්වාස කරනවා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! உண்மையிலேயே இந்த வினாவுக்கான விடை கிடைக்குமா என்று எதிர்பார்த்திருந்த நேரத்திலேயே நீங்கள் விடையளித்தீர்கள்.

இதனை நான் நன்றி உணர்வோடு பார்க்கின்றேன். நீங்கள் இவ்விடயம் குறித்த நடவடிக்கைகளை வெகு விரைவாக மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, நான் இந்தப் பாராளுமன்றத்தில் பல அரசாங்கங்களின் செயற்பாடுகளைப் பார்த்திருக்கிறேன். நாங்கள் கேட்கின்ற கேள்விகளுக்கு உடனுக்குடன் பதிலளிக்கின்ற பொறுப்பை இந்த அரசாங்கம் கொண்டிருக்கின்றது. நாடாளுமன்ற உறுப்பினர்கள் தங்களுடைய பிரதேசங்களிலுள்ள பிரச்சினைகள் தொடர்பில் கேள்வி கேட்கும்போது, அதற்கு ஒரு வார கால அவகாசம் கேட்டு, அந்தக் காலப் பகுதிக்குள் பதிலளிக்கின்ற நடைமுறை உங்களுடைய அரசாங்கத்தில் இருப்பதை நான் வரவேற்கின்றேன்.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 118(3) යටතේ මම මේ කාරණය ඉදිරිපත් කරනවා. මම මේ වනකොට හතර පස් පාරක් ඇහුවා, "යූටියුබ් සුදා"ගේ inquiry එක Ethics and Privileges Committee එකේදී අද වෙනකම් ගත්තේ නැත්තේ ඇයි කියලා. ඒකට දැන් කොච්චර කාලයක් වෙනවාද? ඒ මනුස්සයා හැම කාන්තාවකටම අපහාස කරනවා. ගරු කථානායකතුමනි, සභානායකතුමා සම්බන්ධයෙන් මම කරපු ප්‍රකාශයකට ඔබතුමා විසින් මම පාර්ලිමේන්තුව තුළදී සිදු කරන ප්‍රකාශ සජීවී විකාශය කිරීම දවස් 8කට විතර තහනම් කළා. Ethics and Privileges Committee එකේ වාර්තාවල පැහැදිලිව තිබෙනවා, ඔබතුමා වරදක් කර තිබෙනවා කියලා. මේ, "යූටියුබ් සුදා"ගේ inquiry එක මෙච්චර කාලයක් කළේ නැත්තේ ඇයි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් අපි ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට දැනුම් දෙන්නම්.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා.

## සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலம்
## SOCIAL SECURITY CONTRIBUTION LEVY (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග, විෂය අංක 3 - ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝගය, විෂය අංක 4 - ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති ද මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

To start the Debate, the Hon. Nishantha Jayaweera. You have 11 minutes.

[පූ.භා. 11.37]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පතට ප්‍රධාන සංශෝධන 2ක් ඇතුළත් වනවා. ඉන් පළමුවෙනි සංශෝධනය මෙයයි. වාහන ආනයනකරුවෙකුට සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මෙතෙක් පැනවුණේ ඒ වාහනය ආනයනය කරන අවස්ථාවේදී නොවෙයි, ආනයනය කරපු වාහනය නැවත විකුණන අවස්ථාවේදීයි. නමුත් මේ සංශෝධනය අනුව, යම් කෙනෙක් වාහනයක් ආනයනය කරනවා නම් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පනවන අවස්ථාව වෙනස් වනවා. ඒ කියන්නේ, මේ බද්ද පනවන්නේ වාහනය විකුණන අවස්ථාවේදී නොවෙයි, ආනයනය කරන අවස්ථාවේදීයි. ඒක තමයි මේ යටතේ ගෙනෙන පළමුවෙනි සංශෝධනය.

දෙවැනි සංශෝධනය විධියට ඉදිරිපත් වන්නේ මෙයයි. මෙතෙක් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වුණේ තමන්ගේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 60කට වැඩි පුද්ගලයින්; ව්‍යාපාරිකයින්. නමුත්, මේ සංශෝධනය යටතේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වන සීමාව රුපියල් මිලියන 36 දක්වා අඩු වනවා.

ගරු කථානායකතුමනි, අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය වන්නේ බදු ගෙවන ජනතාව මත මෙතෙක් පැනවිලා තිබෙන බදු බර අඩු කරමින් රජයට වඩාත් වැඩි බදු ආදායමක් අය කර ගැනීමයි. ඒ මධ්‍ය කාලීන ප්‍රතිපත්තියට අපි ගමන් කරනකොට ප්‍රධාන කරුණු 4ක් යටතේ තමයි එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේ. ඒ ප්‍රධාන කරුණු 4 අතරින් පළමුවෙනි කාරණය තමයි, බදු පරිපාලනයට නවීන තාක්ෂණය හඳුන්වා දීම. ඒක ප්‍රධාන කාරණය. බදු පරිපාලනයට නවීන තාක්ෂණය හඳුන්වා දෙන්න යන ගමනේදී අපි විශේෂයෙන්ම කරුණු 2ක් යටතේ කටයුතු කරනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පද්ධතිය මෙතෙක් කාලයක් ක්‍රියාත්මක කළේ, ඒක ගොඩනැඟුවේ විදේශීය සමාගමක් විසින්. ඒ නිසා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා ඒ නඩත්තු කටයුතු, සංවර්ධන කටයුතු දේශීය වශයෙන් කිරීමට අවශ්‍ය කටයුතු මේ වනකොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඊට අමතරව VAT එක සඳහා අපි අලුතෙන් විද්‍යුත් invoicing පද්ධතියක් - e-invoicing system එකක් - හඳුන්වා දෙන්න මේ වනකොටත් කටයුතු කරමින් පවතිනවා. අන්න ඒ ආකාරයෙන් තමයි මේ බදු පරිපාලනයට නවීන තාක්ෂණය යොදා ගන්න අපි කටයුතු කර තිබෙන්නේ. ඒත් එක්කම බදු ක්‍රමය සරල කිරීම කියන දෙවැනි කාරණය වෙනුවෙනුත් අපි කටයුතු කර තිබෙනවා.

මෙතෙක් පැවති, ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කළ බදු පනත්වල තිබුණු ඉතා සංකීර්ණ තැන් අපි හඳුනාගෙන ඒ සංකීර්ණතා ඉවත් කරන්න අවශ්‍ය කටයුතු මේ වනකොට සිද්ධ කරමින් පවතිනවා. ඉදිරියේදී ඒ සංශෝධන මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණාම ඔබතුමන්ලාටත් ඒවා දකින්න පුළුවන් වෙයි. ඒ සංශෝධන ඉතා කඩිනමින් ඉදිරිපත් කරලා මේ බදු ක්‍රමය සරල කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගන්නවා. නීති සංශෝධනය සහ නවීන තාක්ෂණය කැන්දවීම තුළින් තමයි මේ බදු ක්‍රමය සරල කර ගන්න අපි උත්සාහ කරන්නේ. තුන්වෙනි කාරණය තමයි, බදු පදනම පුළුල් කර ගැනීම. හතරවෙනි කාරණය තමයි, ඊට අමතරව බදු අනුකූලතාව වැඩි කර ගන්න එක. ඒ කරුණු හතර කැටි කරගෙන අපේ ප්‍රධානතම පරමාර්ථය තමයි, බදු ගෙවන ජනතාව මත මෙතෙක් පැනවී තිබුණු බදු බර අඩු කරන එක. නමුත් මේ තුළ රාජ්‍ය බදු ආදායම වැඩි කර ගැනීමත් අවශ්‍යයි. ඔබතුමන්ලා කොච්චර කිව්වත් අපි පැහැදිලිව ඉලක්කම්වලින් මේ පිළිබඳව පෙන්වා තිබෙනවා.

විශේෂයෙන්ම අපි බදු ආදායම අහිමි වන පැත්තට සහ බදු ගෙවන ජනතාවට සහනයක් දෙන ආකාරයේ තීන්දු තීරණ කිහිපයක් අරගත්තා. ඒ තීන්දු තීරණ ගත්තොත්, පුද්ගල ආදායම් බද්දට අපි යම් නිදහසක් දීලා තිබෙනවා. ඒ වාගේම එකතු කළ අගය මත බද්දෙන් අපි කිරි නිෂ්පාදන නිදහස් කර තිබෙනවා. විශේෂයෙන්ම එතෙක් පොලී මත පනවා තිබූ රඳවා ගැනීමේ බද්ද පැහැදිලිවම අපි ඉවත් කර තිබෙනවා. මේ ඉවත් කිරීම් තුළින් බදු ගෙවන ජනතාවට සහන දෙමින් අපි රුපියල් බිලියන 75කට වැඩි බදු ආදායමක් අහිමි කරගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අපි රුපියල් බිලියන 2,401ක විශාල ඉලක්කයක් ලබා දුන්නා. ඉතිහාසයේ පළමුවෙනි වතාවට අපේ බදු ආදායම රුපියල් බිලියන 241ක් ඉක්මවා යන්න අපි සමත් වනවා. ඒ, ජනතාවට සහන දෙමින්. අපි පැහැදිලිවම ඉලක්කම්වලින් ඔප්පු කර තිබෙනවා, ජනතාවට බදු සහන දෙන ගමන්ම බදු ආදායම් වැඩි කර ගන්නේ කොහොමද කියලා.

විශේෂයෙන්ම නව රජය පත් වීමත් එක්ක නව රජයේ වැඩ පිළිවෙළ ගැන බදු ගෙවන ජනතාවගේ විශ්වාසය තහවුරු වුණා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි කර ගන්නත් අපට හැකි වෙලා තිබෙනවා. මේ කරුණු කාරණා ඇතුළත ඔබතුමන්ලා කොතෙක් දේවල් කිව්වත්, නව රජය විධියට අපි නිවැරදි ප්‍රතිපත්තිය ඇතුළේ මෙතෙක් කාලයක් කිසිවෙකුට කරන්න බැරි වුණු දෙයක් කරලා පැහැදිලිව ඉලක්කම්වලින්ම එය පෙන්වා දීලා තිබෙනවා. මේ වාගේ සංශෝධන ඇතුළත් කිරීමෙන් අපි ඉදිරියේදී මේ බදු ක්‍රමය වඩාත් සරල කර ගැනීම තුළ බදු අනුකූලතාව වැඩිදියුණු කර ගන්නවා. ඒත් එක්කම බදු පදනම පුළුල් කරලා අපේ අවසාන අරමුණ වන්නේ බදු ගෙවන ජනතාවට තිබෙන බදු බර අඩු කරලා රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමයි. ඒක තමයි පළමුවෙනි කාරණය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියපු සංශෝධන ඇතුළේ රජය විධියට අපි පැහැදිලිවම රාජ්‍ය ආදායම වැඩි කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඒකට අදාළ පළමුවෙනි පියවර විධියට තමයි, මේ සංශෝධන ගෙන එන්නේ. අපි 2026 අය වැයෙන් ඉදිරිපත් කරපු යෝජනාවකට අනුව තමයි මේ සංශෝධන පාර්ලිමේන්තුවට අද ඉදිරිපත් කර තිබෙන්නේ.

ඊළඟට අපි අද පාර්ලිමේන්තුවේදී සම්මත කරනවා, ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වූ රීති. ඒ රීති මොනවාද කියලා අපි බලමු. මෙතෙක් කාලයක් දේශීය ඩොලර් බැඳුම්කර - domestic dollar bonds - කියන එකට ආයෝජනය කරන්න පුළුවන්කම තිබුණේ commercial banksවලට විතරයි. නමුත්, මේ සංශෝධනය මඟින් යම් අපනයනකරුවෙකුට තමන්ගේ නිෂ්පාදන හෝ සේවා අපනයනය කිරීමෙන් ලැබෙන මුදල මේ රටට ප්‍රේෂණය කරන අවස්ථාවේදී ඒ මුදල් ප්‍රමාණයෙන් සියයට 10ක උපරිමයකට යටත්ව දේශීය ඩොලර් බැඳුම්කරවල ආයෝජනය කරන්න අවස්ථාව ලබා දෙනවා. මේකෙන් රජය විධියට අපි බලාපොරොත්තු වන්නේ, අපනයනකරුවන්ගේ සියලු අපනයන ඉපැයීම් අපේ රටට ආපසු ගෙන්වා ගැනීමයි. ඒකට කරන උත්තේජනයක් විධියට තමයි ඔවුන්ට මේ අවස්ථාව ලබා දී තිබෙන්නේ. ඒක තමයි අද මේ පාර්ලිමේන්තුවේදී සම්මත කරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වන රීතිවලින් සිදු කරන්නේ.

අද සම්මත කරන්න යන තවත් අයිතමයක් තමයි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෙන එන නියෝගය. BoI එක යටතේ පසුගිය කාල වකවානුවල බදුවලින් නිදහස් කර තිබෙන්නේ බදු ගෙවන්නන්ගේ මුහුණු බලලා. ඒ සඳහා හරි සිද්ධාන්තයක් තිබුණේ නැහැ. එක එක බදු ගෙවන්නාට එක එක ආකාරයට, *ad hoc* විධියට තමයි බදු නිදහස දීලා තිබුණේ.

නමුත්, මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෙන එන නියෝගයේ තිබෙන ප්‍රධානම අරමුණක් තමයි, rule-based tax exemption policy එකක් ඉදිරිපත් කිරීම. ඒ අනුව අපේ රටට ආයෝජකයෙක් එනවා නම් ඒ ආයෝජකයා ඉතාම පැහැදිලිව දන්නවා, තමන් ගෙනෙන ආයෝජනය කුමක්ද, ඒ තුළින් ලබා දෙන රැකියා ප්‍රමාණය කොපමණද, ඒ ආයෝජනය කරන ක්ෂේත්‍රය අනුව තමන්ට කොච්චර කාලයකට බදු සහනයක් ලැබෙනවාද, එලෙස ලැබෙන සහන මොනවාද කියලා. ඒක ආයෝජකයාට හොඳ දිරියක් වෙනවා.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෙනෙන මෙම නියෝගය ගැන සලකා බැලුවොත්, ප්‍රධාන වශයෙන්ම අපි එය කාණ්ඩ තුනකට බෙදනවා. පළමුවන කාණ්ඩය හැටියට යටිතල පහසුකම් සහ සේවා සංවර්ධනය වෙනුවෙන් යම් ආයෝජකයෙක් අපේ රටට එනවා නම්, දෙවන කාණ්ඩය හැටියට නිෂ්පාදනය සම්බන්ධයෙන් යම් ආයෝජකයෙක් එනවා නම්, තුන්වන කාණ්ඩය හැටියට කෘෂි කර්මාන්තය දියුණු කරන්න යම් ආයෝජකයෙක් එනවා නම් ඒ, ඒ ආයෝජකයා ගෙනෙන ඩොලර් ප්‍රමාණය සහ ඒ තුළින් ලබා දෙන රැකියා ප්‍රමාණය අනුව ඔහුට අවුරුදු 5 සිට අවුරුදු 10ක් දක්වා බදු නිදහස් කාල සීමාවක් ලබා දෙන්න මේ නියෝගය යටතේ ආයෝජන මණ්ඩලයට හැකියාව ලැබෙනවා. ඒ කියන්නේ, යම් ආයෝජකයෙක් අපේ රටට එනවා නම් ඔහු ගෙනෙන ආයෝජනය සහ ඒ තුළින් උත්පාදනය කරන රැකියා ප්‍රමාණය පදනම් කරගෙන ඔහුට බදු සහන ලබා දීලා ආයෝජන වැඩිපුර කැඳවා ගැනීම තමයි මෙහි ප්‍රධානම පරමාර්ථය වන්නේ. මේ යටතේ එහෙම අපේ රටට එන ආයෝජකයෙක් ඒ ආයෝජන ආරම්භ කරන්න කලින් තමන්ගේ යටිතල පහසුකම් වෙනුවෙන්, ඒ කියන්නේ project එකේ implementation period එකේදී සිදු කරන කටයුතු වෙනුවෙන් ආනයනය කරන වාහන හැර සියලු භාණ්ඩ සඳහා ගෙවන රේගු බද්ද, Cess එක, PAL එක සහ VAT එක - එකතු කළ අගය මත බද්ද - කියන සියල්ලෙන්ම සම්පූර්ණයෙන්ම නිදහස් වෙනවා. ඒ project implementation period එක ඇතුළේ කරන සියලු ආනයන වෙනුවෙන් ඒ බදු නිදහස් වෙනවා. හැබැයි, මෙතැනදී මම විශේෂයෙන් කියන්න ඕනෑකම තිබෙනවා, ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ කෙරෙන ආයෝජනයකට මේක අදාළ වෙන්නේ නැති බව. රජය විධියට අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය වෙන්නේ ආර්ථික වර්ධන වේගය සියයට 7ක මට්ටමට ගෙනිහිල්ලා වඩාත් පුළුල් ආර්ථිකයක් දක්වා මේ රට අරගෙන යන එකයි. එතැනට යන ගමනේදී ආයෝජන වැඩියෙන් කැඳවා ගැනීම ඉතාම වැදගත් කාරණයක්. ඒ වෙනුවෙන් අපි ගත්ත එක ක්‍රියාමාර්ගයක් තමයි මේක.

මීට කලින් අපි මේ පාර්ලිමේන්තුවේදීම සම්මත කළා, Colombo Port City Economic Commission Act එක. ඒ පනත යටතේත් ආයෝජකයන්ට යම් යම් බදු සහන දීලා තිබෙනවා. මේ වාගේම project implementation period එකේදී කරන ආනයන වෙනුවෙන් අදාළ සහන ලබා දීලා කොළඹ වරාය නගරය - Colombo Port City එක - වෙනුවෙන් වැඩිපුර ආයෝජන කැඳවා ගන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. අපේ අවසාන පරමාර්ථය වෙන්නේ මේ රටේ ආර්ථිකය වැඩිදියුණු කරන්න ප්‍රධානම සාධකයක් වන ආයෝජන වැඩිපුර කැඳවා ගැනීමයි. 2025 අවුරුද්දේදී අපි රජය විධියට සමත් වුණා, ඩොලර් බිලියනයකට වැඩි ප්‍රමාණයක, එහෙම නැත්නම් ඩොලර් මිලියන 1,057ක ප්‍රමාණයක ආයෝජන කැඳවා ගන්න. පසුගිය වසර තුන හතරක කාලය ගත්තාම ඒක වැඩිම ආයෝජන ප්‍රමාණය වෙනවා. 2026 වසරට ඩොලර් බිලියන 2කට වැඩි ආයෝජන ප්‍රමාණයක් කැඳවා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙන්න මේවාට අදාළ නීතිමය ප්‍රතිපාදන විධිමත් විධියට ඉදිරිපත් කිරීම තමයි මේ අණපනත් සංශෝධනය කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. මෙන්න මේ කරුණු කාරණා තුළ අපේ ආර්ථික වර්ධන වේගය වඩාත් වැඩි අගයකට වාගේම ආර්ථිකය වඩාත් පුළුල් මට්ටමකට ගෙනිහිල්ලා ඒ තුළින් ලැබෙන ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීම තමයි අපේ අවසාන බලාපොරොත්තුව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Kabir Hashim. You have 12 minutes.

[පූ.භා. 11.48]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය කරන ලද අලුත් බදු සාධාරණීකරණය කිරීමට ගරු නියෝජ්‍ය ඇමතිතුමා කළ උත්සාහය දකිනකොට මට එතුමා ගැන දුක හිතුණා. ඒ බදු කොහොමද අය කරන්නේ? මොනවා කිව්වත් ඒ සඳහා වැය වෙන්නේත් මේ රටේ මිනිස්සුන්ගේ සාක්කුවේ තිබෙන මුදල්.

අද කරුණු කිහිපයක් සම්බන්ධයෙන් විවාදය පැවැත්වෙනවා. හැබැයි, මම ඉස්සෙල්ලාම මේ කාරණය ගැන කථා කරන්න ඕනෑ. 2008දී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව යටතේ ක්‍රමෝපාය

[ගරු කබීර් හෂීම් මහතා]

සංවර්ධන ව්‍යාපෘති පනත ඉදිරිපත් කළා; ස්ථාපනය කළා. ජනතා විමුක්ති පෙරමුණ විසින් ඒ කාලයේ ඒ පනත දැඩි ලෙස විවේචනය කළා. විනිවිදභාවයක් නැති, දූෂණයට මහ පැදීමක් කරන, දේශීය කර්මාන්තවලට අසාධාරණයක් වන, විදේශිකයන්ට අසීමිත සහන දෙන පනතක් කියලා ඒ පනතට ඇති වෙන්න පහර ගැහුවා.

හැබැයි, දෛවයේ සරදමක් වෙන්න පුළුවන්, 2025 අංක 26 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනතත් ජේවීපී ආණ්ඩුවෙන් මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තා. ඒ අවස්ථාවේදී 2025 සංශෝධිත පනත ගෙනාවේ නීති-රීති මත පදනම් වූ පාලන රාමුවකට යොමු කිරීම සඳහාත්, ඒ වාගේම 2008දී ගෙනාපු මුල් පනතේ තිබුණු දේශපාලනඥයන් තීරණ ගැනීමේදී ඔවුන්ගේ අභිමතය පරිදි කටයුතු කිරීම වළක්වන්නටත්, විශේෂයෙන්ම ආයෝජකයන්ට ලබා දෙන බදු සහන තාර්කික කිරීම සහ සාධාරණීකරණය කිරීමට ක්‍රමවේදයක් හඳනවාය කියායි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ පනත ගැන දැන් කථා කළා. හැබැයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා සහ එම කමිටුවේ සාමාජිකයින් විසින් ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමන්ලා ඒකට විරෝධය දක්වා තිබෙනවා.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද ගෙනෙන මේ නියෝගයට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් විරෝධය පළ කරලා තිබෙනවා. එතුමන්ලා කියනවා, 2025 සංශෝධිත පනතේ ඉලක්ක, අරමුණු මේ නියෝගයෙන් ඉෂ්ට වෙන්නේ නැහැ, මේක ඒකට පටහැනියි කියලා. ඒ අනුව අද ගෙනෙන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝගය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ තිබුණු පනත හා 2025 සංශෝධිත පනත ගත්තාම මට ලෙහෙසියෙන් ඒක මේ විධියට හඳුන්වා දෙන්න පුළුවන්. කියමනක් තිබෙනවා නේ, "මගේම කලිසම අගේට ඇඳගෙන උගේ වගේ යනවා" කියලා. අලුත් සංශෝධනයක් ගෙනැල්ලා, අරගොල්ලන්ගේම කලිසම ඇඳගෙන යනවා වාගේ කටයුතු කරන බවක් තමයි මට නම් පෙනෙන්නේ. මේ බොරුව අපට කරන්න බැහැ. පොදු ජනයාට මේවා පෙන්වමින් system change කියලා කියන්න පුළුවන්. නමුත්, අපි එච්චර මෝඩ නැහැ. ආණ්ඩුව හිතන්න ඕනෑ, ඔබතුමන්ලා මේ කරන්නේ මොකක්ද කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා සහ කමිටුව මෙහෙම කියනවා. මේ පනත යටතේ ගෙනෙන නියෝගයේ "A" කාණ්ඩය යටතේ තිබෙනවා, සංචාරක ව්‍යාපෘති සඳහා විදේශ ආයෝජකයන්ට වසර හයක බදු විරාමයක් දෙනවාය කියලා. විදේශ ආයෝජකයන්ට විතරක් වසර හයේ සිට වසර දහය දක්වා බදු විරාමයක් දෙනවාය කියනවා. හැබැයි, නිෂ්පාදනය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණයට දෙන්නේ අවුරුදු පහක බදු විරාමයක්. සංචාරකයෙකුට අවුරුදු හයක බදු විරාමයක්, නිෂ්පාදනයට අවුරුදු පහක බදු විරාමයක්. හැබැයි, නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟන්න ඕනෑ කියලා කථා කරනවා. එහෙම නම් මොන පදනමින්ද මේ බදු විරාමය ලබා දෙන්නේ, මෙතැන හරයක් තිබෙනවාද කියන ප්‍රශ්න මම අහනවා.

2025 අංක 26 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත ගෙනාවේ ඇයි? විනිවිදභාවය තිබෙන්න ඕනෑ කියලා. අලුත් විනිවිදභාවයක් ඇති කරනවාය කියනවා. හැබැයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් කියනවා, එහෙම විනිවිදභාවයක් නැහැ, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් කියන්නේ කුමක්ද කියලා අර්ථ දැක්වීමක් ඒ සංශෝධිත පනත තුළ නැහැ කියලා. ඒ කියන්නේ, ඔබතුමන්ලාට ඕනෑ විධියට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් හඳුනා ගන්න පුළුවන්. ඔබතුමන්ලාගේ මිත්‍රයන්ගේ කවුරු හරි කැවර් කෙනෙක් ගෙනැල්ලා, විදේශ ආයෝජකයෙක් ගෙන්වලා ඒ පුද්ගලයාට අවුරුදු පහක බදු විරාමයක් ලබා දීලා, බිස්නස් එකක් පටන් ගන්න ඉඩ දෙන්න පුළුවන්. ඒ නිසා මේක පරණ විධියටම දූෂණයට ඉඩ හැදෙන, අක්‍රමිකතා සිදු වන, ගැළපෙන්නේ නැති බදු විරාම දෙන්න පුළුවන් tool එකක් බවට පත් වෙන්න පුළුවන්. ඉතින්, මේ කියන system change එක කොහේද තිබෙන්නේ? සංචාරකයන්ට, විදේශ ආයෝජකයන්ට අවුරුදු හයේ සිට අවුරුදු දහය දක්වා බදු විරාම දෙනවා කියලා මේ පනත යටතේ නියෝගය අනුව කියා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025දී සංචාරක ව්‍යාපාරය හොඳට දියුණු වුණා, ඒ තුළින් විශාල ආදායමක් ලැබුණා කියලා මේ ආණ්ඩුව කයිය ගැහුවා. ඇත්තටම ඒ තුළින් රටට ඇති වුණු වාසිය කුමක්ද? ඇත්තටම වර්ධනයක් වෙලා තිබෙනවාද? 2024දී ලංකාවට ආපු සංචාරකයන් ප්‍රමාණය ලක්ෂ 20යි. ඔබතුමන්ලාගේ පාලනය පැවති 2025දී මේ ප්‍රමාණය විශාල වශයෙන් වර්ධනය වුණාය කිව්වාට ලංකාවට ආපු සංචාරකයන් ප්‍රමාණය ලක්ෂ 23යි. ලක්ෂ 3ක වැඩිවීමක් වුණා. හැබැයි, සංචාරකයන් ආපු ප්‍රමාණය වැඩි වුණාට ඒ හා සාපේක්ෂව මේ රටට සංචාරකයන්ගෙන් ලැබුණු ආදායම වැඩි වුණේ නැහැ. ඒගොල්ලන් වියදම් කරපු ඩොලර් ප්‍රමාණය අඩු වුණා. උදාහරණයක් විධියට ගත්තොත්, 2024දී සංචාරකයන්ගෙන් ලැබුණු ආදායම US Dollars 3.1 billion. හැබැයි, 2025දී ඒක US Dollars 3.2 billion. ඒ කියන්නේ, it is only a US Dollars 100 million increase. ඒක පොඩි increase එකක්. ඊට අමතරව 2024දී එක් සංචාරකයෙක් දවසකට මේ රටේ වියදම් කරපු ඩොලර් ප්‍රමාණය ඩොලර් 178ක් වෙනවා. හැබැයි, 2025දී ඒ විධියට වියදම් කරපු ඩොලර් ප්‍රමාණය ඩොලර් 140යි. ඒගොල්ලන් වියදම් කළ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ මදිවාට 2025දී සංචාරක ව්‍යාපාරය හරහා මේ රටින් ආපසු පිටට ගිය ඩොලර් ප්‍රමාණය බිලියන 1.3ක්; US Dollars 1.3 billion has gone back. ඒ කියන්නේ එන සංචාරකයින් මෙහෙන් සල්ලි අරගෙන ගිහිල්ලා වාගේ, US Dollars 1.3 billion ආපසු ගිහිල්ලා; net income එක අඩුයි. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මට පෙනෙන්නේ ලංකාවට මේ දවස්වල එන සංචාරකයින් හරියට ජේවීපී එකේ මන්ත්‍රීවරුන් වාගෙයි. දැන් ජේවීපී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හැටි බලන්න. ඒගොල්ලන් ගමකට ගියාම කරන දේවල් බලන්න. අපි ගියාම ගම්වල අය ඒ ගැන කියනවා නේ. ඒ අය ගමේ තිබෙන කෙසෙල් කැන් ටික කපා ගන්නවා, පැපොල් ගෙඩිය කඩා ගන්නවා, පොල් ගෙඩිය කඩා ගන්නවා, ගමේ මිනිහාගෙන් underwear එක ඉල්ලා ගන්නවා, ෂර්ට් එක ඉල්ලා ගන්නවා. අන්තිමට ගමේ ඉන්න කෙනාගේ වත්කම් ටිකත් නැහැ; අඩු වෙලා. දැන් පිටරටින් එන සංචාරකයොත් ඒ වාගෙයි. ඒ අය ලංකාවට ආවාම ගම්වලට ගිහිල්ලා ගජේ ගහනවා, ඒ ගෙවල්වල ඉන්නා මිනිස්සුන්ගෙන් කීයක් හරි ගන්නවා, ගමේ ඉන්නා මිනිහාගෙන් ඉල්ලා ගෙන මොනවා හෝ කනවා. ඒ අය බස් එකේ නැඟලා යනවා. එහෙම ඒ අය කීයක් හරි එකතු කරගෙන; මේ රටේ තිබෙන සල්ලි ටික අරගෙන යනවා. ඒක තමයි මේ දත්තවලින් පෙන්වන්නේ. ඒ වුණාට මේ ගැන මහ ලොකුවට කයිය ගහනවා, මෙච්චර වැඩි වුණා, අච්චර වැඩි වුණා කියලා. නමුත් මේක තමයි යථාර්ථය.

ඊළඟට, ඉතා බැරෑරුම් කරුණු කිහිපයක් පිළිබඳව මම කථා කරන්න කැමැතියි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය ගත්තාම ඒකේ හැඳින්වීම අපැහැදිලියි. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් කියන්නේ කුමක්ද කියන එක හරියට හඳුනා ගන්නේ නැහැ. අද ගෙනෙන රෙගුලාසිවලින් ඔබතුමන්ලා විදේශීය ආයෝජකයන්ට අවුරුදු 10ක බදු විරාමයක් ලබා දෙන්නට කටයුතු කරනවා. හැබැයි, මේ රටේ ඉන්නා දේශීය කර්මාන්තකරුවාගෙන්, දේශීය අපනයනකරුවාගෙන්, මේ රටේ දේශීය ව්‍යාපාරිකයාගෙන් අද

වන විට බදු පිට බදු අය කරන්න පටන් ගෙන තිබෙනවා. ඔබ අදත් බදු කීපයක් වැඩි කරනවා. ගෝලීය මට්ටමේ යුද්ධයක් තිබෙන වෙලාවක, මේ රටේ තෙල් මිල වැඩි වෙලා තිබෙන අවස්ථාවක, ඒ වාගේම විදුලිය පිරිවැය වැඩි වෙලා තිබෙන අවස්ථාවක, ප්‍රවාහන ගාස්තු වැඩි වෙලා තිබෙන අවස්ථාවක, පොලී අනුපාතය වැඩි වෙමින් යන අවස්ථාවක මේ දේශීය කර්මාන්තකරුවන්ට, ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට උදවු කරන්න ඕනෑ වෙලාවක ඔබ බදු වැඩි කරනවා.

ඊළඟට, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - SSCL එක - සම්බන්ධව ගත්තොත්, ඒක අනුක්‍රමික බද්දක්; it is a cascading tax. අන්තිමට ඒක පාරිභෝගිකයාට බරපතළ විධියට වදිනවා. අද ඔබ ඒ ක්‍රමවේදයත් වෙනස් කරනවා. එතකොට ඒකෙන් ජනතාවට ලොකු දිනුමක් නැහැ. ඊළඟට, ඔයගොල්ලන් VAT එකට කරන්නේ මොකක්ද? ඒ ලියාපදිංචි සීමාව - threshold එක - වෙනස් කරලා රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 36 දක්වා අඩු කළා. ඒකෙන් මොකක්ද වෙන්නේ? ගමේ තිබෙන සිල්ලර කඩ හිමියාටත්, එහෙම නැත්නම් එළවලු කඩ හිමියාටත්, මස් කඩ හිමියාටත්, මාළු කඩ හිමියාටත් VAT ගෙවන්න වෙනවා. ඒකත් බලපාන්නේ මේ රටේ පාරිභෝගිකයන්ට. ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සර පේළියේ ඉන්නා ගරු ඇමතිවරුන්ගෙන් මම අහන්නේ මේකයි. මේ රට බංකොලොත් වෙනකොට, මේ රට ආපසු නැඟිට්ටවන්නට විදේශ ආයෝජකයන්ද ආවේ, එහෙම නැත්නම් අපේ දේශීය ව්‍යාපාරිකයන්ද ආවේ? ඡන්දය කාලයේ ඔබතුමන්ලාට -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Hon. Speaker will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මම කියමින් සිටියේ මේකයි. ඡන්දය කාලයේ ඔබට කඩේ ගියේ, ඔබට ඡන්දය දුන්නේ විදේශ ආයෝජකයන්ද, එහෙම නැත්නම් අපේ දේශීය ව්‍යාපාරිකයන්ද? ඒ වාගේම භාණ්ඩාගාරයේ තිබෙන බදු සල්ලි ටිකට දායක වුණේ විදේශ ආයෝජකයන්ද, නැත්නම් මේ රටේ දේශීය ව්‍යාපාරිකයන්ද? හොඳට හිතා බලන්න. නමුත් ඔබතුමන්ලා වැඩ කරන්න උදවු කරන්නේ කාටද කියන එක මේකෙන් පැහැදිලියි.

මේ ආණ්ඩුව දේශීය කර්මාන්තකරුවන්ට කරන අපරාධය, හිංසාව පිළිබඳව මම පොඩි, සරල උදාහරණයකින් පැහැදිලි කරන්න කැමැතියි. උදාහරණයකට බීඩි කර්මාන්තය ගන්න. බීඩි කර්මාන්තය කියන්නේ කුඩා මට්ටමේ තිබෙන කර්මාන්තයක්; ගම් මට්ටමේ තිබෙන කර්මාන්තයක්. හැබැයි, විශාල පිරිසක් මේ කර්මාන්තය ජීවනෝපාය මාර්ගය විධියට භාවිත කරනවා. විශාල ප්‍රමාණයක් ඒ තුළ ඉන්නවා. බලන්න, ඒ කර්මාන්තයට මොකක්ද වෙන්නේ? තෙන්දු කොළවලට අය කරන ආනයන බද්ද වැඩි කර තිබෙනවා. තෙන්දු කොළ කිලෝවකට රුපියල් 6,700ක් අය කරනවා. 2024දී බීඩියකට අය කළේ රුපියල් දෙකයි. මේ ආණ්ඩුව ආපු ගමන් - ජේවීපී ආණ්ඩුව ආපු ගමන් - 2025දී බීඩියක මිල රුපියල් තුනක් කළා; ඒක වැඩි කළා. සුරාබදු දෙපාර්තමේන්තුවෙන් දැන් මොකක්ද කරන්නේ? අපේ පැතිවල විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් මේ කර්මාන්තය තුළින් ජීවත් වෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ගිහිල්ලා බීඩි කර්මාන්තයේ නියැළෙන තැන්වලට බලෙන් පැනලා රාජ්‍ය ත්‍රස්තවාදය මෙහෙයවනවා වාගේ පොලීසියත් අරගෙන, තුවක්කු අරගෙන ගිහිල්ලා බල කරලා අය කිරීම් කරනවා. සමහර වෙලාවට රුපියල් කෝටි 10ක්, 15ක් දඩ ගහනවා. ඒ මිනිස්සුන්ට දැන් ඒ කර්මාන්ත කරන්නත් බැහැ. එහි ප්‍රතිඵලය බැලුවොත්, සුරාබදු දෙපාර්තමේන්තුවම කියනවා, 2024දී බලපත්‍ර 1,140ක් තිබුණා, 2025 වෙනකොට ඒක බලපත්‍ර 840කට අඩු වෙලා තිබෙනවා කියලා. ඒ දේශීය කර්මාන්තය විනාශ කරගෙන යනවා, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිවලින්. ඔබතුමන්ලා හිතන්න, ග්‍රාමීය මට්ටමේ ඇඟලුම් කම්හල් වැහෙනකොට, ඇඟලුම් කම්හල්වල රස්සාවල් නැති වෙනකොට, ගම්වල ඉන්න තරුණ තරුණියන්ට ආදායම් මාර්ග නැති වෙනකොට අම්මලා ගෙවල්වල ඉඳගෙන බීඩි ඔතලා දවසකට රුපියල් 2,000ක්, 2,500ක් උපයා ගන්නවා. ගෙදර මාසයේ වියදම ගෙනියන්නේ ඒකෙන්. සමහර වෙලාවට එක බීඩි කොම්පැනියක 200ක්, 300ක් සේවය කරනවා. එතකොට ඒ සේවය කරන 200ක්, 300ක් දෙනාට බදු විරාම නැහැ. ඔවුන්ට නැති වෙන්න බදු ගහනවා සුරාබදු දෙපාර්තමේන්තුවෙන්. හැබැයි ඔබතුමන්ලා විදේශිකයන් සියදෙනෙක් තමන්ගේ කර්මාන්තශාලාවට බඳවා ගන්නවා නම්, ඒ සියදෙනාට අවුරුදු 10ක බදු විරාමයක් දෙනවා කියනවා. විදේශිකයන්ට අවුරුදු 10ක බදු විරාමයක් දෙනවා. කුඩා කර්මාන්තයක වැඩ කරන 200කට, 300කට නැති වෙන්න බදු ගහනවා. එතකොට මොකක්ද ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Could you give me one more minute, Sir? I will finish.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ඊළඟට, සිගරැට් බද්ද ගන්න. හරි විධියට බැලුවොත්, ඔබතුමන්ලාගේ අය කිරීම අනුව; මිල සූත්‍රය පාවිච්චි කරපු නැති නිසා රුපියල් බිලියන 9.4ක් ගිය වසරේ පාඩු වුණා. සිගරැට්වලට tax-in-price කියලා තිබෙනවා. සිගරැට්වලට අය කළ tax එක, ඒ කියන්නේ සිගරැට් මිලෙන් රජයට එන බදු ප්‍රතිශතය යහ පාලන රජය කාලයේ සියයට 74යි. ජේවීපී ආණ්ඩුව ආවාට පස්සේ ඒක සියයට 68කට අඩු වුණා. ඒ කියන්නේ සිගරැට් එකෙන් අය කරන බදු ප්‍රතිශතය අඩු කරලා තිබෙනවා.

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

[ගරු කබීර් හෂීම් මහතා]

ජනාධිපතිතුමාත් මේ සභාවේ ඉන්නවා. එතුමාත් මේක අහගන්න එක හොඳයි. හැබැයි ගිය වසරේ ඉදිරිපත් කරපු අය වැයෙන් සිගරැට්වල බද්ද වැඩි කළා. හැබැයි ඒ වැඩි කරපු බද්දෙන් වැඩි වාසියක් ලැබුණේ කොම්පැනියට. ඒකෙන් සිගරැට් කොම්පැනිවලට ආදායම වැඩි වුණා. ඔවුන්ගේ සාක්කුවට වැඩි මුදල ප්‍රමාණයක් ගියා. රජයට ආපු ප්‍රතිශතය අඩුයි. මේකෙන් මොකක්ද පේන්නේ? මේකෙන් පැහැදිලිව පේනවා මාෆියාව රකින්නේ කවුද, කොහෙන්ද කියන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා.

මම කියන්නේ මේකයි. නිර්ප්‍රභූ පන්තිය නියෝජනය කරනවා කියලා හැම වෙලාවේම කියන, ජනතා ආණ්ඩුව කියලා කියන මේ ආණ්ඩුව ඇත්තටම රකින්නේ කවුද කියන එක ඔබතුමන්ලා මේ ගේන ප්‍රතිපත්තිවලින්ම ඕනෑ කෙනෙකුට පැහැදිලිව තේරෙනවා. මේ ගේන රෙගුලාසිවලදි විදේශිකයන්ට දෙන මේ බදු විරාම පිළිබඳව කිව්වොත්, හරියට මේ ආණ්ඩුව හැසිරෙන්නේ වෛශ්‍යා ස්ත්‍රියක් තමන්ගේ ගනුදෙනුකරුවන් එක්ක කටයුතු කරන ආකාරයටයි.

Finally, my view, Hon. Speaker, is that foreign investment is essential, but it need not be based on tax holidays. What is needed is, firm investment and a trade policy with consistency, a strong legal framework, an independent Judiciary and rule of law in the country. Absolute security of investment should be made accommodating foreign exchange laws, with implementation of National Single Window systems, access of the Madrid Protocol et cetera. Those are the changes needed to bring investments into the country and not tax holidays.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපතිතුමා.

[අ.භා. 12.03]

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම වර්තමාන යුදමය තත්ත්වයත් එක්ක මතු වෙලා තිබෙන තත්ත්වය හමුවේ අපේ රටේ ක්ෂේත්‍ර ගණනාවක් යම් පීඩාකාරී තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා රජයක් හැටියට අපේ වගකීම තමයි, ඒ පීඩාකාරී තත්ත්වයට පත් වන ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරලා යම් සහනශීලී වැඩසටහනක් ආරම්භ කිරීම. ඒක තමයි, වඩාත් යෝග්‍ය කියලා අපි කල්පනා කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට විසඳුම් සෙවීමේදී අපේ ප්‍රවේශ මාර්ගය මොකක්ද කියලා බැලුවොත්, අපි ආකාර දෙකකට කල්පනා කරනවා. විශේෂයෙන්ම මේ අර්බුදය මතු වෙන තැන් දෙකක් තමයි ඉන්ධන සහ විදුලිය, බලශක්ති ක්ෂේත්‍රයේ, ගෑස්. එතකොට අපිට මෙහිදී දෙවිධියකට කටයුතු කරන්න පුළුවන්. මට මතකයි, පක්ෂ නායක රැස්වීමේදී රවී කරුණානායක මන්ත්‍රීතුමා යෝජනා කළා, ඉන්ධන පිරිවැයට ගළපා විකුණන්න අයිතිය දෙන්න කියලා. ඒක එක ක්‍රමයක්. මොකද, විදුලිබල මණ්ඩලය සහ තෙල් සංස්ථාව අධික ලෙස පාඩු ලැබීමේ ප්‍රතිවිපාකවලට භාණ්ඩාගාරයක්, රටක් හැටියට අපි මුහුණ දුන්නා.

ඒ නිසා අපි ඉන්ධන පිරිවැයට ගළපා market එකේ ඉන්ධන විකුණන්න ඕනෑ. ඒක එක යෝජනාවක්. දෙවැනි යෝජනාව තමයි, ඉන්ධන පිරිවැයටම ගළපන්නේ නැතුව යම් සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මේවා තමයි අපට තිබෙන යෝජනා දෙක. අප පළමුවැනි යෝජනාව ක්‍රියාත්මක කළොත්, මා හිතන විධියට මහා භාණ්ඩාගාරයටත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටත්, ලංකා විදුලිබල මණ්ඩලයටත් බලපෑමක් ඇති වන්නේ නැහැ. මොකද, අපි ඉන්ධන මිල පිරිවැයට අනුව ගළපනවා. හැබැයි අපේ ආර්ථිකයට, කර්මාන්තකරුවන්ට, ව්‍යාපාරිකයන්ට හා සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතයට බලපෑමක් ඇති වෙනවා. එම නිසා අප මෙහි තුලනාත්මක තැනක් සොයා ගත යුතුව තිබුණා. මොකද, ඉන්ධන මිල ඉහළ යෑම අනුව market price එකට දැන් ගියොත් ඩීසල් ලීටරයක් රුපියල් 600 ඉක්මවනවා. ඒ රුපියල් 600 ඇතුළේ රුපියල් 50ක Excise Duty එකත් තිබෙනවා. මම දැක්කා ගොඩක් අය අපට යෝජනා කරනවා, ඒ රුපියල් 50 duty එක මුළුමනින්ම අයින් කරන්න කියලා. ඒකත් හොඳයි. හැබැයි, ඒ බද්ද අයින් කළොත් රුපියල් 50කින් තමයි ඩීසල්වලට බලපෑමක් ඇති වන්නේ. මොකද, රුපියල් 50ක Excise Duty එකක් තිබෙන්නේ. නමුත්, අප කල්පනා කළේ ඒක නොවෙයි. අප කල්පනා කළේ, බද්ද එසේම තිබියදී අලෙවි වන හැම ඩීසල් ලීටරයකටම රුපියල් 100 දක්වා මුදලක් මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන්නයි. ඒ කියන්නේ, ඉන්ධන පිරිවැයට අනුව ගළපනවා; එළඹෙන මැයි මාසයේ 01වැනි දා ගළපනවා. ඒ ආසන්න දිනයකදී අපි නැවත ඉන්ධන පිරිවැය ගාස්තු ගෙනෙනවා. ඒ පිරිවැය ගාස්තුව ගණනය කරන්නේ ඊට පෙර මාසයේ තිබෙන ඇත්ත දත්ත මත. එතකොට ඊළඟ ඉන්ධන ගැළපුම් ගාස්තුවේදී අපට කරන්න පුළුවන්, ඇත්ත ගාස්තුවට ගණනය කරලා ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 100 දක්වා සහනාධාරයක් දෙන්න; පෙට්‍රල් ලීටරයක් සඳහා රුපියල් 20 දක්වා සහනාධාරයක් දෙන්න. ඒ සඳහා මාසයකට රුපියල් බිලියන 20ක් යන බව අපි ගණනය කර තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 2,000ක් වැය වෙනවා. අපි මාස තුනක් සඳහා එම යෝජනාව සකස් කරලා තිබෙනවා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු ජනාධිපතිතුමනි, පොඩි ප්‍රශ්නයක් අහන්නම්. එය අදාළ පිරිස් ඉලක්ක කරගෙන කළා නම් හොඳ නැද්ද?

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඔබතුමා කියන එක හරි, ගරු මන්ත්‍රීතුමනි. ඒ කියන්නේ, ඉලක්ක සහගත ප්‍රජාවට. මූලධර්මයක් හැටියට ඔබතුමා කියන ස්ථාවරයේ අපි ඉන්නවා. මූලධර්මයක් හැටියට, අපි සහනාධාර

ලබා දිය යුතු වන්නේ ඉලක්ක සහගත ප්‍රජාවටයි. එහෙම නැත්නම්, අප ඩීසල් ලීටරයක් සඳහා ඉන්ධන සහනාධාරයක් දුන්නාම, සාමාන්‍ය පරිභෝගිකයෙකු ලබා ගන්නේ ඩීසල් ලීටර් 10යි නම්, ඔහුට ආණ්ඩුවෙන් ලැබෙන්නේ රුපියල් 1,000ක සහනාධාරයක්. හැබැයි, යම් කෙනෙක් අධිකව ඩීසල් භාවිත වන වාහනයක් පාවිච්චි කරනවා නම්, ඔහු ඩීසල් ලීටර් 100ක් එම වාහනයට ගහනවා නම්, ඔහුට ලැබෙනවා රුපියල් 10,000ක සහනාධාරයක්. නමුත්, අපට ඒකට හරිම දත්ත සහිත ක්‍රමවේදයක් නැහැ. ඒ අනුව තමයි අප තීරණය කළේ, සුපර් ඩීසල් සහ සුපර් පෙට්‍රල් වෙළෙඳ පොළ මිලට ගළපන්න. එතකොට, එතැන තිබෙනවා එක නිර්ණායකයක්. සුපර් ඩීසල් සහ සුපර් පෙට්‍රල් පාවිච්චි කරන්නේ ඔබ කියන ලද සහනාධාර අපේක්ෂා නොකරන ජන ප්‍රජාවයි කියලා අපි අපේක්ෂා කරනවා. ඒ අනුව, අපි සුපර් ඩීසල් සහ සුපර් පෙට්‍රල් වෙළෙඳ පොළ මිලට ගළපනවා. හැබැයි, ඉතුරු එක අපට ගළපන්න බැහැ. ඒ නිසා අපි ආකාර කිහිපයක්ම ගැන හිතුවා, "ත්‍රීවිලර්වලට පමණක් සහනාධාරය දෙමුද, අනෙක් ඒවාට නැතුව" ආදි වශයෙන්. නමුත්, කොහොමද අපි එය තීරණය කරන්නේ? අපට එය තීරණය කරන්න බැහැ. එම නිසා අපි පොදුවේ තීරණයක් ගත්තා, සෑම ඩීසල් ලීටරයකටම රජය රුපියල් 100ක වියදමක් දරන්න. ඒ සඳහා රුපියල් කෝටි 2,000ක් වැය වෙනවා, එක මාසයකට. අපි දැන් එය මාස තුනකට සැලසුම් කරලා තිබෙනවා. අපි ඩීසල් සහ පෙට්‍රල් සහනාධාරය සඳහා රුපියල් කෝටි 6,000ක් වෙන් කරනවා, එම බර මුළුමනින්ම ජනතාව පිට දාන්නේ නැතුව. ඒක වැදගත්.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඊළඟට ඔබතුමා කියපු කාරණය. ඒ තමයි තෝරා ගත්තු ජන ප්‍රජාවන්. ඒ ගැනත් අපි කල්පනා කළා. තෝරා ගත්තු ජන ප්‍රජාවන් ඉන්නවා. විශේෂයෙන්ම ඉන්ධන තමන්ගේ ආර්ථිකයේ ප්‍රධාන කාර්යයට අදාළ අවශ්‍යතාවක් බවට පත් කරගෙන තිබෙනවා, ධීවර ජනතාව. අපි කල්පනා කළා අර සහනාධාරයට අමතරව ධීවර ජනතාවට තවත් සහනාධාරයක් දිය හැකිද කියලා. සාමාන්‍ය එන්ජින් සහිත බෝට්ටුවකට පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් කියන කවර ඉන්ධනයක් පාවිච්චි කළත්, රජය ලබා දෙන රුපියල් 100ක සහනාධාරයට අමතරව තවත් රුපියල් 50ක අඩුවීමක් ධීවර ජනතාවට ලබා දෙන්න තීරණය කළා. මොකද, ඉන්ධන ප්‍රභේද හඳුන්න ගියොත් අපි අසීරුතාවකට පත් වෙනවා. සාමාන්‍ය බෝට්ටුවකට දවසකට ලීටර් 25 ගණනේ දවස් 25කට ලීටර් 625ක් ලබා දෙනවා, රුපියල් 50ක් අඩුවට. ඒ රුපියල් 50 ආණ්ඩුව විසින් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට එවනවා. ඒ සාමාන්‍ය බෝට්ටු හිමියන්ට මාසයකට රුපියල් 31,250ක් ලැබෙනවා. අපි එය මාස 3කට ලබා දෙනවා. ඒ, අප ඉලක්ක සහගතව ලබා දෙන අර කියපු සහනාධාරයට අමතරවයි.

ඒ වාගේම, බහුදින යාත්‍රා ගැනත් කියන්න ඕනෑ. ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා, තිබෙනවාද බහුදින යාත්‍රාවක්?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඔව්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
සාමාන්‍යයෙන් බහුදින යාත්‍රාවක් මාස 3කට එක සැරයක් වාගේ තමයි දියඹට දියත් කරන්නේ. එහෙම නේද? ඒ නිසා අපි කල්පනා කරලා තිබෙනවා ඒ මාස 3 ඇතුළත බහුදින යාත්‍රාවක් සඳහා එක වරකට - එක වරයි වැටෙන්නේ - රුපියල් 150,000ක ඉන්ධන දීමනාවක් ලබා දෙන්න. සෘජුවම ඉන්ධන එක්ක සම්බන්ධ වන කර්මාන්තයට අදාළ පොදු සහනාධාරයට අමතරව ධීවර ජනතාව ඉලක්ක කර ගත්තු සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නත් අපි අපේක්ෂා කරනවා.

ඊළඟට, ප්‍රධාන ප්‍රශ්නය පැන නඟින්නේ මේ හා බැඳුණු පොහොර පිළිබඳවයි. විශේෂයෙන්ම යූරියා. යූරියා සම්බන්ධයෙන් මුහුණ දීලා තිබෙන ප්‍රශ්නය මේකයි. දැනට පරණ මිලට ගෙනාපු පොහොරවලින් සැලකිය යුතු ප්‍රමාණයක් අපේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව තිබෙනවා. පරණ මිලට ගෙනාපු පොහොර මෙට්‍රික් ටොන් 14,000ක් අප සතුව තිබුණා. ඒ වාගේම, සමාගම් සතුවත් තිබුණා. මම ඒ සමාගම්වලටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, ආරම්භක සාකච්ඡාවේදී ඒ සමාගම් සියල්ල එකඟ වුණා තමන් සතුව තිබෙන යූරියාවලින් සියයට 65ක් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පැරැණි මිලට ලබා දෙන්න. ඊට අමතරව, අප නැවත සාකච්ඡාවක් කළාට පසුව, ඔවුන් සතුව තිබෙන, පැරැණි මිලට ගෙනාපු සියලු පොහොර අපට ලබා දෙන්න එකඟතාව පළ කළා. එතකොට ඒ යූරියා ප්‍රමාණය - එනම්, අප සතුව තිබුණු සහ පෞද්ගලික අංශයෙන් අප විසින් ගන්නා ලද යූරියා ප්‍රමාණය - අපට වී ගොවිතැන සඳහා නම් මුර දෙකකට ප්‍රමාණවත්. හැබැයි, තුන්වැනි මුරය සඳහා අපි අධික මිලට පොහොර ගත යුතුව තිබෙනවා.

ඊයේ නැවක් ආවා. ඒ නැවෙන් ව්‍යාපාරිකයෝ හතර දෙනෙක් පොහොර ගෙනාවා. ඒ හතර දෙනාගේ මිල ගණන් තිබුණේ හතර මට්ටමක. අඩුම මිල තිබුණේ මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 680ටයි. ඩොලර් 680 සිට ඩොලර් 850ක් දක්වා වන විවිධ මිල ගණන්වලට තිබෙනවා. ඒ අනුව, තුන්වැනි මුරය වනකොට පොහොරවල මිල ඉහළ යාමේ අනතුරක් තිබෙනවා. ඒ නිසා අපි තීරණය කළා, තුන්වැනි මුරයටත් දැනට ලබා දෙන රුපියල් 10,200ටම පොහොර ලබා දෙන්න; අර කියපු සමාගම්වලින් අපේ ආණ්ඩුව පොහොර අරගෙන රුපියල් 10,200 ස්ථාවර මිලකට ලබා දෙන්න. එතකොට සමාගම්වල මිල අධිකයි. මම හිතනවා සාමාන්‍යයෙන් රුපියල් 13,500ක්, රුපියල් 14,000ක් විතර වේවි කියලා. ඒවා ආණ්ඩුව විසින් අරගෙන රුපියල් 10,200ක මිලකට ලබා දෙනවා. එතකොට පොහොර මිටියකට රුපියල් 3,000ක අතිරේක පිරිවැයක් රජයට දරන්න සිදු වෙනවා. ආසන්න වශයෙන් ගත්තොත්, රුපියල් බිලියන 1.7ක් ඒකට වැය වෙනවා. මේ යල කන්නයට අදාළව වී ගොවිතැන සඳහා යූරියා ස්ථාවර කරනවා. ගොවි ජනතාවට පොහොර මිල ඉහළ යාමට අමතරව ඉන්ධන ගාස්තු ඉහළ යාමත් බලපා තිබෙනවා. ඉතින්, ඒකත් සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. හැබැයි, පොහොර සහනාධාරය ලබා දෙන්නේ ඉතාම හොඳ ක්‍රමවේදයකටයි. කුඹුරේ ඔවුන් වගා කරන භෝග මොනවාද? ඒ, වී ද? අතුරු භෝග ද? ඒ මත තමයි පොහොර නිර්දේශය දෙන්නේ. ඒ නිසා පොහොර නිර්දේශයම අපි සැලකිල්ලට භාජන කළා, තවත් අමතර සහනාධාරයක් ලබා දෙන්න. පොහොර තමයි මේ කියන සහනාධාරයට ලබා දෙන්නේ.

පොහොර තමයි නිර්ණායකය. ඔහු වී ද වගා කරන්නේ. වී වගා කරනවා නම්, දැනට තිබෙන පොහොර සහනාධාරය රුපියල් 25,000යි. ඔහු කුඹුරේ අතුරු භෝග වගා කරනවා නම්, දැනට තිබෙන පොහොර සහනාධාරය රුපියල් 15,000යි. නමුත්, ඒක ලබා දෙන්නේ කොහොමද? ඔවුන් වගා කරන භෝගය සහ භූමි ප්‍රමාණය මතයි. එතකොට ඒක යම් විධිමත් නිර්ණායකයක් වනවා, අනෙක් සහනාධාර ලබා දීමට. ඒ අනුව අපි තීරණය කළා, රුපියල් 25,000ට තිබෙන පොහොර සහනාධාරය රුපියල් 30,000ක් දක්වා වැඩි කරන්න. එවිට රුපියල් 5,000කින් පොහොර සහනාධාරය වැඩි වෙනවා. ඇත්තටම පොහොර සහනාධාරය තුළ ගැබ් වී තිබෙනවා, අනෙක් වියදම්. මොකද, අපි පොහොර රුපියල් 10,200ට දෙනවා නේ. නමුත්, අපි ඒක නිර්ණායකයක් ලෙස පදනම් කර ගත්තා, වී ගොවිතැන සඳහා රුපියල් 5,000ක් ලබා දෙන්න. විශේෂයෙන්ම යල කන්නයේ කුඹුරුවල අතිරේක භෝග වගා කරන ප්‍රමාණය වැඩියි. ඒ සඳහා රුපියල් 15,000ක පොහොර සහනාධාරයක් තමයි ලබා දෙන්නේ. අපි එය රුපියල් 18,000

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

දක්වා වැඩි කරන්න තීරණයක් ගත්තා. ඊට අමතරව, තේ වගාව සඳහා අපි දැනටමත් කුඩා තේ වතු හිමියන් සඳහා පොහොර මිටියකට රුපියල් 4,000ක දීමනාවක් ලබා දෙනවා. අපි පොහොර මිටියකට එකවරකට පමණක් තවත් රුපියල් 5,000ක දීමනාවක් අමතරව ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. මේ සියල්ල ගත්තාම ඒ වෙනුවෙන් අපට රුපියල් මිලියන 6,500ක් වැය වෙනවා. පොහොර සහනාධාරය සඳහා අපි ඒ රුපියල් මිලියන 600 වැය කරන්න කල්පනා කරනවා.

ඊළඟට ප්‍රධාන වශයෙන් අපි මුහුණ දීලා තිබෙන ප්‍රශ්නය තමයි, අඩු ආදායම්ලාභීන් කවුද, ඔවුන්ට අපි කොහොමද සහනාධාරයක් ලබා දෙන්නේ කියන ප්‍රශ්නය. අඩු ආදායම්ලාභීන් සම්බන්ධයෙන් අපට දැනට තිබෙන එකම නිර්ණායකය තමයි අස්වැසුම වැඩසටහන. ඒක පිළිබඳ යම් විවේචන තිබෙනවා. හැබැයි, යම් විවේචන තිබුණත් මේ වෙලාවේදී අපට අඩු ආදායම්ලාභීන් ලෙස තේරුම් ගන්න තිබෙන නිර්ණායක පද්ධතිය තමයි අස්වැසුම වැඩසටහන. දැනට රුපියල් 17,500 අස්වැසුම ප්‍රතිලාභය තිබෙනවා. රුපියල් 10,000 අස්වැසුම ප්‍රතිලාභය තිබෙනවා. රුපියල් 5,000 අස්වැසුම ප්‍රතිලාභය තිබෙනවා. ඒක තමයි දැනට තිබෙන විධිය. අපි තීරණය කරලා තිබෙනවා, අප්‍රේල් මාසයට පමණක් - මේ උත්සව මාසයත් එක්ක - රුපියල් 17,500 අස්වැසුම ප්‍රතිලාභය රුපියල් 25,000 දක්වා රුපියල් 7,500කින් වැඩි කරන්න; රුපියල් 10,000 අස්වැසුම ප්‍රතිලාභය රුපියල් 15,000 දක්වා රුපියල් 5,000කින් වැඩි කරන්න; සංක්‍රාන්ති අවධියේ ඉන්න අයට අස්වැසුම ප්‍රතිලාභය රුපියල් 2,500කින් වැඩි කරන්න. ඒ සඳහා අපි ඇස්තමේන්තු කරලා තිබෙනවා, රුපියල් මිලියන 8,500ක්. මේ මාසයේ ඒ සඳහා අතිරේකව එවැනි මුදලක් වැය කරන්න අපට සිදු වෙනවා.

ඊළඟට ගනිමු, විදුලිය බිලේ ප්‍රශ්නය. විදුලිය බිලේ ප්‍රශ්නය අපට ආකාර තුනකින් පැන නඟිනවා. එක ආකාරයක් තමයි, ජලාශවල ජල මට්ටම පහළ යෑම නිසා අපට වැඩිපුර තාප බලාගාරවලින් විදුලිය නිෂ්පාදනය කරන්න සිදු වී තිබීම. ඒක පළමුවැනි කාරණය. අපි මුහුණ දෙන දෙවැනි ප්‍රශ්නය මෙයයි. Furnace oil, naphtha සහ ඩීසල් යොදා ගන්නා බලාගාර ගත්තොත්, ඩීසල්, naphtha, furnace oilවල මිල ඉහළ යෑම. ඒක අපට බලපෑමක් ඇති කරනවා. ඊළඟට තමුන්නාන්සේලා හැම වෙලාවේම කියන ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නය. ඒක නිසා විදුලිය ඒකක යම් ප්‍රමාණයක් අඩුවෙන් නිෂ්පාදනය වෙන්නේ. ඒ විදුලිය ඒකක ප්‍රමාණය අනෙක් බලාගාරවලින් ගන්න යනකොට ඇතිවන අතිරේක වියදම තමයි තුන්වැනි කාරණය. මේ කරුණු තුන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපට අතිරේක වශයෙන් පැන නඟිනවා, බොරතෙල් - crude oil - ප්‍රශ්නය. බොර තෙල්වල තමයි අපට ප්‍රශ්නය තිබෙන්නේ. මම මීට කලිනුත් පාර්ලිමේන්තුවේදීත් ඒ ගැන කිව්වා. අපට ඈපේරාවලින් එන්න තිබුණේ, බොරතෙල්. අපි සිංගප්පූරුවෙන්, ඉන්දියාවෙන් පිරිසිදු කරපු තෙල් ගන්නවා. හැබැයි, අපට බොරතෙල් ගන්න තිබුණේ මැද පෙරදිග කලාපයෙන්. අපට බොරතෙල් එන්න තිබුණු නැවක් ප්‍රමාදයට ලක් වුණා. ඊට පස්සේ තව නැවක් එන්න තිබුණා. ඒකත් ප්‍රමාදයට ලක් වෙලා තිබෙනවා. අපි නැවේ ගමන් මාර්ගය පරීක්ෂා කරමින් ඉන්නවා. මේ මාසයේ - අප්‍රේල් මාසයේ - මැද භාගය වෙනකොට තමයි අපට බොරතෙල් නැවක් එන්නේ. ඒක නිසා පිරිපහදුව යම් අනතුරකට මුහුණ දෙනවා. අපට පිරිපහදුව දවස් කිහිපයක් වසා තබන්න සිද්ධ වේවි. පිරිපහදුවෙන් තමයි අපට අවශ්‍ය naphtha සහ furnace oil හැදෙන්නේ. බොරතෙල් ගෙනැල්ලා පිරිපහදු කරන කොට ඇතිවන naphthaවලින් සහ furnace oilවලින් තමයි අපේ බලාගාරවලට අවශ්‍ය naphtha සහ furnace oil සපයා ගන්නේ. අපි ඒ අනතුර කලින් දැකලා furnace oil වෙනම ආනයනය කරන්න තීරණයක් අරගෙන තිබුණා. බොහෝ දුරට 13, 15 වාගේ කාලය ඇතුළත furnace oil නැවක් එනවා. හැබැයි, අපි බොරතෙල්වලින් පිරිපහදු කරලා furnace oil ගන්න මිලට වඩා furnace oil ආනයනය කරන කොට මිල අධික වෙනවා. ඒ වාගේම අපට පිරිපහදුව යම් කාලයක් වසා තබන්න සිද්ධ වුණොත්, ඒ පිරිපහදුවෙන් අවශ්‍ය naphtha ප්‍රමාණය නිෂ්පාදනය වෙන්නේ නැත්නම් අපට ඒ බලාගාර ඩීසල්වලින් දුවන්න සිද්ධ වෙනවා. එහෙම නේ වෙන්නේ. හිටපු විදුලිබල ඇමතිවරයෙක් හැටියට රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ තත්ත්වය දන්නවා. නේද? එහෙම වුණාම සිදු වෙන දේ තමයි, අපේ විදුලිය බිලට අතිරේක බලපෑමක් වෙන එක. මම දැක්කා ගොඩක් අය -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සියයට 20ක් LPGත් නිෂ්පාදනය කරන්න පුළුවන්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඔව්, LPGත් නිෂ්පාදනය කරන්න පුළුවන්. දැන් ඒකත් ලැබෙන්නේ නැහැ. LPG නොලැබෙන කොට ඒක අපේ ගෑස් මිලට බලපෑමක් ඇති කරනවා. බොරතෙල් එන්නේ නැති නිසා තමයි ප්‍රශ්නයේ හිර වුණේ. බොරතෙල් අපි කෙළින්ම ගෙනෙන්නේ මැද පෙරදිග කලාපයෙන්. නමුත් ඒ වරායවලට පහර දෙන්න පටන් ගත්තා. ඒ නැව් මාර්ග අවහිර වෙන්න පටන් ගත්තා. එතකොට බොරතෙල් ආනයනය කර ගැනීම ඉතාම දුෂ්කර තත්ත්වයක්. අප්‍රේල් මාසයේ මැද භාගයේ අපි එක තෙල් නැවක් ගෙන්වා ගන්න LC open කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒක ලැබේවි කියලා විශ්වාසයක් අපට තිබෙනවා. බොරතෙල් හිඟ වීම නිසා naphtha සහ furnace oil නිෂ්පාදනය නොවෙන නිසා, සමහර වෙලාවට ඩීසල්වලින්ම විදුලිය නිෂ්පාදනය කරන්න සිද්ධ වෙනවා. එතකොට විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා යන පිරිවැය වැඩි වෙනවා. ඒ වාගේම, ඒ පිරිවැයට ආකාර කිහිපයක බලපෑම් තිබෙනවා. පළමුවැනි එක තමයි, ජලාශවල ජල මට්ටම පහළ යෑම නිසා ඉන්ධනවලින් විදුලිය නිෂ්පාදනය කිරීමේදී සිදු වන බලපෑම. දෙවැනි එක තමයි, ඉන්ධන මිල ඉහළ යෑම නිසා විදුලි බිලට ඇති වන බලපෑම. තුන්වැනි කාරණය, furnace oil සහ naphtha වෙනුවට ඩීසල් පාවිච්චි කරන්න සිදු වීම නිසා ඇති වන බලපෑම. ***හතරවැනි*** එක, අපි ගල් අඟුරුවලින් අපේක්ෂා කරන නිෂ්පාදනය සිදු නොවීම නිසා ඇති වන බලපෑම.

මා දන්නා විධියට, පෙරේදා නොරොච්චෝලේ විදුලි බලාගාරය සම්පූර්ණයෙන්ම වැඩ කරලා තිබෙනවා. එහෙම නේද ගරු ඇමතිතුමා? ඒ කියන්නේ, සාමාන්‍යයෙන් එම විදුලි බලාගාරයේ එක් ඒකකයකින් මෙගාවොට් 270ක් නිෂ්පාදනය වෙන්න ඕනෑ. එක් ඒකකයකින් මෙගාවොට් 270ක් නිෂ්පාදනය වුණා, තවත් ඒකකයකින් මෙගාවොට් 266ක් නිෂ්පාදන වුණා. පළමු ඒකකයෙන් නිෂ්පාදනය වුණේ මෙගාවොට් 244යි. කොහොමත් ඒක පහළ මට්ටමක තිබෙන්නේ. ඒ ප්‍රමාණය උච්චාවචනය වෙනවා. අපි එක දවසකට මෙගාවොට් 900ක් නිෂ්පාදනය කළ හැකි විදුලි බලාගාරයක් හැදුවාට, මෙගාවොට් 810යි අපට ලැබෙන්නේ. අභ්‍යන්තර කාර්යක්ෂමතාව වෙනුවෙන් අපට හැම ඒකකයකින්ම මෙගාවොට් 30 ගණනේ වැය වෙනවා. එතකොට, මෙගාවොට් 810ක් වාගේ ප්‍රමාණයක් තමයි නිෂ්පාදනය වෙන්නේ. එක් ඒකකයකින් මෙගාවොට් 270 ගණනේ නිෂ්පාදනය වුණාම තමයි ඒ මෙගාවොට් 810 ලැබෙන්නේ. සමහර අවස්ථාවල මෙගාවොට් 270ක් නිෂ්පාදනය

වෙන්නේ නැහැ. ඒක ඇත්ත. මේ ගල් අඟුරුවල ප්‍රමිතියේ ප්‍රශ්නයක් තිබෙනවා. එතැන කිසිසේත්ම ටෙන්ඩරයේ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. සැපයුම් සමාගම අපට නිවැරදි පරිදි සපයන්නේ නැතිකම තමයි තිබෙන ප්‍රශ්නය. ඒ කියන්නේ ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු නොමැතිකම.

ඒ විතරක් නොවෙයි, මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, ගල් අඟුරු ප්‍රමිතියෙන් යුතුද කියලා බලන්නේ මම හෝ වෙන කවුරුවත් කාලා හපලා නොවෙයි කියන එක. නියමිත පරීක්ෂණාගාරවලින් තමයි ඒක බලන්නේ. ගල් අඟුරු පැටවීමට පෙර එම පරීක්ෂණාගාරය අපට report එක එවනවා, ගල් අඟුරු පාස් කියලා. ඊට පස්සේ අපි අදාළ වටිනාකමින් සියයට 80ක් ගෙවනවා. ඉතිරි සියයට 20 ගෙවන්න පෙර අපි නැවත ඉන්දියානු පරීක්ෂණාගාරයකින් පරීක්ෂා කරනවා. මේ ඉන්දියානු පරීක්ෂණාගාරය තෝරා ගත්තේ 2023 වසරේ. පරීක්ෂා කළ අවස්ථා දෙකේදීම ඒ සමත් වීම සිද්ධ වෙනවා. නැව් තුනක ගල් අඟුරු අසමත් වෙලා තිබෙනවා. හැබැයි, අනෙක් ගල් අඟුරුවලට අදාළ පරීක්ෂණ වාර්තාවල සමත් වීමක් පෙන්වනවා. නමුත් විශේෂයෙන්ම බලාගාරයේ පසෙකින් තිබ්බත්, අපේ පද්ධති කළමනාකරණය පැත්තෙන් පැහැදිලිව කියනවා, අවශ්‍ය නිෂ්පාදනය ලැබෙන්නේ නැහැ කියලා. එම නිසා අපි සමහර ගල් අඟුරුවලට ඉතිරි සියයට 20 ගෙවීම අත්හිටුවලා තිබෙනවා. සමහර වාර්තාවලට යටත්ව penalty එකක් තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම, සමහර ගල් අඟුරුවලට අපි සියයට 80 ගෙවලාත් නැහැ. ඒ අනුව, ප්‍රමිතිය අඩු වීම හේතු කොටගෙන ගල් අඟුරුවලින් නිෂ්පාදනය කළ යුතු විදුලිය අපට ඩීසල්වලින් නිෂ්පාදනය කරන්න සිද්ධ වෙනවා. ඒ සඳහා වැය වන අතිරේක වියදමක් තිබෙනවා නම්, ඒ අතිරේක වියදම එම සමාගම හරහා අය කර ගන්නවා. කිසිසේත්ම එය මේ රටේ පුරවැසියන්ගේ ලයිට් බිලට එකතු කරන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. මේක අපේ ආණ්ඩුවක්. කොම්පැනිකාරයන්ගේ ආණ්ඩු තමයි ඒවා කරන්නේ. පළමුවැනි වර penalty එක බැලුවොත්, ඔවුන් අපට ආරම්භක නැවේ ටොන් එකක් දුන්නේ ඩොලර් 98ට. Penalty එක ආවාම ඔවුන්ගේ ටොන් එකක් ඩොලර් 64ට අඩු වෙනවා. ඇත්තටම ඒක විශාල penalty එකක්. අපි දඩ ගහනවා. ගෙවා ගන්න අසමත් වුණොත් නඩු යනවා. ඒවා පාරිභෝගිකයන්ගේ බිලට ඇතුළත් කරන්නේ නැහැ.

හැබැයි, ඉන්ධන මිල ඉහළ යෑම, naphtha සහ furnace oilවලින් නිෂ්පාදනය කරන විදුලිය ඩීසල්වලින් නිෂ්පාදනය කරන්න සිදුවීම, ජල මට්ටම පහළ යෑම වැනි අතිරේක සාධක නිසා විදුලි බිලට යම් බලපෑමක් ඇති වෙනවා. එතකොට අපි කල්පනා කරලා තිබෙනවා, අන්න එහෙම බිදුලි බිලට බලපෑමක් ඇති වෙනකොට මෙතුමා කියපු, තෝරගත්ත ඉලක්කසහගත ප්‍රජාවට සහනයක් ලබා දිය යුතුයි කියලා. මේ අප්‍රේල් මාසයේ පළමුවැනි දා සිදුවූ විදුලි බිල වැඩිවීම කිසිසේත්ම මේ තත්ත්වය මත සිදුවෙච්ච වැඩිවීමක් නොවෙයි. පෙබරවාරි මාසයේ පළමුවැනි දා කරන ලද උපකල්පනය මත තමයි අප්‍රේල් මාසයේ පළමුවැනි දා බිලට මේ බලපෑම ඇති කළේ. අප්‍රේල් මාසයේ පළමුවැනි දා සිදුවූ වැඩිවීම ගත්තොත්, ඒකක 30ට වඩා අඩු අයට මාසයකට රුපියල් පහළොවක වැඩිවීමක් වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ දවසකට ශත 50යි. ශත 50යි. හරිද? ඒ නිසා පන්දම් ටික පසුවට තියාගන්න හොඳේ. ඒවා දැන්ම ගන්න එපා.

ඊළඟ කොටසට රුපියලයි, දවසකට වැඩි වෙලා තිබෙන්නේ. ඊළඟ කොටසට දවසකට රුපියල් 1.50යි වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ විදුලි බිල වැඩිවීම කිසිසේත්ම මේ ඇති වෙන අර්බුදයත් එක්ක ඇති වෙච්ච වැඩි වීමක් නොවෙයි. හැබැයි, මේ අර්බුදයත් එක්ක මේවාට තැන් කිහිපයකින් බලපෑමක් එනවා කියලා අපි දකිනවා. ඒක මුළුමනින්ම විදුලිබල මණ්ඩලයට දරාගන්න කියන්න පුළුවන්. එහෙම නැත්නම් ඒක මුළුමනින්ම අපේ භාණ්ඩාගාරයට දරාගන්න කියන්න පුළුවන්. එහෙම නැත්නම් ඒක මුළුමනින්ම ජනතාවට දරාගන්න කියන්න පුළුවන්. ඒවා තමයි තිබෙන මාවත් තුන. අපි තීරණය කරලා තිබෙන්නේ මොකක්ද? ඒකෙන් යම් පංගුවක් ආණ්ඩුව දරා ගන්නවා; යම් පංගුවක් ජනතාව දරා ගන්නවා; තවත් පංගුවක් සමාගම දරා ගන්නවා. සමාගම දරාගන්න ඕනෑ පංගුව මොකක්ද? අර ප්‍රමිතියෙන් බාල ගල් අඟුරු නිසා වන පංගුව දරාගන්න ඕනෑ, ඒ සමාගම. දැන් නම් විදුලිබල මණ්ඩලය නොවෙයි, අපේ ජාතික ජනන සමාගම. නැහැ, සමාවෙන්න. ජාතික පද්ධති ක්‍රියාකරු සමාගම. එතකොට ජාතික පද්ධති ක්‍රියාකාරු සමාගම විසින් ඒ පංගුව දරාගත යුතුයි, ඒ සමාගම්වලින් අයකර ගැනීම මත. අපි තීරණය කරලා තිබෙනවා, ඒකක 90ට වඩා අඩුවෙන් ඉන්න අයට ඊළඟට විදුලි බිලේ ඇති වන වෙනස්කමකදී සහනාධාරයක් දෙන්න. ඒ සහනාධාරය සඳහා අපි වෙන් කරනවා, මසකට රුපියල් කෝටි 500ක්. ඒ සඳහා අපි මාස තුනකට වෙන් කරලා තිබෙනවා, රුපියල් කෝටි 1,500ක්.

දැනට ගණනයේ තිබෙන්නේ ආසන්න වශයෙන් රුපියල් බිලියන 32ක වාගේ පාඩුවක් මාස තුනකදී සිදු වේවි කියලායි. ඒ රුපියල් බිලියන 32න් රුපියල් බිලියන 15ක් ආණ්ඩුව දරා ගන්නවා. ආසන්න වශයෙන් රුපියල් බිලියන 7ක් අර ගල් අඟුරු ප්‍රශ්නය නිසා මතු විය හැකියි. එය අය කරගන්නවා. රුපියල් බිලියන 10ක් වාගේ -තුනෙන් එකක් වාගේ- පංගුවක් විදුලි බිලට ඇතුළත් විය යුතුයි. මේකයි ක්‍රමය. මට කවුරු හරි නැඟිටලා කියන්න, මීට වඩා වෙනස් ක්‍රමයක් ගැන. මතක තබාගන්න. මේ අර්බුද මේ විදියටම මතු වුණා, 2022දීත්. මම ඒ ගැන පොඞ්ඩක් කියන්නම්. රුපියල් 5,000 කොළ ගහලා බෙදුවා. අවස්ථා දෙකකදී විතර බෙදුවා නේ. ඊට පස්සේ මොකක්ද වුණේ? උද්ධමනය සියයට 70ට ගියා. විශාල ප්‍රමාණයක් මුදල් සංසරණය කරන්න market එකට එවන්න පටන් ගත්තා. අපටත් එහෙම බෙදන්න පුළුවන්. එහෙම බෙදුවොත් අනෙක් පැත්තත් බලන්න ඕනෑ. ඒ නිසා සියයට 70ට ගියා, උද්ධමනය. සියයට 33ට ගියා, පොලී අනුපාතිකය. සියයට 38ට ගියා, OD එක. ආණ්ඩුවේ බැඳුම්කර පොලිය සියයට 30 ඉක්මවා ගියා. නිසා ඒවා ඉතාම අක්‍රමවත්. අපි මොකක්ද කරන්න ඕනෑ? අපි උද්ධමනය දෙස බලන්න ඕනෑ, බැංකු පොලී අනුපාතික දෙස බලන්න ඕනෑ, ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව දෙස බලන්න ඕනෑ. ඒ අනුව භාණ්ඩාගාරයට දරාගන්න පුළුවන් ප්‍රමාණය දරන්න ඕනෑ. මේ ඔක්කොම දෙස බලමින් තමයි මේ විධිමත් ක්‍රමය හදලා තිබෙන්නේ. ඔබතුමන්ලාට මතක ඇති, අපි "දිට්වා" විනාශයේදී අතිරේක වශයෙන් රුපියල් කෝටි 50,000ක් මහජනතාවගේ වුවමනා වෙනුවෙන් යෙදෙව්ව බව. ඒවා තමයි ආණ්ඩු. එහෙමයි අපේ ආණ්ඩුව කටයුතු කළේ.

මේ ව්‍යසනයේදී අපි දැනට වෙන් කරලා තිබෙනවා, රුපියල් කෝටි 10,000ක්. රුපියල් කෝටි 10,000ක් මා මේ ඉදිරිපත් කරන ලද package එක ඇතුළේ තිබෙනවා. රුපියල් කෝටි 10,000ක්; රුපියල් බිලියන 100ක් මේ යෝජනා ඇතුළේ තිබෙනවා. මේ වෙලාවේ අපි ජනතාවට සහනයක් දිය යුතුයි. අපි ජනතාව බලාගත යුතුයි. ඒ වෙනුවෙන් අපට දරාගත හැකි ප්‍රමාණය වන රුපියල් බිලියන 100ක වැය ශීර්ෂයක් අපි දරලා තිබෙනවා, මාස තුනකට.

හැබැයි, මේ තත්ත්වය මීට වඩා වර්ධනය වෙනවා නම්; එහෙම වර්ධනය වුණොත් අපි නැවත තමුන්නාන්සේලා ළඟට එන්නම්. ඇවිල්ලා අපි යෝජනා ඉදිරිපත් කරන්නම්. අපට ඒක අනුමත කරලා දෙන්න. අලුතෙන් මුදල් ණයට ගැනීමකින්, අලුත් මුදල් සපයා ගැනීමකින් තොරව අපේ අය වැය ලේඛනය තුළින්ම තමයි මුළුමනින්ම මේ රුපියල් බිලියන 100 හොයා ගැනීම සඳහා අපි සැලසුම් කරලා තිබෙන්නේ. ඒ නිසා කිසිසේත්ම රට තුළ මුදල් සංසරණය වැඩි වෙන්නේ නැහැ. ආණ්ඩුවේ ණය පංගුව කිසිසේත්ම වැඩි වෙන්නේ නැහැ. ආණ්ඩුවට දෛනිකව market

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

එකෙන් ගන්න ඕනෑ බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වල අගය ඉහළ යන්නේ නැහැ. අගය ඉහළ ගියොත්, ඒකට පොලී අනුපාතිකය වැඩි වෙනවා. ඒ නිසා අපි සියයට 10ට වඩා යටින් පොලී අනුපාතිකය පවත්වාගෙන යන්න, උද්ධමනය සියයට 5ට වඩා යටින් පවත්වාගෙන යන්න බලනවා. ඩොලරය ගැනත් අපි බලන්න ඕනෑ. මම ඒකත් කියන්නම්. මේ තිබෙන ඉන්ධන පාවිච්චිය මේ විධියටම ගිහිල්ලා ඉන්ධන මිල ඉහළ ගියොත්, අපට මේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා ඉන්ධන ආනයනය වෙනුවෙන් අතිරේක වශයෙන් ඩොලර් බිලියන 1.5ක් වැය වෙනවා. එය අපේ economy එකට දරා ගන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. අවශ්‍ය කරන ප්‍රමාණයට අතිරේකව ඩොලර් බිලියන 1.5ක් වැය වෙනවා. එතකොට ඒක ඩොලරයට බලපෑමක් ඇති කරනවා. ඒ නිසා ඉන්ධන පාවිච්චිය සම්බන්ධයෙන් අපි තවත් පරිස්සම් විය යුතුයි.

ඉන්ධන මිල පමණක්ම නොවෙයි, පාවිච්චිය ගැනත් අපි කල්පනා කරන්නට ඕනෑ. ඒ ඔක්කෝම කල්පනා කරලා බලලා, ඉතාම විධිමත් ලෙස, ආර්ථිකය කිසිසේත්ම බණ්ඩනයකට පත් නොවන ලෙස, ජන ජීවිතය සාමාන්‍ය ආකාරයෙන් පවත්වාගෙන යමින්, ආර්ථිකය සාමාන්‍ය ආකාරයෙන් ඉදිරියට ගෙන යමින්, රජය රුපියල් කෝටි 10,000ක සහන පැකේජයක් යෝජනා කරනවා. ධීවර ජනතාවට, කෘෂි කර්මාන්තයේ යෙදෙන ජනතාවට, කුඩා තේ වතු හිමියාට, පොදුවේ සියලු ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලෙස, විදුලි සහනාධාරයක් ලෙස, ධීවර බෝට්ටුවට සහනාධාරයක් ලෙස, ගොවියාට පොහොර සහනාධාරයක් ලෙස, කුඩා තේ වතු හිමියාට පොහොර සහනාධාරයක් ලෙස, අස්වැසුම ප්‍රතිලාභීන්ට මූල්‍යමය සහනාධාරයක් ලෙස ඒ රුපියල් බිලියන 100 දෙන්න අපි යෝජනා කරලා තිබෙනවා. මේ තිබෙන තත්ත්වයට අනුරූපීව රුපියල් බිලියන 100 වැය කිරීමක් සහ යෝජනාවක් තිබෙන්නේ. මේ තත්ත්වය තවත් වෙනස් වෙනවා නම්, අපි තවත් ඒ පිළිබඳව සැලකිල්ලට භාජන කරන්න සූදානම්.

ඒ වාගේම අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මේ කාරණයත්. අපේ මූලික අවශ්‍යතාව තිබෙනවා අඛණ්ඩ බලශක්ති සැපයුමට. අඛණ්ඩ ඉන්ධන සැපයුමට අපි වගවීම භාර ගන්න ඕනෑ. දැනට තිබෙන සැලසුම් අනුව අපට මැයි මාසයේ අග දක්වා අඛණ්ඩව ඉන්ධන සපයන්න පුළුවන්. ඊළඟ කාරණය තමයි සහන මිලකට ඉන්ධන සැපයීම. ඒ සඳහා තමයි මේ යෝජනාව තිබෙන්නේ. මැයි අග දක්වා අඛණ්ඩව ඉන්ධන සැපයීමට. ඒක සහතික කරලා තිබෙනවා. මේ තත්ත්වය අනුව අපට පුරෝකථනය කරන්න පුළුවන් එච්චරයි. ඊට එහා පුරෝකථනය කරන්න බැහැ. මම හිතන විධියට ඒක මේ තිබෙන තත්ත්වය වර්ධනය වීමත් එක්ක බලන්න ඕනෑ. නමුත් කොහොමත් අපට ඊට පසුව - ඒ කියන්නේ දින 55ක් සඳහා තිබෙනවා - කොහොමත් අපේ ගබඩා පහසුකම් අනුව බලලා තමයි ඉතිරිය සඳහා සැලසුම හදන්න ඕනෑකම තිබෙන්නේ. එතකොට අපට තවත් දින 55ක් තිබෙනවා, මැයි මාසයෙන් ඔබ්බට සැලසුමට යන්න. දැන් අද මේ අප්‍රේල් මාසයේ 5 වැනිදා අපට සැලසුම තිබෙනවා, මැයි අග දක්වා ඉන්ධන සැපයුමට. ඒ නිසා අඛණ්ඩ ඉන්ධන සැපයුමට අපි වග කියනවා. ඒ වෙනුවෙන් ඉන්දියානු රජය - නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යතුමා - එක්ක මා කථා කළා. එහිදී මෝදි අග්‍රාමාත්‍යතුමා විශේෂයෙන් ඩීසල් සහ පෙට්‍රල් යම් ප්‍රමාණයක් අපට ලබා දෙන්න එකඟතාව පළ කළා. එතුමාටත් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අපි චීනයේ තානාපතිතුමා එක්ක සාකච්ඡා කළා. එතුමා මෑතකදී චීනයට ගිහිල්ලා චීන රජයත් එක්ක සාකච්ඡා කරලා ඇවිල්ලා අපව මුණ ගැහුණා. චීන රජයත් යම් ඩීසල් සහ පෙට්‍රල් ප්‍රමාණයක් අපට ලබා දෙන්න එකඟතාව පළ කරලා තිබෙනවා. විශේෂයෙන්ම රුසියාවත් එක්ක අපි ඉතාම ශක්තිමත් ගනුදෙනුවකට අවතීර්ණ වෙමින් තිබෙනවා. රුසියානු බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා ඉතා විගස ශ්‍රී ලංකාවට පැමිණියා. පසුගිය සතියේ රුසියානු නියෝජ්‍ය විදේශ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පැමිණියා. එතුමන්ලා එක්ක අපි සාකච්ඡාවක යෙදෙමින් සිටිනවා. ගෑස්, ගල් අඟුරු, ඉන්ධන, පොහොර පිළිබඳව සාකච්ඡාවක නිරත වෙමින් සිටිනවා. නමුත් ලෝක ස්වභාවය අපි කවුරුත් දන්නවා. මොන බැංකු හරහාද අපි ගනුදෙනු කරන්නේ, බැංකු සූදානම්ද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. ඒවා, අප පමණක් මුහුණ දෙන ප්‍රශ්න නොවෙයි. ජාත්‍යන්තර වශයෙන් මුහුණ දී තිබෙන ප්‍රශ්න. දැනට ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිතුමා ප්‍රකාශයට පත් කරලා තිබෙනවා,- මාර්තු මාසයේ 11වැනි දා ප්‍රකාශ කළා, අප්‍රේල් 11 වැනිදා දක්වා රුසියාවත් එක්ක ගනුදෙනු කරන්න අවශ්‍ය අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒක තවත් දීර්ඝ වෙනවාද, එතැනින් නතර වෙනවාද කියන්න අපි දන්නේ නැහැ. නමුත් අපි රුසියානු රජය එක්කත් ඉතාම ශක්තිමත් ගනුදෙනුවක් පවත්වාගෙන යන්න ඕනෑ. අපේ ප්‍රවාහන අමාත්‍යතුමා පසුගිය සතියේ රුසියාවේ සංචාරයක යෙදිලා, එහිදීත් බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා එක්ක සාකච්ඡාවක නිරත වුණා. ඒ අනුව අඛණ්ඩ බලශක්ති සැපයුම සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් මේ අවස්ථාවේදී අවශ්‍ය වන රාජ්‍ය තාන්ත්‍රික සහාය ලබා ගැනීම සඳහා අපි උපරිම වශයෙන් මැදිහත් වෙමින් තිබෙනවා. ඒ නිසා රජයක් හැටියට මේ වෙලාවේදී ගත හැකි පියවර ඉතාම විමසිලිමත්ව අපි ගන්නවා. තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන අදහස්වලට, පාර්ලිමේන්තුවෙන් පිටතදී ඉදිරිපත් කරන අදහස්වලට සවන් දෙමින්, ඒවා උරා ගනිමින් මේ පිළිබඳව අපි සැලකිල්ලට භාජන කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ජනාධිපතිතුමනි, රුපියල අවප්‍රමාණය වීම ගැනත්, -

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඔව්. රුපියල යම් ප්‍රමාණයකට අවප්‍රමාණයක් සිදුවී තිබෙනවා. මම බැලුවාම, ප්‍රධාන වශයෙන් ගත්තොත් අපේ විදෙස් සංක්‍රාමවල අඩුවීමක් සිද්ධ වෙලා නැහැ. විදෙස් සංක්‍රාම මාර්තු මාසයේ වැඩිවෙලා තිබෙනවා. හැම මාර්තු මාසයකටම වඩා වැඩියෙන් අපට මේ වසරේ මාර්තු මාසයේ විදෙස් සංක්‍රාම ලැබී තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ගත්තොත්, අපට සංචාරක කර්මාන්තයේ අවස්ථාව ආවේ අපේ season එක අවසන් වෙමින් තිබුණු වෙලාවක, මාර්තුවල. ඇත්තටම දැන් යුද්මය ගැටුම් කලාපයෙන් නොවෙයි, අනෙක් කලාපයෙන් තමයි අපට සංචාරකයින් එන්නේ. ඒ නිසා මාර්තු මාසයේ සංචාරකයින් ලක්ෂ 3ක් අපි අපේක්ෂා කළා නම් 150,000කට ආසන්න ප්‍රමාණයක් තමයි ඇවිල්ලා තිබෙන්නේ. සංචාරක කර්මාන්තයෙන් අපට ලැබෙන සංක්‍රාම පිළිබඳ ප්‍රශ්නය මතුවෙලා තිබෙනවා.

හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අපේ ඉතාම ඵලදායී සාකච්ඡාවක් තිබෙනවා. දැනටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කණ්ඩායම මෙහි ඉන්නවා. මම හිතන විධියට, ඔබතුමන්ලාටත් ආරාධනා කළා. විපක්ෂයේ නායකයින් හතරදෙනෙක් ඊට සහභාගි වුණා කියලා තමයි මට වාර්තා වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා ඒක ප්‍රතික්ෂේප කළාද, ඒක වර්ජනය කළාද කියන්න මා දන්නේ නැහැ. නමුත්, පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයින් එක්ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සාකච්ඡාවල නිරත වෙලා තිබුණා. මට වාර්තා වෙලා තිබෙන විධියට නායකයින් 4ක් හෝ 5ක් සාකච්ඡාවට සහභාගි වුණා කියලා තමයි කිව්වේ. මම

හිතන විධියට, ගරු කථානායකතුමා පක්ෂ නායකයින්ගේ ලොකු ලැයිස්තුවක් එවලා තිබුණා. නේද? ඒ ලැයිස්තුවම සහභාගි වුණේ නැහැ. මා දන්නේ නැහැ, ඉතින්. වර්ජනය කරන්න පුළුවන්. නේද? ඕනෑ දෙයක් කියන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. ඒක ඒ දේශපාලන පක්ෂවල අයිතිය. නමුත්, අපි ඔවුන් එක්ක ඉතාම ඵලදායී සාකච්ඡාවක නිරත වෙමින් සිටිනවා. අපි උත්සාහ කරනවා, බ්‍රහස්පතින්දා ඔවුන් එක්ක මාණ්ඩලික මට්ටමේ ගිවිසුම මෙහේදීම අත්සන් කරන්න. වෙනදා අපි සාකච්ඡා කරලා ගිහිල්ලා, මාණ්ඩලික මට්ටමේ ගිවිසුමට එළඹෙන්නේ එහේදී. අපි උපරිම උත්සාහ කරමින් සිටිනවා මේ බ්‍රහස්පතින්දා වෙනකොට මාණ්ඩලික මට්ටමේ එකඟතාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබා ගන්න. එහෙම එකඟතාව ලැබුණොත් අපට 5, 6 කියන වාරික දෙකම එකටම ලැබෙනවා. ඒ අනුව, මැයි මාසයේ අග වෙන්න පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට ඩොලර් මිලියන 700ක මුදලක්, 5 සහ 6 කියන වාරික දෙක එකටම ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවේ සභාපතිතුමා සහ නියෝජිත කණ්ඩායමත් පැමිණියා. අපි ඔවුන් එක්කත් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. ආසන්න වශයෙන් ගත්තොත්, ඔවුන් ඩොලර් බිලියන 1.2ක ප්‍රදානයන් කරන්න මේ වසර තුළ එකඟතාව පළ කර තිබෙනවා. එතකොට World Bank එකත් එක්ක අපි සකස් කරන ව්‍යාපෘති තිබෙනවා. ඒවායේත් යම් ඩොලර් ප්‍රමාණයක් පිළිබඳ අපේ අපේක්ෂාවන් තිබෙනවා. එතකොට මම හිතන විධියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව විසින් ලබාදෙන සහායන් එක්ක අපට විදෙස් සංචිතවල ප්‍රශ්නයක් මතු වීමේ අනතුර අඩුයි.

විශේෂයෙන්ම ගත්තොත්, මම ඔබතුමන්නාන්සේලාට කියන්න කැමැතියි, ලංකාවේ පළමු වතාවට පසුගිය ජනවාරි සහ පෙබරවාරි කියන මාස දෙකේ විතරක් අපේ මහ බැංකුව market එකෙන් ඩොලර් මිලියන 700ක් මිලදී ගෙන තිබුණු බව. ඒක ඉතාම වැදගත් දෙයක්. ඒ කියන්නේ, අපේ වෙළෙඳ පොළෙන් - market එකෙන් - ඩොලර් මිලියන 700ක් මිලදී ගෙන තිබුණා. ඒ අනුව අපේ ඩොලර් සංචිත ප්‍රමාණය බිලියන 7ක ආසන්නයට පැමිණියා. දැන් අපි market එකෙන් මිලදී ගන්න එක ටිකක් අඩුවෙලා තිබෙන්නේ. නමුත්, අපේ ණය වාරික ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි මිලදී ගත්තේ නැතුවාට ආණ්ඩුව සහ මහ බැංකුව විසින් ගෙවිය යුතු ණය වාරික ගෙවන්න ඕනෑ. ඒ ණය වාරික ගෙවනකොට පෙබරවාරි මාසයේ අග තිබුණු සංචිතවල යම් අඩුවීමක් මැයි මාසයේදී සිදු වීමේ ඉඩක් තිබෙනවා. නමුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට ලබාදෙන ඩොලර් මිලියන 700ක යෙදවුමත්, ආසියානු සංවර්ධන බැංකුව අප සමඟ ඇති වුණු එකඟතාවනුත් එකතු කරගත්තොත් විදෙස් සංචිත ප්‍රශ්නයට අපට මුහුණ දෙන්න පුළුවන්කම තිබෙනවා කියලා මම හිතනවා. ඒ වාගේම ලෝක පරිමාණයෙන් ගත්තත් ඒ අර්බුදයට පත්වන රටවල මුදල් ඒකකයේ යම් අවප්‍රමාණය වීමක් සිද්ධ වෙලා තිබෙනවා. ලෝක පරිමාණයෙන් සිද්ධ වෙලා තිබෙන ප්‍රතිශතාත්මක අගයන් ගත්තොත්, අපි තවම එතැන නැහැ. සමහර රටවල් එක්ක බැලුවොත් තුනෙන් එකකින් වාගේ තමයි අපේ අඩුවීම සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ඇති වන අර්බුදය විසින් මුළුමනින්ම අනෙක් රටවලට කර තිබෙන බලපෑමක් තිබෙනවා. ඒකෙන් අපටත් බලපෑමක් තිබෙනවා. අනෙක් රටවලට සාපේක්ෂව දැනට අපේ මුදල් ඒකකය අවප්‍රමාණය වීම අඩුයි. නමුත්, අපේ විදෙස් සංචිත ශක්තිමත් කර ගැනීම පිළිබඳ සැලැස්මක අපි ඉන්නවා.

මම හිතන විධියට, විශේෂයෙන්ම මේ උත්සව සමයේ යම් ප්‍රමාණයකට අපේ භාණ්ඩ ආනයනය කිරීමේ ප්‍රමාණය වැඩිවෙලා තිබෙනවා. අපි ඒකත් බැලුවා. නමුත්, 10වැනි දා පමණ වනකොට අපේ ආනයන වියදම්වල යම් අඩුවීමක් සිද්ධ වේවි කියලා අපි හිතනවා. ඊට පසු නැවත ආනයන වියදම් වැඩිපුර එන්න පටන් ගන්නේ මැයි මස මැද වාගේ. මම හිතන විධියට එතකොට අපට balance කරගන්න පුළුවන් වේවි. ඒ නිසා ඩොලරය කෙරෙහි සිද්ධ වන බලපෑම, - ඒ නිසා තමයි මම කිව්වේ, විශේෂයෙන්ම මේ ඉන්ධන මිල යහමින් ඉහළ යෑම නිසා ඉන්ධන සඳහා අපට ඩොලර් බිලියන 1.5ක විතර අතිරේක බලපෑමක් එනවා කියන එක. ඒ නිසා තමයි මම අපේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, අපි පුළුවන් තරම් පරිභරණය තව ටිකක් අඩු කරමු කියලා. පරිභරණය අඩු කරගන්න ප්‍රමාණයට අපට ඉන්ධන ආනයන වියදම අඩු කරගන්න පුළුවන්. වියදම අඩු කරගත්තොත් අපට මේ ඩොලර් බිලියන 1.5 ආසන්න වශයෙන් ඩොලර් බිලියනයක මට්ටමට ගේන්න පුළුවන්. මොකද, මේ විධියටම ගියොත් අතිරේක වැය බරක් දරනවිට ඒක අපේ ඩොලරයට අහිතකර බලපෑමක් වෙනවා කියලා අපි කල්පනා කරනවා. අපි ඒ පැත්තත් කල්පනා කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට මම කියන්න කැමැතියි, විශේෂයෙන්ම මෑතකදී මතු වුණු ගෑස් ප්‍රශ්නය පිළිබඳව. ගෑස් ප්‍රශ්නය ගත්තොත්, අපට අඛණ්ඩතාවෙන් යුතුව ගෑස් සපයන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, දැන් ප්‍රධාන ප්‍රශ්නය වී තිබෙන්නේ නැව් ගාස්තු සහ insurance ගාස්තු ඉහළ යෑමයි. එම ගාස්තු විශාල ලෙස ඉහළ ගිහින් තිබෙනවා. අපි මෑතකදී ඩීසල්වලට අදාළව ටෙන්ඩරයක් කැඳෙව්වා. ඒ තමයි, පසුගිය මාර්තු මාසයේ 17වන දා විවෘත කරපු ටෙන්ඩරය. ඒ ටෙන්ඩරයේ premium අගය ඩොලර් 45යි. සාමාන්‍යයෙන් අපේ premium අගය ඩොලර් දෙකත්, තුනත් අතර වාගේ ප්‍රමාණයක තමයි තිබුණේ. හැබැයි, මාර්තු 17වන දා අප ඉදිරිපත් කරපු ටෙන්ඩරයේ premium අගය ඩොලර් 45යි. මොකද, අවදානම වැඩි වුණාම insurance ගාස්තු වැඩි වෙනවා; නැව් ගාස්තු වැඩි වෙනවා; තරගය වැඩි වෙනවා; එය විසින් premium ගාස්තු ඉහළ යනවා.

ගෑස් සම්බන්ධවත් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ඒකයි. ගෑස් සම්බන්ධයෙනුත් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? මුහුද හරහා ගෑස් ප්‍රවාහනය කිරීමේදී තිබෙන අවදානම, ඉන්ධන ගාස්තු ඉහළ යෑම, නැව් ගාස්තු ඉහළ යෑම සහ රක්ෂණ ගාස්තු ඉහළ යෑම විසින් ගෑස්වලටත් යම් ප්‍රමාණයක බලපෑමක් ඇති වෙලා තිබෙනවා. නමුත්, ගෑස් අඛණ්ඩව ලබා දීමේ හැකියාව අපට තිබෙනවා. මා නැවත කියන්නේ, පෞද්ගලික සමාගමේ ප්‍රශ්නය මතු විය හැකි බවයි.

තෙල් වෙළෙඳ පොළේ තවත් පෞද්ගලික සමාගම් තුනක් තිබෙනවා. සමාගම් 4ක් තිබෙනවා. නමුත්, දැනට සමාගම් 3ක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාත් යෝජනා කළා වෙළෙඳ පොළ විවෘත කරන්න කියලා. අපි විශේෂයෙන්ම Super Diesel සහ Super Petrolවලට වෙළෙඳ පොළ විවෘත කළා. එහිදී හැම කෙනාම තමන්ගේ නිෂ්පාදන පිරිවැයට අනුව මිල ගළපන්න තීරණය කළා. ඒ අනුව ඔවුන් විශාල ලෙස මිල ඉහළ දාලා තිබෙනවා මම දැක්කා. ඒක තමයි ඇත්ත මිල. ආණ්ඩුව සතුව තිබෙන්නේ තෙල් market එකෙන් සියයට 57යි. ඒ සියයට 57 ඇතුළේ තමයි අප මෙය balance කරන්න උත්සාහ කරන්නේ. අපේ මිල සහ සමාගම්වල මිල අතර විශාල පරතරයක් ඇති වෙලා ඒ සමාගම්වල තිබෙන market එකත් මුළුමනින්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ආවොත් අපේ සංස්ථාවට ඒක දරා ගන්න බැහැ. ඒ නිසා ඒ ගැනත් අපි කල්පනා කර බලන්න ඕනෑ. මොකද, ඒ සමාගම් සහ ආණ්ඩුව අතර තිබෙන මිල අතර විශාල gap එකක් ඇති වුණොත් ඒ සමස්ත පාඩුවේ බර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එනවා. ඒ නිසා ඒකත් සමනය කරන්න අපි සැලසුම් කර තිබෙනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

මේ යුද්ධයත් එක්ක මතු වී තිබෙන බලශක්ති ක්ෂේත්‍රයේ අර්බුදය, ඒ හරහා සමාජ ජීවිතයට ඇති වන බලපෑම, ඒ හරහා ආර්ථික ක්‍රියාකාරකම්වලට ඇති වන බලපෑම පිළිබඳව සලකා බලමින් තමයි අප මේ තීන්දු තීරණ ගන්නේ; යෝජනා ඉදිරිපත් කරන්නේ. ඒ සඳහා තමුන්නාන්සේලාගේ අදහස්, තමුන්නාන්සේලාගේ විවේචනාත්මක යෝජනා, චෝදනාත්මක යෝජනා ඕනෑම දෙයක් අපට විවෘතයි. ඒ අනුව අපට පුළුවන් වේවි, මේ ඇති වී තිබෙන අර්බුදය සඳහා පිළියම් යොදන්න. දැනට අපි මාස 3ක සැලැස්මකට අවතීර්ණ වෙලා සිටිනවා. ඉන්ධනවලට, විදුලි බලයට සහ පොහොරවලට අදාළව මාස 3ක සැලැස්මක අපි ඉන්නවා. එතැනින් එහා මෙය ඉදිරියට යා යුතුද කියලා තීරණය කරන්නේ ලෝකයේ ඇති වන තත්ත්වය අනුවයි. අපි ඒ තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කරමින් ඉන්නවා. මෙතැනින් එහාට යන්න ඕනෑ නම්, මෙතැනින් එහාටත් යන්න අපි සූදානම්. ඒ සඳහා අවශ්‍ය වන මුදල් වැය කිරීම් පිළිබඳව භාණ්ඩාගාරය අධ්‍යයනය කරමින් ඉන්නවා.

බොහොම ස්තුතියි තමුන්නාන්සේලා සියලුදෙනාට, මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඒවා සියල්ල සැලකිල්ලට භාජන කරමින් තමයි අප මේ පිළිබඳව ප්‍රතිපත්ති තීරණ ගන්නේ. එසේ අදහස් ඉදිරිපත් කිරීම පිළිබඳව නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මම නතර වෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, THE HON. DEPUTY SPEAKER in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition. You have 15 minutes.

[අ.භා. 1.00]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සති ගණනාවක් මුළුල්லේ අපි වර්තමාන රජයෙන්, ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළා, අසහනයට, පීඩනයට, කම්පනයට පත් වුණු අපේ රටේ ජනතාවට සහන ලබා දෙන්නට වහාම කටයුතු කරන්න කියලා. අද දවස වෙනකම් ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව හිටියේ ලොකු නින්දක; මර නින්දක. අද කඩිමුඩියේ නින්දෙන් නැඟිටලා ඇවිල්ලා පොරොන්දු වට්ටෝරුවක් ඉදිරිපත් කළා. එය ඉදිරිපත් කරන අතරතුර පන්දම් අල්ලපු එක ගැනත් ජනාධිපතිවරයා කථා කළා. ඒ කියන්නේ, අපි සමගි ජන බලවේගය හැටියට දින ගණනාවක් තිස්සේ රට පුරාවටම පවත්වපු ඒ උද්ඝෝෂණ මාලාවත් යම්තාක් දුරකට හරි ගිහිල්ලා තිබෙනවා. ඒ පන්දම්වලට රජය නියෝජනය කරන උදවියත්, ජනාධිපතිවරයාත් නැඟිටලා අද යම් කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කළා. ඒ නිසා මම පළමුවෙන්ම කියන්න ඕනෑ, මර නින්දක ඉඳලා තිබෙන්නේ, coma එකක ඉඳලා තිබෙන්නේ මේ ආණ්ඩුවයි කියන එක.

මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත්වුණු ජනතාවටත් පොරොන්දු වට්ටෝරුවක් ඉදිරිපත් කළා. රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා, ලක්ෂ 100ක් දෙනවා කිව්වා, ඉඩම් ලබා දෙනවා කිව්වා. ඒ විධියට විවිධාකාර පොරොන්දු ලැයිස්තුවක් රටටම ඉදිරිපත් කළා. අහිමි වුණු තහඩුවකටත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ පොරොන්දු වුණු සහන ටික ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වය තුළ පීඩනයට පත් වුණු ඒ වින්දිත ප්‍රජාව වන අපේම රටේ ජනතාව මහ පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා, කියපු දේවල් ඉෂ්ට වුණේ නැහැ කියලා. ඒ නිසා අඩුම තරමින් අද දවසේ ඉදිරිපත් කරපු පොරොන්දු වට්ටෝරුවවත් ක්‍රියාත්මක කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. "දිට්වා" සුළි කුණාටුව ගැන ජනාධිපතිවරයා කථා කරපු නිසා මමත් මතක් කරන්න කැමැතියි, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු දස ලක්ෂ සංඛ්‍යාත ජනතාවට පොරොන්දු වුණු දේවල් ලබා දෙන්නත් කටයුතු කරන්න කියලා.

ජනාධිපතිවරයා තමන්ගේ කථාව තුළින් ලොකු උත්සාහයක් දැරුවා, ගල් අඟුරු බාලයි කියන කථාව පිළිගන්න. අපි මේ ගල් අඟුරු බාලයි කියන කතන්දරය කියනකොට රජය නියෝජනය කරන කී දෙනෙක් කිව්වාද, Load Port Report එක බලන්න, ගල් අඟුරු බාල නැහැ, Dispatch Port Report එක බලන්න, ගල් අඟුරු බාල නැහැ, Gross Calorific Value එක බලන්න, ගල් අඟුරු බාල නැහැ කියලා? ඒ විධියට කී දෙනෙක් කියන්න හැදුවාද, ගල් අඟුරු බාල නැහැයි කියන කථාව. අවසානයේදී ලක් විජය බලාගාරයේ plant එකෙන් ලබා දෙන සජීවී දත්ත - live data - තුළින්, ප්‍රමිතියට අදාළව ගල් අඟුරු තිබෙනවා කියන කථාව අද රජයටත් කියන්න බැරි වෙලා තිබෙනවා. අපි දැක්කා, රජය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුත් ගල් අඟුරු බලාගාරය නිරීක්ෂණය කරන්න යනවා. මම ඕනෑ නම්, ඒ ඡායාරූපය සභාගත කරන්නම්. එතුමා ඒක නිරීක්ෂණය කරලා එළියට ඇවිල්ලා කියනවා, බලාගාරයේ කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. හැබැයි, ඒ ඡායාරූපයේ සටහන් වෙලා තිබුණා, dash board එක. ඒ dash board එකේ පෙන්නුම් කර තිබුණා, අඩු මෙගාවොට් ප්‍රමාණයක් උත්පාදනය කර තිබෙන කාරණාව. ඉතින්, පැහැදිලිව ජනාධිපතිතුමා මේ ගැන දැනගන්නට ඕනෑ. එතුමා සංඛ්‍යාලේඛන ගණනාවක් කිව්වා. මෙගාවොට් 900ක් නිපදවනවා, අභ්‍යන්තර භාවිතයට මෙගාවොට් 90ක් පාවිච්චි කරනකොට මෙගාවොට් 810යි පිටතට ලබා දෙන්නේ කියලා කිව්වා. ඔව්, ඒ ඔක්කෝම හරි. හැබැයි, ඊයේ දවසේත්, පෙරේදාත්, පළමුදාත් උත්පාදනය කර තිබෙන්නේ, අඩු මෙගාවොට් ප්‍රමාණයක්. ඇණවුම් කරපු ඒ බාල ගල් අඟුරු දිගින් දිගටම යෙදවීම තුළ අඩු විදුලිය ප්‍රමාණයක් උත්පාදනය වෙලා තිබෙනවා කියන තත්ත්වය ඉතිහාසයේ ප්‍රථම වතාවට උදා වුණේ මේ රජය යටතේය කියන එකත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ජනාධිපතිවරයා කිව්වා, මේ සහන පැකේජය රුපියල් බිලියන 100ක්, මෙච්චර මුදලක් යෙදෙව්වාට මුදල් සංසරණයේ වැඩිවීමක් වෙන්නේ නැහැ, හැබැයි පරිහරණය අඩු කරන්න කියලා. Economic multiplier කියන concept එක, ඒ ආර්ථික චක්‍රය, ඒ

වැඩි වෙමින් යන චක්‍රය ගැන කුඩා හෝ අවබෝධයක් තිබුණා නම් අපි හැමෝම පිළිගන්න ඕනෑ, ආර්ථිකය ශක්තිමත් වෙන්නට, ආර්ථිකය වර්ධනය වෙන්නට, නිෂ්පාදනය වැඩි වෙන්නට ඕනෑ බව. ඒ නිෂ්පාදන සහ සේවා වර්ධනය වීම තුළ මුදල් සංසරණය වැඩි වෙන්නට ඕනෑ. මුදල් සංසරණය අඩු වුණා කියලා සතුටු වන්න බැහැ. මුදල් සංසරණය අඩු වුණොත් වර්ධනය අඩු වනවා, ආදායම අඩු වනවා, ජීවන මට්ටම අඩු වනවා, ජන ජීවිත කුඩා වනවා. ඇත්තවශයෙන්ම මේ වාගේ අවස්ථාවක ජන ජීවිත කුඩා කරලා ආර්ථික ස්ථායීකරණය ලැබුවා කියලා සතුටුවීමෙන් එලක් වන්නේ නැහැ. මොකද මතක තබාගන්න, මැද පෙරදිග හෝ අනෙකුත් රටවල කුමන දෙයක් සිදු වුණත්, ඉදිරියේදී අපට වාර්ෂිකව විශාල ඩොලර් ප්‍රමාණයක් ගෙවන්නට තිබෙන බව. දැනටමත් යම් කොටසක් ගෙවාගෙන යනවා. තවත් විශාල ප්‍රමාණයක් ඉදිරියේදී ගෙවන්න තිබෙනවා, වාර්ෂිකව. විශේෂයෙන්ම 2028 වර්ෂයේ සිට ඉදිරියට.

මම පෙන්වන්න හදන්නේ මේකයි. අපි කියපු අවස්ථාවේ, ඔබ මැතිවරණයේදී පොරොන්දු වුණු ආකාරයට IMF එකත් එක්ක සාකච්ඡා කරලා මහජනතාවට වාසිදායක වන ආකාරයට ඒ ණය ගිවිසුමෙහි වෙනසක් ඇති කර ගත්තා නම් මැද පෙරදිග පවතින යුද්ධය තුළ අද දවසේ අපට යම් සහනයක් ලබා ගන්න තිබුණා. අපි ප්‍රාර්ථනා කරනවා, මේ යුදමය තත්ත්වය ඉක්මනින් අවසන් වන්න කියලා, ඒක ප්‍රසාරණය නොවේවා කියලා, ඒක ව්‍යාප්ත නොවේවා කියලා. නමුත් මේ යුදමය තත්ත්වය ව්‍යාප්ත වුණත් අපේ රටට සිදු වනවා, එදා එකඟ වුණු කොන්දේසි මතම ඉදිරියට යන්න. ඒ නිසා කරුණාකරලා අවබෝධ කරගන්න, අපට අවශ්‍ය IMF එකෙන් ප්‍රශංසා ලබා ගැනීම නොවෙයි කියන එක. අපට අවශ්‍ය වන්නේ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය කොන්ද කෙළින් තියාගෙන IMF එකත් එක්ක සාකච්ඡා කරලා "දිට්වා" සුළි කුණාටුවෙන් පසු උද්ගත වුණු තත්ත්වයත්, මැද පෙරදිග තත්ත්වයත් පාදක කරගෙන අලුත් IMF ගිවිසුමකට යන්නට කටයුතු කිරීමයි.

ගරු ජනාධිපතිතුමා කථා කළා, IMF එකේ නියෝජිතයින් හමුවීම ගැන. කිසිම දවසක අපි IMF එකේ නියෝජිතයින් හමුවීම වර්ජනය කරලා නැහැ. IMF එකේ නියෝජිතයින් විපක්ෂ නායක කාර්යාලයේදී අපව හමු වුණු හැම අවස්ථාවකදීම - ඒ ආපු පීටර් බෲවර් මහත්මයා ප්‍රමුඛ දේශීය නියෝජිතයෝ මේ ගැන කියාවි - අපි කිව්වේ පුළුවන් තරම් අපේ රටට, අපේ රටේ ජනතාවට සහනදායී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලායි. එහෙම නැතිව IMF එකත් එක්ක කථා කරලා අපි කවදාවත් රට හිර කරලාත් නැහැ, ආණ්ඩු හිර කරලාත් නැහැ, ලක්ෂ 220ක් වන රටේ ජනතාවගේ බෙල්ල හිර කරලාත් නැහැ. හැබැයි වෙනසකට තිබෙන්නේ දැන් IMF එක විපක්ෂයේ අපව වෙනමම හමු වන අවස්ථා, ඒ කියන්නේ කථානායකවරයාගේ අධීක්ෂණයෙන් පැවැත්වෙන සාකච්ඡා නොවෙයි වෙනමම විපක්ෂයේ කණ්ඩායම් හමු වන අවස්ථා අහිමි කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, කාගේ බලපෑමටද එය වුණේ කියලා. මම හිතනවා, ඒක එච්චර සුදුසු නැහැ කියලා. මම දන්නේ නැහැ, මේ බලපෑම් කරන්නේ කවුද කියලා. අපි රජයට කියනවා, IMF එකට කියන්න කියලා ඇවිල්ලා අපිත් වෙනමම හම්බවෙන්න කියලා. ඒ, කථානායකවරයාගේ අධීක්ෂණයෙන් නොවෙයි. හැබැයි මම කියන්න කැමැතියි, අපි කවුරුවත් ඒ IMF හමුව වර්ජනය කළේ නැහැ කියන එක. ඉතාම සීමාසහිත දැනුම්දීමකින්, කෙටි කාලයක දැනුම්දීමකින් එම හමුව යොදා ගත් නිසා තමයි අපට එයට සහභාගි වන්නට නොහැකි වුණේ. මොකද, මමත් පිට හිටියේ. නමුත් අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, ඔය ජාත්‍යන්තර ආයතන සියල්ලටම කියන්න කියලා බියෙන් සැකයෙන් තොරව ඇවිල්ලා අපව හමුවෙන්න කියලා. ආණ්ඩුවට උදවු කරන්න එපා, රටට උදවු කරන්න එපා, රජයට උදවු කරන්න එපා, ජනතාවට උදවු කරන්න එපා කියන කුහක ප්‍රතිපත්තියක් අපි කිසි දාක අනුගමනය කරලාත් නැහැ, අද අනුගමනය කරන්නේත් නැහැ, හෙට දවසේ අනුගමනය කරන්න බලාපොරොත්තුවකුත් නැහැ.

ඇත්තවශයෙන්ම ජනාධිපතිතුමාගේ පොරොන්දු වට්ටෝරුව තුළ කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. එතුමා කියනවා, සම්පූර්ණ පැකේජය රුපියල් බිලියන 100යි කියලා. හැබැයි, පසුගිය කාල වකවානුව පුරාවටම බදු ගහලා, බදු පිට බදු බර පටවලා රුපියල් ට්‍රිලියන 1.4ක් ඉතුරු කරලා තිබෙනවා. ඒ අනුව එම ඉතුරු කරපු මුදලෙන් අද සහනයක් හැටියට රුපියල් බිලියන 100ක් ලබා දෙනවා. එය සියයට 7ක ප්‍රමාණයක් පමණයි. අපි කියනවා, ඒක කිසිසේත්ම ප්‍රමාණාත්මක නැහැ කියලා. එතුමා ගත් පියවර සුබ පියවරක්. හැබැයි, අපි ඒක සලකන්නේ පළමුවන පියවර හැටියටයි. ඒ පළමුවන පියවර තුළ ඔබ පිරී ඉතිරී යන භාණ්ඩාගාරයේ රුපියල් ට්‍රිලියන 1.4කින්, රුපියල් බිලියන 100ක පැකේජයක්, සියයට 7ක පැකේජයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන්නේ නැහැ.

ඒ වාගේම මේ පැකේජයේදී ගෑස් මිල වැඩි වීම තුළින් අසහනයට පත් වුණු පාරිභෝගිකයන් අමතක කරලා තිබෙනවා. විශේෂයෙන්ම වර්තමාන රජයට මම මතක් කර දෙන්න කැමැතියි, අපේ රටේ 61ලක්ෂයක ජනතාවගෙන් සියයට 42ක් පමණ, ඒ කියන්නේ ලක්ෂ 25ක් ගෑස් පාවිච්චි කරනවාය කියන එක. ඒ අයට ඒ වැඩි වුණු මිල සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන්නට රජය අද දවසේ අපොහොසත් වුණා. කමක් නැහැ, හෙට දවසත් තිබෙනවා. ජනාධිපතිවරයාට පුළුවන් නම් හෙට දවසේත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, මේ රුපියල් ට්‍රිලියන 1.4න් රුපියල් බිලියන 100ක් විතරක් - සියයට 7ක පමණ මුදලක් - වෙන් කරලා ලබා දුන්නු සහන ප්‍රමාණය වැඩි කරන්න කියා අපි යෝජනා කරනවා. ඒ වාගේම රජයට අමතක වුණු ගෑස් පාරිභෝගිකයා වෙනුවෙන් මම කියනවා, කරුණාකර ඒ ලක්ෂ 25ත් අමතක කරන්න එපා කියලා. ඒ අය සම්බන්ධයෙනුත් කල්පනා කරලා, ගෑස් මිල අඩු කිරීමේ වැඩ පිළිවෙළ සඳහා ක්‍රියාත්මක වෙන්න කියලා මම ඉල්ලනවා.

මම හිතන විදියට, ජනාධිපතිවරයා 12.00ට විතර මේ සභාවට ඇවිල්ලා කථා කරන්න පටන් ගත්තා. නමුත් ඊට පෙර රජය ඉදිරිපත් කළා, ජනතාවට බදු වැඩි කිරීමක්. අද දිනයේ පනවන අනුක්‍රමිකතා බදු - cascading taxes - නිසා VAT එකේ සියයට 18ට අමතරව අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා කියන ආකාරයට අඩුම ගාණේ තව සියයට 4ක්, 5ක් එකතු වෙනවා. එක පැත්තකින් මේ රටේ පාරිභෝගික ජනතාවගේ බෙල්ල මිරිකලා, බදු බර වැඩි කරලා, රාජ්‍ය ආදායම වැඩි කරලා ඒකෙන් සියයට 7ක් වාගේ සොච්චමක් දෙනවා, මැද පෙරදිග පවතින යුද්ධය නිසා අසහනයට සහ පීඩනයට පත් වුණු ජනතාවට සහන වශයෙන්. මම නැවත වරක් කියන්න කැමැතියි, අඩුම ගණනේ මර නින්දෙන් නැඟිටලා ඇවිල්ලා සහන ලබා දීම පටන් ගත්ත එක හොඳයි කියන එක. හැබැයි, ඔබ මෙය පළමුවන පියවර බවට පත් කරගෙන මේ සහන ප්‍රමාණය වැඩි කරන්න කියන එකත් මම ඉල්ලීමක් හැටියට කරනවා.

ඒ වාගේම ජනාධිපතිතුමා විශේෂයෙන්ම සඳහන් කළා, පොහොරවලට ලබා දෙන සහනය ගැන. සහන ලබා දෙන එක හොඳයි. අපි ඒ ගැන සතුටු වෙනවා. නමුත්, රටේ පොහොර හිඟයක් තිබෙනවා. රජය කියපු ආකාරයට භය වෙන්න එපා, පොහොර මෙට්‍රික් ටොන් ලක්ෂයක් තිබෙනවා, ඉදිරියට එන යල කන්නයේ වැඩකටයුතු ක්‍රියාත්මක කරන්න ඒ මෙට්‍රික් ටොන් ලක්ෂයක පොහොර ප්‍රමාණවත්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you have exhausted the time, the 15 minutes, allotted to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I will take just one more minute.

රජය පැහැදිලිව කියනවා, පොහොර හිඟයක් නැහැ, තිබෙන මෙට්‍රික් ටොන් ලක්ෂය ප්‍රමාණවත් කියලා. අපි පැහැදිලිවම මේ අවස්ථාවේදී කියනවා, යූරියා පමණක් නොවෙයි, පැහැදිලිවම යූරියා, MOP, TSP කියන මේ තුනේම හිඟයක් තිබෙන බව. කරුණාකරලා ඔබතුමන්ලා ගොවි ජනතාව කෘෂිකාර්මික කටයුතු කරන බල ප්‍රදේශවලට ගිහිල්ලා සොයා බලන්න. ඒක තමයි මහ පොළොවේ සත්‍යය.

අපි පැහැදිලිවම සතුටු වෙනවා, මැද පෙරදිග යුද්ධය ආරම්භ වෙලා සති ගණනාවක් ගත වුණත් මේ සිදු වුණු තත්ත්වය පිළිබඳව මහ හරිමින් සිට අද දවසේදීවත් ආණ්ඩුව රටේ ජනතාවට පුංචි සහනයක් හෝ ලබා දෙන්නට මුල පිරීම ගැන. ඒ සම්බන්ධයෙන් අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත්, පියවර ගණනාවකින් ලබා දෙන සහන ටික ඉක්මනින්ම වැඩි කරන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවාදී, ජනහිතකාමී, ප්‍රගතිශීලී විපක්ෂයක් හැටියට අපේ පන්දම් උද්ඝෝෂණත් ජනාධිපතිතුමා කියපු ආකාරයට විශේෂයෙන්ම මේ සොච්චම් සහනය හරි ලබා දෙන්නට හේතු වුණා කියන කාරණාව සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. ඒක අපිටත් සතුටක්. කරුණාකර රජයෙන් අපි ඉල්ලීමක් කරනවා, මේ ලබා දෙන සහන ප්‍රමාණය ප්‍රමාණාත්මකව වැඩි කරන්න කියලා. ඒ වාගේම අපි කනගාටු වෙනවා, ගෑස් පාරිභෝගිකයින්ව අමතක වීම ගැන. හෙට දවසේත් මේ සභාවට ඇවිල්ලා, මේ සහන පැකේජය වඩාත් පුළුල්ව, ප්‍රමාණාත්මක වශයෙන් වැඩියෙන් ලබා දෙන්න කියා අපි ජනාධිපතිතුමාට ආරාධනා කරනවා. මොකද, රුපියල් ට්‍රිලියන 1.4ක් ඉතුරු කර ගෙන ඉන්නවා නේ. ඒකෙන් තව යම්කිසි ප්‍රතිශතයක් යොදා මේ හැකිළුණු ආර්ථිකය තුළ, හැකිළුණු ජන ජීවිත ගත කරන අපේ රටේ ජනතාවට දැනෙන සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේදී මම යෝජනා කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wasantha Samarasinghe. You have 13 minutes.

[අ.භා. 1.18]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ පාර්ලිමේන්තුව තුළ වැදගත් කරුණු තුනක් පිළිබඳව සාකච්ඡා වෙනවා. විශේෂයෙන් විපක්ෂ නායකතුමා අදහස් ඉදිරිපත් කළා, රජය මේ සහන ලබා දීම පිළිබඳව. එතුමා කිව්වා, රජය හදිසියේ නින්දෙන් ඇහැරිලා ඇවිල්ලා කියලා. මම විපක්ෂ නායකතුමාට මතක් කරන්න ඕනෑ, රජය නින්දෙන් ඇහැරිලා ආවා නොවෙයි කියන එක. මේ සිද්ධිය සිදු වූ දවසේ සිට; මැද පෙරදිග කලාපයට විශේෂයෙන් ඉරානය ඉලක්ක කරගෙන ඊශ්‍රායලය සහ ඇමෙරිකාව විසින් දියත් කළ පහර දීමත් එක්ක මේ කලාපයේ ඇති වෙච්ච තත්ත්වයට මුහුණ දීමට කැබිනට් මණ්ඩලය තුළ, රජය තුළ ගත යුතු සියලු ක්‍රියාමාර්ග අරගෙනයි තිබෙන්නේ. ප්‍රවාහනය සම්බන්ධයෙන් ඇති වෙන බලපෑම්වලට අදාළව කැබිනට් කමිටුවක්, අත්‍යවශ්‍ය ආහාර සැපයීම පිළිබඳ කමිටුවක්, ඒ වාගේම ජනතාවගේ කටයුතු පවත්වාගෙන යාමට බාධා ඇති වීම සම්බන්ධව තීරණ ගන්න කමිටුවක් නම් කරලා ඒවාට අදාළව කටයුතු කරමින් තමයි යන්නේ. ඒ නිසා තමයි විශේෂයෙන් ඉන්ධන පරිභෝජනය පැත්තෙන් යම් සීමා හදන්න, ඇති වූ තත්ත්වය වර්ධනය වුවහොත් එයට මුහුණ දෙන්න QR කේතය හඳුන්වා දෙමින් පරිභෝජනය අඩු කර කටයුතු කළේ. මොකද, බලශක්ති ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ප්‍රශ්නයක් හැටියට තිබෙන්නේ.

මම විපක්ෂ නායකතුමාට කාරණයක් මතක් කරන්න ඕනෑ. එතුමා කිව්වා, ගිය වසරේ ඉතිරි කරපු සල්ලිවලින් සියයට හතයි රජය වියදම් කළේ කියලා. එතුමා "දිට්වා" සුළි කුණාටුව ගැන කථා කළා, මතක් කළා. හැබැයි, එතුමාට මතක නැහැ, මේ පාර්ලිමේන්තුවේදී ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් මේ අවුරුද්දේ රුපියල් බිලියන 500ක් - පසුගිය අවුරුද්දේ බිලියන 270ක් - Budget එකට පිටින් අරගෙන වියදම් කරනවා කියලා. එතුමා එදා හිටියේ නැද්ද, එතුමාට අමතක වෙලාද දන්නේ නැහැ. ඒකත් අර ගණන් හැදීමට එකතු කරගන්න ඕනෑ. රජයේ භාණ්ඩාගාරයේ රුපියල් ට්‍රිලියන 1.4ක් ඉතිරි කළේ බදු පිට බදු ගහලා නොවෙයි. රටේ තිබුණු බදු ප්‍රතිපත්තිය ක්‍රමවත්ව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පියවර අරගෙන, ඒ බදු ප්‍රතිපත්තිය යටතේ රාජ්‍ය වියදම් අඩු කරලා, රාජ්‍ය ආදායම් වැඩි කරලා රුපියල් බිලියන 1,400ක් මහා භාණ්ඩාගාරයේ ඉතිරි කරගත් නිසා තමයි මේ අවුරුද්දේ මුල කිසිදු වැය බරක් වෙන්නේ නැතිව ඒකෙන් රුපියල් බිලියන 500ක් "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් සියලු ජනතාවට - කර්මාන්තකරුවා, ව්‍යාපාරිකයා ඇතුළු සියලු දෙනාට - සහන සැලසීම සඳහා Budget එකට පිටින් අපට වෙන් කරන්න පුළුවන් වුණේ. එම නිසා එතුමාට මම නැවත කියන්න ඕනෑ, සියයට 7ක් කියලා ගණන් හදපු මේ රුපියල් බිලියන 100ට ඒ රුපියල් බිලියන 500ත් එකතු කරන්න කියලා. එතකොට රුපියල් බිලියන 600යි. එතකොට, අර එකතු කර ගත්ත එකෙන් සියයට 45ක්, සියයට 50ක් විතර දැන් දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් විපක්ෂයට තිබෙන ප්‍රශ්නය මොකක්ද? සහන පැකේජය දුන්නාට පස්සේ දැන් විපක්ෂයේ අය කලබල වෙලා ඉන්නේ. ඒ අය දැන් බියක් ඇති කරන්න හදනවා, පොහොර නැහැ කියලා. විපක්ෂ නායකතුමනි, අපිත් අනුරාධපුරයේ. ගොවි ජනතාව පොහොර පාවිච්චි කරන විධිය ගැන අපි දන්නවා. පොහොර බෙදා දීම සඳහා රජය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය අපි දන්නවා. පොහොර සමාගම් එක්ක අපි සාකච්ඡා කරලා තිබෙනවා. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය එක්කත් අපි සාකච්ඡා කර තිබෙනවා. අපේ ලාල් කාන්ත ඇමතිතුමාගේ, බිමල් රත්නායක ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතාවට අත්‍යවශ්‍ය කාරණා සම්බන්ධයෙන්, විශේෂයෙන් නිෂ්පාදනයට, ප්‍රවාහනයට බලපාන කරුණු පිළිබඳව තීරණ ගන්න කමිටු පත් කරලා තිබෙනවා. ආහාර සුරක්ෂිතතා කමිටුව සති දෙකකට සැරයක් රැස් වෙලා මේ ගැන තීරණ ගන්නවා. ඒ නිසා අපි පොහොර ගැන දිගටම සොයා බැලුවා. ගරු විපක්ෂ නායකතුමනි, අපේ රටේ

MOP දැනටත් අවුරුදු දෙකකට තිබෙනවා. TSPවල අඩුවක් තිබෙනවා. යූරියාවල අඩුවක් තිබෙනවා. ඒවා ගෙන ඒමට අදාළ කරන ක්‍රියාවලිය කර තිබෙනවා. ටෙන්ඩර් දාලා තිබෙනවා. කොටසක් එනවා. සමාගම් සහ වී අලෙවි මණ්ඩලය සතු පොහොර එන යල කන්නයට අදාළව ප්‍රමාණාත්මකව සම්පාදනය කරන්න අවශ්‍ය සියලු තීරණ අරගෙනයි තිබෙන්නේ. නමුත් මේ පිළිබඳව බියක් ඇති කරන්නයි හදන්නේ. මම විපක්ෂයට යෝජනා කරනවා, ඇත්ත කරුණු එක්ක අපි සංවාද කරමු, එහෙම නැතිව බොරු කරුණු කියන්න උත්සාහ කරන්න එපා කියලා.

මේ රජය ලබා දෙන සහන පැකේජය තුළ විශේෂයෙන් පීඩාවට පත් වෙච්ච ජනතාවට සහන ලබා දෙනවා වාගේම ඒ පීඩාවන් අඩු කරන්න පුළුවන් ක්‍රමවේදත් සොයා තිබෙනවා. ජනාධිපතිතුමා විශේෂයෙන් කිව්වා, මුදල් සංසරණය වැඩි වෙන්නේ නැහැ කියලා. මුදල් සංසරණය වැඩි වීම තුළින් ආර්ථික වර්ධනය පැත්තට උදව්වක් වෙනවා වාගේම ඒක උද්ධමනයට හේතුවක් වෙනවා. එම නිසා මෙය පාලනය කරන්න ක්‍රම දෙකකට උදව් කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එකක්, අදාළ affected partiesවලට, එහෙම නැත්නම් මෙහි බලපෑම ඇති වෙන පාර්ශ්වයන්ට සෘජුව සහන දෙන්න පුළුවන්. අපි ධීවරයාට තෙල් දෙනවා, අස්වැසුම ලබන අයට ඒ දීමනාවක් වැඩි කරලා දෙනවා. මොකද, මේ යුද්ධය හැමදාම තියෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම වැඩි වීම අවම කිරීම සඳහා, අතින් ගෙවන්න තිබෙන ගණන අඩු කිරීම - ඒ වැඩි වීම නැවැත්වීම - සඳහා තමයි ආයතනවලට සහන දෙන්නේ. ආයතනවලට සහන දෙමින්, සෘජුව ලබා දෙන ආධාර වැඩි කරමින්, උද්ධමනයත් පාලනය කර ගනිමින් මේ ගෝලීය උණුසුම් තත්ත්වය, ගෝලීය යුද්ධමය තත්ත්වය අපේ රටේ ආර්ථිකයට බලපාන්නේ කොහොමද කියන එක පිළිබඳවත් සැලකිලිමත් වෙලා තමයි රජය මේ තීන්දු තීරණ ගන්නේ. එහෙම නැතුව, මොනවා හරි දෙන්න ඕනෑ නිසා රජය මේවා දීලා තිබෙනවා නොවෙයි. ඒවා සැලසුම් සහගතව, දිය හැකි, දිය යුතු, අවශ්‍ය සහ ඒවා පවත්වා ගෙන යන්න පුළුවන් ක්‍රමවත්භාවයක් ඇති සියලුදෙනාට දීලා තිබෙනවා. මේ පිළිබඳව ගරු ජනාධිපතිතුමා කරුණු ඉදිරිපත් කළා.

අද උදෙත් මම දැක්කා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු රටේ බඩු මිල පිළිබඳව කථා කළ ආකාරය. මම මේ ගැන කියන්නම ඕනෑ කියලා හිතුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි පසුගිය කාලය පුරාවට අපේ රටේ පාරිභෝගිකයාට භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තකරුවන්, බෙදා හරින්නන් වාගේම ආනයනකරුවන් එක්කත් මේ ගැන සාකච්ඡා කළා. අපේ රටේ ආනයනකරුවන් දැන් වැඩිපුරම ඉන්නේ පිටකොටුව සහ දඹුල්ල වාගේ ප්‍රදේශ පදනම් කරගෙන. ඒ අයත් එක්ක අපි වෙනම සාකච්ඡා කළා. ආනයනකරුවන්ගේ සංගමයක් තිබෙනවා. ඒ වාගේම කිරිපිටි නිෂ්පාදකයින් සහ බෙදා හරින්නන්, බිස්කට් නිෂ්පාදකයින් සහ බෙදා හරින්නන්, බේකරි නිෂ්පාදකයින් සහ බෙදා හරින්නන්, පාන්පිටි නිෂ්පාදකයින් සහ බෙදා හරින්නන් සහ සිමෙන්ති, යකඩ නිෂ්පාදකයන් එක්කත් අපි සාකච්ඡා කළා. ගෑස් ප්‍රශ්නය පිළිබඳව ගෑස් සමාගම් එක්කත් අපි වෙනම සාකච්ඡා කළා. හැම පැත්තකින්ම රජය මේ ආයතනත් එක්ක සාකච්ඡා කරලා උත්සව සමයේ ජනතාවට ඇති වෙන බර, පීඩාව අවම කරන්න කටයුතු කළා. හැබැයි විපක්ෂයේ අය මිල ගණන් ගැන කියද්දී එක්කෝ මතක නැතුව කියනවා, එහෙම නැත්නම් වුවමනාවක් නැතුව ඔහේ කියාගෙන යනවා. විපක්ෂය කරන වැඩේ එයයි. විශේෂයෙන් බිස්කට් ඇතුළු ආහාර වර්ගවලත්, කිරිපිටි ඇතුළු කිරි ආහාර වර්ගවලත් කිසිදු මිල වැඩි කිරීමක් මේ උත්සව සමයත් එක්ක හෝ යුද්ධමය තත්ත්වයක් එක්ක සිදු වෙලා නැහැ. පාන් පිටි සම්බන්ධයෙනුත් එහෙමයි. ඒගොල්ලන් අපට කිව්වේ මාස තුනකට පාන් පිටි තිබෙනවා, මිල වැඩි කිරීමක් මේ වෙලාවේ සිද්ධ කරන්නේ නැහැ කියලායි. ඉදිරියේදී ගෙනෙන පාන් පිටිවල මිල වැඩි වෙනවා. එතකොට යම් මිල වැඩි කිරීමක් පිළිබඳව හිතන්න වෙනවා. මොකද, ඩොලරයේ ප්‍රශ්නයත් මේ සඳහා බලපාන්න පුළුවන්.

ඉතාම පැහැදිලිව ජනාධිපතිතුමා කිව්වා, ඩොලරයේ බලපෑමක් ඇති වෙලා තිබෙනවා කියලා. ඒක පොඩි එකක් නොවෙයි. තෙල් මිල ඉහළ යාම විසින් ඩොලර් බිලියන 1.5ක පමණ අපේ විදේශ සංචිතවලට බලපෑමක් ඇතිවෙන්න පුළුවන්. එක පැත්තකින් විදේශ සංක්‍රාම අඩු වුණොත් සහ තව පැත්තකින් විදේශ සංචාරකයන් අඩු වුණොත් මේක තව වැඩි වෙන්න පුළුවන්. අපේ වෙලාවට දැන් සංක්‍රාමවල අඩු වීමක් පෙනෙන්නේ නැහැ. හැබැයි, සංචාරකයන්ගේ අඩුවීමක් අපට පෙනෙනවා. ඒ නිසා මේ තත්ත්වය එක්ක පාර්ලිමේන්තුව පාවිච්චි කරලා බොරු කියන එක හොඳ නැහැ. මේ වෙලාවේ ලෝකය තුළ අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ අර්බුදකාරී තත්ත්වයත් එක්ක රජයේ අරමුණත්, ජනතා අපේක්ෂාවනුත් හඳුනා නොගෙන තමයි විපක්ෂය මේ බොරු කියන්නේ. මේ වෙලාවේ ජනතාව දන්නවා ලෝකයේ අර්බුදයක් තිබෙනවා කියලා. හැබැයි, විපක්ෂය ඒක දන්නේ නැහැ වාගේ ඉන්නවා. ඒ අර්බුදය කළමනාකරණය කරමින්, ජනතාවටත් සහන දෙමින්, රට තුළ ආර්ථිකය කළමනාකරණය කරමින් රට ආර්ථිකමය වශයෙන් ශක්තිමත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන තීන්දු තීරණ රජය ගන්නවා. එහෙම තීන්දු තීරණ අරගෙන තමයි අපි වැඩ කරන්නේ.

ගල් අඟුරු පිළිබඳ කාරණයේදී වෙලා තිබෙන්නේ මොකක්ද කියලා ඉතාම පැහැදිලිව ජනාධිපතිතුමා කිව්වා. ඒක ෆොටෝ ගහන්න ගිය එක්කෙනා හරි, බලන්න ගිය එක්කෙනා හරි කියපු කථාව විතරක් නොවෙයි ගන්න ඕනෑ. සමහර දවස්වල මෙගාවොට් 810ක නිෂ්පාදන ධාරිතාව සිදු වෙනවා. සමහර දවස්වල ඒක අඩු වෙනවා. අඩු වීමට හේතුව ගල් අඟුරුවල ප්‍රමිතියේ ප්‍රශ්නයක් නම්, අදාළ ගිවිසුමේම තිබෙනවා ඒක ඔවුන්ගෙන් අඩු කර ගැනීමේ එකඟතාවක්. ඒ අනුව අපි කටයුතු කරනවා. ඒ හරහා ඇති වෙන්න පුළුවන් බලපෑම ගැන ජනාධිපතිතුමා කිව්වා. නමුත් මේක පුන පුනා කියනවා. මේකේ ඊළඟ විකල්පය විධියට, හිටපු කෙනාටම ඒක අරගෙන දෙන්නද මේ හදන්නේ කියන එකයි මට හිතෙන්නේ. එහෙම කරන්න බැහැ. අපට එකඟ වෙච්ච ගණනට වඩා ඊළඟ ගණනට ගියාම ඒ ගණන වැඩියි. අර්බුදයක් තිබෙනවා නම් ඒකට උත්තරයක් ලෙස යම් ප්‍රමාණයක්; ලක්ෂ 3ක වාගේ ප්‍රමාණයක් spot tenders හරහා මිලදී ගන්නත් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දුන්නා. එහෙම කළේ මේ ඇති වෙන බලපෑම අවම කර ගැනීම සඳහා. ඒ නිසා රජය, රජයක් හැටියට ගත යුතු තීන්දු තීරණ ටික අරගෙනයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජකයන් සඳහා බදු සහන ප්‍රමාණයක් ලබා දීමේ යෝජනාවකුත් අද ඉදිරිපත් කර තිබෙනවා. අපි දන්නවා, මේ අර්බුදය තුළ අපේ රටටත් යම් අවස්ථාවක් හදාගන්න පුළුවන්කම තිබෙනවා කියලා. මොකද, මැද පෙරදිග කලාපයේ ඉන්න ආයෝජකයන් වෙනත් පැතිවලට යාමේ ප්‍රවණතාවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා කර්මාන්ත ක්ෂේත්‍රයට, කෘෂි කර්මාන්තයට, සේවා ක්ෂේත්‍රයට ලැබෙන ආයෝජන මත, ඔවුන් ලබා දෙන රැකියා ප්‍රමාණය මත අපි ඒ ආයෝජකයන්ට යම් බදු සහන ප්‍රමාණයක් ලබා දීමේ යෝජනාවක් අද ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ ඩොලර් මිලියන 50-100 අතර, ඩොලර් මිලියන 100-150 අතර, ඩොලර් මිලියන 150-300 අතර සහ ඩොලර් මිලියන 300ට වැඩියෙන් ආයෝජනය කරනු ලබන ව්‍යාපෘතිවලට බදු සහන ලබා දෙන්නේ කොහොමද කියන එක ඉදිරිපත් කර

[ගරු වසන්ත සමරසිංහ මහතා]

තිබෙනවා. වසර 6 සිට වසර 10ක් දක්වා බදු සහන දෙනවා. සේවා ක්ෂේත්‍රයේ ආයෝජකයන්ට වසර 5 සිට වසර 10ක් දක්වා බදු සහන දෙනවා.

කෘෂි කර්මාන්තයට තාක්ෂණය ගෙනෙන්න ඕනෑ; නව ඇසුරුම් ක්‍රම එන්න ඕනෑ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ඩොලර් මිලියන 50ක ආයෝජන ගෙනෙනවා නම්, රැකියා 50ක් දෙනවා නම් අවුරුදු 5ක බදු සහන ගන්න පුළුවන්. ඩොලර් මිලියන 50-100 අතර ආයෝජන ගෙනෙනවා නම්, රැකියා 100ක් දෙනවා නම් අවුරුදු 8ක බදු සහන ගන්න පුළුවන්. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට ඩොලර් මිලියන 100ට වැඩි ආයෝජන ගෙනෙනවා නම්, රැකියා 100ක් දෙනවා නම් අවුරුදු 10ක බදු සහන ගන්න පුළුවන්. ඇසුරුම් ක්‍රම, තාක්ෂණය, ප්‍රවාහනය ආදියත් එක්ක කෘෂි ක්ෂේත්‍රයට සහන දෙන යෝජනා අපි ඉදිරිපත් කර තිබෙනවා. මොකද, මේ තුළ යම් අවස්ථා ඇති වීමේ ඉඩක්, ප්‍රවණතාවක් තිබෙන බව අපි දකිනවා. ඒ, අපේ වාගේ රටවලට කලාපීය ලෙස ආයෝජකයන් කැඳවා ගැනීම සඳහා ඉඩ තිබෙන නිසායි. මේ තත්ත්වයත් සලකා බලා තමයි අප මේ කරුණු කියන්නේ.

විපක්ෂ නායකතුමා කිව්වේ මොකක්ද? IMF එකට, ජාත්‍යන්තර සංවිධානවලට කියන්නලු, "ඇවිල්ලා අපව හමු වෙන්න" කියලා. ඒගොල්ලන් කැමැති නම් නේ, හමු වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි කියන්නද, "ඔයගොල්ලන් ගිහිල්ලා විපක්ෂය හමු වෙලා කථා කරන්න" කියලා? විපක්ෂයේ ක්‍රියාවලිය, විපක්ෂයේ කාර්යභාරය, විපක්ෂයේ හැසිරීම ආදි ඔක්කෝම බලලා තමයි ඔය ආයතනත් තීරණය කරනවා ඇත්තේ, විපක්ෂ නායකතුමා හමු වෙනවාද, නැද්ද කියලා. එහෙම නැත්නම් අපි කියන්න ඕනෑ නැහැ නේ, ඔබතුමන්ලාව හමු වෙන්න කියලා. විපක්ෂයත් එක්ක ගනුදෙනු කරන එක ජාත්‍යන්තර සංවිධානවල සාමාන්‍ය ක්‍රියාවලියක්. ඒගොල්ලෝ තමන් යන රටවල විපක්ෂ නායකවරයා සහ විපක්ෂයේ අනෙකුත් පක්ෂවල අය හමු වෙනවා. එහෙම නැතිව, ඔබතුමන්ලාව හමු වෙන්න කියලා කථානායකතුමා හරි අපි හරි කියන්න ඕනෑ නැහැ නේ. ආණ්ඩුවට කිසි වුවමනාවක් නැහැ, ඔබතුමන්ලා කුමන හෝ ජාත්‍යන්තර සංවිධානයක් හමු වන එක නවත්වන්න. එහෙම කවුරු හරි නවත්වා තිබෙනවා නම් ඇත්තටම ඒ මොකද කියලා හොයන්න වෙයි. ඔබතුමන්ලා හමු වන එක නවත්වා තිබෙන අයට අපි කියන්නම්, හමු වෙන්න කියලා. ඒ කවුද කියලා ඔබතුමන්ලා හොයා ගත්තොත් අපට කියන්න. අපි එතකොට කියන්නම්, "එහෙම කරන්න එපා. අන්න විපක්ෂයත් බලාගෙන ඉන්නවා ඔබතුමන්ලා හමු වෙන්න; ගිහිල්ලා ඒ අයව හමු වෙලා කථා කරන්න" කියලා.

මේ වෙලාවේ විපක්ෂ නායකතුමා ඇතුළු මේ කණ්ඩායමට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ අය සී සී කඩ වෙලායි තිබෙන්නේ. මොකද, එන හැම ප්‍රශ්නයකටම අදාළ අවස්ථාවේ අදාළ විධියට උත්තර දෙමින්, මැදිහත් වෙමින්, මේ මතු වෙලා තිබෙන තත්ත්වය කළමනාකරණය කරමින් රටත්, ජනතාවත් ඉදිරියට ගෙන යන්න අවශ්‍ය තීන්දු තීරණ ආණ්ඩුව ගන්නවා.

විපක්ෂය බඩු මිල ගැන කියපු කථාවට මම උත්තරයක් දෙන්නම ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි අදාළ ආයතන එක්ක සාකච්ඡා කරලා ඒ කාරණය කළමනාකරණය කළා. පසුගිය දිනවල ලෝකයේ ඇති වෙච්ච තත්ත්වයත් එක්ක බඩු මිල පිළිබඳ යම් සාකච්ඡාවක් ආවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනදා උත්සව සමය වනකොට බඩු මිල ඉහළ යනවා. මම ආනයනකරුවන් එක්ක, නිෂ්පාදකයන් එක්ක යම් සාකච්ඡාවක් කරනවා. වෙළෙඳ පොළ තුළ දිගටම හාල් සම්බන්ධයෙන් - විශේෂයෙන් කීරි සම්බා සම්බන්ධයෙන් - ප්‍රශ්නයක් මතු කර තිබෙනවා. ඒ නිසා අපි කුඩා මෝල් හිමියන් වාගේම විශාල මෝල් හිමියන් ළඟ තිබෙන තොග පිළිබඳවත් සොයා බැලුවා. දිගින් දිගටම අත්අඩංගුවට ගැනීම් සිදු කරනවා. අද දවසේත් දඹුල්ලේ වැඩි මිලට හාල් විකුණපු, වැඩි මිලට බඩු විකුණපු 40ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. 40ක් වැටලීම් කර තිබෙනවා, අද දවසේ. කවුරුන් හෝ මේ විධියට දිගින් දිගටම පාරිභෝගිකයා පීඩාවට පත් කරනවා නම් අපි ඒ ගැන තීන්දු තීරණ ගන්නවා. අප්‍රේල් මාසය වනකොට මාර්තු මාසයටත් වඩා බඩු මිල යම් ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා.

අපේ ලංකා සතොස වෙළෙඳ සැල් 430කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. අපි භාණ්ඩ බෙදා හැරීම සඳහා ටෙන්ඩර් කැඳවලායි මිල ගන්නේ. මාර්තු මාසයේ අපි ගත්තු මිලයි, ඊයේ දවසේ ගත්තු මිලයි අතර යම් සන්සන්දනයක් කළොත්, සුදු සීනි කිලෝවක් රුපියල් 212ට දුන්නේ. නමුත්, ඊයේ දුන්නේ රුපියල් 205ට. ඒ වාගේම brown sugar කිලෝවක් රුපියල් 237යි. ඒ වාගේම පරිප්පු කිලෝවක් දුන්නේ රුපියල් 272ක්, 273ක් වාගේ මිලකට. ඊයේ දුන්නේ රුපියල් 266කටයි. ඒ වාගේමයි, ලොකු ලූනු. ඊයේ දුන්නේ රුපියල් 126කට. ගිය සතියේ දුන්නේ රුපියල් 148කට. රතු ලූනු රුපියල් 230යි. අපේ වෙළඳ පොළේ imported අල තිබෙනවා. Imported අල කිලෝවක් රුපියල් 187ටයි දුන්නේ. ඊයේ රුපියල් 193යි. අල විතරක් රුපියල් 2කින්, 3කින් වැඩි වෙලා තිබෙනවා. මේ විධියට ගත්තොත්, මිල අඩු වෙච්ච භාණ්ඩ වර්ග ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සුදු ලූනු තිබුණේ රුපියල් 359ටයි. ඊයේ රුපියල් 317යි, අපේ ටෙන්ඩරයේ. මේ විධියට ගත්තාම මිල අඩු වෙච්ච භාණ්ඩ වර්ග ගණනාවක් තිබෙනවා. ඒ කියන්නේ, භාණ්ඩ මිල අඩු වීමක් තිබෙනවා. වෙනදා අප දකින්නේ, උත්සව සමය වනකොට, ඉල්ලුම වැඩි වනකොට වෙළෙඳ පොළ තුළ භාණ්ඩ මිල ඉහළ යෑමක්. හැබැයි, මේ තත්ත්වය හමුවේ ආනයනකරුවන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන් සියලුදෙනා එක්ක සාකච්ඡා කරමින් වෙළෙඳ පොළ තුළ භාණ්ඩ මිල ඉහළ යාම යම් විධියකට පාලනය කරන්න අවශ්‍ය මැදිහත්වීම රජය හැටියට අපි කරලා තිබෙනවා. එසේ කිරීම නිසා තමයි වෙළෙඳ පොළ තුළ අද උණුසුම් තත්ත්වයක් ඇති නොවන්නේ.

ඒ වාගේම ගෑස් සිලින්ඩර ගැනත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
I will wind up, Sir. මට තවත් තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දැන් නිල් පාට ගෑස් සිලින්ඩර වෙළෙඳ පොළට නිදහස් කරනවා. අපි කහ පාට ගෑස් සිලින්ඩර සපයපු සමාගමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා නිශ්චිතව දැනුම් දුන්නා, "ඔයගොල්ලන් පාරිභෝගිකයාට දුන්නු සිලින්ඩරයට ගෑස් දෙන්නේ නැත්නම් 'පාරිභෝගිකයා රැවටීම' කියන කොන්දේසිය යටතේ අපට නඩු දමන්න වෙනවා" කියලා.

ඒ නිසා ඒගොල්ලන්ට දිගටම මේ වැඩේ කරගෙන යන්න බැහැ. අපි ලිට්රෝ ගෑස් සමාගම හරහා ගෑස් සිලින්ඩර වෙළෙඳ පොළට නිකුත් කරනවා. අපේ ගෑස් සිලින්ඩරයක මිල රුපියල්

1,000ක් අඩුවෙන් තිබෙන්නේ. නිල් පාට ගෑස් සිලින්ඩරයක මිල කහ පාට ගෑස් සිලින්ඩරයකට වඩා රුපියල් 1,000ක් අඩුවෙන් තිබෙන්නේ. ඒ නිසා ඒ තත්ත්වයත් පාවිච්චි කරලා, කහ පාට ගෑස් සිලින්ඩර අයිති පාරිභෝගිකයන්ට වෙළෙඳ පොළෙන් නිල් පාට ගෑස් සිලින්ඩරයක් ලබා ගන්න පුළුවන් වන විධියට, ඉදිරියේදී අපි වෙළෙඳ පොළට සිලින්ඩර නිකුත් කරනවා. ඒ වාගේම, දැන් කහ පාට සිලින්ඩරවලට ගෑස් සපයන සමාගමේ වගකීම තමයි, පාරිභෝගිකයන් ළඟ තිබෙන තමන්ගේ සමාගමේ සිලින්ඩරයට ගෑස් ලබා දෙන එක. එහෙම දෙන්නේ නැත්නම් ඒ අය වැරැද්දක් කරනවා, පාරිභෝගිකයාට. අන්න ඒකට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා කියන කාරණයත් අපි දැනුවත් කරලා තිබෙනවා. ඒ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා ඒ කටයුත්තත් සිදු කරන ගමන්, මේ උත්සව සමයේදී පාරිභෝගික ජනතාවට වෙළෙඳ පොළ තුළින් පීඩාවකින් තොරව භාණ්ඩ හා සේවා මිල දී ගැනීමටත්, මේ උත්සව සමය ගත කිරීමටත් අවශ්‍ය කරන වටපිටාව ජාතික ජන බලවේගය රජය විසින් ගොඩනහලා තිබෙනවා; ඒ සඳහා අවශ්‍ය තීන්දු තීරණ ටික අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය අවශ්‍ය නායකත්වය දෙනවා. අද දවසේ සම්මත කරන මේ පනත් කෙටුම්පත හරහා, මේ නියෝග හරහා, නීති රීති හරහා අප සිදු කරමින් ඉන්නේ, ආර්ථිකය ස්ථාවර කර ගැනීමට, ආයෝජකයන් කැඳවා ගැනීමට අවශ්‍ය කරන තීන්දු තීරණ හරියට අරගෙන, රට ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය පියවර ගැනීමයි.

අද දවසේ ලබා දුන්නු සහන පැකේජය එක පැත්තකින් විපක්ෂය බිය ගැන්වීමක් බවට පත් වෙලා තිබෙනවා. නමුත්, ඒක ජනතාවට නම් සහනයක් වෙලා තිබෙනවා. ජනතාවට සහන දීම අපේ රජයේ වගකීමක්. එම වගකීම ඉටු කරමින් ජනතා අපේක්ෂාවලට රජයේ අරමුණු ද එකතු කරගෙන, රට ඉදිරියට ගෙන යන්න අප කටයුතු කරනවා කියන කාරණය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am raising a point of Order under Standing Order Nos. 92(2) and 118(3), which relate to the Committee on Ethics and Privileges. සර්, මම අහන්න කැමතියි, මම දැන්,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you brought this issue also to the attention of the Hon. Speaker this morning.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, this does not relate to the issue with Sudaththa Thilakasiri, but to the issue with the Hon. Speaker and "*Sabhanayakathuma*". සර්, කරුණාකරලා මේක පොඩ්ඩක් අහන්න. මම ගැහැනු ළමයින්ට අපහාස කළා කියලා පාර්ලිමේන්තුවේ මට බොරු චෝදනාවක් දාලා, දවස් 8ක් මගේ කථා නවත්තලා තිබුණා. ඒකට inquiry එකක් කරලා, කථානායකතුමා වරදක් කරලා තිබෙනවා කියලා පැහැදිලිව inquiry Report එකක් තිබෙනවා. එතකොට මේ සභානායකතුමාට විරුද්ධව, කථානායකතුමාට විරුද්ධව කවුද ඒ නඩුව අරගෙන යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? කවුද ඒකට වගකීම ගන්නේ? දැන් කථානායකතුමා වරදක් කරලා තිබෙනවා, සභානායකතුමා වරදක් කරලා තිබෙනවා කියලා තියනවා. කවුද මේවාට වගකීම ගන්නේ? මේකට උත්තර දෙන්න. මේක Ethics and Privileges Committee -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I got your point. I will have to bring it to the notice of the Hon. Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒක කරන්න බැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I understood your point. We will bring it to the notice of the Committee on Ethics and Privileges.

The Next, the Hon. Sivagnanam Shritharan. You have seven minutes.

[பி.ப. 1.36]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலம், இலங்கை மத்திய வங்கிச் சட்டத்தின் கீழான விதிகள் மற்றும் இன்னும் இரண்டு ஒழுங்குவிதிகள் தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில் முக்கியமானதொரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

இந்த நாட்டை NPP அரசு பொறுப்பெடுத்த பிற்பாடும் பலவிதமான நெருக்குதல்களையும் நெருக்கடிகளையும் தமிழ் பல்கலைக்கழக மாணவர்களும் தமிழ் உத்தியோகத்தர்களும் தமிழ் மக்களும் சந்திக்கிறார்கள் என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகின்றேன். மிக முக்கியமாக, 2026 பங்குனி மாதம் 16ஆம் திகதி யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் கலைப்பிரிவு சங்கத்தின் தலைவர் தர்மலிங்கம் ஜதுர்சன், சிரேஷ்ட மாணவர் சங்கத் தலைவர் தயாபரன் லஜிதரன், ஏ. அபிசேக் உட்பட இன்னும் சில மாணவர்கள் யாழ்ப்பாண மாவட்ட குற்றத் தடுப்புக் காரியாலயத்தில் வைத்து பொலிஸாரல் கடுமையாக

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

விசாரணைக்கு உட்படுத்தப்பட்டார்கள். பல்கலைக்கழகத்தில் படிக்கின்ற மாணவர்கள் தங்களுடைய செயற்பாடுகளைச் சுதந்திரமாக மேற்கொள்வதற்கு, தங்களுடைய உரிமை தொடர்பில் கருத்துகளை முன்வைப்பதற்கு, தங்கள் இனம் சார்ந்த கொள்கைகளை வெளிப்படுத்துவதற்கு இந்த அரசாங்கத்திலும் தடையிருக்கிறது என்பதை அரசு அச்சுறுத்தல் ஊடாக வெளிப்படுத்துகின்றது என்பதைத்தான் இந்தச் செயற்பாடுகள் காட்டுகின்றன. இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். இனிவரும் காலங்களிலாவது பல்கலைக்கழக மாணவர்கள் குறிப்பாக, தமிழ்ப் பல்கலைக்கழக மாணவர்கள் சுதந்திரமாக தங்களுடைய கல்வி நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத வகையில், அரசின் புலனாய்வுத்துறை, இராணுவம் மற்றும் பொலிஸாரின் அடக்குமுறைகள் இருக்கக் கூடாது என்பதை வினயமாகக் கேட்டுக் கொள்கின்றேன். மேற்குறித்த மாணவர்களுக்கு விடுக்கப்பட்ட அழைப்பாணை தொடர்பான கடிதத்தை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

அடுத்து, எங்களுடைய இலங்கை தமிழரசுக் கட்சியின் கிளிநொச்சி மாவட்டக் கிளையின் நிருவாகக் குழு உறுப்பினராக இருக்கின்ற திருமதி தயாநந்தன் ஜெயசித்திரா அவர்கள் இன்றைய தினம் கொழும்பிலுள்ள பயங்கரவாதத் தடுப்பு மற்றும் விசாரணைப் பிரிவுக்கு காலை 10.00 மணிக்கு விசாரணைக்கு அழைக்கப்பட்டு இருக்கிறார். திருமதி தயாநந்தன் ஜெயசித்திரா அவர்கள் இதேபோல மூன்று தடவைக்கும் மேலாக அழைக்கப்பட்டு, விசாரணைக்கு உட்படுத்தப்பட்டிருக்கிறார். கிளிநொச்சியிலும் அவர் பொலிஸாரால் அடிக்கடி விசாரணைக்கு உட்படுத்தப்படுகிறார். வளர்ந்த பிள்ளைகளையுடைய தாயாரான அவர், தனது பணிகள் நிமித்தமாகவும் தமிழர்களுடைய தேசியப் பயணம் தொடர்பிலும் தன்னுடைய செயற்பாடுகளை முன்னெடுக்கின்றபொழுது, பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரும் பொலிஸ் மற்றும் இராணுவப் பிரிவினரும் அவரை அச்சுறுத்தும் வகையில் அடிக்கடி விசாரணைகளுக்கு உட்படுத்துகின்றார்கள். தன்னுடைய இயல்பான உரிமைகளை வெளிப்படுத்த முடியாமல் அவர் தடுக்கப்படுகிறார் என்பதையே இச்செயற்பாடுகள் வெளிப்படுத்துகின்றன. ஏற்கனவே, மூன்று தடவை கொழும்புக்கு அவர் விசாரணைக்கு அழைக்கப்பட்டார். இதைவிட, கிளிநொச்சியிலும் பல தடவை விசாரிக்கப்பட்டார். இன்று காலை 10 மணிக்கு மீண்டும் கொழும்புக்கு அவர் விசாரணைக்கு அழைக்கப்பட்டு இருக்கிறார். அந்த கடிதத்தின் பிரதியையும் நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கிறேன்.**

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இம்மாதம் 2ஆம் திகதி கிளிநொச்சி மாவட்டத்தின் பச்சிலைப்பள்ளி பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட இயக்கச்சியிலுள்ள ஊர்வணிகன்பற்று என்ற கிராமத்திலே இருக்கின்ற காணிகளைச் சட்டவிரோதமாக அளவீடு செய்யும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டது. அவை அங்குள்ள மக்களின் சொந்தக் காணிகளாகும்; அவர்கள் பரம்பரையாக, வரலாற்று ரீதியாக, ஆண்டாண்டு காலமாக, -6-7 பரம்பரைகளாக - ஆண்டு வந்த காணிகளாகும். அந்த மக்களின் சொந்தக் காணிக்குள் முத்துமாரி அம்மன் ஆலயம், பொதுநோக்கு மண்டபம், சிறுவர் முன்பள்ளி, சிவபூமி அறக்கட்டளைக்குரிய காணி போன்றவை உண்டு. 1990ஆம் ஆண்டு யுத்தம் காரணமாக இடம்பெயர்ந்த அந்த மக்கள், மீண்டும் அங்கே குடியேறியிருந்தார்கள். 2006ஆம் ஆண்டு யுத்தம் வெடித்தபொழுது மீண்டும் அந்த இடத்திலிருந்து இடம்பெயர வேண்டிய சூழ்நிலை அவர்களுக்கு ஏற்பட்டது. 2006ஆம் ஆண்டுக்குப் பிறகு, அந்த இடத்தைக் கையகப்படுத்திக்கொண்ட இராணுவத்தின் இயந்திரப் பொறியியல் பிரிவைச் சேர்ந்தவர்கள், இப்பொழுது அங்கேயிருக்கின்ற கிட்டத்தட்ட 30 ஏக்கர் காணியைத் தங்களுக்குச் சொந்தமாக்கிக்கொள்வதற்காக சட்டவிரோதமாக அளவீடு செய்வதற்கான முயற்சிகளை மேற்கொள்கின்றார்கள்.

நான் ஏற்கெனவே கூறியதுபோல, கடந்த 02ஆம் திகதி பச்சிலைப்பள்ளி பிரதேச செயலாளருடைய வேண்டுகோளுக்கு இணங்க, நில அளவைத் திணைக்களம் அந்தக் காணியை அளந்து இராணுவத்துக்கு வழங்குவதற்கு முயற்சி செய்திருந்தது. அவ்வேளையில் அங்கு திரண்ட மக்களும் அங்கு சென்றிருந்த அரசியல் தலைவர்களும் அந்த முயற்சியைப் பூரணமாகத் தடுத்து நிறுத்தினார்கள். அத்துடன், நில அளவை செய்ய வந்த உத்தியோகத்தர்களும் திருப்பி அனுப்பப்பட்டார்கள். "4ஆவது பட்டாலியன் என்கின்ற மின் மற்றும் இயந்திரப் பொறியியல் படையணி வசமுள்ள இராணுவ முகாம் அமைந்துள்ள காணி எங்களுடைய பரம்பரைக் காணி! தயவுசெய்து, அதனை அளக்காதீர்கள்! எங்களுடைய சொந்தக் காணியை எங்களிடம் தாருங்கள்!" என்று அந்த மக்கள் கோரிக்கையாக முன்வைத்திருந்தார்கள். நான் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், அரசாங்க அதிபரோடும் பிரதேச செயலாளரோடும் தொடர்புகொண்டு இது பற்றி பேசினேன். அதற்குப் பிற்பாடு, அளவை செய்யும் நடவடிக்கைகள் நிறுத்தப்பட்டிருந்தன. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தக் காணி விடயம் தொடர்பில் 21 பேர் கையொப்பமிட்டு அனுப்பிய கடிதத்தின் பிரதியை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

குறிப்பாக, முருகேசு செல்வராசா, மயில்வாகனம் பாலச்சந்திரன், தம்பையா வல்லிபுரம், சந்திரரூபன் உதயகலா, மார்க்கண்டு பொன்னம்மா, காண்டீபன் பத்மாவதி, பிரகாஷ் சுபத்திரா, செல்லப்பா தியாகராசா, பாஸ்கரன் கேதீஸ்வரி, துஸ்யந்தன் சுஜீபா, சிவசிதம்பரம் லோஜினி, கமலாவதி செல்வராசா, கனகரத்தினம் மகேஸ்வரி, முருகேசு யோகராணி, செந்தில்செல்வன் மேனகை, தர்மலிங்கம் தாசன் ஆகியோர் உட்பட ஊர்வணிகன்பற்று கிராமத்தைச் சேர்ந்த 21 பேர் அந்தக் காணி தங்களுடைய பரம்பரைக் காணிதான் என்பதை அக்கடிதத்தில் தெளிவாகக் குறிப்பிட்டு இருக்கிறார்கள். அந்தப் பெயர்ப்பட்டியலை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, யுத்தம் இல்லாத இந்த நாட்டில் மக்களுடைய சொந்தக் காணிகளை இவ்வாறு வலுக்கட்டாயமாக அளந்து, பறித்துக்கொடுப்பதற்கு ஏன் இந்த அரசாங்கம் முயற்சிக்கிறது? இது எவ்வளவு கொடூரமானது? இன்றைக்கும் வலிகாமம் வடக்கிலும், யாழ்ப்பாணப் பகுதியிலும், கிளிநொச்சியிலும் மக்கள் தங்களுடைய சொந்த நிலத்தை இழந்து, தெருக்களில் அநாதைகளாகவும் இன்னொருவருடைய காணியிலும் மற்றும் உறவினர், நண்பர் வீடுகளிலும் குடியிருக்கிறார்கள். நில அளவைத்

---

***පුස්තකාලයේ තබා ඇත.**
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***පුස්තකාලයේ තබා ඇත.**
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

திணைக்களத்தை அனுப்பி, இராணுவ மற்றும் பொலிஸ் பிரசன்னத்தோடு அவர்களுடைய சொந்தக் காணிகளை அவர்களுடைய கண்ணுக்கு முன்னாலே அளக்க முற்படுவது மிகக் கொடூரமானது! கடந்த அரசுதான் இதனைச் செய்தது என்றால், ஏன் உங்களால் அந்த 30 ஏக்கர் காணியை உடனடியாக விடுவிக்க முடியாது?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த மக்களுடைய துயரம் மிகவும் கொடுமையானது. ஏன் இந்த நாடு இன்னும் உருப்படவில்லை? நான் அடிக்கடி இந்த உயர்ந்த சபையில் சொல்லியிருக்கிறேன், கர்ம வினைகள் உங்களை ஒருகாலமும் உருப்படவிடாது என்று. கடந்த காலங்களில் இருந்த அரசியல் தலைவர்கள் விட்ட தவறுகள் மற்றும் தமிழ் மக்கள்மீது புரிந்த யுத்தங்களுக்கு அப்பால், இன்றைக்கும் அந்த மக்களைத் தெருக்களிலே வைத்துக்கொண்டு, அவர்களுடைய காணிகளையும் விடுவிக்காமல் பறிக்க முயற்சிப்பது மிகக் கொடூரமானது. கண்ணுக்கு முன்னாலே தன்னுடைய நிலத்தை அளந்து பறிக்கும்போது, அந்தக் காணிச் சொந்தக்காரனுடைய மனநிலை எவ்வாறு இருக்கும் என்பதை நீங்கள் அந்தக் காணியின் உரிமையாளராக எண்ணி சிந்தித்துப் பாருங்கள்! தயவுசெய்து, அந்த மக்களுடைய மனநிலையைப் புரிந்து கொள்ளுங்கள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

உங்களுடைய இந்த அரசாங்கத்தின் காலத்திலும் பல்கலைக்கழக மாணவர்களை விசாரிக்கிறீர்கள்! சாதாரணமாக அரசியல் உரிமைக்காகப் போராடுகின்ற செயற்பாட்டாளர்களை விசாரணைக்கென கொழும்புக்கும் கிளிநொச்சிக்கும் யாழ்ப்பாணத்துக்கும் கூப்பிடுகிறீர்கள்! மக்களுடைய காணிகளைப் பறிக்கிறீர்கள்! அவற்றை வலுக்கட்டாயமாக அளந்து எடுக்கிறீர்கள்! இதில் என்ன நியாயம் இருக்கிறது? இந்த மக்களுக்கான நியாயம் எப்பொழுது கிடைக்கப் போகிறது? எந்த அரசாங்கத்தில் கிடைக்கப் போகிறது? 'எல்லோருக்கும் சம உரிமை' என்று உங்களுடைய அரசு சொல்கிறது. தேர்தல் விஞ்ஞாபனத்தில் சொன்ன விடயங்களைச் செய்வதாகச் சொல்கிறீர்கள்.

நீங்கள் மக்களுடைய உரிமைகளை மதிக்கத் தவறினால், மக்களின் எண்ணங்களைச் சரியான முறையில் புரிந்துகொண்டு நல்லிணக்கத்தை உருவாக்க வில்லை என்றால், நல்லெண்ணங்களை சரியாகப் பிரதிபலிக்கத் தவறினால், கொரோனா காலத்தில் ஏற்பட்ட வீழ்ச்சி போலல்லாது, இப்பொழுது உலகத்தில் நடக்கின்ற யுத்தத்தால் ஏற்பட்டிருக்கின்ற வறுமையும் பொருளாதார வீழ்ச்சியும் போலல்லாது மிக மோசமான வீழ்ச்சி ஏற்படும். ஏனெனில், நீங்கள் போக வேண்டிய தூரம் இன்னும் அதிகமானது. இந்த அரசுகூட, தமிழ் மக்களுடைய பிரச்சினையை - இந்த மண்ணில் இருக்கின்ற இனப் பிரச்சினையை - தீர்க்கும் நோக்கில் எள்ளளவுகூட காலடி எடுத்து வைக்கவில்லை. எனவேதான் நான் சொல்கிறேன், சமாதானம், நல்லிணக்கம் பற்றி பேசுவதற்கு நீங்கள் கடக்கவேண்டிய பாதை இன்னும் கடினமானதும் தூரமானதும் என்று. முதலில் அது பற்றி சிந்தியுங்கள்! அதற்கான பாதையைத் திறவுங்கள்! மக்களுடைய எண்ணங்களைப் புரிந்து கொள்வதன்மூலம்தான் கௌரவமான நாட்டை, இனங்களை இணைத்துக்கொண்டு செல்லக்கூடிய நாட்டை உங்களால் உருவாக்க முடியும் என்பதைப் பதிவுசெய்து, எனது உரைய நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon Denindu Saman Hennayake. You have ten minutes.

[අ.භා. 1.45]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි දෙවන වර කියවීමේ පනත් කෙටුම්පතක් සහ නියෝග සහ රීති වශයෙන් වූ යෝජනා කිහිපයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. දෙවන වර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පතයි. මම හිතනවා, එය අප විසින් කථා කළ යුතු සුවිශේෂී පනත් කෙටුම්පතක් බව. ඒ වාගේම මුදල් අමාත්‍යාංශයට අදාළව 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වන රීති ද අනුමත කර ගැනීමට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ වන නියෝගත් ඉදිරිපත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි විෂය කරුණු ඉදිරිපත් කරද්දී අපි ඒවායේ තිබෙන සුවිශේෂී කාරණාවලට අවධානය යොමු කරන්න ඕනෑ.

අපි දන්නවා, අපේ රටේ ක්‍රීඩාවට තිබෙන තැන. අපේ සමහර ක්‍රීඩා ආගම වාගේ අදහන මිනිස්සු ඉන්නවා. ක්‍රීඩාව කියන්නේ රටක කීර්ති නාමය ඉස්සරහට ගෙන යන එකක්. ක්‍රිකට් ක්‍රීඩාව තුළදී වාගේම වෙනත් ක්‍රීඩා තුළදීත් අපි ඒ කාරණය දැක තිබෙනවා. ඒ කියන්නේ, "ලංකාව" කියනවාට වඩා ඒ ක්‍රීඩකයන්ගේ නම් කියනකොට අපේ රට ගැන දැනගත් ඉතිහාසයක් මේ රටට තිබෙනවා. එවැනි කාරණා එක්ක බැලීමේදී ක්‍රීඩාව කියන්නේ අපේ රටේ කීර්ති නාමය ජාත්‍යන්තරව වඩා ඉහළට ඔසවන කාරණයක්. හැබැයි, ඒ කීර්ති නාමය යම් සුළු කාරණයක් නිසා පලුදු වෙන්නත් පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ රටේ ක්‍රීඩාව තුළ තිබෙන දැඩි තරගකාරීත්වය නිසා ක්‍රීඩාවලට යොමු වෙන ක්‍රීඩකයන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිත කර ක්‍රීඩාවේ යෙදීමට පෙලඹෙන අවස්ථාත් තිබෙනවා. මේ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිත කර ක්‍රීඩාවේ යෙදෙනකොට එක පැත්තකින් ක්‍රීඩකයාට හානියක් සිද්ධ වෙනවා වාගේම, අනෙක් පැත්තෙන් ජාත්‍යන්තරය තුළ අපේ රටට තිබෙන කීර්ති නාමය අපකීර්තියට හැරෙන්න ගත වෙන්නේත් ක්ෂණයක් පමණයි. ඒ නිසා මේ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිත කිරීමට එරෙහිව කටයුතු කරන්න ඕනෑ බව අප විශ්වාස කරනවා. 2013 වසරේදී ශ්‍රී ලංකාව මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න බැඳී තිබෙනවා. විශේෂයෙන්ම ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය - WADA - තමයි

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

මේ තහනම් උත්තේජක ද්‍රව්‍ය මොනවාද කියා හඳුන්වා දෙන්නේ. ඔවුන් හැම වසරකම ඔක්තෝබර් මාසයේ 01වැනි දා ලෝකයට අලුතින් එකතු වන තහනම් උත්තේජක ද්‍රව්‍ය මොනවාද කියා හඳුන්වා දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්ෂයක් පාසා හඳුන්වා දෙන මේ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිත කරන්නේ නැහැ කියලා ඒ ඒ රටවල් විසින් සම්මත කරන්න ඕනෑ. අද දවසේදී මේ සිද්ධ වෙන්නේත් WADA එක විසින් හඳුන්වා දී තිබෙන තහනම් උත්තේජක ද්‍රව්‍ය අපේ රට ඇතුළේ පාවිච්චි කරන්න එපා කියලා ඊට අදාළ නීති රීති සම්පාදනය කරන්න ගරු පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කිරීමයි. අපි විශ්වාස කරනවා, මේ හරහා ලංකාවේ ක්‍රීඩකයන්ට කීර්තිමත්ව ඉදිරියට යන්න, ලංකාවේ ක්‍රීඩකයන්ගේ කාය ශක්තිය වර්ධනය කරගන්න සහ ඔවුන්ට නිවැරදිව ක්‍රීඩාවේ යෙදෙන්න අවස්ථාව අරගෙන දෙන්න ඕනෑය කියලා.

අපි දන්නවා, සමහර ක්‍රීඩකයන් තහනම් උත්තේජක භාවිත කරලා ක්‍රීඩාවලට ඉදිරිපත් වෙද්දී, තවත් අය නිවැරදිව ක්‍රීඩාවට ඉදිරිපත් වෙන බව. එතකොට ඒ නිවැරදි ක්‍රීඩකයන්ට දැඩි අසාධාරණයක් සිද්ධ වෙනවා. එම නිසා මේ තහනම් උත්තේජක භාවිත කරන අය පිළිබඳව මේ නියෝග හරහා කටයුතු කරලා රටේ කීර්ති නාමය ආරක්ෂා කරගන්න පුළුවන් බව අපි විශ්වාස කරනවා. ඒ වාගේම ඉතා දියුණු මට්ටමින් යුත් ක්‍රීඩකයන් නිර්මාණය කරන්න අවශ්‍ය මැදිහත්වීම කරන්නත් පුළුවන් වෙනවා. ඒ සඳහා අවශ්‍ය සෘජු බලපෑමක් කරන්නත් අපට පුළුවන් වෙනවා.

විශේෂයෙන්ම ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නියෝජනය කරමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කටයුතු කරනවා. අපි දැක තිබෙනවා, එසේ කටයුතු කිරීම තුළ වසර 13කට වැඩි කාලයක් අපේ රටේ ක්‍රීඩකයෝ නිවැරදි දිශානතියකට ගෙනයන්න, ඔවුන්ගේ හැකියා වර්ධනය කරගන්න වාගේම ඔවුන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා ගැනීමට අවශ්‍ය සෘජු මැදිහත්වීමක් කරන්නත් මෙම ආයතනය කටයුතු කර තිබෙන බව. ඒ තහනම් උත්තේජක ද්‍රව්‍ය මොනවාද කියන කාරණය පිළිබඳව වන සාකච්ඡාවක් තමයි අද දවසේ අපි පාර්ලිමේන්තුව තුළ සිදු කරන්නේ.

ඒ වාගේම අද ආර්ථික කටයුතු සම්බන්ධයෙන් වන සුවිශේෂී පනත් දෙකක් යටතේ වන යෝජනාත් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය කාලය තුළ අපේ රටේ බදු අය කරන එක එක ක්‍රියාවලි තිබුණා. අපි දන්නවා, විශේෂයෙන්ම ආයෝජකයන්ට බදු සහන දෙනකොට, ඒ බදු සහන දීමේ ක්‍රියාවලිය කළේම කාලයක් තිස්සේ පැවැති ඒ ආණ්ඩුවල හිටපු ඇමතිවරුන්, එහෙම නැත්නම් ඒ ආණ්ඩුවල හිටපු මොළ හතක් තිබුණු විශේෂ කට්ටිය බව. ඒ වාගේ අය තමයි ඒ බදු සහන ක්‍රියාවලියට දායක වුණේ. හැබැයි, නිශ්චිත නිර්ණායක පදනම් කරගත් බදු සහන ක්‍රියාවලියක් අද අපේ රටට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා ගෙන යද්දී මේ රටට විදේශීය ආයෝජකයන් ගෙනෙන්න ඕනෑ, දේශීය ආයෝජකයන් ශක්තිමත් කරන්න ඕනෑ. ඒ ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියේදී නිශ්චිත නිර්ණායක පදනම් කර ගත් බදු සහන ක්‍රියාවලියක් අපි අනුගමනය කරන්න ඕනෑ. අද දවසේ මේ ඉදිරිපත් කරන බදු සහන ක්‍රියාවලිය තුළින් රටකට අවශ්‍ය එවැනි නිශ්චිත නිර්ණායක පදනම් කර ගත් බදු සහන ක්‍රියාවලියක් අපට හඳුන්වා දෙන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ තුළින් එක පැත්තකින් දේශීය ව්‍යවසායකයා සංවර්ධනය වෙනවා වාගේම, විදේශීය ආයෝජකයන්ට අපේ රටට එන්න, අපේ රටේ ආයෝජන කටයුතු කරන්න නිවැරදි අවස්ථාවක් ලැබෙනවා. විපක්ෂය ඉදිරිපත් කරපු මතයක් තිබුණා. ඒ තමයි, මේ බදු සහන දෙන්නේ විදේශීය ආයෝජකයන්ට විතරයි, දේශීය ව්‍යවසායකයාට බදු සහන දෙන්නේ නැහැ කියන එක. මම ඉල්ලීමක් කරනවා, මේ වාගේ විවාදයකට එන කොට අඩුම ගණනේ ඔය දීලා තිබෙන කොළය හරි කියවලා එන්න කියලා. මේක ඇතුළේ තිබෙන කාරණා ගැන විපක්ෂය දිගින් දිගටම අසත්‍ය කියමින් ඉන්නවා. මම එතුමන්ලාට කියනවා, මේ කාරණා නිවැරදිව අවබෝධ කරගෙන ඉදිරිපත් කරන්න කියලා.

ඒ වාගේම විපක්ෂයෙන් ඉදිරිපත් කළා, දැවැන්ත විධියට මිනිස්සුන්ගෙන් බදු අය කරන කටයුත්තක් කරනවා කියලා. එතුමන්ලාට මතක නැහැ, කලින් ජාතිය ගොඩනැඟීමේ බද්ද කියලා එකක් ගහලා වර්ෂයට රුපියල් මිලියන 12ක ආදායමක් තිබෙන සියලුදෙනාට බදු ගහපු බව. මාසයකට රුපියල් ලක්ෂ 10කට වඩා ආදායම් තිබෙන සියලුදෙනාට බදු ගැහුවා. සාමාන්‍ය මිනිස්සුන්ට, සාමාන්‍ය වෙළෙඳාම් කරන මිනිස්සුන්ට බදු ගහලා, බදුවලින් ජීවත් වෙච්ච ආණ්ඩු අද කියනවා, අපි බදු ගහනවා කියලා. රුපියල් මිලියන 36කට වැඩි ආදායමක් ගන්න අයට තමයි මේ බද්ද ඇතුළත් වෙන්නේ. මේ බද්ද ක්‍රමානුකූල කිරීම තුළින් එක පැත්තකින් මේ රටට ආදායම ගෙනෙනවා වාගේම, බදු ගෙවන ජනතාවට අදාළ කරන සහනය සෘජු බදු ඇතුළේ අත් පත් කර දෙන්න අපට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, සංචාරක කර්මාන්තය ගැනත් එතුමන්ලා කථා කළා. සංචාරක කර්මාන්තය ඉතිහාසයේ ඉහළම සංචාරකයන් ප්‍රමාණය ගෙනාපු අවුරුද්ද බවට මේ අවුරුද්ද අපි පරිවර්තනය කළාය කියන එක අපි ආඩම්බරයෙන් කියනවා. "දිට්වා" සුළි කුණාටුව වාගේ ස්වාභාවික ආපදාවක් ඇවිල්ලාත් සංචාරක කර්මාන්තය මෙච්චර ඉහළ මට්ටමකට ගෙන එන්න පුළුවන් වුණේ ඒ තිබුණු කැප කිරීමේ ප්‍රතිඵලයක් විධියටයි. අද සංචාරක ආදායම අරගෙන බෙදලා එක එක වර්ගීකරණ කරලා පෙන්වනවා, "කෝ, මොනවාද ආදායමට වුණේ?" කියලා. එතුමන්ලාට මතක නැහැ, සංචාරක කර්මාන්තය කියන්නේ ආදායම මත පදනම් වෙලා විතරක් හිතන්න ඕනෑ දෙයක් නොවෙයි කියන එක. සංචාරකයන් මේ රටට එද්දි සෘජු සහ වක්‍ර රැකියා අතිවිශාල ප්‍රමාණයක් හැදෙනවා, විවිධ සංවර්ධන ක්‍රියාවලීන් රට ඇතුළේ සිද්ධ වෙනවා. ඒවා ආදායම ඇතුළේ පෙන්වන්න බැහැ. ඒක නිසා, සංචාරක කර්මාන්තය නඟාසිටුවන්න අපේ ආණ්ඩුව ඇතුළේ දැවැන්ත වැඩ පිළිවෙළක් කරලා තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. මේ බදු

ක්‍රියාවලිය තුළ, මේ පනත් තුළ එතුමන්ලා එය බරපතළ විධියට විවේචනයට ලක් කළාට ඉතිහාසයේ වැඩිම සංචාරකයන් ගෙනාවා වාගේම ඉදිරියටත් සංචාරකයන් ගෙනෙන්න අදාළ කරන සැලසුම්වලට ඒවා ඉතා නිශ්චිතව ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගිය අවුරුද්දේ අපි විශේෂත්වයක් දැක්කා. මොකද, 2025 අවුරුද්ද තමයි පසුගිය අවුරුදු 5 තුළ සෘජු විදේශීය ආයෝජන වැඩියෙන්ම ගෙනාපු අවුරුද්ද. සෘජු විදේශීය ආයෝජන ගේනකොට විපක්ෂ නායකතුමා මෙතැන ඉඳගෙන අඬනවා, IMF එකට කථා කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ කියලා. දැන් විපක්ෂ නායකතුමාට අමතක වෙලා තිබෙනවා, අපි ආණ්ඩුව ගන්න කලින් එතුමන්ලා ගෙයක් ගෙයක් ගාණේ කියාගෙන ගිය දේවල්. අපිට ජාත්‍යන්තර සම්බන්ධකම් නැහැ, අපේ අයට ඒ වාගේ ගනුදෙනු කරන්න තේරෙන්නේ නැහැ කියලා කිව්වා. හැබැයි, ඒ ජාත්‍යන්තර සම්බන්ධකම් තිබෙන ඔස්තාර් අද ඇවිල්ලා මෙතැන අඬනවා, ඒගොල්ලන්ට IMF එකත් එක්ක කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ කියලා. අපිට ඒවා එහෙම වළක්වන්න ඕනෑ නැහැ. එවැනි විපක්ෂ නායක කෙනෙක් එක්ක සාකච්ඡා කරලා තේරුමක් නැහැ කියන එක විපක්ෂයේ එම හැසිරීම විසින්ම ප්‍රකාශයට පත් කර තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරු ගරු සභාවේ ඉන්නවා. "ගම්මන්පිල සරණං ගච්ඡාමි" විපක්ෂ නායක කෙනෙක් අද ඉන්නේ. තමන්ගේ පක්ෂය බලයේ ඉන්න කාලයේ; තමන් ආණ්ඩු කරන කාලයේ පාස්කු ප්‍රහාරය රට ඇතුළට ඇවිල්ලා මේ රට විනාශ කරද්දී ඒක හඳුනාගන්න බැරිවුණු, ඒක වළක්වාගන්න බැරි වෙච්ච විපක්ෂ නායක අද මහ මොළකරු හොයාගෙන ගම්මන්පිල ළඟට යනවා. ලජ්ජයි! මෙතැන ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරු දන්නවා, ඒ කරපු වැඩේ කැතයි කියලා. එතුමන්ලා මොකද කළේ? මාධ්‍ය සාකච්ඡා අරගෙන එතුමන්ලා කිව්වා, "අපේ නායකයා නොවෙයි ගියේ, AI නායකයායි ඒ ගියේ" කියලා. ඒ ගියේ, AI නායකයා කියලා කියන තරමට විපක්ෂය පහළට වැටුණා. ඒ තුළින් කියන්නේ වෙන මොකක්වත් නොවෙයි, විපක්ෂ නායකවරයාට අද විපක්ෂය එක මතයක තියාගන්න බැරි වෙලා තිබෙනවා කියන එකයි. විපක්ෂය එක මතයක තියාගන්න බැරි වෙච්ච විපක්ෂ නායකයෙක් එක්ක විදේශ රටවල් ඇවිල්ලා සාකච්ඡා කරන්නේ නැහැ. ඒක එතුමා තේරුම් ගන්න ඕනෑ. මෙතැනට ඇවිල්ලා බණ කියනවා, මෙතැනට ඇවිල්ලා එක එක කථා කියනවා. එතුමාට එහෙම සුරතල් කථා කියන්න පුළුවන්. මෙන්න මේ සබ්මැරීනයෙන් ආවේ කියලා මෙතැනට ඇවිල්ලා අපිට උපදෙස් දෙනවා, අහවල් සබ්මැරීනය ගැන පාඩම් කියලා දෙනවා. හැබැයි, එතුමාගේ පක්ෂය බලයේ සිටි කාලයේ - තමන්ගේ ආණ්ඩුව තිබුණු කාලයේ - තමයි ඇවිල්ලා රට ඇතුළේ විනාශයක් කරලා ගියේ කියන එක එතුමාට මතක නැහැ. ඒක නිසා ආපහු හැරිලා බලන්න කියලා අපි විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලනවා.

අපේ රටේ දැන් තිබෙන ආර්ථික තත්ත්වය ගැන අපි තේරුම් ගන්න ඕනෑ. දැන් අපේ රට තුළ සුවිශේෂී තත්ත්වයක් තිබෙන්නේ. එක පැත්තකින් "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා ඇමෙරිකානු ඩොලර් බිලියන 4.02කට එහා පැත්තේ දැඩි ආපදාවක් අපේ රටට සිද්ධ වෙලා තිබෙනවා. ඒක බේරාගන්න කලින් තමයි මේ තිබෙන ජාත්‍යන්තර ප්‍රශ්නය දැන් අපේ රටට බලපා තිබෙන්නේ. එවැනි මොහොතක විපක්ෂයටත් ලොකු කාර්යභාරයක් කරන්න තිබෙනවා කියලා අපි හිතනවා. අද මේ විපක්ෂය කරන්නේ මොකක්ද? ඒ කාර්යභාරය කරනවා වෙනුවට ගිනි පන්දම් පත්තු කර කර තැනින් තැනට යන එකයි කරන්නේ, බොරු කිය කියා යන එකයි කරන්නේ, අවලාද කිය කියා යන එකයි කරන්නේ. ඒ වෙනුවට සාධනීය යෝජනා ගෙනෙන්න කියලා අපි විපක්ෂයට කියනවා. මේ වෙලාවේ අපි රටක් විධියට එකතු වෙන්න ඕනෑ, රටක් විධියට මැදිහත් වෙන්න ඕනෑ. එසේ සාධනීය යෝජනා ගෙනාවොත්, ඒ යෝජනාත් එක්ක ඉදිරියට යන්න අපිට පුළුවන්. හැබැයි ඒ වෙනුවට අවලාද, මඩ, පම්පෝරි එක්ක මේ ගමන යන්න බැහැ. ඒක නිසා විපක්ෂය ඒකාබද්ධ කරන වැඩේ ඔබතුමන්ලා මැදිහත් වෙලා කරන්න කියලා යෝජනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.55]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද දවසේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත වාගේම තවත් පනත් කිහිපයක් යටතේ නියෝග සහ රීති ඉදිරිපත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කළ කථාවට මම ඇහුම්කන් දුන්නා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒවා ඉදිරිපත් කරන වෙලාවේත් විශේෂයෙන්ම වරාය නගරය - Port City එක - ගැන කිව්වා. Port City එකට ආයෝජන ගෙන්වාගන්න තමයි මේ දේවල් කරන්නේ කියලා ඔබතුමා කිව්වා. මේක කළ යුතු දෙයක්. මොකද, වරාය නගරය කියලා කියන්නේ අපේ රටේ ආර්ථික මර්මස්ථානයක්. ඒක අපේ ආණ්ඩුව කාලයේ පටන් ගත්තේ. මම තමයි විෂය භාර අමාත්‍යවරයා හැටියට හිටියේ. එය ඉතා හොඳ තැනක්.

හැබැයි, ඒ එක්කම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ වරාය නගරය හදනකොට ඒ සඳහා සීගිරි ගලත් කඩන්න ඕනෑ කියලා තමුන්නාන්සේලා එදා කිව්වා. තමුන්නාන්සේලා එහෙම නේ, කිව්වේ. නමුත් සීගිරි ගල එහෙමම තිබෙනවා. සීගිරි ගලට මොකුත් හානියක් වෙලාත් නැහැ. හැබැයි Port City එක හදලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද Port City එක ගැන තමයි ඔබතුමා කිව්වේ. ඔබතුමා කරපු මේ වැඩේ හරි හොඳයි කියන එක මම ඔබතුමාට මතක් කරන්න ඕනෑ. හැබැයි ඔබතුමා ආයෝජකයෝ ගේන්න හදනකොට, Port City එකේ ඉන්න සභාපති හර්ෂ අමරසේකර. මේ වාගේ අය තියාගෙන නම් තමුන්නාන්සේලාට ආයෝජකයෝ ගේන්න බැරි වෙයි. මොකද, තමුන්නාන්සේලා ආණ්ඩුවක් හැටියට සද්භාවයෙනුයි මේක කරන්නේ. තැන් තැන්වලට පත් කළ ඒ වාගේ බහිරවයෝ ටිකක් ඉන්නවා, බලාගෙන. ඒගොල්ලෝ හොඳයි අධිකරණවලට. නඩු අහන්න උසාවිවලට දාන්න හොඳයි. ආයෝජකයෙක් ආවාම විත්ති කූඩුවට නඟවා ප්‍රශ්න අහන විධියට ඒ ආයෝජකයාගෙන් ප්‍රශ්න ඇහුවාම මොකක්ද වෙන්නේ? දේශීය ආයෝජකයෙක් වෙන්න පුළුවන්, විදේශීය ආයෝජකයෙක් වෙන්න පුළුවන්. එහෙම කළාම ආයෝජකයෙක් එන්න කැමැති වෙනවාද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? එන්නේ නැහැ. එම ආයතනයට පත් කරන්න ව්‍යාපාරික ලෝකය ගැන දන්න කෙනෙක්; ව්‍යාපාරිකයකු හැටියට හිටපු කෙනෙක් පත් කරන්න. තමුන්නාන්සේලා ළඟ ඉන්නවා නේ හොඳ businessmenලා. අන්න ඒ අයගෙන්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා ]

කෙනෙක් පත් කරන්න, මේකට. එහෙම නොවුණොත් ඔබතුමන්ලා බලාපොරොත්තු වුණු දේ කවදාවත් කරන්න බැරි වනවා. මොකද හේතුව, ආයෝජකයෙක් එනකොට සුහදශීලීව කථා කරන්න ඕනෑ. ආයෝජකයාත් එක්ක සුහදශීලීව කථා කරලා තමයි එම ආයෝජනය ගෙන්වා ගන්න ඕනෑ. ඒකයි ක්‍රමවේදය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම නිසා ඒ පුද්ගලයා ගැන ඔබතුමා හොඳට හොයලා බලන්න. මම මේ කියන්නේ සාක්ෂි සහිතවයි. ඒ ගැන හොයන්න කියලා මම කියනවා.

ඊළඟට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මැද පෙරදිග යුද්ධය ගැන. යුද්ධයේ අම්හිරි බව අපට දැනිලා තිබෙනවා. මේ යුද්ධයේ අම්හිරි බව අපි හැමෝටම දැනිලා තිබෙනවා. එදා මම පාර්ලිමේන්තුවේදී කිව්වා, ඇමෙරිකාවේ ට්‍රම්ප් ජනාධිපතිවරයා මේ කරන වැඩේ වැරදි බව. විපක්ෂයක් හැටියට එය අපි තරයේ හෙළා දැක්කා. ඊශ්‍රායලයත් එක්ක එකතු වෙලා ඉරානයට පහර දෙනවා. සම්පූර්ණයෙන්ම ගමක චණ්ඩියෙක් වාගේ කියලා කිව්වා. දැන් මට ට්‍රම්ප් ගැන මොනවාද කියන්න තිබෙන්නේ? ඇමෙරිකාවේ ජනාධිපති ගැන දැන් මට කියන්න තිබෙන්නේ මෙයයි. සාමාන්‍යයෙන් ඇමෙරිකාවේ මිනිස්සු පිස්සෙක්ව ජනාධිපති කරන්නේ නැහැ. හොඳ මිනිහෙකුව තමයි ජනාධිපති කරන්නේ. හැබැයි, යම් විධියකින් ජනාධිපති වුණාට පසුව පිස්සු හැදුණොත් මොකද කරන්නේ? අස් කර ගන්න විධියකුත් නැහැ. ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ වෛද්‍යවරු වැරදිලාවත් කිව්වොත් එතුමාට පිස්සු කියලා, ඒ මිනිහා මොකද කරන්නේ? වෛද්‍යවරුන්වත් මරා දමනවා. එම නිසා ට්‍රම්ප් ජනාධිපතිවරයාට පිස්සු වුණත් වෛද්‍යවරයා කියන්නේ නැහැ, "ඇමෙරිකාවේ ජනාධිපතිට පිස්සු" කියලා. එතුමාගේ ඒ පිස්සු වැඩ නිසා නේ අපට මෙහෙම වෙලා තිබෙන්නේ. දැන් තමුන්නාන්සේලා, අපි ඇතුළු රටට මෙහෙම වුණේ මොකක් නිසාද? ඒ පිස්සු වැඩ නිසා නොවෙයිද? එදා අපි ට්‍රම්ප්ට බණිනකොට අපට මොනවාද කිව්වේ? මේ කොහේද යන පහර නැට්ටෝ, හාල්පාරුවෝ වගයක් ඉන්නවා නේ. ඔවුන් කියනවා, "අන්න ට්‍රම්ප්ට බණිනවා" ලු. මේක පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවේදී අපි ලෝක දේශපාලනය, ලෝකයේ තත්ත්වය හා ලංකාවේ තත්ත්වය ගැන කථා කරන්න ඕනෑ නේ. ඒකයි ඇත්ත තත්ත්වය.

අපට මතකයි, අපේ ආණ්ඩුව කාලයේ ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහ අරගළ භූමියක් හදාගෙන ජනතාව මාස ගණනාවක් එතැන නැවතිලා ඉඳගෙන "Gota, go home!" කියමින් එතැන සිටි ආකාරය. වැටවල් බැඳගෙන එතැන පදිංචි වෙලා, බිරියානි කෑවා. එදා අරගළ කරලා ගෝඨාභය රාජපක්ෂව එළෙව්වා. එදා ගෝඨාභය රාජපක්ෂව එළවන දවස වනකොට හාල් කිලෝ එකක් රුපියල් 190යි. ගෝඨාභයව පන්නනකොට හාල් කිලෝ එකක් රුපියල් 190යි. අද කිරි සම්බා කිලෝ එකක මිල රුපියල් 400ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. එදා සීනි කිලෝ එකක් රුපියල් 120යි. අද සීනි කිලෝ එක රුපියල් 240යි. එදා පරිප්පු කිලෝ එකක් රුපියල් 190යි. අද පරිප්පු කිලෝ එක රුපියල් 360යි. එදා මුංඇට කිලෝ එක රුපියල් 300යි. අද මුංඇට කිලෝ එකක් රුපියල් 1,000ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. එදා කිරි පිටි ග්‍රෑම් 400 පැකට් එක රුපියල් 330යි. අද කිරි පිටි ග්‍රෑම් 400 පැකට් එක රුපියල් 1,150යි. එදා ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,982යි. ඊයේ අවුරුදු තෑගි හම්බ වුණා. අද ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 4,765යි.

එදා "Gota, go home!" කියලා අරගළ කරලා ජනතාව බලාපොරොත්තු වුණේ මොකක්ද? එදා මිනිස්සු ඔක්කෝම පාරට බැස්සා. ආණ්ඩුවේ වැරදි තිබුණා. අපි හිටපු ආණ්ඩුවේ වැරදි තිබුණා. එය බොහොම නිර්ලෝභීව කියනවා. නමුත්, අද මොකක්ද වුණේ? ඒ ආණ්ඩුව පැන්නුවේ ඇයි? ඒ ආණ්ඩුව ගෙදර යැව්වේ ඇයි? එහෙම කළේ, ජනතාවට තිබෙන මේ බරින් නිදහස් වෙන්න. ගෙදර කුස්සියේ තිබෙන බර දැනෙන්නේ කාන්තාවට. අම්මාට, සහෝදරියට තිබෙන ඒ බරින් නිදහස් වෙන්න තමයි එහෙම කළේ. නමුත්, මොකක්ද වුණේ? ගමේ කථාවක් තිබෙනවා නේ, "කැහි ගැනි දීලා හොටු ගැනි ගත්තා වාගේ" කියලා. ආණ්ඩුවක් හදාගෙන අද වුණේ හරියට ඒ වාගේ දෙයක්. එහෙමයි කියන්නේ. මේවා ගැන පත්තරවල වාර්තා පළ වනවා. 2026 අප්‍රේල් 04වන සෙනසුරාදා "ලංකාදීප" පත්තරය වාර්තා කරනවා "ජනගහනයෙන් සියයට 33කට හරිහමන් කෑමක් නැහැ. ඉදිරි වසර දහයේ උග්‍ර රැකියා අර්බුදයක්. තරුණයන් 10කගෙන් 7කට හොඳ රස්සාවක් නැහැ. ලංකාවේ විදුලි බිල්පත ආසියාවේ ඉහළම විදුලි බිල්පත් අතර" කියලා. මේ, "ලංකාදීප" පත්තරය වාර්තා කරන්නේ.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා මේකද අපි බලාපොරොත්තු වුණේ? මේකද අපි බලාපොරොත්තු වුණේ? ඒ බලාපොරොත්තු වූ දේ ඉෂ්ට වුණාද, නැද්ද කියන එක ජනතාවගෙන් අහන්න ඕනෑ. ඒක ජනතාවගෙන් අහන්න තිබෙන එකම ක්‍රමය, මිනුම් දණ්ඩ මොකක්ද? සාමාන්‍ය මිනිහෙකුගේ උස මනිනවා නම්, අඩිකෝදුවක් අරගෙන මනින්න පුළුවන්. බර මනිනවා නම් තරාදියකින් මනින්න පුළුවන්. ආණ්ඩුවේ ප්‍රසාදය, අප්‍රසාදය මනින්න නම් පළාත් සභා මැතිවරණය පවත්වන්න ඕනෑ. පළාත් සභා මැතිවරණය පැවැත්වූවාම තමුන්නාන්සේලාට තිබෙන්නේ ජනතා ප්‍රසාදයක් ද, අප්‍රසාදයක් ද කියන එක බලාගන්න පුළුවන්. ආණ්ඩු ඕනෑ තරම් එනවා. හැබැයි, මොන තරම් ආණ්ඩු ආවත් ඒවා සදාකාලික නැහැ. දැන් ජනතාව විශාල අමාරුවකින් ඉන්නේ. හැබැයි, ඒ අමාරුවෙන් ඉන්න වෙලාවක වුණත් තමුන්නාන්සේලා හොඳ හොඳ කථා කියනවා. අපි දැකලා තිබෙනවා, බොහොම හොඳ කථා කියා තිබෙනවා.

මම දැක්කා තමුන්නාන්සේලාගේ නායකයෙක් කියා තිබෙනවා, මේ දවස්වල තිබෙන බලශක්ති අර්බුදය නිසා රට කරන්න තිබෙන වැඩය දවල්ට කරන්න කියලා. මේක මාර වැඩක් නේ. රට කරන වැඩය දැන් දවල්ට කරන්න වෙලා තිබෙන්නේ. මේ, එක්කෙනෙක් කියපු එකක්. ඊළඟට තව කෙනෙක් කියනවා, හැම දාම රෙදි හෝදන්න එපා, සතියකට සැරයක් රෙදි හෝදන්න ලු. ආපහු එක නෝනා කෙනෙක් - මන්ත්‍රීතුමියක් - කිව්වා, තෙල්වලට QR code එකක් දාපු නිසා මිනිස්සුන්ගේ අතේ දැන් සල්ලි ඉතිරි වෙලා තිබෙනවාය කියලා. ඒගොල්ලන් රට රට කථා කරලා, telephone කරලා ස්තුති කරනවා ලු. දෙවි හාමුදුරුවනේ! රටේ තෙල් ගණන් ගිහිල්ලා, ඔක්කෝම ගණන් ගිහිල්ලා මිනිස්සු අමාරුවෙන් ඉන්නේ. එහෙම අමාරුවෙන් හිටියත් කමක් නැහැ, මේ වාගේ ගොන් ආතල් නම් දෙන්න එපා. සාමාන්‍යයෙන් card pack එකක් - බුරු කුට්ටම - ගත්තාම, ඒකේ jokersලා දෙන්නයි ඉන්නේ. දැන් මේ මුළු pack එකේම jokersලා නේ. අද ඒ තත්ත්වයට පත් වෙලා. මේ, මිනිස්සුන්ට මල පැනලා ඉන්න වෙලාවක් නේ. මල පැනලා ඉන්න වෙලාවේ එහෙම එකක් ඇහුවාම අමාරුයි. අමාරුවෙන් ඉන්න වෙලාවේ, මල පැනලා ඉන්න වෙලාවේ මේ වාගේ දේවල් කියලා මිනිස්සුන්ව තවත් අසරණභාවයට පත් කරන්න එපා කියලා අපි ආණ්ඩුවට යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සරහට එන්නේ සිංහල අවුරුද්ද. අපි දන්නේ නැහැ, සිංහල අවුරුද්ද එනකොට තවත් කීයකින් ඩීසල් මිල ඉහළ යයි ද කියලා. අපි කියන්නේ නැහැ, මේක අපේ ප්‍රශ්නයක් කියලා. ඇමෙරිකාවේ ජනාධිපතිට පින් සිද්ධ වෙන්න තමයි මෙහෙම ඉල්ලාගෙන කන්න වෙන්නේ. ඩීසල් කීයට යයි ද? පෙට්‍රල් කීයට යයි ද? මේවායේ මිල ඉහළ ගිය ගමන් ප්ලේන්ටි එකේ ඉඳන් එක්කෝම

ගණන් යනවා. රාජ්‍ය සේවකයින්ට මේ මාසයේ පඩිය හම්බ වුණාම ආයෙත් මැයි මාසයේ අන්තිමට තමයි පඩියක් හම්බ වෙන්නේ. මේ පඩියෙන් සිංහල අවුරුද්ද කන්න පුළුවන්ද? සිංහල අවුරුද්ද කන්න නොවෙයි, ලෙව කන්නයි වෙන්නේ. සිංහල අවුරුද්ද කන්න බැහැ. ඒ තරමට මිනිස්සුන්ගේ ආර්ථිකය කඩාගෙන වැටිලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කථා කළා. බොහොම හොඳයි, ඒ කථාවේදී කියූ පරිදි සහන දීම ගැන අපි ස්තුතිවන්ත වනවා. හැබැයි ඒ එක්කම ජනාධිපතිතුමා කිව්වා, ධීවර ජනතාවට දෙන සහනාධාර ගැන. රුපියල් 150,000ක සහනාධාරයක් බහුදින ධීවර යාත්‍රාවකට දෙනවා කිව්වා. මොකද, බහුදින ධීවර යාත්‍රාවලින් තමයි අපට වැඩි මාළු අස්වැන්නක් ගෙනැල්ලා දෙන්නේ. මේ ධීවර සහනාධාරයට ඉස්සෙල්ලා තවත් ධීවර සහනාධාරයක් - රුපියල් 25ක සහනාධාරයක් - දුන්නා. ධීවරයෙකුට එක වාරිකයක් හම්බ වුණා. නැත්නම්, උපරිමයෙන් වාරික දෙකක් හම්බ වුණා. ඉන් පසුව තවත් එක වාරිකයක්වත් මේ වනකොට ලැබිලා නැහැ. මම ධීවර ඇමතිතුමාට කියනවා, පුළුවන් නම් මේ ගරු සභාවට අදාළ ලේඛන ගෙනැල්ලා පෙන්වන්න කියලා, මේ ධීවර සහනාධාරය අඛණ්ඩව දුන්නා ද කියන එකට. අඛණ්ඩව දුන්නා නම් පෙන්වන්න, මෙන්න තංගල්ල ධීවර වරායේ, බේරුවල ධීවර වරායේ, මීගමුව ධීවර වරායේ මේ බහුදින ධීවර යාත්‍රා හිමියාට මේ සහනාධාරය දීලා තිබෙනවා කියලා. එහෙම පෙන්වන්න බැහැ. අද ඒ බහුදින ධීවර යාත්‍රාවකට අනිවාර්යයෙන්ම රුපියල් ලක්ෂ 35ක වියදමක් යනවා. ඒ රුපියල් ලක්ෂ 35න් රුපියල් ලක්ෂ 20ක් යන්නේ ඩීසල්වලට. ඒ තරම් තත්ත්වයකට ඒ ධීවරයින් පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කියනවා, කරුණාකරලා මේ ජනතාව වෙනුවෙන් ඒ යුතුකම, වගකීම ඉටු කරන්න කියලා. එහෙම නැත්නම් ජනතාව ඉතාම අසරණ තත්ත්වයකට පත් වනවා.

අද ජනතාව ඉන්නේ බොහොම අමාරුවෙන්. මොකක්ද, හේතුව? අද මාළු ග්‍රෑම් 500ක් ගන්න යන්න, බලන්න. මාළුවල ගණන කීයද කියලා ඇහුවාම ඇඟේ මාළු නටනවා. ඒ තරමට මිනිස්සු අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, මේ අර්බුදය එන්නේ සිංහල අවුරුද්දක් එනකොට. මේ අර්බුදයෙන් අපි ගොඩ එන්න ඕනෑ. සමහර අහිංසක මිනිස්සු තමන්ගේ ගේ දොර විකුණලා ස්ථාවර තැන්පතුවක් දාලා තිබෙනවා. ඒ තැන්පතුවට ලැබෙන පොලියෙනුත් සියයට 10ක් කපා ගන්නවා. මේකෙන් මොකක්ද වෙන්නේ කියලා හිතලා බලන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

අපි විදේශ ව්‍යාපාරිකයින් ආරක්ෂා කර ගන්න ඕනෑ. අපි ආණ්ඩුවට කියනවා, ඔවුන්ගේ බෙල්ල මිරිකන්න එපා කියලා. දැනුත් බදු ගහලා, ගහලා ඔවුන්ගේ බෙල්ල මිරිකලා තිබෙන්නේ. Sri Lanka Customs එකෙන් හදිසියේ එනවා, සමහර ව්‍යාපාරික ස්ථානවලට. එහෙම ඇවිල්ලා ඒ ස්ථානවල තිබෙන ලැප්ටොප් එක, අරවා මේවා ඔක්කෝම උස්සාගෙන යනවා. මේ රටේ සිටින ව්‍යාපාරිකයින් හොරුද? නැහැ, ඒ අය හොරු නොවෙයි. ඔවුන් මේ රටේ ආර්ථිකයට සම්බන්ධ වන මිනිස්සු. ඒ අයට සලකන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. විශේෂයෙන් මේ සිංහල අවුරුද්දේ ජනතාවට තිබෙන ජීවන බර අඩු කරන්න කියලා අපි යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.08]

**ගරු සුගත් තිලකරත්න මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுகத் திலகரத்ன - விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர்)
(The Hon. Sugath Thilakaratne - Deputy Minister of Sports)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනයේ නියෝග දෙකක්, පනත් කෙටුම්පතක් සහ තවත් අයිතම කිහිපයක් විවාදයට ගන්නවා. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ වූ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයට අදාළව තහනම් ද්‍රව්‍ය ලැයිස්තු ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදී මා මේ කාරණය කියන්න කැමැතියි.

අද වනකොට ක්‍රීඩාව ලෝකයේ ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා. විශේෂයෙන්ම තාක්ෂණික පැත්තෙන්, විද්‍යාව පැත්තෙන් ලෝකයේ තිබෙන දියුණුවත් එක්ක ක්‍රීඩාව අද විශාල තරගකාරී මට්ටමකට පත්ව තිබෙනවා. මේ තරගකාරී මට්ටමත් එක්ක ක්‍රීඩකක්‍රීඩිකාවන්ගේ ආර්ථිකයත් ගොඩක් ඉහළ මට්ටමකට එසවිලා තිබෙනවා. මේ කරුණු කාරණා එක්ක කෙසේ හෝ ක්‍රීඩාවෙන් ජය ගැනීමට, එහෙම නැත්නම් මේ තිබෙන ආර්ථිකය ඔවුන් වෙත ළඟා කර ගැනීමේ අභිප්‍රායයන් එක්ක විවිධ උපක්‍රම භාවිත කරමින්, ඔවුන්ගේ ජයග්‍රහණ වාගේම ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා ඉහළට ඔසවා තැබීමට උත්සාහ කරනවා.

අපි ක්‍රීඩාවේදී විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ, පිරිසිදු ක්‍රීඩාවක්. ක්‍රීඩා කරනකොට සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔවුන්ගේ ශාරීරික ශක්තිය සහ මනස වෙහෙසවමින් තමයි ඔවුන්ගේ දක්ෂතා ඉදිරියට ගෙනෙන්නේ. අද වනකොට ලෝකය වෙනස් ගමනකට යන අතරතුර ඔවුන් පුරුදු වෙලා තිබෙනවා, කෙසේ හෝ බාහිර දේවල් තම ශරීරයට ඇතුළු කරගෙන, තහනම් ද්‍රව්‍ය භාවිත කරමින් ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් ගොඩනහා ගැනීමට. මේ සඳහා තමයි විශේෂයෙන්ම ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය පිහිටුවන්නේ. ඒ හා සමගාමීව තමයි 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය පිහිටුවන්නේ. ඒ තුළින් විශේෂ කාර්යභාරයක් රට තුළ සිදු වනවා.

මීට බොහෝ කාලයකට පෙර මේ උත්තේජක වර්ග පිළිබඳව ක්‍රීඩකයින් නොදැන සිටීම නිසා විවිධාකාරයෙන් ඔවුන්ට මේවා ශරීරගත කරලා තිබුණා. ඒවාට සම්බන්ධ වුණු විවිධ පුහුණුකරුවන්, ඒ වාගේම විවිධ පාර්ශ්ව ඉන්නවා. ඒ පාර්ශ්ව එක්ක එකතු වෙලා තමයි මේ සම්බන්ධව කටයුතු කරලා තිබුණේ. හැබැයි, ලංකාව ගත්තොත් වර්ෂ 2000න් පසු කාලය තුළ තමයි තහනම් උත්තේජක පිළිබඳව, එහෙම නැත්නම් තහනම් ද්‍රව්‍ය පිළිබඳව විශේෂ විමසිල්ලකට භාජන වන්නේ. ඒත් එක්ක තමයි ශ්‍රී

[ගරු සුගත් තිලකරත්න මහතා]

ලංකාව තුළත් තහනම් උත්තේජක මර්දන ව්‍යාපාරය ක්‍රියාත්මක වන්න පටන් ගන්නේ. ඒ අනුව තමයි 2013දී මේ සියල්ලම ස්ථාපිත වන්නේ.

World Anti-Doping Agency එක හරහා දැනට ලෝකයේ පවතින තහනම් ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තුවක් වාර්ෂිකව ඉදිරිපත් කරනවා. ඒ ලැයිස්තුව සෑම වර්ෂයකදීම අපි මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්න ඕනෑ. ඒ අනුව 2026 වර්ෂයට අදාළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව පිළිබඳව තමයි අද අපි මේ සාකච්ඡා කරන්නේ.

විශේෂයෙන්ම තහනම් ද්‍රව්‍ය පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය මඟින් රට පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් වසර පුරාම ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම පාසල් දරුවන්, පුහුණුකරුවන් ආදී සියලුදෙනාම දැනුවත් කරමින් මේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. ඒ කොහොම වුණත් ඒ ද්‍රව්‍ය මොනවාද කියන එකත් අපි බොහෝ වෙලාවට ප්‍රසිද්ධ කරනවා. මොකද, ලංකාව කියන්නේ දූෂණවලට ටිකක් කැමති පිරිසක් සිටින රටක්. ඒ වාගේම "මේ දේ කරන්න එපා" කියලා අපි කිව්වොත් ඒ දෙයම කරන්න පෙලඹෙන ස්වභාවයක් තිබෙන පිරිසක් සිටින රටක්. එම නිසා අපි මේ තහනම් ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තුව එළිදැක්වූවාම ඒ දේවල්ම ප්‍රයෝජනයට අරගෙන ක්‍රීඩාවෙන් ආර්ථික වාසි ලබා ගන්න සමහර කණ්ඩායම් පෙලඹෙන අවස්ථාත් තිබෙනවා. එහෙම අවස්ථා නැතුවාම නොවෙයි. අපි මෙවැනි දේවල් එළිදැක්වීම තුළින් අපේ රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අයුතු ප්‍රයෝජන ගන්න උත්සාහ කරයි කියලා මට සාමාන්‍යයෙන් බියකුත් ඇති වෙනවා.

මොකද, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පමණක් නොවෙයි, විවිධ ක්‍රීඩා කණ්ඩායම් තිබෙනවා. ඒ ක්‍රීඩා කණ්ඩායම්වල සහයෝගයෙන් තමයි බොහෝ වෙලාවට අපේ රටේ ක්‍රීඩාව විනාශ වෙන්නේ.ඒ වාගේම, තහනම් උත්තේජක අරගෙන ක්‍රීඩකයන් බලාපොරොත්තු වෙන්නේ ජයග්‍රහණ වුණාට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය මඟින් ඔවුන්ගේ සාම්පල පරීක්ෂාවට ලක් කරන අවස්ථාවේදී ඒවා positive වුණොත් ඒක රටට වාගේම ක්‍රීඩාවටත් විශාල හානියක් වෙනවා. ඒ වාගේම නිවැරදිව ක්‍රීඩා කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටත් ඒ මඟින් විශාල හානියක් සිදු වෙනවා.

ඒත් එක්කම, 2013 වසරේ ඉඳලා පසුගිය වසර 13ක කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයන් 70දෙනෙක් පමණ තහනම් උත්තේජක චෝදනාවලට වරදකරුවන් වෙලා තිබෙනවා. ඒ සියලුදෙනාගේම ක්‍රීඩා කටයුතු මාස 6 සිට වසර 4 දක්වා වූ කාලයක් සඳහා තහනමට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා අපි හිතන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ සිටින දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමයි මේ විධියට තහනමට ලක් වෙලා, ඔවුන්ගේ දක්ෂතා ක්‍රීඩාව වෙනුවෙන් ඉදිරිපත් කර ගන්න බැරිව අසරණ වෙලා සිටින්නේ. අපි මෙවැනි ලැයිස්තු එළිදැක්වීම තුළින් අවම වශයෙන් ඔවුන් වරදට පෙලඹෙන එක හෝ අපට අඩු කර ගන්න පුළුවන් වෙයි කියලා අප විශ්වාස කරනවා. විශේෂයෙන්ම ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමයි මේ විධියට තහනමට ලක් වෙන්නේ.

හැබැයි, ඔවුන් මේ විධියට තහනමට ලක් වෙනකොට විශේෂයෙන්ම ඔවුන්ගේ පුහුණුකරුවන්, ඒ වාගේම ඔවුන්ට මෙවැනි තහනම් උත්තේජක ද්‍රව්‍ය ලබා දෙන පුද්ගලයින් පිළිබඳව සමහර විට අපට තොරතුරු ලැබෙනවා අඩුයි. එසේ තොරතුරු ලැබුණත් ඔවුන්ට දඬුවමක් දෙන්න ක්‍රමවේදයක් අපේ රට තුළ ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, ඉදිරියේදී ක්‍රීඩකයන්ට, අදාළ පුහුණුකරුවන්ට වාගේම බාහිරින් ක්‍රීඩාවට උදවු කරන අය ඉන්නවා නම් ඔවුන්ටත් අනිවාර්යයෙන්ම යම්කිසි විධියක දඬුවමක් ලබා දෙන්න කටයුතු කරමු කියලා. එහෙම නොවුණොත් ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව විතරයි හැමදාම මේ සමාජය තුළ අසරණ වෙන්නේ; ක්‍රීඩාව තුළ තනි වෙන්නේ. මොකද, ඔවුන්ව පුරුදු පුහුණු කරන පුහුණුකරුවන් දිගින් දිගටම ක්‍රීඩාංගණය තුළ ඉඳිමින් ක්‍රීඩකයන් තව තවත් පුහුණු කරන එක තමයි ඔවුන්ගේ කාර්ය භාරය වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් කොතැන හෝ වැරැද්දක් සිදු වෙලා ඇති කියලා අපි හිතනවා. ඒ වැරැද්ද නිවැරදි කර ගන්න නැත්නම් මෙවැනි දේවල් කෙසේ හෝ වළක්වා ගන්න තමයි අපි අද මේ ලැයිස්තුව ඉදිරිපත් කිරීම තුළින් බලාපොරොත්තු වෙන්නේ.

විශේෂයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තරගවලට මුහුණ දෙන අවස්ථාවලදී අපට සාම්පල ලබා ගන්න පුළුවන්. එහෙම නැත්නම් ක්‍රීඩා තරගාවලියක් පැවැත්වෙන අවස්ථාවකදී සාම්පල ලබා ගන්නත් පුළුවන්. එහෙම නැත්නම් අපට තරග අවාර කාලවලදී සාම්පල ලබා ගන්නත් පුළුවන්. විශේෂයෙන්ම මම මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 2025 වසරේදී එක් ක්‍රීඩකයෙකුගේ මුත්‍රා සාම්පල ලබා ගැනීමට ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ නිලධාරින් ගිය වෙලාවේදී ඒ ක්‍රීඩකයා මුත්‍රා සාම්පල ලබා දීම ප්‍රතික්ෂේප කරලා තිබුණා. එලෙස ඔහු එය ප්‍රතික්ෂේප කරලා ඔහුගේ පුහුණුකරුත් සමඟ පලා ගිහින් තිබුණා. හැබැයි, දිගින් දිගටම ඔවුන් පිටුපස ගොස් පරීක්ෂා කරන්න ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ නිලධාරින් අවශ්‍ය කටයුතු කරලා තිබුණා. මේ වනකොට ඔහුට තරග තහනමක් පනවා තිබෙනවා. තරග තහනම පැනවෙන්නේ 2026 මාර්තු මස 05වැනි දින. ඔහුගේ තරග තහනම් කාලය 2027 ඔක්තෝබර් 30වැනි දින දක්වා තිබෙනවා. මුත්‍රා සාම්පල එහෙම නැත්නම් රුධිර සාම්පල ලබා දීලා ඒවා positive වීම පමණක් නොවෙයි, මේ කර්තව්‍යයට බාධා කිරීම එහෙම නැත්නම් එය මඟ හැරීම පවා දඬුවම් ලබන්න පුළුවන් අවස්ථා වෙනවා.

කෙසේ වෙතත් ඉදිරියේදී මේ කටයුතු නිවැරදිව සිදු වෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන් ක්‍රීඩකයන් සහ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ප්‍රමාණය අපි වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම සාම්පල ලබා ගැනීමේ ක්‍රමවේදයත් අපි වැඩිදියුණු කරන්න ඕනෑ. 2023 වසරේදී මුත්‍රා සාම්පල 145කුත්, 2024 වසරේදී මුත්‍රා සාම්පල 130කුත් ලෙස තමයි ලබාගෙන තිබෙන්නේ. 2025 වසරේ ලබා ගත් මුත්‍රා සාම්පල ප්‍රමාණය ගොඩක් අඩු වෙලා තිබෙනවා. ඒ අනුව මුත්‍රා සාම්පල 41ක් පමණයි ලබා ගෙන තිබෙන්නේ. නමුත් මම හිතනවා, මේ ප්‍රමාණය 41ක් විය යුතු නැහැ කියලා. මොකද, මේ වෙනුවෙන් විශාල මුදලක් අපි අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. අපි ක්‍රීඩාව හොඳ තැනකට ගෙනෙන්න නම් මේ ලැයිස්තුව එළි දැක්වීම පමණක් ප්‍රමාණවත් මදි. මුත්‍රා සාම්පල පරීක්ෂාව තුළින් තමයි ක්‍රීඩකයන් කරන වැරදි මඟ හරවා ගැනීමට අපට පුළුවන් වෙන්නේ. ඒ නිසා අපි හිතනවා, ඒ සඳහා තව තවත් මහන්සි විය යුතුයි කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් සඳහන් කරනවා. ඉදිරියේදී ආසියානු ක්‍රීඩා උළෙල සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල පැවැත්වීමට නියමිතව තිබෙනවා. මේ තරග සඳහා අපේ රටේ ක්‍රීඩකයන් අනිවාර්යයෙන් පිරිසිදු ක්‍රීඩකයන් හැටියට අපි සහභාගි කළ යුතු වෙනවා. එක ක්‍රීඩකයෙක් හෝ කළු පැල්ලමක් ඇති කළොත් ඒ තුළින් අපේ රටට සහ ක්‍රීඩාවට ලොකු හානියක් වෙනවා. මේ සියල්ල මඟ හරවා ගනිමින් කටයුතු කරන්න අපට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.19]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේදී අපි පළමුවෙන්ම ඒ සඳහා අපේ එකඟත්වය සහ කැමැත්ත ප්‍රකාශ කරන්න කැමතියි. ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් ඒ කටයුත්ත කිරීම පිළිබඳව අපේ සතුට අපි ප්‍රකාශ කරනවා.

අපට ඊටත් වඩා සතුටට කාරණයක් තිබෙනවා. එදා චීන කොලනියක් වෙයි කියලා ඔබේ ජනාධිපතිවරයා කියපු, සීගිරි ගල කඩලාවත් ගොඩ කරන්න බැහැ කියලා ඔබේ ජනාධිපතිවරයා කියපු, වරාය නගරයෙන් ප්‍රතිලාභ ගැනීම වෙනුවෙන් කටයුතු කරන්න තීරණය කිරීම පිළිබඳවත්, ඒ සඳහා යම් යම් තීන්දු ගැනීමට කටයුතු කිරීම පිළිබඳවත් අපේ සතුට ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වාගේම අද දවසේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනතාව මත තබපු බර යම් තාක් මට්ටමකින් අඩු කරන්න කටයුතු කිරීම පිළිබඳවත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විධියට මගේ සතුට මේ වෙලාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වසන්ත සමරසිංහ ඇමතිතුමා මීට මොහොතකට කලින් කිව්වා, පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා විපක්ෂය පාර්ලිමේන්තුවේදී බොරු කියනවා කියලා. එතුමා විපක්ෂයේ ඉන්නකොට කියපු බොරු අද වනකොට එතුමාට අමතක වෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී මෙම කාරණයත් කියන්න කැමතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 2024 දෙසැම්බර් 18වැනි දින - මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා - එතුමා ප්‍රසිද්ධ රූපවාහිනී නාළිකාවකදී කිව්වා, මේ රටේ හාල් ආනයනය කරන අවසාන අවස්ථාව බව ලියලා තියා ගන්න කියලා. එහෙම කියපු වසන්ත සමරසිංහ මැතිතුමා අද වනවිට හතර වතාවකට වැඩිය හාල් ආනයනය කරලා තිබෙනවා. මේ වනවිටත් එතුමා හාල් ආනයනය කරමින් ඉන්නවා. එදා එතුමා කිව්වේ ගජ මිතුරන්ට වාසි ලබා දෙන්න හාල් ආනයනය කරනවාය කියායි. අපි අහන්න කැමතියි, අද වසන්ත සමරසිංහ මැතිතුමා එතුමාගේ ගජ මිතුරන්ට සහන දෙන්නද මේ හාල් ආනයනය කරන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙලාවේ තිබෙන ගැටලු කිහිපයක් පිළිබඳව මම මේ සභාව හමුවේ කියන්න කැමතියි. 2025 උසස් පෙළ විභාගයට පෙනී සිටි දරුවන්ගේ ප්‍රතිඵල මේ වනවිට නිකුත් වෙලා තිබෙනවා. හැබැයි, 2024 දෙසැම්බර් මාසයේ පැවති උසස් පෙළ විභාගය සමත් වෙලා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට තේරුණු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ආරම්භ කර ගන්න තවම ඔබගේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් වැඩි පිරිසක් ඒ තරුණ ළමයින්ගේ පළමුවැනි ඡන්දය අරගෙන තමයි අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. අඩු ගණනේ ඒ පීඨය පැත්තෙන්වත්, විශ්වවිද්‍යාලය පැත්තෙන්වත්, රජය පැත්තෙන්වත් තවම ඒ දරුවන් වෛද්‍ය පීඨයට බඳවා ගැනීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා නැහැ. අවුරුදු දෙකකට ආසන්න කාලයක් තිස්සේ ඒ දරුවන් ගෙදර. ඒ දරුවන්ගේ කාලය, ඔවුන්ගේ ජීවිතයේ වටිනාම කාලය අද අපතේ යමින් තිබෙනවා. ඒක ජාතික අපරාධයක්. ඒ නිසා ඒ දරුවන්ගේ කාලය ගැන හිතලා, ඔබේ ආණ්ඩුවේ ප්‍රමුඛ අවශ්‍යතාවක්, ප්‍රමුඛ කටයුත්තක් විධියට සලකා ඒ ගැටලුව විසඳන්න කටයුතු කරන්න කියලාත් මම මේ මොහොතේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද රටේ ජනප්‍රිය පාසල්, ජාතික පාසල් සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. දිවයින පුරා ජාතික පාසල්වල පුරප්පාඩු වෙලා තිබෙන අධ්‍යාපන පරිපාලන සේවයේ පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ මේ වන විට පවත්වලා අවසානයි. ඒ සම්මුඛ පරීක්ෂණය පවත්වලා, සුදුසුකම් සහිත 46දෙනෙකුගේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා දැන් මාස ගණනාවක් වෙනවා. හැබැයි තවම ඔබේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා, ඒ පත්වීම් ලබා දෙන්න. මම මුලිනුත් කිව්වා, අධ්‍යාපනය කියන්නේ ප්‍රමුඛ කාර්යයක් බව. අද විදුහල්පතිවරු නොමැතිව මේ රටේ ජාතික පාසල්වල පරිපාලන කටයුතු කරගෙන යන්න බැරි වෙලා තිබෙනවා. වැඩ බලන විදුහල්පතිවරුන්ට ඒ බලය නැහැ. අපි දන්නවා, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය, මාතර රාහුල විද්‍යාලය ඇතුළු පාසල් විශාල ගණනක අද මේ ගැටලුව මතු වෙලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඉල්ලීමක් කරනවා, මේකට කල් ගන්න එපා, කල් මරන්න එපා කියලා. සුදුසුකම් ලබපු විදුහල්පතිවරුන්ට ඒ පත්වීම් දීලා, අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කරන්න. ඔබේ ප්‍රමුඛ කාර්යයක් විධියට ඒ කටයුත්තටත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දිගින් දිගටම මම මේ පාර්ලිමේන්තුවේ කථා කළ කරුණක් පිළිබඳවත් අවධානය යොමු කරන්න කැමැතියි. පුල්මුඩේ ඛනිජ වැලි සමාගමේ අනියම් පදනමින් සේවය කරන කම්කරු මහත්වරුන් 80කට අධික පිරිසක් අද ඉතාම ඛේදනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඔවුන් අවුරුදු එකහමාරක් තිස්සේ කිසිදු වැටුපක් නැතුව සේවය කරනවා. ගෙවල් දොරවල් රක්ෂා කරන්න ඕනෑ මිනිස්සු ගෙවල් දොරවල්වලින් සල්ලි අරගෙන, ගෙදර අම්මා තාත්තාගෙන් මුදල් ඉල්ලාගෙන, යහළුවන්ගෙන් මුදල් ඉල්ලාගෙන අවුරුදු එකහමාරක් තිස්සේ ලංකා ඛනිජ වැලි සමාගමේ සේවය කරනවා, කිසිදු වැටුපක් ලබා ගන්නේ නැතුව. ඒ සම්බන්ධව මම පාර්ලිමේන්තුවේදී ගරු ඇමතිතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම එතුමා ඉතාම සාධනීය පිළිතුරක් ලබා දුන්නා. එතුමා කිව්වා ඛනිජ වැලි සමාගමේ සේවක මහත්වරුන් ස්ථිර කරන්න කටයුතු කරනවාය කියලා. නමුත් කනගාටුවට කරුණ නම්, එතුමා සාධනීය පිළිතුරක් ලබා දුන්නත්, කැබිනට් මණ්ඩලය එය අනුමත කරලා තිබුණත්, භාණ්ඩාගාර අනුමැතිය දීලා තිබුණත් අද ඔබ ඒ 80දෙනා බඳවා ගැනීම පැත්තකින් තියලා අලුතෙන් බඳවා ගැනීමට උත්සාහයක් ගනිමින් තිබෙනවා. ඒක ඉතාම ඛේදනීය කරුණක්. අවුරුදු එකහමාරක් ඔවුන් වැඩ කළා. ඔවුන් ගින්දරෙන් ජීවත් වෙන්නේ. එහෙම ගින්දර දෙන්න එපා මිනිසුන්ට. ඒ ගින්දර පෙරළා ඔබ පසුපස එනවාය කියන කාරණයත් මතක තියා ගන්න. අපි දැක්කා, උප පොලිස් පරීක්ෂකවරු 100ක් බඳවා ගන්න තිබියදී, ඒ අයට පත්වීම් ලියුම් දෙන්න තිබෙද්දී ඔබ ඒක නැවැත්වුවා. ඒවා ගින්දර. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, මිනිසුන්ට ගින්දර දෙන්න එපාය කියලා. ඒ ගින්දර ඔබ පසුපස එනවා. ඒ නිසා ඒ සේවක මහතුන් පිළිබඳව අවධානය යොමු කරන්න කියලාත් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය සහන ණය ලබා දීම වෙනුවෙන් කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තා, 2026.01.01 සහ 2026.01.12 යන දිනවල. පැහැදිලිව තීරණයක් අරගෙන

[ගරු චානක මාදුගොඩ මහතා]

තිබෙනවා. කර්මාන්ත අමාත්‍යාංශය පවා මේ සඳහා නිර්දේශ ලබා දීලා තිබෙනවා. නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාත්මක කිරීමට වාණිජ බැංකු හා රාජ්‍ය බැංකු තවමත් පසුබට වෙමින් සිටිනවා. බැංකු නිලධාරීන් විවිධ ප්‍රායෝගික බාධා පෙන්වමින්, ඒ ණය මුදල් නිදහස් කිරීම පමා කරමින් තිබෙනවා. බැංකු පැත්තෙන් ගැටලුවක් තිබෙනවා. ඒ නිලධාරින්ට ඒ ගැටලුව නිරාකරණය කරලා දීලා, ඒ ණය ලබා දීමට කටයුතු කරන්න. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව පවා ලිපි මඟින් පිළිගෙන තිබෙනවා, ඒ ණය ලබා දීම සම්බන්ධයෙන් ප්‍රායෝගික ගැටලුවක් තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2025 දෙසැම්බර් මාසයේ සිට තවම ජනාධිපති ලේකම් කාර්යාලය සහ අදාළ අමාත්‍යාංශය අතර ලිපි හුවමාරු මඟින් විතරයි කටයුතු කරන්නේ. ක්ෂේත්‍රයේ සිටින ව්‍යවසායකයන්ට තවම විසඳුමක් ලැබිලා නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ආරක්ෂා කර ගැනීම ඔබේ ආණ්ඩුවේ යුතුකමක්, වගකීමක්. ඔබ විපක්ෂයේ ඉන්නකොට ඒ වෙනුවෙන් හඬ නැඟුවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ශක්තිමත් කරන්න කියලා. ඒ සඳහාත් ඔබේ අවධානය යොමු කරන්න කියන කාරණයත් ඉල්ලා සිටිමින්, අද දවසේ මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.27]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ වැදගත් පනත් කෙටුම්පතක් සහ පනත් කිහිපයක් යටතේ නියෝග අනුමත කරන මේ විවාදයට සහභාගි වෙන්න ලැබීම සතුටට කරුණක්. මෙක ඊටත් වඩා සුවිශේෂී වෙන්නේ, අපේ ගරු ජනාධිපතිතුමා පසුගිය අය වැය කථාවේදී ඉදිරිපත් කරපු කරුණු අනුව අදාළ නීති සම්පාදනය කිරීමේ කාර්ය භාරය තමයි අද මේ පනත් යටතේ කෙරෙන්නේ. විශේෂයෙන්ම සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කිරීම, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියෝග අනුමත කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ රීති කිහිපයක් අනුමත කිරීම සිදු වෙනවා. ඊට අමතරව අපි දන්නවා ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට අදාළ තහනම් නියෝග කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියන එක. එම පනත යටතේ නියෝගත් ඉදිරිපත් කර තිබෙනවා. මෙන්න මේ අදාළ කරුණු ටික තමයි අද සාකච්ඡා කෙරෙන්නේ.

අද මීට මොහොතකට පෙර අපේ ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා. ලෝකයේ පවතින යුද තත්ත්වය තුළ අලුතින් මේ රට මුහුණ දෙන තත්ත්වයන්ට මාස 3ක කෙටි කාලීන සැලැස්මක් සහිතව රජයක් විධියට කොහොමද මුහුණ දෙන්නේ කියන එක සාකච්ඡා කළා. අපේ රට නිවැරදි මඟට අරගෙන, ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන්, එදිනෙදා තත්ත්වයන් ගළපමින්, හොඳ කළමනාකාරිත්වයක් සහිතව ඉදිරියට යන ආකාරය අපි දකිනවා. විශේෂයෙන්ම බහුතර ජනතාවක් තේ වගා කරන ප්‍රදේශයක තමයි මම ජීවත් වන්නේ. ලංකාවේ තේ වගා කරන විශාල ප්‍රජාවක් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, විශාල ධීවර ප්‍රජාවක් ඉන්නවා. ඒ වාගේම, සුළු ආදායම් ලබන ප්‍රජාවක් ඉන්නවා. ඒ සියලු දෙනාට මේ මාස 3ක සැලැස්ම තුළදී සහනයක් ලැබෙන්නේ කොහොමද කියලා සාකච්ඡා කළා. විශේෂයෙන්ම පවතින දේශගුණ තත්ත්වයත් එක්ක තේ දළු නිෂ්පාදනයේ යම් අඩුවකුත් තිබෙන වෙලාවක මේ වාගේ සහනයක් ලබා දීම වටිනවා. ඒ ජනතාව ඉතාම බලාපොරොත්තුවෙන් හිටපු දෙයක් තමයි ජනාධිපතිතුමා අද ඉදිරිපත් කළේ.

මේ වෙලාවේ ඇත්තටම තව කාරණයක් කියන්න ඕනෑ. අපි මේ තහනම් උත්තේජක ගැන කථා කරනකොට, තහනම් උත්තේජක භාවිත කරන විපක්ෂයක් තමයි අපට හම්බවෙලා තිබෙන්නේ කියන කාරණයත් කියන්න ඕනෑ. මොකද, යම් රීති සම්ප්‍රදායන් උල්ලංඝනය කරමින්, සදාචාරාත්මක නොවන විධියට, මේ රටේ රජය කරන හොඳ වැඩ පවා විවේචනය කරමින්, අසුබවාදී දැක්මක් සහිතව කථා කරන සහ ජනතාව කුපිත කරවන විපක්ෂයක් තමයි අපට ඉන්නේ. ඉතින්, ඒ විපක්ෂයත් තහනම් උත්තේජක පාවිච්චි කරලා අනියම් ආකාරයෙන් මේ රටේ බලය ඩැහැගන්න උත්සාහ කරන කණ්ඩායමක් කියලා මට හිතෙනවා. ඒ නිසා මේ තහනම් උත්තේජක කථාව ඇත්තටම විපක්ෂයටත් අදාළයි.

මෙහිදී අපි දකින සුබවාදී දෙයකුත් තිබෙනවා. පසුගිය කාලයේ අපි දැක්කා, උදේ පාන්දර මේ සභාව ඇතුළේ කොහොමද ඔවුන් හැසිරුණේ කියලා. ඝෝෂා කරමින්, සභාව ආක්‍රමණය කරමින්, මාධ්‍ය හරහා ජනතාවට විකෘති රූපී ස්වභාවයක් ගෙන දෙන, ප්‍රහාරාත්මක ආකාරයේ හැසිරීමක් අපි දැක්කා. ඒ විතරක් නොවෙයි. අවිද්‍යාත්මක කථා, අසාධාරණ කථා සමාජයට ගෙන යන යන්ත්‍රණයක් විධියට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කළා. ඒකට අදාළ මාධ්‍ය ප්‍රධානීනුත් මෙතැන සිටියා. ඒගොල්ලන් මේ රට අවුල් කරන, මිනිස්සුන්ගේ මනස විකෘති කරන ව්‍යාපාරයක් ගෙන ගියා. හැබැයි, අද වෙනකොට අර ඉරානයට ගහන බෝම්බ වාගේ ඒවා ඇවිල්ලා වැටිලා තිබෙනවා විපක්ෂයට. විපක්ෂයත් අද ඉන්නේ එහෙම. ඒ සද්ද බද්ද අඩුයි දැන් ඇත්තටම. මොකද, හේතුව විපක්ෂයටත් දිට්ඨධම්මවේදනීය කර්මය පල දීලා තිබෙනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒගොල්ලන් අතර ගැටුම් ඇතිව තිබෙනවා. දැන් ඇත්තටම විපක්ෂය ඇතුළේ තිබෙන ගැටුම් ගැන තමයි මේ රටේ මිනිස්සුන්ට කථා කරන්න වෙලා තිබෙන්නේ. මේ පැත්තෙන් ලෝකයේ යුද්ධයක් තිබෙන අතරේ, තව පැත්තකින් ආර්ථික අර්බුදයකටත් මුහුණ දෙමින් සිටින අතරේ, එය අපේ රටවලටත් බලපාන අතරේ, මේ පැත්තෙන් වියළි දේශගුණ තත්ත්වයකුත් තිබෙන අතරේ, විපක්ෂයට මොකද වෙලා තිබෙන්නේ? විපක්ෂයේ තිබෙන විකාර ටික තමයි ජනතාව දැන් හැම තැනම කථා කරන්නේ. අපි දකිනවා, තමන් කරපු දේවල පල නෙළා ගන්නා විපක්ෂයක්. පසුගිය දවස් ටිකේ කරපු දේවල්වල පල දැන් විපක්ෂය භුක්ති විඳිනවා. මම හිතනවා, තව මාස කිහිපයක් යනකොට මේ විපක්ෂයට ඇත්තටම පාර්ලිමේන්තුවට එන්නත් බැරි තරම්, ජනතාව අතරට යන්නත් බැරි තරම් ලජ්ජා සහගත තත්ත්වයක් ඇති වෙයි.

අපි දැන් අද දවසේ අපේ සාකච්ඡාවට යමු. අද අපි මේ පනත් කෙටුම්පතත්, නියම සහ රීතිවලිනුත් මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? අපි දන්නවා, අපි මේ රට ක්‍රමක්‍රමයෙන් යම් සාධනීය තැනකට ගෙන එමින් තිබෙන බව. ඒ යටතේ විශේෂයෙන්ම පළමුවෙන්ම කරන දේ තමයි, මේ රට පිළිබඳ විශ්වාසය ගොඩ නඟන එක. අපි දැන් ලෝකය හමුවේ මේ රට පිළිබඳ විශ්වාසය ගොඩ නඟලා තිබෙනවා; මේ රටට මෙච්චර කල් තිබුණු "දූෂිතයන්ගේ රාජ්‍යය" කියන නම වෙනස් කරලා තිබෙනවා. සාධාරණ සමාජයක් තිබෙන, සාධාරණ පාලකයන් සිටින, ජනතාව වෙනුවෙන් වැඩ කරන පාලකයන් සිටින රටක් බවට මේ රට දැන් ලෝකය පුරා ප්‍රසිද්ධයි. ඒ විතරක් නොවෙයි, යම් අර්බුදයක් පැන නැඟුණොත් ජනතාවත් එක්ක එකතු වෙලා ඒ අර්බුදය හොඳින් කළමනාකරණය කරලා ජනතාවගේ පීඩනය ඉක්මනින්ම නිමා කරන්න මහන්සි වන රජයක් තිබෙන බවත් දැන් ප්‍රසිද්ධයි. වසරක් ඇතුළත අප ගොඩ නඟා ගත් ඒ ප්‍රතිරූපය අපි දැන් ඊළඟ අදියරට ගෙන යා යුතුයි.

ඒ අදියර තමයි ආයෝජනය වර්ධනය තුළින් අපේ රටේ ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම. අපේ රටේ අයත් - ස්වදේශිකයෝත් - පිටරටවලට ගිහිල්ලා මුදල් හම්බ කරනවා. ඒ දේශීය සහ විදේශීය සියලු ආයෝජන ගෙනැල්ලා නැවත අපේ රටේ ආර්ථික වර්ධනයේ පිම්මක් ගත යුතු අවධිය තමයි දැන් ඇවිල්ලා තිබෙන්නේ. ඒකට අවශ්‍ය වන වැදගත් අණ පනත් පාර්ලිමේන්තුව විධියට සම්මත කරලා දෙන එක තමයි අපේ පැත්තෙන් අපට තිබෙන වගකීම. මෙපමණ කලක් අපේ රට ගැන පිටරට ආයෝජකයන් සහ අපේම රටේ ආයෝජකයන් හිතුවේ කොහොමද? ඔවුන් හැමදාම හිතුවේ, මේ රටේ ආයෝජනය කරන්න පුළුවන් වන්නේ ඇමතිතුමා යාළු කරගෙන, එතුමාට commission එකක් දීලා, එතුමාට කීයක් හරි මිට මෙළවීමෙන් පමණක්ය කියලායි. එවැනි මතයක් තමයි මේ රට ගැන තිබුණේ. ඒක ධනවාදී ආර්ථිකයටත් විරුද්ධයි. ඒක ඔබතුමන්ලා නිතරම කථා කරන, මෙතැනදී නිතරම පාරම් බාන ඔබතුන්ලාගේ ආර්ථික ක්‍රමයටත් විරුද්ධයි.

ඔය කියන ආකාරයට commissions දීලා කටයුතු කරන එක ඒ ආර්ථික ක්‍රමයට පවා විරුද්ධ ක්‍රමයක්. හැබැයි, අපේ රටේ තිබිච්ච ඒ විකෘති ආර්ථික ක්‍රමය තුළ මිනිසුන්ට ඒත්තු ගන්වා තිබුණා ඇමතිට ගාණක් දෙනවා නම් ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියා. මට මතකයි, ලංකාවේ හිටපු ඇමතිවරයෙකුට එසේ අදාළ ගාණ දුන්නේ නැතිව ජපානයේ ආයෝජකයන් පිරිසක් අපේ රටින් යන්න ගිය ආකාරය. ප්‍රසිද්ධියේම ඒ වාගේ අවිචාරවත් ආර්ථිකයක් පවත්වාගෙන ගිය මේ රටට අපි ක්‍රමක්‍රමයෙන් විචාරවත් ආර්ථිකයක් ගෙන එමින් තිබෙන වෙලාවක්, මෙය. ඒ නිසා ආයෝජකයන්ගේ මුහුණ බලන්නේ නැතිව, ඇමතිවරයා දිහා බලන්නේ නැතිව කටයුතු කරන යම් නිශ්චිත ක්‍රමවේදයක් අපේ රටේ ස්ථාපිත කිරීම අපේ පාර්ලිමේන්තුවේ වගකීමක්. අන්න ඒ නිසා තමයි මේ වාගේ අණ පනත් වැදගත් වන්නේ.

මේ පනත් කෙටුම්පත ආදියෙහි යම් යම් අඩු පාඩු තිබෙනවා නම් ඒවා ගැන සාකච්ඡා කරන එක, ඒවායේ තාක්ෂණික දෝෂ ගැන කථා කරන එක අප කාගෙකාගේත් වැඩක්. ඒක විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ අප කාගේත් වගකීමක්. පාර්ලිමේන්තුවේ සිටින අය විතරක් නොවෙයි, මේ රටේ උගතුන්, බුද්ධිමතුන්, ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයන් ඇතුළු සියලු දෙනාගේ මත සැලකිල්ලට ගෙන මෙය විධිමත් කරන එක අපේ වගකීමක්. ඒ අනුව, මෙන්න මේ කියන විධිමත් කිරීමේ කාර්ය භාරය තමයි අප මේ සිදු කරමින් ඉන්නේ. මේ තුළ අපේ රටේ යටිතල පහසුකම්, සේවා උපයෝගිතා, නිෂ්පාදනය, කෘෂි කර්මාන්තය, අධ්‍යාපනය හා තාක්ෂණය, තොරතුරු තාක්ෂණය ආදි දේවලට උපරිම දායකත්වය දරමින් අපේ රටේ ඊළඟ අදියරට යන්න අප සැලසුම් කරමින් ඉන්න වෙලාවක තමයි මේ පනත් කෙටුම්පත, නියම සහ රීති ආදිය ගෙන එන්නේ.

මේ වාගේ වෙලාවක තමයි විපක්ෂ නායකතුමා මෙතැනට ඇවිල්ලා අද උදේ ඉඳලා අඬන්නේ. එතුමා මොකක්ද කියන්නේ? "අප කෙරෙහි ජාත්‍යන්තර විශ්වාසය නැති කළා" කියලායි කියන්නේ. ඇත්තටම අපේ රටේ ජනතාවට විපක්ෂය කෙරෙහි විශ්වාසය නැති වෙච්ච එක ජාත්‍යන්තර සංවිධානත් දකිනවා. විපක්ෂයේ හැසිරීම, ඒ ගොල්ලන් පෝලිමේ උසාවියට යන හැටි ජාත්‍යන්තර සංවිධාන දකිනවා. ඉතින් කොහොමද, විළිලජ්ජාවක් ඇතිව ඇවිල්ලා ඒ මිනිසුන් එක්ක කථා කරන්නේ? ඇත්තටම පළමුවෙන්ම වෙන්න ඕනෑ, මේ විපක්ෂය විචාරවත් විපක්ෂයක් බවට පත් වන එකයි. අපි ඒ සඳහා විපක්ෂයට ආරාධනා කරනවා. ඒකට දැනටත් පරක්කු නැහැ. විපක්ෂයේ මහත්වරු ඇත්තටම නිවැරදි වෙන්න උත්සාහ කරන්න. නිකම් කෑ ගහලා, "මට දවසේ පැය 24ම වුණත් කමක් නැහැ, මම එන්නම් විවාදයට..." කියලා මහා ලොකු වීර, චණ්ඩි පාට් දමන එක නොවෙයි කරන්න ඕනෑ. සාධාරණ කරුණු එක්ක කථා කරන්න පුරුදු වෙන්න. සමහර අය කථා කරන විධිය දැක්කාම අපට පුදුමත් හිතෙනවා, මේ මිනිස්සු මොනවා කරපු අයද කියලා.

අපට මතකයි, වෙනදා මේ වාගේ ආර්ථික තත්ත්වයන් හමුවේ ඩොලර් ප්‍රශ්න ආපු අවස්ථාවල රුපියල් 5,000 නෝට්ටු මුද්‍රණය කරලා මේ රට පාලනය කරන්න කටයුතු කරපු හැටි. එහෙම කරලා, අපේ රටේ උද්ධමනය වැඩි කරලා, අපේ රට තවදුරටත් ණය බරෙහි ගොදුරක් කරලා තමයි එදා මේ රට පාලනය කළේ. එහෙම ඉතිහාසයක් ගැන තමයි අපේ රටේ මිනිස්සු දන්නේ. හැබැයි, දැන් මොකක්ද වෙන්නේ? අපේ රටේ ආර්ථිකය සාධාරණ ආකාරයට පවත්වා ගනිමින්, විදේශ සංචිතත් රැක ගනිමින්, ලෝකයේ විශ්වාසයත් දිනා ගනිමින්, මේ යුද තත්ත්වය හමුවේත් අපේ රටේ කීර්තිය එන්න එන්න වැඩි කර ගනිමින්, ලෝකයට උදව් කරමින් අපි වැඩ කරන රටාවක් තිබෙනවා. ඒ නිසා තමයි අප මේ අවස්ථාවේදී සහන දිය යුතු අයට සහන දෙමින් උද්ධමනය පාලනය කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ඒ, ධීවරයාට වෙන්න පුළුවන්; කුඩා තේ වතු හිමියාට වෙන්න පුළුවන්; වෙන වෙන නිෂ්පාදකයන්ට වෙන්න පුළුවන්; සංචාරක ව්‍යාපාරයේ යෙදෙන අයට වෙන්නත් පුළුවන්. ඒ අයට නිශ්චිත සහන දෙමින්, උද්ධමනය පාලනය කරමින් අපේ රට අදාළ තැනට ගෙන යන්නයි හදන්නේ. ඒ නිසා මම හිතනවා, මේ පනත් කෙටුම්පත ඇතුළුව මේ නියෝග, රීති ආදිය අපේ රටට විශේෂ වැදගත්කමක් ඇති ඒවා වෙයි කියලා.

මේ වාගේ අවස්ථාවක වචන කිහිපයක් හෝ කථා කරලා අදහස් දක්වන්න මට අවස්ථාවක් ලැබීම ගැන ඉතාම සතුටුයි. ඔබතුමියට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආයෝජන ආකර්ෂණය කර ගැනීම, ක්‍රීඩාව ආදිය ගැන කෙරෙන සාකච්ඡාවක් තමයි අද දවසේ පාර්ලිමේන්තුවේ සිද්ධ වෙන්නේ. අප මෙයට ආරම්භයක් ගත්තොත්, විදේශීය ආයෝජකයන් ලංකාවට ඇවිල්ලා කරපු ආයෝජන හරහා ආරම්භ කරපු කර්මාන්තශාලාවල - විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තශාලාවල - පසුගිය කාල සීමාවේ යම් අර්බුදයක් අලුතින් ආරම්භ වෙලා වර්ධනය වෙමින් යනවා. නමුත්, තවමත් මේ ආණ්ඩුව පැත්තෙන් ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. සමහර කර්මාන්තශාලා වහනවා. අනෙක් පැත්තෙන්, කර්මාන්තශාලාවල සේවකයන්ට වැටුප් ගෙවා ගන්න බැරුව, බෝනස් ගෙවා ගන්න බැරුව තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයට අදාළව ගත්තොත්, වැඩ වර්ජනවලට පවා ගිහිල්ලා තිබෙනවා. ලෝකයේ මේ ප්‍රවණතාවත් එක්ක, මිල වැඩි වීමත් එක්ක මේ ආයතන පවත්වාගෙන යන අතරතුර, මේ විධියට ලාභය අඩු වන අවස්ථාවක මහ ජනතාවගේ පැත්තෙන්, සේවකයන්ගේ පැත්තෙන් ආයතන හිර කරලා, pressurize කරලා බෝනස් ඉල්ලන එක කොයි තරම් සාධාරණද යන්න පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මැතිවරණවලින් දිනන්න ජනතාවගේ පැත්තට මොනවා හරි දෙන්නම ඕනෑ, දෙන්නම ඕනෑ කියන එක තමයි ලංකාවේ තිබෙන කථාව. අදත් ජනාධිපතිතුමා ඇවිල්ලා කළේ ඒක නේ. වැදගත් වන කාරණාව තමයි මේ රට මුහුණ පාන අර්බුදය විසඳීම.

සහන දෙන්න ඕනෑ තමයි. ජනාධිපතිතුමාත් කියනවා, සහන දෙන්න ඕනෑ කියලා. ආයතනවල වැඩ කරන අයත් කියනවා, සහන දෙන්න ඕනෑ කියලා. නමුත් කොහෙන්ද හම්බ කරන්නේ? ව්‍යාපාරිකයෙකු ගෙනැල්ලා, ආයෝජකයෙකු ලංකාවට ගෙනැල්ලා, ඒ ආයෝජකයාට බදු සහන දුන්නාට ආයෝජන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම නම්, ලංකාව තුළ තිබෙන මේ සෘණාත්මක ජන මනස වෙනස් කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වගකීම ආණ්ඩුව ලෙස ඔබ භාර ගන්න ඕනෑ. හේතුව, මේ රට තුළ අයිතිවාසිකම් පිළිබඳවම හැම වෙලාවකවම අවධානය යොමු කරවූයේ ඔබේ පක්ෂය විසින්. ඒ නිසා මේ සෘණාත්මක අදහස් ධනාත්මක තත්ත්වයට පත් කිරීමේ වගකීමත් ඔබතුමන්ලා භාර ගන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, ආණ්ඩුව පැත්තෙන් ආයෝජන ආකර්ෂණය කර ගන්න ඕනෑ, ආයෝජකයන් ගෙන්වා ගන්න ඕනෑ. ඊට අමතරව කළ යුතු දෙයක්ද තිබෙනවා. VAT එක හිර කරගෙන ඉඳීම, ඒ ආයතන සතු මුදල් ප්‍රමාණය, සංසරණය වෙන්න තිබෙන මුදල් ටික ආණ්ඩුව විසින් හිර කරගෙන මාස කිහිපයක් තියාගෙන ඉඳීම ඇඟලුම් කර්මාන්තයට වාගේම බොහෝ කර්මාන්තවලට බලපානවා.

ඊළඟ කාරණාව මේකයි. ලංකාවට එන විදේශීය ආයෝජකයන් ගැන පමණක් නොවෙයි, ලංකාවේ ආයෝජකයන්, ලංකාව ඇතුළේ ව්‍යාපාර කරන මිනිසුන් ගැන පවා හිතන්නේ කොහොමද? 'ආණ්ඩුවට බදු එකතු කරන මිනිස්සු, ආණ්ඩුවට බදු ලබා ගන්න ඉන්න මිනිස්සු' කියලා හිතන චින්තනයෙන් අපි අයින් වෙන්න ඕනෑ. අපට ඒ ව්‍යාපාරිකයන්ට දෙන්න පුළුවන් තවත් දේවල් මොනවාද කියලායි බලන්න ඕනෑ. ඒ, බදු සහන පමණක් නොවෙයි. ඒ අයට ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. උදාහරණයක් හැටියට, ව්‍යාපාරයක් ආරම්භ කිරීම ගනිමු. ඒ ව්‍යාපාරයේ වැඩ කරන අය හොරකමක් කළොත්, ඒ කරපු හොරකමට අදාළව දඬුවමක් ලබා දීම සඳහා ගත වන කාලය වැඩියි. එහි අවසන් ප්‍රතිඵලය වෙන්නේ මොකක්ද? සේවකයන් ඒ විධියට හොරකම් කරන්න පටන් ගත්තාම, දඬුවම් ලබා දීමට අදාළ කාලය වැඩි වෙද්දී අනෙක් සේවකයනුත් හොරකම් කරන්න පටන් ගන්නවා. මේවා තමයි ප්‍රායෝගික ප්‍රශ්න, ලංකාවේ තිබෙන. ඉන්ධන මිල, බලශක්ති අර්බුදය ආදියට අමතරව බිමේ තිබෙන ප්‍රශ්නයි මේවා.

ඊළඟ ගැටලුව තමයි ආයෝජකයෙකු, එහෙම නැත්නම් ව්‍යාපාරිකයෙකු දැක්කාම, 'අපි කොහොම හරි සියයට 18ක tax එකක් ගහන්න ඕනෑ, Income Tax ගහන්න ඕනෑ' කියලා හිතන එක. එහෙම හිතනවාට වඩා, ඒ ව්‍යාපාරිකයාට තම ව්‍යාපාරය පවත්වාගෙන යන්න නීතිය පැත්තෙන් හෝ වෙනත් පැතිවලින් කළ යුත්තේ මොනවාද කියලා බලන්න ඕනෑ. සමහර විට cheque එකක් return වුණොත්, අපි කොහොමද ඒ වෙනුවෙන් ඉක්මනින් මැදිහත් වෙන්නේ? ව්‍යාපාරිකයාට තමන්ගේ සේරම වැඩ පැත්තකින් තියලා උසාවි ගාණේ යන්නයි, පොලීසි ගාණේ යන්නයි, හොරු අල්ලන්නයි වුණොත් ව්‍යාපාර පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, ව්‍යාපාරිකයන් කියලා කියන්නේ බදු එකතු කර ගන්න ඉන්න මිනිසුන් විධියට දකින්න එපා කියලා; ඔවුන් මේ රට ඉදිරියට ගෙන යන මිනිසුන් හැටියට දකින්න කියලා; එහෙම දැකලා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසන්න කියලා.

ඒ වාගේම, ලංකාවේ මේ වෙලාවේ පෞද්ගලික අංශයේ සේවය කරන අයටත් කියන්න දෙයක් තිබෙනවා. බෝනස් හම්බ වෙනවා නම් හොඳයි තමයි. හැබැයි, රටක් කඩාගෙන වැටිලා තිබෙන වෙලාවක, ලෝක ආර්ථික අර්බුද තිබෙන වෙලාවක, ලාභය අඩු වන වෙලාවක ආයතන බිත්තියට හේත්තු කරලා බෝනස් ඉල්ලීමෙන් සමහර විට ආයෝජකයා ලංකාව දාලා යන්න පුළුවන්; ඒකෙන් ඔබේ වැටුපට හානියක් වෙන්න පුළුවන්. මේවා ඡන්ද දිනන්න හේතු වන කථා නොවෙයි. මිනිසුන් සතුටු වන්නේ, ජනාධිපතිතුමා කිව්වා වාගේ "මොනවා හරි දෙනවා, දෙනවා, දෙනවා" කියලා කියන එකට. හැබැයි, ඇත්ත ප්‍රශ්නවලට විසඳුම් සොයන්න නම්, මෙන්න මේ කියපු දේවල් කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ.

ආණ්ඩුව පැත්තෙන් ගත්තාම, දඩ සහ බදුවලට එහා ගිය දේවල් ටිකක් ගැන හිතන්න වෙනවා. අපේ ආසනයේ ඉන්නවා, බීඩි කර්මාන්තයේ යෙදෙන විශාල පිරිසක්. ඒ අයගේ ගෙවල්වලට පැනලා, බීඩි ඔතන ඒවා ගැන හොයලා ඒ ව්‍යාපාරවලට විශාල වදයක් දෙනවා. මම ආණ්ඩුවෙන් එක ඉල්ලීමක් කරනවා. ලංකාවට බීඩි කොළය ගේන්නේ පිටරටින්. ඔබතුමන්ලාට ඕනෑ කරන සියලු බදු ටික අන්න ඒ බීඩි කොළයට ගහලා, ඒ බීඩි කොළේ එළියට දෙන්න. ඊට පස්සේ ඒ මිනිසුන්ට කැමැති විධියට ඒ වැඩේ කරගෙන යන්න ඉඩ දෙන්න. ඒක ඉතාම සරල වැඩක්. ව්‍යාපාරිකයෝ කවුරුත් බදු ගෙවන්න බැහැ කියන්නේ නැහැ. බීඩි කොළයට බද්ද ගහලා ඒ අයට දෙන්න. ඔතන බීඩියේ ප්‍රමාණය හොයන එකයි, කීයක් එතුවාද කියලා හොයන එකයි නවත්වලා ඒ වැඩේ කරලා දෙන්න. මොකද හේතුව, මේ නිසා ඒ ව්‍යාපාරිකයන් බොහෝ සෙයින් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ තමයි ආයෝජනය පැත්තෙන් කියන්න තිබෙන කාරණාව.

ඊළඟ එක විධියට පාර්ලිමේන්තුව පැත්තෙන් කියන්න කාරණාවක් තිබෙනවා. අද ඒක ඉල්ලීමක් විධියටත් එනවා, යෝජනාවක් විධියටත් එනවා. ඒ තමයි, COPE එක විසින් සිදු කරන පරීක්ෂණ සහ ඒ නිරීක්ෂණ හරහා ගනු ලබන තීරණ කෙළින්ම CID එකට යොමු කිරීම පිළිබඳ යෝජනාව. එහෙම යෝජනාවක් එන්න නියමිතයි. මම කියනවා, මේක වැරැදි යෝජනාවක් කියලා. මම එහෙම කියන්න හේතුව මේකයි. මේ පාර්ලිමේන්තුව සතුව පවතින ප්‍රධාන කාර්යභාර 4ක් තිබෙනවා. එකක් තමයි, නියෝජනය. අනික් එක තමයි, නීති හදන එක. ඊළඟ එක තමයි, පසුවිපරම. ඊළඟ එක තමයි, මහජන මුදල් භාවිත කරන ආකාරය පිළිබඳ තීරණ ගැනීම. මෙන්න මේ පසුවිපරම

කියන කොටස මේ ගෙනෙන යෝජනාව හරහා බණ්ඩනය වෙනවා. ඇයි මම එහෙම කියන්නේ? ලංකාවේ කවුරු හරි රාජ්‍ය නිලධාරියෙක් ගෙනැල්ලා, COPE එකෙන් ප්‍රශ්න කරද්දී, COPE එකේ සභාපතිවරයාට හෝ කමිටුවේ සාමාජිකයන්ට හිතුණොත් මෙයා වැරැදියි කියලා, එකවරම ඒක CID එකට යොමු කරපු ගමන් අර නිලධාරියාට තමන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්න බැරි වෙනවා. ඒ නිසා ඒක නොවෙයි ක්‍රමය. ඒක වැරැදියි. ඒක උසාවිය හරහා, අමාත්‍යාංශය හරහා එන ක්‍රමයක් තිබෙනවා. කරුණාකරලා ඒ ගැන අවධානය යොමු කරන්න. මේක වැරැදි තැනකටයි ගෙනයන්න හදන්නේ. මම COPE එකේ සභාපතිවරයා සහ කමිටුවේ අයගෙන් ඉල්ලීමක් කරනවා. මීට කලින් COPE එකේ සභාපතිවරු හැටියට ඩිව් ගුණසේකර මහතා හිටියා, සුනිල් හඳුන්නෙත්ති මහතා හිටියා, විජයදාස රාජපක්ෂ මහතා හිටියා, චරිත හේරත් මහතා හිටියා. ඒ අයගෙන් අහලා බලන්න ඒගොල්ලෝ මේක දැක්කේ නැද්ද කියලා. පාර්ලිමේන්තුවට තිබෙන කාර්යභාර හතරෙන් එකකට මේ ගෙනෙන ක්‍රමය හරහා බලපෑමක් එනවා. එම නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

ඊළඟ කාරණාව තමයි, මේ දවස්වල ක්‍රිකට්වල තිබෙන අර්බුදය. ක්‍රීඩා ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මේ ගැන කියන්න ඕනෑ. දැන් fitness test එකක් පිළිබඳ කථාවක් යනවා. ක්‍රීඩකයෝ පාලක මණ්ඩලයට විරුද්ධව නඩු දාලා තිබෙනවා. සමහර fitness testsවල තිබෙන ක්‍රියාකාරකම් පිළිබඳව coachesලා විරෝධතාව පළ කරලා තිබෙනවා. ක්‍රීඩා ඇමතිවරයා මේ පිළිබඳව අවධානය යොමු කරලා නැහැ, තවම. මේ නිසා ක්‍රීඩාව ඇතුළේ සැලකිය යුතු, විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව ඇතුළේ සැලකිය යුතු අර්බුදයක් නිර්මාණය වෙමින් පවතිනවා. කරුණාකරලා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

ඊළඟ ප්‍රශ්නය තමයි, ක්‍රීඩාව හා බැඳුණු online සූදුව. ලංකාවේත්, පිටරටවලත් - ලෝකයේ හැම තැනකමත් - මේ online සූදුව ව්‍යාප්ත වෙලා ඉවරයි. පසුගිය දවස්වල චීන ජාතිකයන් අත්අඩංගුවට ගත්තේ මේ online සූදුවට සම්බන්ධ නිසායි. එම නිසා මේක ලංකාවේ ආණ්ඩුව තුළින් regulation system එකක් ඇතුළට ගන්න කියන ඉල්ලීම කරනවා. මේකට ඕනෑ කරන අණ පනත්, නීති සම්මත කරන්න කියලා ඉල්ලනවා. මම මේකට විරුද්ධ නැහැ. සූදුව කියන එක ඇතුළේ මේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා නම්, ආණ්ඩුවට ආදායමක් උපයා ගත හැකි තත්ත්වයට ඒක පත් කරගන්නේ කොහොමද කියලායි අපි හොයන්න ඕනෑ වෙන්නේ.

ඒ එක්කම එන ප්‍රශ්නය මේකයි. ක්‍රීඩාව හා බැඳුණු තරග පාවා දීම් සහ ඊට අමතරව තහනම් උත්තේජක ගැනීම් මේ සමඟම සිද්ධ වෙන්න පුළුවන්. ලංකාව ඇතුළේ ඒ සූදුව ක්‍රියාත්මක වෙනවා නම් ඒ පිළිබඳ අලුත් නීති හදලා පුළුවන් තරම් ඒවා ශක්තිමත් කරන්න ඕනෑ. ඒ වාගේම ලංකාවේ ආණ්ඩුව නොදැන ප්‍රධාන වශයෙන් online සූදුව ක්‍රියාත්මක වන apps තුන, හතරක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා. මේ apps සියල්ල හරහා ලංකාව සතු මුදල් විශාල ප්‍රමාණයක් පිටරටට ඇදිලා යනවා. ආණ්ඩුවේ වගකීම තමයි මේ පිළිබඳව හොයා බලන එක. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය තිබෙනවා, මුදල් අමාත්‍යාංශය තිබෙනවා, ආරක්ෂක අමාත්‍යාංශය තිබෙනවා. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමති කෙනෙක් ඉන්නවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරන එකට අමතරව, මේ වාගේ කාර්යයන් ගැන අවධානය යොමු කරන්න කියලාත් ඉල්ලනවා.

අද ජනාධිපතිතුමාත් මෙතැනට ඇවිල්ලා කථා කළා. වෙලාව මදි නිසා ඒ පිළිබඳව කියන්න දෙයක් නැහැ. හැබැයි, පළමුවැනි වතාවට ජනාධිපතිතුමා කිව්වා, බාල ගල් අඟුරු ගෙනාවා කියලා. ඒක ඉතාම වැදගත්. බාල ගල් අඟුරු ගෙනාවා නම්, අපට බාල ගල් අඟුරු හොයා ගන්න වෙන්නේ කාලා බලලාද කියලා ජනාධිපතිතුමා ඇහුවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මේ කාරණය ඉවර කරන්න මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

කාලා බලලා බාල ගල් අඟුරු හොයා ගන්න නම් විද්‍යාව දියුණු වෙන්න ඕනෑ නැහැ. මේ ජනාධිපතිවරයා සහ ආණ්ඩුව එන්න කලින්, කලින් හිටපු ජනාධිපතිවරු ගල් අඟුරු කෑවේ නැහැ නේ. පළමුවැනි වතාවට මේ රටට බාල ගල් අඟුරු ගෙනාවා කියලා ජනාධිපතිතුමා පිළිගත්තා. එහෙම නම්, මේ ඇමතිවරයා විසින් මේ වංචාව කළා කියලා පිළිගත්තා. ආණ්ඩුවේ අයගෙන් අපි අහනවා, කොහොමද ඔබතුමන්ලා ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ කියලා. ජනාධිපතිවරයාගේ කථාව ගැන කියන්නට බොහෝ දේවල් තිබෙනවා. අවසාන වශයෙන් ඒ පිළිබඳව කියන්න එක දෙයක් තිබෙනවා. පොඩි වෙලාවකින් ඒක කියලා මගේ කථාව අවසන් කරනවා.

මම ජනාධිපතිවරයාට ස්තුතිවන්ත වෙනවා, විවේචනවලට ඉඩ තිබෙනවා කියලා එතුමා කියපු එක පිළිබඳව. මොකද, හැමෝම කථා බහ නොකර බස්සෝ වාගේ බලාගෙන ඉද්දී අපට බයක් එනවා, ජීවිත තර්ජනයක්වත් එයිද කියලා. ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ විවේචන සාධනීය ලෙස භාරගන්න, ඒවා පෞද්ගලිකව භාර අරගෙන අපට තර්ජන, අනං මනං කරන්න එපා කියලා. අපේ ජීවිත ආරක්ෂා කිරීමත් ජනාධිපතිවරයාගේ වගකීමක්. ඒවා මේ රට වෙනුවෙන් කරන විවේචන මිසක්, පෞද්ගලික විවේචන නොවෙයි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.47]

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද අපි රටේ අනාගතය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාරණා තුනක් මේ පාර්ලිමේන්තුවේදී විවාදයට ගනු ලබනවා සහ ඒවා සම්මත කරගන්න කටයුතු කරමින් ඉන්නවා.

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

විශේෂයෙන්ම අපේ රටේ ක්‍රීඩාවට වැදගත් වන, ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග, මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් තිබෙන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත, මුදල් සම්බන්ධ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන නියෝගය සහ ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ගෙනෙන රීති අද මේ පාර්ලිමේන්තුවේදී සභා සම්මත කරගන්න සූදානම් වෙනවා.

අපි ක්‍රීඩාව පිළිබඳව කථා කළොත්, අද සම්මත කිරීමට බලාපොරොත්තු වන 2026.03.17 දින ඉදිරිපත් කරන ලද ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ 2026.01.16 දිනැති 2471/51 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත තහනම් උත්තේජක පිළිබඳ නියෝග අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සභා සම්මත කර ගන්නවා.

මේ රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල පිරිසක් ලෝකය ජයග්‍රහණය කරලා තිබෙනවා. ලෝකයත් එක්ක තරග කරලා ලංකාවට කීර්තියක් ගෙනාපු මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමා වාගේ අපි ආඩම්බරයෙන් කථා කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල ප්‍රමාණයක් මේ මහ පොළොවෙන් නිර්මාණය වෙලා තිබෙනවා. නමුත් අවුරුදු 76ක ඉතිහාසය තුළ ඔවුන්ට හොඳම දේ ලබා දෙන්න අපට බැරි වුණා කියලා අපි විශ්වාස කරනවා. අපේ රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල පිරිසක් ලෝකයට ගෙනියන්න පුළුවන්කම තිබියදීත් අපි ඒ සම්බන්ධයෙන් හොඳ මැදිහත්වීමක් කරපු රටක් නොවෙයි කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. රජයක් විධියට අපි මේ කටයුත්ත වඩා වැඩියෙන් සංවර්ධනය කරන්න, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සම්බන්ධයෙන් හොඳ මැදිහත්වීමක් කරන්න බලාපොරොත්තුවෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය වැඩ පිළිවෙළක් කරගෙන යනවා.

මේ නීති ලෝකයේම සම්මත කරලා තිබෙනවා. මීට වසර 13කට ඉස්සෙල්ලා, ඒ කියන්නේ 2013දී තමයි මේ පනත සම්මත වෙන්නේ. ඒ තමයි 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත. සාමාන්‍ය විධියට ක්‍රීඩාව නොකර, ශරීරයට උත්තේජනයක් ලබා ගැනීම සඳහා යම් යම් දේවල් ලබාගෙන ක්‍රීඩා කරලා ඉදිරියට යෑම තමයි මේවා හරහා සිද්ධ වුණේ. ඒක ඉතිහාසයේත් සිද්ධ වුණා. ඒක, දැන ගත්තාට පස්සේ ඒවා වැළැක්වීම සඳහා පනතක් සම්මත කරගත්තා. මේ නීති දැන් ලෝකයේ ක්‍රියාත්මක වෙනවා. ඒවා දැන් ලංකාව තුළත් බොහොම හොඳින් ක්‍රියාත්මක වෙනවා. වසරකට වතාවක් මේ තහනම් උත්තේජක වර්ග පිළිබඳ ලැයිස්තුවක් සකස් කරලා භාෂා තුනකින් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා, මෙන්න මේවා තහනම් කියලා.

අද ලෝකය ජයග්‍රහණය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල ප්‍රමාණයක් අලුතින් බිහිවෙමින් තිබෙනවා. ඒවා අංකුර. ඒ අංකුරවලට හොඳ උත්තේජනයක් ලබා දීම තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ කටයුත්තක් විධියට භාරගෙන තිබෙනවා. මේක, ඒ අංකුරවලට හොඳ උත්තේජනයක් ලබා දෙමින් තිබෙන කාලයක්. විශේෂයෙන්ම හෙල්ල විසි කිරීම, බර ඉසිලීම වාගේ ක්‍රීඩා විශාල ප්‍රමාණයක් මේ මහ පොළොවේ යහපත් විධියට ක්‍රියාත්මක වෙනවා.

අද විපක්ෂයේ මන්ත්‍රීවරු ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කළා. ඒ සම්බන්ධයෙනුත් රජයට හොඳ මැදිහත්වීමක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒකත් දැනට යන ක්‍රමයට වඩා අලුත් ක්‍රමයකට වෙනස් කිරීම අවශ්‍යයි කියන එක මුළු රටම පිළිගෙන තිබෙනවා. මොකද, ලංකාවේ හැම කෙනෙක්ම ක්‍රිකට් ක්‍රීඩාවට ආදරෙයි. ක්‍රිකට් ක්‍රීඩාව තමන්ගේ ජීවිතය කර ගත්තු මිනිස්සු මේ මහ පොළොවේ, ලංකාවේ ඕනෑ තරම් ඉන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ක්‍රිකට් ක්‍රීඩාව මීට වඩා වෙනස් වෙන්න ඕනෑ, සංවර්ධනය වෙන්න ඕනෑ, ඒ වාගේම සූදුවට නතු නොවෙන, ඒ තුළට හොඳ ක්‍රීඩකයන් අරගෙන ඒ ක්‍රීඩකයන් යහපත් විධියට ඉස්සරහට ගෙනයන ක්‍රීඩාවක් බවට පත්වෙන්න ඕනෑ කියලා.

ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ ගෙනෙන මේ නියෝග අද පාර්ලිමේන්තුව තුළ සම්මත වෙයි. අපි විශ්වාස කරනවා, ඒකෙන් අනාගතයේදී ලංකාවේ බිහිවෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විශාල මෙහෙවරක්, වටිනාකමක් ඇතිවෙයි කියලා.

ඒ වාගේම බදු පිළිබඳව අපි ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙනුත් විපක්ෂයෙන් බොහෝ අදහස් මතු වුණා. බදු සම්බන්ධයෙන් කථා කරද්දී, කිසිම බද්දක් එකතු කරපු නැති අය වැයක් තමයි අපි ගෙනාවේ. පසුගිය කාලසීමාවේ රටේ මහ ජනතාවට පීඩාවන විධියට කිසිම බද්දක් මේ රජය ගෙනැල්ලා තිබුණේ නැහැ. හැබැයි, අපි දියුණු වන රටක් විධියට ඉදිරියට යනකොට ලෝකයත් එක්ක ගනුදෙනු කරද්දී, විදේශ රටවල් එක්ක වැඩකටයුතු කරද්දී බදු ප්‍රතිපත්ති, බදු අණපනත්, අලුත් චක්‍රලේඛ සම්මත කරගන්න සිද්ධ වෙනවා. ඒවාත් එක්ක විපක්ෂයේ ඉන්න සමහර මහත්වරු මෙතැනදී අර්ථකථනය කරන්න උත්සාහ කරමින්, සූදානමින් ඉන්නවා මේ බදු පැනවීම හරහා රටේ මහජනතාවට විශාල විනාශයක්, විශාල පීඩාවක් රජය විසින් ලබා දෙනවා කියලා. අපි, පසුගිය කාල සීමාවේදී රටේ මහජනතාවට දෙන්න පුළුවන් උපරිම සහන දීපු රජයක්. නයි කාලා බේරිච්ච සමහර මහත්වරු අද මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරනවා, මේ රට ඉතාම විනාශකාරී තත්ත්වයකට යනවා කියලා. "බඩු මිල තදබල විධියට වැඩි වෙනවා, ජීවත් වෙන්න බැරි ආර්ථික වටපිටාවක් නිර්මාණය වෙමින් එනවා, බදු පැනවීම සම්පූර්ණයෙන්ම රටේ මහජනතාවට අහිතකර විධියට බලපාමින් තිබෙනවා, මේ රට එන්න එන්නම ප්‍රපාතයට වැටෙන රටක් බවට පත් වෙලා තිබෙනවා" කියලා ප්‍රකාශ කළා. අපි බොහොම ආදරණීය විධියට කියනවා, ඔයගොල්ලන්ට වැරදිලා කියන එක. මීට අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලා අපි මේ රට භාර ගනිද්දී තිබුණේ ඔයගොල්ලන් ඔය කියන සුන්දර රට නොවෙයි. මේ රටේ අයට ජීවත් වෙන්න බැහැ කියලා ඉන්දියාවේ හිඟන්නෝ සල්ලි එකතු කරලා එව්වා. එහෙම රටක් තමයි අපි භාර ගත්තේ. ඔයගොල්ලන්ගේ පාලන කාලය තුළ ඉන්දියාවේ හිඟන්නෝ සල්ලි එකතු කරලා එව්වා, ලංකාවේ මිනිස්සු ජීවත් කරවන්න. හැබැයි, අපි ඒ දේවල් සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබෙනවා. අපි රටක් විධියට ඉදිරියට යද්දී, බොහොම හොඳ ආර්ථික වටපිටාවක් නිර්මාණය කරගෙන තිබෙනවා.

ඒ වාගේම අපි ඔබතුමන්ලාට මතක් කරන්නට ඕනෑ, මේ රට අපි සැහෙන දුරට සංවර්ධනීය දිශාවකට රැගෙන යන බව. මේ, අවුරුදු එකහමාරක් තුළ "දිට්වා" සුළි කුණාටුව වාගේ විශාල, විනාශකාරී ව්‍යසනවලට අපි රජයක් විධියට හොඳින් මුහුණ දෙමින් ඒවා මාස හතරක් ඇතුළත ප්‍රති නිර්මාණය කරගනිමින් යන ගමනක්. එහිදී බඩු මිල වැඩියි, ජීවත් වෙන්න බැහැ, අවුරුද්දට හොඳ සහන සපයන්න ඕනෑ කියලා අපට මතක් කිරීම පිළිබඳවත්, එතුමාට රට ගැන තිබෙන අවබෝධය පිළිබඳවත් අපට කනගාටුවක් තිබෙනවා. ඒ වාගේම විපක්ෂයේ මහත්වරු දිගින් දිගටම අපට අවවාද අනුශාසනා දෙනවා, මේ රජය මෙන්න මේ විධියට ගෙනියන්න ඕනෑ, බඩු මිල අඩු කරන්න ඕනෑ, ජීවත් වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ කියලා. අපි රැකියා

අවස්ථා විශාල ප්‍රමාණයක් දීලා තිබෙනවා. අවුරුදු 5කින් රැකියා නොදීපු රටක් තමයි අපි භාර ගත්තේ. ඒ වාගේම අපි මේ රටේ රාජ්‍ය සේවකයන්ට සියයට 70කින් වැටුප් වැඩි කරපු රජයක්. දිළිඳු ජනතාවට දෙන්න පුළුවන් සහන සියල්ලක්ම අපි ලබා දී තිබෙනවා. ඒ කිසිම දෙයක් මතක නැති, ඉතිහාසය තුළ තමන් කරපු දේවල් තමන්ට මතක නැති විපක්ෂයේ සමහර මහත්වරු අද මෙතැනට ඇවිල්ලා වරප්‍රසාද භුක්ති විඳිමින් විවිධ දේවල් ප්‍රකාශ කරනවා. අපි කනගාටුවට පත් වෙනවා. විපක්ෂයේ අය - විපක්ෂ නායකතුමාගේ ඉඳලා හැමෝම - සමහර දේවල් මෙතැන ප්‍රකාශයට පත් කරද්දී අපට හිතෙනවා, එතුමන්ලා මේ ලංකාවේ නොවෙයිද ඉන්නේ කියලා. සමහර පොත් එළි දක්වද්දී වර්තමාන විපක්ෂ නායකතුමා එතැන හිටියේ නැහැ කියන්න විපක්ෂයේ මහත්වරු දත කනවා. කුරුණෑගල ප්‍රදේශයේ එක මහත්මයෙක් ටයි, කෝට් ඇඳගෙන කියනවා, ඒ හිටියේ AI තාක්ෂණයෙන් නිර්මාණය කරපු විපක්ෂ නායකතුමා කියලා. ඒ තත්ත්වයට අද එතුමන්ලා පත් වෙලා තිබෙනවා. සමහර දේවල් වරදිනවා. වැරදුණාම අතරමඟ නැගිටලා යනවා. අපි රජයක් විධියට මේ රටේ අනාගතය වෙනුවෙන් අණ පනත්, චක්‍රලේඛ විශාල ප්‍රමාණයක් - අපේ මන්ත්‍රීවරු 159දෙනාට ගරු කරමින් - මේ පාර්ලිමේන්තුවේදී සම්මත කරගෙන තිබෙනවා. අදත් ඒ විධියේ ගරු කටයුතු පනත් කෙටුම්පතක් සහ නියෝග, රීති ඉදිරිපත් කර තිබෙනවා. ඒවා අනුමත කරගන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.57]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමෙක් තමයි මට පෙර කථා කළේ. හැබැයි, එතුමා අවසානයේ කියපු කාරණා සම්බන්ධයෙන් පොඩි කනගාටුවකුත් හිතෙනවා. ඒ කොහොම වුණත්, අද ඇති වෙලා තිබෙන තත්ත්වය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් කියන එක අපි කාටත් පැහැදිලියි. අද ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ කළා අපි දැක්කා, මේ තිබෙන තත්ත්වයට යම් යම් සහන ලබා දෙනවා කියලා. ඒක හොඳයි, සහන දෙන්න ඕනෑ. හැබැයි මට මතකයි, මීට මාස හතරකට ඉස්සෙල්ලා එතුමා මෙතැනටම ඇවිල්ලා "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාවට සහන ලබා දෙන ආකාරය කියපු හැටි. දැන් මේ සභාවේ ඉන්නවා, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන්. ඔබතුමන්ලාට පුළුවන් නම් කියන්න, "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වෙච්ච අයගේ නිවාසවලට සහ අනෙකුත් දෑ වෙනුවෙන් සහන ලබා දෙන වැඩ පිළිවෙළෙහි ප්‍රගතිය මොකක්ද කියලා. නිවාස පැත්තෙන් ගත්තොත්, මම හිතන විධියට ඉතාම අඩු ප්‍රගතියක් තිබෙන්නේ. ඒ පොරොන්දුවලින් සියයට 10ක්වත් ඉෂ්ට කරලා නැහැ. කිව්වේ නම් නිවසක ටකරමක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා. අද ජනාධිපතිතුමා කියපු කාරණාවලටත් ඒ තත්ත්වය උදා නොවේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ තත්ත්වය තුළ එක පැත්තකින් අඩු ආදායම්ලාභීන්ගේ දුප්පත්කම තව වැඩි වෙලා තිබෙනවා. මොන විධියේ වාර්තා අරගෙන බැලුවත්, අද සියයට 30කට එහා ගිය ප්‍රමාණයකින් මේ රටේ දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්ත. සාමාන්‍ය මධ්‍යම පන්තියේ හිටපු අය, පහළ මධ්‍යම පන්තියේ හිටපු අය වාගේම අද රාජ්‍ය සේවකයිනුත් දුප්පතුන් බවට පත් වෙලා තිබෙනවා. එක් මන්ත්‍රීතුමෙකු කිව්වා, රාජ්‍ය සේවකයාගේ වැටුප සියයට 70කින් වැඩි කළා කියලා. ඒ කොහොම කථා කළත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒගොල්ලන්ට තමන් ලබන වැටුපෙන් මාසයක් ජීවත් වෙන්න බැරි වෙලා තිබෙනවා. ඔවුන් ඉතාම අමාරු තැනකට වැටිලා තිබෙනවා. සිංහල දෙමළ අලුත් අවුරුද්ද ළඟම එනවා. මේ වන විට සියලු රාජ්‍ය සේවකයින් විශාල පීඩාවකට පත් වෙලා ඉන්න කණ්ඩායමක් බවට පත් වෙලා තිබෙනවා. මේ, තමුන්නාන්සේලාට සියයට 80ක් ඡන්දය දුන් කණ්ඩායමක්. මොනවා කථා කළත් විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ තත්ත්වය තුළ හැම ක්ෂේත්‍රයකම ප්‍රශ්න ගණනාවක් තිබෙන බව.

නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කරලා ආපු තමුන්නාන්සේලා මේ වනකොට නිෂ්පාදන ආර්ථිකයට මොකක්ද කරලා තිබෙන්නේ? හැම දාම මොනවා හරි ගෙනැල්ලා බදු වැඩි කරනවා. VAT එකට අමතරව තව සියයට 5ක බද්දක් එකතු කර තිබෙනවා, යම් යම් භාණ්ඩවලට. ඒ වාගේම මේ තත්ත්වය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන යුද්ධමය තත්ත්වයත් එක්ක ඉන්දියාව, බංග්ලාදේශය වාගේ අපේ කලාපයේ ප්‍රශ්න තිබෙන අනෙකුත් රටවලට වඩා වැඩි වේගයකින් තමුන්නාන්සේලා ඉන්ධන මිල වැඩි කර තිබෙනවා. මේ තත්ත්වය තුළ ඉන්ධන විතරක් නොවෙයි, ගෑස් මිල, විදුලි බිල ආදී සියල්ල අද ඉහළට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා කර්මාන්තකරුවාගේ නිෂ්පාදන වියදම වැඩි වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අද කිසිම සහනයක් කර්මාන්තකරුවාට ලැබිලා නැහැ.

විශේෂයෙන්ම අපි දැක්කා, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා කොවිඩ්-19 වසංගත කාලයේදීත් යම් අපහසුතා ගණනාවකට මුහුණ දුන් බව. මේ වනකොට ඒ අය වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන අදහසක්වත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට නැහැ. එතකොට මොකක්ද වෙන්නේ? ඒ නිෂ්පාදකයා, කර්මාන්තකරුවා කඩා වැටෙනකොට රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වනවා. මේවා සම්බන්ධයෙන් තමුන්නාන්සේලාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? භාණ්ඩාගාරයේ මුදල් එකතු කරගෙන හිටියා කියලා මේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. අපි පැහැදිලිව කියනවා, තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ තුළින් මේ තත්ත්වයට හරියට මුහුණ දෙන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ කියලා.

අද ගල් අඟුරු සම්බන්ධයෙන් තිබෙන කථාව බලන්න. ජනාධිපතිතුමා අද පිළිගත්තා, මේවා බාල ගල් අඟුරු කියලා. දැන් මේ කියන්න හදන්නේ බාල ගල් අඟුරු විතරයි කියලා. හැබැයි උදේ සභානායකතුමා කිව්වා, "ගල් අඟුරු වංචාව" කියලා. එක පැත්තකින් දැන් ජනාධිපතිතුමා පිළිගන්නවා, බාල ගල් අඟුරු කියලා. සභානායකතුමා කිව්වා, ගල් අඟුරු වංචාව කියලා. බලශක්ති අර්බුදයක් තිබෙන වෙලාවේ අවශ්‍ය විදුලි ධාරිතාව නිෂ්පාදනය කරන්න බැරි ගල් අඟුරු ගෙන්වීම තුළින්, ඒ වංචාව තුළින් අද ජනතාවට විශාල වන්දියක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. එක පැත්තකින්, මේ නිසා රුපියල් බිලියන ගණනක වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා, පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, මේ වනකොට විදුලිය කප්පාදු කරනවා. අද උදේ මේ ගරු සභාවේ ඒ ගැන කථා වුණා. නමුත්, ඇමතිවරයා ඒකට හරියට පිළිතුරු දුන්නේ නැහැ. එතුමා කිව්වා, එහෙම නැහැ, දැනුම් දීලායි විදුලිය කපන්නේ කියලා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

නමුත්, අප ජීවත් වන කුරුණෑගල ප්‍රදේශයේත්, ඊයේ කොළඹ ප්‍රදේශයේත් විදුලිය කැපුවා. ඊයේ විපක්ෂ නායක කාර්යාලයේදී අපි සාකච්ඡා කරමින් ඉන්නකොටත් විදුලිය කැපුවා. එන්න එන්නම මේ තත්ත්වය භයානක වනවා. අපි පැහැදිලිව කියනවා, ආණ්ඩුව අද මේ තිබෙන තත්ත්වය කළමනාකරණය කර ගන්න බැරි තැනට ඇවිල්ලා තිබෙන බව. මේකේ අවාසිය එන්නේ කාටද? මේ රටේ ජීවත් වන හැම ජන කොටසක්ම අද විශාල වශයෙන් අසරණභාවයකට පත්ව සිටිනවා. එක පැත්තකින් අද ගොවියා අමාරුවේ වැටිලා තිබෙනවා. තමන්ට අවශ්‍ය පොහොර ප්‍රමාණය අවශ්‍ය කාලයට, අවශ්‍ය වෙලාවට ලැබෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මේ වනකොට එළවලු ගොවියාට, අල ගොවියාට තමන්ගේ නිෂ්පාදන සාධාරණ මිලකට විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. අද ඔවුන්ට එවැනි ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. මේ ප්‍රශ්න තුළ අද ඉතාම අසරණ තැනකට පත්ව තිබෙන්නේ මේ රටේ ජනතාවයි. අපි රටේ ජනතාව ජීවත් කරවන්න අවශ්‍යයි. මේ සභාවට ඇවිල්ලා කියවලා, කයිය ගහලා, විපක්ෂයට බැණලා වැඩක් වෙන්නේ නැහැ, විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කාරණා විවේචනය කරලා වැඩක් වෙන්නේ නැහැ. එතුමා කථා කරන්නේ ජනතාව වෙනුවෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද ආණ්ඩුව හැටියට තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව බලය ලබා දීලා තිබෙනවා. ඒ, තුනෙන් දෙකකට එහා ගිය බලයක්. ඒ නිසා ජනතාව ජීවත් කරවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. මේ රටේ ප්‍රධාන විපක්ෂය හැටියට ගරු විපක්ෂ නායකතුමා ඇතුළු අපි මේ අවස්ථාවේ රටේ ජනතාව අපහසුතාවට පත් නොකර, මේ රටේ ජනතාව විඳින දුෂ්කරතා මැඩපැවැත්වීමට අවශ්‍ය සහයෝගය ලබා දෙමින් කටයුතු කරනවා. ඒ ගැන තමුන්නාන්සේලා සතුටු වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා එදා කටයුතු කළ ආකාරයට අපි අද කටයුතු කරන්නේ නැහැ. එදා තමුන්නාන්සේලා පාරට බැහැලා, කාර්යාලවලට ගිහිල්ලා, කර්මාන්තශාලා වහලා, උද්ඝෝෂණ කරලා, strike කරලා මේ රට අරාජික කරන්න කටයුතු කළා. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුව ගිනි තියන්න කථා කළ කණ්ඩායමක්. නමුත් අපි එහෙම කරන්නේ නැහැ. විපක්ෂයක් හැටියට අපි අද ජනතාව විඳින මේ දුක හඳුනනවා. අපි ජනතාව අතරින් ආපු කණ්ඩායමක්, රැල්ලට ඇවිල්ලා නොවෙයි. මේ තත්ත්වය තුළ තවදුරටත් ජනතාවට බොරු කරන්නේ නැතිව ජනතාව ජීවත් කරවන වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 3.06]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ - World Anti-Doping Agency එකේ - මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය පිහිටුවා තිබෙනවා. World Anti-Doping Agency එක යටතේ තමයි මේ ආයතනය ක්‍රියාත්මක වන්නේ; World Anti-Doping Agency එකේ අනුබද්ධ ආයතනයක් විධියට අපි, එහි ක්‍රියාත්මක වන නීති රීති, රෙගුලාසිවලට යටත්ව කටයුතු කරන්න ඕනෑ. ඒ ලෝක ආයතනයට අනුව කටයුතු කරන්න අපි සම්මත කරගෙන තිබෙනවා, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත. ඒ ලෝක ආයතනයට සහ අපේ පනතට අනුව තමයි අපේ රටේ උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය කටයුතු කරන්නේ. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය - World Anti-Doping Agency - වසරින් වසර තමන්ගේ තහනම් උත්තේජක - anti-doping - පිළිබඳ ලැයිස්තුව වෙනස් කරනවා. 2026 වර්ෂයට අදාළව වෙනස් කළ ලැයිස්තුව තමයි අපි අද සභාගත කරලා සාකච්ඡා කරන්නේ. මොකද, ඒක මේ පාර්ලිමේන්තුවේ අනුමත වෙන්න ඕනෑ. මම හිතනවා, ඒ සම්බන්ධව ගැටලුවක් ඇති වන්නේ නැහැ කියලා.

අපේ Sri Lanka Anti-Doping Agency එක, එහෙම නැත්නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය කරන කටයුතු ගැන අදහසක් කිව්වොත්, එය අපේ රටේ ක්‍රීඩකයන් යහපත්, හොඳ ක්‍රීඩකයන් බවට පත් කිරීම වෙනුවෙන් කටයුතු කරන ආයතනයක්. මොකද, ක්‍රීඩාවට අදාළ විනය වාගේම ක්‍රීඩකයෙකුගේ ශරීර සෞඛ්‍ය පිළිබඳ වගකීම, දැනුම ආදී සියල්ල සම්බන්ධයෙන් අපේ උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය මඟින් කටයුතු කරමින් තිබෙනවා. අපි පසුගිය අවුරුද්දේ විතරක් ක්‍රීඩකයන් 140ක් check කරලා තිබෙනවා. ඒ 140දෙනාගෙන් මම දන්නා තරමින් 3දෙනෙක් තමයි doping සඳහා ක්‍රීඩකයන් විධියට අපට හසු වුණේ. ඒ අයට විරුද්ධව ක්‍රීඩා තහනම් කිරීම වාගේ නීතිමය කටයුතු අපි සිදු කරනවා. මොකද, ක්‍රීඩකයෙකුගේ වගකීමක් තමයි, මේ anti-doping, එහෙම නැත්නම් තහනම් උත්තේජක ගන්නේ නැතුව ක්‍රීඩා කිරීම. අද දවස වනවිට ක්‍රීඩකයන් test කරන්න ඉතා විශාල වියදමක් දරන්න සිදු වීම අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. අපට එක test එකක් වෙනුවෙන් සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂයක් විතර වියදම් කරන්න වෙනවා. ඒ නිසා තමයි අපි 140ක් වාගේ සංඛ්‍යාවක් test කරලා තිබෙන්නේ. ඒ වාගේම ජාත්‍යන්තර තරගවලට සහභාගී වන ක්‍රීඩකයන් තමයි අපි විශේෂයෙන්ම මේ පරීක්ෂණයට ලක් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

අපේ මේ ආයතනය ක්‍රීඩකයන් දැනුවත් කිරීම, පුහුණුකරුවන් දැනුවත් කිරීම ඇතුළු අධ්‍යාපනික වැඩසටහන් විශාල ප්‍රමාණයක් කරන බව ඔබතුමන්ලා දන්නවා. මොකද, අපේ වගකීම වන්නේ

ක්‍රීඩකයන්ට තහනම් උත්තේජක ගන්න දීලා ඒ අයව test කරන එක නොවෙයි. අපේ වගකීම වන්නේ තහනම් උත්තේජක නොගන්නා තැනට ක්‍රීඩකයන් දැනුවත් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය කරන ඉතුරු වැඩ කොටස කිරීමයි. විශේෂයෙන්ම පුහුණුකරුවන් පවා දැනුවත් කිරීම සිදු කළ යුතුයි. මොකද, අපේ රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් තිබෙන ඛේදවාචකයක් තමයි, මේ වනවිට ක්‍රීඩාව වාණිජකරණය වෙලා තිබීම. ලෝකයේ තත්ත්වයත් එහෙමයි. සමහර ක්‍රීඩා අසාමාන්‍ය විධියට තරගකාරි වෙලා තිබෙනවා. ඒ නිසා සමහර පුහුණුකරුවන් උත්සාහ ගන්නවා, තමන්ගේ ක්‍රීඩකයා කෙසේ හෝ කෙටි කාලයකදී, තමන් ළඟ ඉන්න කාලයේදී හෝ ඊළඟ තරගයේදී ජයග්‍රහණය කරන්න පුළුවන් වන විධියට මොනවා හරි ක්‍රමවේදයක් අනුගමනය කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකත් එක්ක තමයි අපට මේ doping ප්‍රශ්නය එන්නේ. මොකද, ඒගොල්ලන් ඒ ක්‍රීඩකයාව කෙසේ හෝ ජයග්‍රහණය කරවන්න බලනවා. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. නමුත්, ඒකට අපට කරන්න දෙයක් නැහැ. අපි කරන්නේ අපේ පැත්තෙන් ඒක සිදු නොවෙන්න, ලංකාවේ ක්‍රීඩකයන් ඒ තත්ත්වයෙන් ගලවා ගන්න උත්සාහ කරන එකයි. මොකද, dopingවලින් ක්‍රීඩකයෙකුට එක තරගයක් ජයග්‍රහණය කරන්න පුළුවන්. කෙටි කාලයකදී ජයග්‍රහණයක් අත්පත් කර ගන්නත් පුළුවන්. නමුත්, ඒ තුළින් ඔහුගේ ක්‍රීඩා ජීවිතය, ඔහුගේ ශරීර සෞඛ්‍ය බොහෝ විට කෙටි කාලයකදී මුළුමනින්ම විනාශ වෙලා, සමහර විට ඒ ක්‍රීඩකයාට ක්‍රීඩාවෙන් සමු ගන්න පවා සිද්ධ වෙනවා. ඒක නිසා තමයි අපි මේ ආයතනය ගැන වැඩි අවධානයක් සහ විශේෂ සැලකිල්ලක් දක්වලා ඒ ක්‍රීඩකයන්, එහෙම නැත්නම් පුහුණුකරුවන් දැනුවත් කිරීමේ වැඩකටයුතු පවත්වා ගෙන යන්නේ.

අපි මේ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි පනත යටතේ නියෝග ගෙන එනවා වාගේම ලෝකයේ ක්‍රීඩාවට අදාළව ජාත්‍යන්තර සංවිධාන බොහෝ ප්‍රමාණයක් තිබෙන බවත් අප දන්නවා. World Anti-Doping Agency එක වාගේම ක්‍රීඩාව එක්ක බැඳුණු ජාත්‍යන්තර ආයතන, ජාත්‍යන්තර සංවිධාන ගණනාවක් තිබෙනවා. අපට මේ ක්‍රීඩාව සම්බන්ධයෙන් හුදෙකලාව තීරණ අරගෙන, අපේ කොන්දේසිවලට අනුව පමණක් කටයුතු කරන්න බැහැ. ඒක නිසා අපි ජාත්‍යන්තර ක්‍රීඩාවලට යනකොට මේ වාගේ පනත්, ඒ සංවිධානවල ව්‍යවස්ථාවන්, ඒ සංවිධානවල රෙගුලාසි අනුගමනය කරන්න වෙනවා. ඒක අපේ රටේ විතරක් තිබෙන එකක් නම් අපිට ඕනෑ නීතියක් දමාගෙන ඕනෑ එකක් කරන්න පුළුවන්. ඒ නිසා මේ අණපනත්, නීති ගැන අපට විශේෂ අවධානයක් යොමු කරන්නම වෙනවා. නීති සම්පාදනය කිරීමේදී අපි රටට අවශ්‍ය විධියට වෙනස්කම් කරමින් එම නීතිරීති සම්පාදනය කරනවා. ඒ වාගේම ක්‍රීඩාව තුළත් අපි අවශ්‍ය කරන නීතිරීති සම්පාදනය කර තිබෙනවා. දැනටත් අපි එම කටයුත්ත කරමින් තිබෙනවා. සමහරු මගෙන් අහනවා, "ඇමතිතුමා, ක්‍රීඩා පනතේ වෙනස්කම් කරනවා කිව්වා. කෝ, තවම කර නැද්ද?" කියලා. සමහර අය මේවා දන්නේ නැහැ. නිකම් එහෙම අහනවා. අපි පසුගිය අවුරුද්දේ මේ ගැන අධ්‍යයනය කළා. අපේ ක්‍රීඩා පනත් කෙටුම්පත ගැසට් එකකින් මේ පාර්ලිමේන්තුවටම ගෙනැල්ලා පාර්ලිමේන්තුවෙන්ම සම්මත කරලා, ක්‍රීඩාවට අදාළ නීතිරීති ගණනාවක් අපි පසුගිය අවුරුද්දේ මැයි මාසය තුළ වෙනස් කළා. පසුගිය අවුරුද්දේ එම පනතට අදාළව කරපු ඒ වෙනස්කම් ටිකට අමතරව මේ අවුරුද්දේත්, ඉදිරි වර්ෂයකදීත් ඒ අවශ්‍ය නීතිමය තත්ත්වයන් සංශෝධනය වෙයි. ඒවා කාටවත් වෙනස් කරන්න බැහැ.

අපි දන්නවා, අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තිබෙන ගැටලු ගැන. ඒ අතර විශේෂිත වූ ගැටලුවක් තිබෙනවා. අපේ රටේ ක්‍රීඩා සංගම් 74ක් තිබෙනවා. මේ ක්‍රීඩා සංගම් 74 තුළම අර්බුද තිබෙනවා. සැහෙන කාලයක් තිස්සේ මේවා අත්පත් කරගෙන, අල්ලාගෙන ඉන්න පාලකයෝ ඉන්නවා. සභාපතිලා, ලේකම්ලා, භාණ්ඩාගාරිකලා විශාල කාලයක් තිස්සේ මේවා තුළ ඉන්නවා. අපි මේ ගැන අධ්‍යයනය කර ඒ සම්බන්ධව මේ පනත යටතේ වෙනස්කම් සිදු කළා. ඒ අනුව අවුරුදු අටක් විතරයි එම තනතුරු දරමින් සිටිය හැක්කේ. අවුරුදු අටකට වඩා හිටපු කිසිම කෙනෙකුට මේ කිසිම ජාතික ක්‍රීඩා සංගමයක තවදුරටත් තනතුරු දරන්න බැහැ කියලා අපි පනත වෙනස් කළා. දැන් මේ නීතිය ක්‍රියාත්මක වෙනවා. මේ පනතට අනුව ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා සංගමයක අවුරුදු අටකට වඩා හිටපු කෙනෙකුට නැවත ඒ සංගමය තුළ තනතුරක් දරාගෙන එන්න බැහැ. ඒ විතරක් නොවෙයි, එවැනි තැනැත්තෙකුට වෙන ක්‍රීඩා සංගමයකට යන්නත් බැරි වන විධියට අපි එම නීතිය වෙනස් කළා. අවුරුදු අට නම් අටයි; එතැනින් ඉවරයි; ගෙදර. මොකද, අවුරුදු අටක් ඉඳලාත් හදන්න බැරි වුණා නම් අපි විශ්වාස කරන්නේ නැහැ, එතැනින් එහාට ඒ මනුස්සයාට ඒ වැඬේ කරන්න පුළුවන් කියලා. ඒ ආකාරයට අපේ රටේ ප්‍රධානම ක්ෂේත්‍රයක් වන ක්‍රීඩාවට අදාළ නීතියක් සංශෝධනය කර මේ පාර්ලිමේන්තුවේ සම්මත කර තිබෙනවා. ඒකේ තව ගොඩක් වෙනස්කම් තිබෙනවා. මම මේ එක වෙනස්කමක් ගැන විතරයි කිව්වේ. ඒ ගැසට් එක තුළින්ම අපි වෙනස් කර තිබෙනවා, අනිවාර්යයෙන්ම ජාතික ක්‍රීඩා සංගමයක් අවුරුදු දෙකකට වතාවක් නිලවරණය පවත්වන්න ඕනෑ බවට. ඒ අනුව ඉදිරි වසර දෙක තුළ - පසුගිය අවුරුද්දේ මැයි මාසයේ ඉඳලා අවුරුදු දෙකක් ගත වනකොට - එම සංගම්වලට අදාළ නිලවරණ පවත්වනවා. එතකොට මම හිතන විධියට මේ සංගම්වල ඉන්න බොහෝ අයට - මේ සංගම් 74ටම - නැවත ඒ සංගම්වලට එන්න බැරි වෙනවා, මේ කාලය පිළිබඳ ප්‍රශ්නය නිසා.

අපි බොහොම සාධනීය විධියට රටේ නීතිය වෙනස් කරමින් ඒවා ජාත්‍යන්තර ආයතනවලට පිළිගන්න පුළුවන් මට්ටමට අපේ පැත්තෙන් මේ වැඩකටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම මම මේ අමාත්‍යාංශයට ඇවිල්ලා මාස පහක පමණ කාලයකදී ඒ වාගේ විශාල වෙනසක් කර ගන්න පුළුවන් වුණු එක ගැන සතුටු වෙනවා. ඒ එක්කම ක්‍රීඩාව සම්බන්ධයෙන් අපි මොනවාද කර තිබෙන්නේ කියලා බැලුවොත්, පසුගිය අවුරුද්දේ අප විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් ඒ වෙනුවෙන් කර තිබෙන බව සඳහන් කළ යුතුයි. එයින් එකක්, දෙකක් ගැන මතක් කරන්න මා කැමැතියි. මොකද, සමහර අය අහනවා, මොනවාද කර තිබෙන්නේ කියලා. ඔබට මතක ඇති, අපි යාපනයේ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හදන්න කටයුතු කළ බව. මේ සභාවේ කෑ ගහන අය කොච්චර හිටියත් මෙපමණ කාලයකට යාපනය නගරයේ indoor stadium එකක් තිබුණේ නැහැ. මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව අපි ගිහිල්ලා ඒ ගැන සොයා බැලුවා. දැක්ක ගමන් අපි කිව්වා, යාපනය නගරයේ indoor stadium එකක් හදමු කියලා. ඒ කියන්නේ පොදු එකක්, හැමෝටම ක්‍රීඩා කරන්න. අපි ඒ සඳහා ඉඩමක් හොයා ගත්තා. ඒ ඉඩම ගත්තේ දිස්ත්‍රික් ලේකම්තුමාගෙන්. දිස්ත්‍රික් ලේකම්තුමා තමයි අපට ඉඩම ලබා දුන්නේ. අපි මුල්ගල් තැබුවා. නමුත් අවාසනාවට යාපනයේ ද්‍රවිඩ දේශපාලනඥයෝ ඒකට නඩු දමා තිබෙනවා. ඒ නිසා දැන් අපිට ඒ වැඩ කටයුත්ත කරන්න වෙන්නේ නැහැ. නමුත් අපි කොහොම හරි ඒ කටයුත්ත කරනවා. යාපනයේ ඉන්න දෙමළ මිනිස්සුන්ගේ ක්‍රීඩා කිරීමේ අයිතිය වෙනුවෙන් අපි පෙනී සිටින ගමන්, ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරනවා.

ඒ වාගේම, අපි ගිය අවුරුද්දෙත් රුපියල් මිලියන 300ක් වියදම් කරලා පාසල් 90ක ක්‍රීඩා පිටි සංවර්ධනය කළා. ඒකත් අපි ගිය අවුරුද්දේ කරපු විශාල වැඩවලින් එකක්. ඒ වාගේම, අපි බණ්ඩාරවෙල ගෘහස්ථ ක්‍රීඩාංගණය, මන්නාරමේ swimming pool එකක්, ත්‍රිකුණාමලයේ මීටර් 400ක ධාවන පථයක්, රත්නපුරයේ මීටර් 400ක ධාවන පථයක් හදලා නිම කරලා ජනතා අයිතියට භාර දුන්නා. මේ මම කිව්වේ අපි කරපු නිර්මාණවලින් කිහිපයක්.

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

ක්‍රීඩාව පිළිබඳව තිබුණු අර්බුදය තමයි, එය අවුරුදු ගණනක් වැටිලා තිබුණු එක. ක්‍රිකට් ක්‍රීඩාවේ ඉඳලා සියලු ක්‍රීඩා දශකයකට වැඩි කාලයක් වැටිලා තිබුණේ. ඒ නිසා මේවා ගොඩගන්න එක මාසයකින්, දෙකකින් කරන්න බැහැ. සාමාන්‍යයෙන් ගොඩනැඟිල්ලක් හදනවා නම්, පාරක් හදනවා නම්, වැඩි ගණනක් දීලා අපිට ඒක ටිකක් ඉක්මන් කරලා - අඩු කාලයකින් - හදාගන්න පුළුවන්. හැබැයි ක්‍රීඩකයෙක් ගොඩනඟනවා කියන එක, ක්‍රීඩාවක් ගොඩනඟනවා කියන එක එහෙම අපිට අවශ්‍ය කාලයකදී, කෙටි කාලයකදී කරන්න බැහැ. ඒකට යම්කිසි කාලයක් අවශ්‍යයි. ඒ නිසා අපි ඒ කාලය ගන්නවා.

විශේෂයෙන්ම ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් හැමෝම කථා වෙනවා. අපි ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව නැවත වරක් තිබුණු තැනටම අරගෙන එනවා. නියත ලෙසම අපි ඒක කරනවා. ඒ ගැන කවුරුවත් බය වෙන්න, විවාද කරන්න ඕනෑ නැහැ. හැබැයි අපිට ඒකට යම්කිසි කාලයක් අවශ්‍යයි. අපි වැඩසටහනක් හදලා තිබෙනවා. අපිට agenda එකක් තිබෙනවා. අපි අනුන්ගේ agendasවලට නොවෙයි වැඩ කරන්නේ. අපි වැඩ කරන්නේ අපේ agenda එකට. මඩ ගහලා, අපිව බය කරලා, බොරු කථා කියලා විපක්ෂයට ඒගොල්ලන්ගේ agendasවලට අපිව තල්ලු කරගන්න බැහැ. අපිට නිශ්චිත දැක්මක්, agenda එකක් තිබෙනවා. ඒ agenda එකට අපි වැඩ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.20]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු සම්බන්ධ පනත් කෙටුම්පතක්, ක්‍රීඩාව හා සම්බන්ධ පනතක් යටතේ වන නියෝග ඇතුළුව වැදගත් කාරණා කිහිපයක් ගැන අද දවසේ සාකච්ඡා කරනවා. ඒ වාගේම ජනාධිපතිවරයා අද දවසේ ගෙනාපු සහන මල්ල ගැනත් මේ මොහොතේ කථා කරනවා.

විශේෂයෙන්ම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත පිළිබඳව කථා කරනකොට අපට අද දකින්න තිබෙන කාරණයක් තිබෙනවා. ආණ්ඩුව බලයට එනකොට ජනතාවට කිව්වේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උරුම කර දෙනවා කියලායි. නමුත් දවස ගාණේ බදු බර වැඩි කරමින්, ජීවන වියදම වැඩි කරමින් කටයුතු කිරීම තුළ ජනතාවට නම් ලස්සන ජීවිතයක් අද කොහෙත්ම උරුම වෙලා නැහැ කියලා අපිට බොහොම පැහැදිලිව පේනවා.

මෙතුමන්ලා කියනවා, භාණ්ඩාගාරය පිරී ගිහිල්ලා, පොහොසත් වෙලා තිබෙනවා කියලා. හැබැයි ඒකෙන් ජනතාවට ලැබෙන සහනය මොකක්ද කියන එක පිළිබඳව අද ජනාධිපතිතුමා ගෙනාපු සහන මල්ල පිළිබඳව කථා කරද්දීත් අපිට කථා කරන්න සිද්ධ වෙනවා. මොකද, ජනාධිපතිවරයා සහන මල්ලක් ගේනකොට Hiru Newsවල දාලා තිබෙනවා මම දැක්කා, "ජනාධිපතිතුමාගෙන් සහන මල්ලක්, අදත් පාර්ලිමේන්තුවට" කියලා. ජනාධිපතිතුමාගේ කථාව ඉවර වෙන්න කලින් ඒකට ජනතාවගේ විශ්වාසය කොහොමද කියන එක පහළින් commentsවලින් සහ "Likes"වලින් දකින්න තිබුණා. "Haha" ප්‍රතිචාර තිබුණා 3,800ක්. 1,100ක් තමයි "Likes" තිබුණේ. ජනාධිපතිතුමාගේ කථාව පිළිබඳ ජනතාව තුළ තිබෙන විශ්වාසය අද එතැනින්ම බොහොම පැහැදිලියි. මේකට 5,000ක් "Likes" සහ comments දානකොට 3,800ක් "Haha" කියලායි දමන්නේ.

ජනාධිපතිතුමා මේ වාගේම පාර්ලිමේන්තුවට ඇවිල්ලා "දිට්වා" සුළි කුණාටුව පිළිබඳව කථා කරනකොටත්, "ආයේ ඉතින් කිසි ප්‍රශ්නයක් නැහැ, පීඩාවට පත් වෙච්ච එක තමයි හොඳ" කියලා මේ රටේ සියලු දෙනා හිතන තැනටයි පත් වුණේ. තහඩුවක් ගියා නම් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලායි කිව්වේ. හැබැයි අද රුපියල් ලක්ෂ 10 හම්බ වෙච්ච අය කවුද? හදලා දීපු ගෙවල් බැලුවාම කී දෙනෙකුටද ගෙවල් හදලා දීලා තිබෙන්නේ කියලා පේනවා. තවම ගෙවල් කුලී දීගන්න බැරි වෙලා තිබෙනවා. ගංවතුර ආපු නිසා, නාය ගිය නිසා සමහර අයට තමන්ගේ නිවසට යන්න එපා කියලා තහනම් කර තිබෙනවා. "ගෙයක් හොයා ගන්න. අපි කුලිය දෙනවා" කියලා ඒ අයට කියා තිබෙනවා. එක මාසයයි ගෙවල් කුලිය දීලා තිබෙන්නේ. ඊට පස්සේ අද වෙනකම් ඒ අයට ගෙවල් කුලියකුත් නැහැ, ගෙවල්වලට වන්දිත් නැහැ, යන්න එන්න තැනකුත් නැහැ. ඒ අය ගේ හදා ගන්නේ කොහේද කියන එක සම්බන්ධයෙන්වත් අවශ්‍ය කටයුතු කරලා නැහැ. හැබැයි ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කියනවා, රුපියල් කෝටි 50,000ක් ඒ ජනතාව වෙනුවෙන් දීලා ඒ කටයුතු කර තිබෙනවා කියලා. හැබැයි ඒ රුපියල් කෝටි 50,000 කොහේටද ගියේ කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

දැන් අර ක්‍රමෝපාය පිළිබඳව කථා කරනවා නේ. ක්‍රමෝපාය තිබෙනවා, ආණ්ඩුව ඇතුළේ කොටසකට. පසුගිය කාලයේ ඇමතිවරයෙක් කියනවා අපි දැක්කා, "අපට call කරලා රුපියල් 1,000ක් දෙන්න ඥාතියෙක්වත් නැහැ" කියලා. හැබැයි ඒ ඇමතිවරයාම දැන් කියනවා, "අපිට එක telephone call එකෙන් රුපියල් ලක්ෂ 5 ගාණේ 100දෙනෙකුගෙන් එකතු කරගන්න පුළුවන්" කියලා. අන්න! ඒ කට්ටිය ක්‍රමෝපාය හදාගෙන තිබෙනවා. ඒ කට්ටිය වසර එකහමාරක් තුළ කෝටි ගණන් වටිනා තට්ටු නිවාස හදන්න පුළුවන් විධියට තමන්ගේ ක්‍රමෝපාය සංවර්ධනය කරගෙන තිබෙනවා. අපි අහන්නේ, ඒක රටට ආදේශ නොකරන්නේ ඇයි? එතුමන්ලා ගැන විශ්වාසය තබලා අවුරුදු 76ක ශාපය නිම කරන්නට ඡන්දය දෙන්න පෙලඹුණු ජනතාවට මේ ක්‍රමෝපාය ආදේශ නොකරන්නේ ඇයි? තමන්ට පුළුවන් වුණා නම් අවුරුදු එකහමාරක් තුළ එවැනි තත්ත්වයකට ගොඩනැඟෙන්න ඒක රටට ආදේශ නොකරන්නේ ඇයි? අද ඒ පිළිබඳව විවිධ කථා කියනවා. අහවලාගේ සල්ලිවලින් තමයි හැදුවේ කියනවා. තමන්ගේ අඹ වත්ත විකුණලා තමයි හැදුවේ කියනවා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. කලිනුත් ඒ අඹ වත්ත තිබුණා නම් ඒක විකුණලා ගේ හදා ගන්න තිබුණා නේ. මෙච්චර කාලයක් ඉඳලා ආණ්ඩු බලය ලැබිලා ඇමතිකම ලැබුණාට පසුව දැන් ගේ හදා ගන්න අදහස පහළ වුණේ ඇයි? ඒ කියන්නේ, ආණ්ඩුවේ කොටසකට හොඳ ක්‍රමෝපාය තිබෙනවා. ඒ කට්ටිය පොහොසත් ජීවිතයක්, ලස්සන ජීවිතයක් ගත කරනවා. ඒ කට්ටිය තමන්ගේ ආර්ථිකය පොහොසත් කරගෙන තමන්ට සහ තමන්ගේ දරුවන්ට ලස්සන ජීවිතයක් උදා කර ගන්න කටයුතු කරනවා. ඒ අතරේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා අර වාගේ කථාවක් කිව්වාම ජනතාව තුළ විශ්වාසය ඇති වෙයිද? අද ජනාධිපතිතුමා කියපු දේවල් පිළිබඳව ජනතාවගේ තිබෙන විශ්වාසය පිළිබඳව තමයි මම අර ඉස්සෙල්ලා කිව්වේ. ඒ news එකට ජනතාව දක්වපු ප්‍රතිචාර පිළිබඳවයි මම මුලින් කථා කළේ.

ඊළඟට, මේ දෙනවාය කියපු දේවල් ගොවීන්ට ආදේශ කරලා ගත්තාම, දෙනවා කියපු සියල්ලම රුපියල් 5,000කින් වැඩි කරපු පොහොර සහනාධාරය ඇතුළේ තමයි තිබෙන්නේ. අද ඉන්ධන මිල වැඩි වෙලා. ගොවීන් ඉන්ධන ලබා ගන්න විශාල පරිශ්‍රමයක් දරන්න ඕනෑ. දැන් නම් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ඉන්ධන ටික ලැබෙනවා, කුඹුරු හාගන්න. හැබැයි, කුඹුරු හාන්න යන කුලිය අද කීයකින් වැඩි වෙලාද? ගිය කන්නයේ අක්කරයක් හාන්න ගියේ රුපියල් 20,000ක් විතර. අද අක්කරයක් හාන්න රුපියල් 28,000ක්, 30,000ක් යනවා. එතකොට පොහොර ටික? මේ වනකොට දෙන්නම් කියලා තිබෙන්නේ පොහොර කිලෝ 20යි. එක මුරයකට පොහොර කිලෝ 20ක් දෙන්නම් කියලා තිබෙනවා. එතකොට පොහොර කිලෝ 20ක් පිළිබඳව විශ්වාසය ඇතුව තමයි ගොවියාට කුඹුරට බහින්න වෙලා තිබෙන්නේ. ඊළඟට, ආණ්ඩුව වැඩි කළ රුපියල් 5,000ක් කවදා ලැබෙයිද කියලා විශ්වාසයක් නැහැ. ගිය කන්නයේ දෙවැනි පොහොර සහනාධාරයේ කොටස දුන්නේ කවදාද? පළමුවැනි කොටසට අදාළ මුදල හෝ හෝ ගාලා ගිණුම්වලට දැම්මා. දාලා කිව්වා, "අපි සියයට 90ක්, සියයට 95ක්, සියයට 98ක් දාලා තිබෙනවා" කියලා. හැබැයි, දෙවැනි පොහොර සහනාධාර මුදල ලබා දෙන්න ආණ්ඩුව අසමත් වුණා. ඒක නිසි වෙලාවට දුන්නෙත් නැහැ. තවම නොලැබුණු අය ඉන්නවා. ඒ නිසා පොහොර පිළිබඳව ජනාධිපතිතුමා කියපු කථාව අපි විශ්වාස කරන්නේ කොහොමද? අද ගොවියෝ විශාල අපහසුතාවකට පත් වෙලා ඉන්නවා. පොහොර ටික ලැබෙනවා කියලා විශ්වාසයක් නැහැ. මුර කිහිපයකට පොහොර තිබෙනවාය කියලා ජනාධිපතිතුමා කිව්වාට, දැනට පොහොර කිලෝ 20කට විතරයි ඒ ආවරණය ලැබිලා තිබෙන්නේ කියන විශ්වාසය ගොවීන් තුළ තිබෙන්නේ. පොහොර ටික ලබා දීමට ආණ්ඩුව කටයුතු කළ යුතු වනවා.

අද ඔක්කෝම බඩුවල මිල වැඩි වනවා. හැබැයි, ගොවියාගේ වී ටිකට තවම ගෙවන්නේ ඒ මිලමයි. රජය නියම කළ මිලට නාඩු වී ටික ගොවියාට විකුණා ගන්න බැහැ. සම්බා පිළිබඳව අපි කථා කරන්නේ නැහැ. ආණ්ඩුව ගිය සැරේ කීරි සම්බාවලට, සම්බාවලට කළ වැඩේ නිසා මේ සැරේ ගොවීන් කීරි සම්බා, සම්බා වගා කළේ නැහැ. ගිය කන්නයේ නාඩුවලට වඩා සම්බාවල මිල අඩු වුණා. ඒ නිසා ගොවියෝ මේ සැරේ නාඩු වගා කරන්න පෙලඹුණා. මේ සැරේ සම්බා මිල ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම කීරි සම්බා මිල ඉහළ ගිහින් තිබෙනවා. නැවත අපි හාල් ඇටයක්වත් ආනයනය කරන්නේ නැහැ කියපු කට්ටියට සම්බා ආනයනය කරන්න වෙලා තිබෙනවා. හැබැයි, නාඩු වගා කළ ගොවීන්ට අද කර කියා ගන්න දෙයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ පැත්තෙන් වී ගොවියාට සාධාරණයක් ඉටු වෙන්නේ නැහැ.

සාමාන්‍යයෙන් බෙත්ම ක්‍රමය පාවිච්චි කරන්නේ වතුර පිළිබඳ සැකය නිසා. මෙවර වතුර ලැබෙනවා කියන විශ්වාසය තුළ අක්කර දෙකහමාරම වගා කරන්න ඉන්නවා. මේ යල කන්නය වුවත් ගොවීන් පෙලඹිලා ඉන්නවා සම්බා වී වගා කරන්න. සම්බා වගා කරන්න ගියාම ජලය පිළිබඳ ප්‍රශ්නයක් එන්න පුළුවන්. මොකද, ගොයම පැහෙන්න වැඩි කාලයක් ගත වනවා. එම නිසා ජලය පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්. ඊළඟට, පොහොර ටික ලැබෙන්නේ නැහැ. ඒ වාගේම හැමෝම සම්බා වගා කළායින් පස්සේ සම්බාවලටත් අබ සරණයි කියන එක තමයි කියන්න තිබෙන්නේ. එම නිසා ආණ්ඩුව ක්‍රමවත් සැලැස්මකට ගිහින් තිබෙනවාද? ගොවියා නහා සිටුවන්න වැඩ පිළිවෙළ සකස් කරනවාය කිව්වාට ගොවියා වගා කරන්න ඕනෑ මොන ප්‍රමාණයෙන්ද කියලා කියන්න ආණ්ඩුව සැලසුමක් ඇතුව කටයුතු කරන්නේ නැහැ. ගොවියා පොහොර සහනාධාරයට යට කරලා අපහසුතාවට පත් කරන්න කටයුතු කරනවා.

උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල දැන් නිකුත් වෙලා තිබෙනවා. උසස් පෙළ ප්‍රතිඵල අනුව පළාත් නවයෙන් මෙවර උතුරු මැද පළාත නවවැනි තැන. ජනාධිපතිවරයාගේ දිස්ත්‍රික්කය තමයි අනුරාධපුරය. කලාප ගත්තාම, උතුරු මැද පළාතේ කලාප අටක් තිබෙනවා. ප්‍රතිඵල අනුව තඹුත්තේගම කලාපය හත්වන තැන. හත්වැනි තැනට පත් වෙලා තිබෙන්නේ ජනාධිපතිතුමාගේ ගම පිහිටි තඹුත්තේගම කලාපය. හැබැයි, උතුරු මැද පළාතෙන්ම තඹුත්තේගම කලාපයේ අධ්‍යාපනය හත්වැනි තැනට පත් වනකොට කලාපයේ කඩවලින් ගුලි නම් හම්බ වනවා, ලොරි ගණන්. *[බාධා කිරීම්]* මදනමෝදක ගුලි නම් ලොරි ගණන් හම්බ වනවා. ඔබතුමන්ලා තඹුත්තේගමට ගුලි promote කරන එකද කරන්නේ? ගුලි කාලා, මෝහනය වෙලා කියන ඒවාට වශී වෙලා වාගේ ඉන්න කියලාද කියන්නේ? ජනාධිපතිවරයාගේ දිස්ත්‍රික්කයේ, ජනාධිපතිවරයාගේ කලාපයේ අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය මේකයි.

අද පාසල් ගුරුවරුන්ට සහනාධාරයක් නැහැ. දුෂ්කර පාසල්වල ගුරුවරුන්ට දෙනවා කියපු දුෂ්කර දීමනාව තවමත් ලබා දීමට කටයුතු කරලා නැහැ, මේ ආණ්ඩුව. ඒ නිසා අධ්‍යාපනය පැත්තෙන් ජනතාවට අත් වෙලා තිබෙන්නේ මේ තත්ත්වයේ ඉරණමක් බවයි මට කියන්න තිබෙන්නේ. උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගමින් ජනාධිපතිවරයෙක් පත් වෙලාත් උතුරු මැද පළාත ගොඩනැඟීම සම්බන්ධයෙන් අද ඇති වෙලා තිබෙන්නේ මේ වාගේ තත්ත්වයක්.

ජනාධිපතිවරයා ගෙනාපු සහන මල්ලෙන් රටේ එක කොටසක් ගැන විතරක් කථා කළා. හැබැයි, තවත් විශාල පිරිසක් ඒකෙන් අත් හැරිලා තිබෙනවා. රාජ්‍ය සේවකයන්, කම්කරුවන් ඇතුළු විශාල පිරිසක් පීඩාවට පත් වෙලා ඉන්නවා, මේ රටේ සෑම භාණ්ඩයක්ම ඉහළ ගිහින් තිබෙන නිසා. පීඩාවට පත්ව ඉන්න ජනතාව සියලු දෙනා ආවරණය කරන්න ජනාධිපතිතුමා ගෙනාපු මේ සහන මල්ල තුළින් හැකි වන්නේ නැහැ. අවසානයේදී අපට කියන්න තිබෙන්නේ, මේ ලබා දෙන දේවල් පිළිබඳව විශ්වාසයකුත් නැති බවයි. මේ රටේ පසුගිය කාලයේ නම් දකින්න තිබුණේ, "දවසේ වෙඩිල්ල". දවසේ වෙඩිල්ලට ආණ්ඩුව පැත්තෙන් අපි දැක්කේ "දවසේ ඇඩිල්ල". දැන් "දවසේ හුව" එනවා. තවත් දවස් කිහිපයක් යනකොට "දවසේ හුව" ජයග්‍රහණය කරන මන්ත්‍රීවරයා සොයා ගන්නා තරගය තමයි ඔබතුමන්ලා කාට කාටත් පවත්වන්න සිදු වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.29]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොමත්ම ස්තුතියි. මට හුඟක් කරුණු කාරණා කියන්න තිබෙන නමුත් කාල වේලාව අඩු නිසා කෙටියෙන් තමයි කියන්න වෙන්නේ. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය සම්බන්ධවත්, මත්ද්‍රව්‍ය සම්බන්ධවත් අපි කථා කරන්න

[ගරු ෆස්මින් ෂරීෆ් මහතා]

ඕනෑ. අපේ රටේ සෑහෙන්න ක්‍රීඩකයෝ බිහි වෙලා තිබෙනවා. ඒ කට්ටිය හරියට, නීත්‍යානුකූලව ක්‍රීඩා කරලා ලංකාව කීර්තියට පත් කරලා තිබෙනවා.

ඔබතුමන්ලාත් දන්නවා, ඇමෙරිකාවේ මේරියන් ජෝන්ස් ක්‍රීඩිකාව ගැන. ඇය ක්‍රීඩා කරපු කාලයේ පදක්කම් පිට පදක්කම් දිනා ගත්තා. අවසානයේදී, මේරියන් ජෝන්ස්ම ප්‍රකාශ කළා "මම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණා. මත්ද්‍රව්‍ය පාවිච්චි කළා" කියලා. ඊට පස්සේ ඇය දිනාගත් පදක්කම් ටික ආපහු ගන්න කටයුතු කළා. අපේ රටේ ක්‍රීඩකයෙක් හෝ ක්‍රීඩිකාවක් මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා ක්‍රීඩා කරලා මොකක් හෝ පදක්කමක් හරි certificate එකක් හරි දිනා ගත්තොත්, ඉදිරි කාලයේදී ඒ ගැන නීත්‍යානුකූලව සොයා බලලා, මුත්‍රා සහ ලේ සාම්පල test කරලා පරීක්ෂණ කටයුතු කළාට පස්සේ, වැරදිකරු වුණොත් ඒ පදක්කම ආපහු ගන්න සිදු වෙනවා. ඒ වාගේම, රටටත් අපකීර්ති නාමයක් අත් වෙනවා. ඒ වාගේම, හොඳට ක්‍රීඩා කරන කෙනෙකුට අවස්ථාවක් ලැබෙන්නේ නැති වෙන්නත් පුළුවන්. ඒ වාගේ දේවල් වළක්වා ගන්න තමයි ඇත්තටම මේ නීතිය ගෙනාවේ.

ඒ වාගේම අපි tax සම්බන්ධවත් නීතියක් ගෙනෙනවා. මේ සියලුම නීති ගෙනෙන්නේ මේ රට වෙනුවෙන්, රටේ කීර්ති නාමය දියුණු කර ගන්නත්, සමාජය හදා ගන්නත් එක්ක.

මේ දවස්වල AI තාක්ෂණය ගැන කථාවක් යනවා. මම අද කැන්ටීමේ හිටියා. එතකොට විරුද්ධ පක්ෂ නායකයා කථා කරමින් ඉන්නවා දැක්කා. මට හිතුණා, මේ කථා කරන්නේ විරුද්ධ පක්ෂ නායකයාමද, එහෙම නැත්නම් AI තාක්ෂණයෙන් හදපු කෙනෙක්ද කියලා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, ගම්මන්පිල ගැනත්. 'ජාතිවාදියා' කියලා තමයි ඇත්තටම කියන්නේ. මුස්ලිම් ජනතාව ගැන කියමින් ජාතිවාදය පතුරුවලා පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධව පොතක් එළිදක්වපු වෙලාවේ විරුද්ධ පක්ෂ නායකයා එතැනට සහභාගි වුණා. ඒක අපි සියලු දෙනා රූපවාහිනියෙන් දැක්කා. ඒ වුණත් නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, සජිත් ප්‍රේමදාස එතැනට ගියා කියලා පෙන්නලා තිබෙන්නේ AI තාක්ෂණයෙන් කියලා.

අපි තවත් එක් දෙයක් දැන ගන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවා සුළු ජාතීන් - මුස්ලිම්, දෙමළ, ක්‍රිස්තියානි ජනතාව - හුහදෙනෙක් සජිත් ප්‍රේමදාස මහත්මයාට ඡන්දය දුන්නා කියලා. මොකද, එදා එතුමා ගැන විශ්වාසයක් තිබුණා. දැන් ඒ විශ්වාසය සම්පූර්ණයෙන් කැඩිලායි තිබෙන්නේ. ඒ විශ්වාසය දැන් සම්පූර්ණයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමා කෙරෙහි තබා තිබෙනවා. ඒකට එක් හේතුවක් තමයි, ඉරාන නැවක් ඇවිල්ලා, ඒ ඉරාන නැවට ඇමෙරිකාවෙන් පහර දීලා තියෙද්දී ලෝකයේ කොයි නායකයෙක්වත් මැදිහත් වුණේ නැති වෙලාවේ අපේ පොඩි රටේ නායකයා ඒ මුස්ලිම් ජනතාව -ඒ නාවිකයෝ- බේරා ගැනීම. ඒ අය බේරා ගත්තු හින්දා ලෝකයේ මාධ්‍ය නාළිකාවලින් - බීබීසී, අල් ජසීරා වැනි mediaවලින් - අපේ අතිගරු ජනාධිපතිතුමා වීරයෙක් විධියට තමයි ඇත්තටම හැඳින්වූයේ.

ඒ වාගේම, අපි තවත් දෙයක් දැනගන්න ඕනෑ. මේ රටේ සජිත් ප්‍රේමදාසලා, ගම්මන්පිලලා එකතු වෙලා ජාතිවාදය පැතිරෙව්වා. විරුද්ධ පක්ෂයේ වුණත් සජබයේ කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීකෙනෙකුට ISIS මන්ත්‍රී කෙනෙක් කියලා හංවඩු ගහන කොට ඒකට සජිත් ප්‍රේමදාස මහත්මයා උත්තර දෙන්න ඕනෑ. සජිත් ප්‍රේමදාස මහත්මයා ඉන්නේ ඒ මුස්ලිම් මන්ත්‍රීතුමාගේ පැත්තේද, නැත්නම් ගම්මන්පිලගේ පැත්තේද කියලා අපිට ඇත්තටම පවසන්න ඕනෑ.

පාස්කු ඉරු දින ප්‍රහාරය සිදු කළ දිනය කළු දිනයක් කියලා තමයි මුස්ලිම් ජනතාව විධියට අපි ඇත්තටම විශ්වාස කරන්නේ. ඒ කළු දිනය නිසා ලංකාවේ වැඩිම හානිදායක තත්ත්වයට පත් වුණේ මුස්ලිම් ජනතාව. මුස්ලිම් ජනතාව කියන්නේ, සියලුදෙනා එක්ක ආදරයෙන්, සහෝදරත්වයෙන් ජීවත් වෙන්න කැමති ජනතාවක්. සජිත් ප්‍රේමදාස මහත්තයලා අද බලන්නේ මොකක්ද? ඉස්සර වාගේ තාත්තලා, පුතාලා, බාප්පලා එකතු වෙලා මේ රටේ ජාතිවාදය පතුරුවලා, ජාතිවාදය මතින් ජනාධිපති වෙලා මේ රට කාපු විධියටම සජිත් ප්‍රේමදාස මහත්මයාත් මේ රට කන්නද අද බලන්නේ? ඒ පක්ෂයේ මුස්ලිම් මන්ත්‍රීවරුන්ගෙනුත්, විරුද්ධ පක්ෂයේ අනෙක් පක්ෂවල ඉන්න මන්ත්‍රීවරුන්ගෙනුත් මම ඒ ප්‍රශ්නයට උත්තරය බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් එක කාරණයක් කියන්න ඕනෑ. දැන් තෙල් ප්‍රශ්නය ගැන කථා කළා. ලෝකයේම තෙල් ප්‍රශ්නයක් තිබෙනවා. හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා තමයි තෙල් ටික එන්නේ. අපේ ආණ්ඩුව විධියට අපි අපේ රටේ ජනතාවට සහනයක් දෙන්න පුළුවන් විධියට පෙට්‍රල් ලීටරයකින් රුපියල් 20ක් අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම ඩීසල්වලින් රුපියල් 100ක් අඩු කරගෙන ජනතාවට සහන දෙනවා. විපක්ෂයේ සමහර කට්ටිය හිතාගෙන ඉන්නේ ලෝකයෙන්ම තෙල් මිල වැඩි ලංකාවේ විතරයි කියලායි. අද පාකිස්තානයේ ඩීසල් ලීටරයක් රුපියල් 539ක් දක්වා ඉහළ ගිහිල්ලා. ඒ වාගේම පෙට්‍රල් ලීටරයක් රුපියල් 439ක් දක්වා ඉහළ ගිහිල්ලා. ලංකාවේ පෙට්‍රල් ලීටරයක්වත් නිෂ්පාදනය කරන රටක් නොවෙයි. ඔබතුමන්ලා ඉන්දියාව ගැන හිතලා බලන්න. එය පෙට්‍රල් නිෂ්පාදනය කරන, පෙට්‍රල් තිබෙන රටක්. අද ඒ රටේ මුම්බායිවල පෙට්‍රල් ලීටරයක් රුපියල් 350යි. ඒ වාගේ රටවල එවැනි මිලකට තෙල් මිල ඉහළ යනකොට අපට ජනතාවට සේවය කරන්න පුළුවන් පළමුවැනි අවස්ථාවේම මේ තෙල් ප්‍රශ්නයට ඉදිරි කාලයේදී අපි විසඳුමක් ලබා දෙනවා.

විපක්ෂයේ තව මන්ත්‍රීවරයෙක් මෙතැනදී කිව්වා, "දිට්වා" සුළි කුණාටුවෙන් ගෙදරක ටකරමක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා ජනාධිපතිතුමා කිව්වා කියලා. ඔව්, අපි පුළුවන් විධියට එය දුන්නා. අර්ධ හානි වෙච්ච සියලු ගෙවල්වලට අපි රුපියල් ලක්ෂ 5ක් දෙනවා. ඒ වාගේම සම්පූර්ණ හානි වෙච්ච අයට රුපියල් ලක්ෂ 50ක් දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. ඉදිරියේදී ඒක ලබා දෙනවා. ඔබතුමන්ලා පසුගිය කාලයේ දුන්නේ කීයද? රුපියල් ලක්ෂ 16යි දුන්නේ. නමුත් අපි තුන්ගුණයක්, හතරගුණයක් වැඩිපුර දෙනවා. ඉඩම් දෙනවා. ඒ ප්‍රශ්න විසඳන්න මැදිහත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මම විපක්ෂයට තව දෙයක් කියන්න ඕනෑ. මේ රටේ ජනතාවට සේවය කරන්න පත් වෙච්ච රජයක් තමයි, අපේ රජය. අපි කාටවත් හානි කරන්නේ නැහැ. අපි ළඟ ජාතිවාදයත් නැහැ; ආගම්වාදයත් නැහැ. මට දීලා තියෙන කාල වෙලාව තුළ මෙච්චරයි කථා කරන්න පුළුවන්. අවසාන වශයෙන්, ඉදිරි කාලයේදීත් ජාතිවාදය නැති රටක් බවට මේ රට පත් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. නෝම්බි අවුරුද්ද සමරපු කට්ටියටත්, ඒ වාගේම දෙමළ, සිංහල අවුරුද්ද සමරන්න ඉන්න සියලුදෙනාටත් සුබ පතමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

[අ.භා. 3.36]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පනත් කෙටුම්පතක්, රීති සහ නියෝග ආදිය ඉදිරිපත් කරලා තිබෙනවා. එක නියෝගයක් ක්‍රීඩා අංශය සම්බන්ධවයි. පනත් කෙටුම්පත, බදු සම්බන්ධවයි. ඇත්තටම සියයට 36ක් බදු ගෙවලා මිනිස්සුන්ට කර්මාන්තයක් කරගෙන යන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. සියයට 36ක් බදු ගෙවලා කිසිම ව්‍යවසායකයෙකුට, කිසිම කර්මාන්තකරුවෙකුට ඉදිරියට යන්න බැහැ. විශේෂ කර්මාන්තයක් කරන කෙනෙක් තමයි ඩඩ්ලි සිරිසේන මැතිතුමා. එතුමාත් කියනවා, මෙච්චර බදු ගෙවලා මේ ක්ෂේත්‍රය පවත්වාගෙන ගෙන යන්න බැහැ කියලා. ඒ විධියට බදු වැඩි කරන්න, වැඩි කරන්න සියලු කර්මාන්ත වැටෙනවා. සියයට 18ක තිබුණු බදු ප්‍රමාණය තමයි දැන් සියයට 36ට ඇවිල්ලා තිබෙන්නේ. ඒ දමපු බදු ප්‍රමාණය නිසා ආර්ථිකයත් එක්කම සියලු කර්මාන්ත කඩාගෙන වැටෙනවා. එම නිසා මේ බදු ක්‍රමය නම් අපි අනුමත කරන්නේ නැහැ. බදු අඩු කරන්න ඕනෑ. එන්න, එන්න බදු වැඩි කරන කොට එකම කර්මාන්තයකටවත්, එකම ක්ෂේත්‍රයකටවත් ඉස්සරහට යන්න බැහැ.

අපේ ක්‍රීඩා ඇමතිතුමා කිව්වා, "ක්‍රීඩා සංගම් 70 ගණනක් තිබෙනවා. අවුරුදු 8කට පස්සේ කිසිම කෙනෙකුට ඒ සංගම්වලට එන්න බැහැ" කියලා. ඒක හොඳ යෝජනාවක්. ඒක ගෙනාපු එකට මම ස්තුතිය පුද කරනවා. *[බාධා කිරීමක්]* අපේ හිටපු ක්‍රීඩා ඇමති දයාසිරි ජයසේකර මැතිතුමා මගේ ළඟ ඉන්නවා. එතුමා කියනවා, එතුමා ගෙනාපු යෝජනාව වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා ක්‍රියාත්මක කරනවාට විශේෂයෙන්ම අපි ස්තුතිය පුද කරනවා කියලා. අපේ හිටපු ක්‍රීඩා ඇමති දයාසිරි ජයසේකර මැතිතුමා දක්ෂයෙක්; වැඩකාරයෙක්. අපි ඒක දන්නවා. එතුමාට කරගන්න බැරි වුණාට, වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා එය ඉටු කිරීම පිළිබඳව එතුමාට ස්තුතිය පුද කරනවා.

ගරු ජනාධිපතිතුමා අද මේ සභාවට ඇවිල්ලා සහන පැකේජයක් ගැන ප්‍රකාශ කළා. ඒ සහන පැකේජය ගැන කියපු දේවල් අපි අහගෙන සිටියා. එතුමා ඒක ලස්සනට කිව්වා. බලාගෙන ඉන්න කට්ටියට ඒක ලස්සනයි, අහගෙන ඉන්න කට්ටියටත් ලස්සනයි. නමුත්, ක්‍රියාත්මක කරනකොට තමයි ප්‍රශ්න තිබෙන්නේ.

"දිට්වා" සුළි කුණාටුව ඇති වුණාට පස්සේ ඒකට රුපියල් බිලියන 500ක මුදලක් වෙන් කළා. නමුත් ගම්බද ජනතාවට ඒ මුදල් නිවැරදි ආකාරයෙන් ගිහිල්ලා නැහැ. ඒ කටයුතු නිලධාරි මට්ටමින් ක්‍රියාත්මක වෙනකොට චක්‍රලේඛ බලන්න කියනවා, එහේ එන්න කියනවා, මෙහේ එන්න කියනවා. අහිංසක ජනතාවට ඒ ආධාර ලබා ගැනීම එතැනින්ම එපා කරවනවා. මීට කලින් කිව්වා, සහනාධාර ඔක්කෝම දීලා ඉවරයි කියලා. "දිට්වා" සුළි කුණාටුව වෙනුවෙන් සහන ලබා දීමේ කටයුතු සියයට 25ක්වත් අපි දන්නා තරමින් ක්‍රියාත්මක වෙලා නැහැ. අද කිව්වා, පොහොර සහනාධාරය දෙනවා, තෙල්වලට සහනාධාර දෙනවා, ලොකු බෝට්ටුවලට රුපියල් 150,000ක් දෙනවා කියලා. එහෙම දෙනවා නම් අපි සතුටුයි. නමුත් ඒවා ක්‍රියාත්මක කරනකොට ඒ රැකී රක්ෂා කරන ජනතාව ලොකු ප්‍රශ්නවලට මුහුණ දෙනවා.

අද බලන්න, පොහොර මිටියක් කීයද කියලා. අද පොහොර මිටියක් ගන්න නැහැ. ඒ වාගේම තෙල් මිල කීයද? මේ තෙල් මිල අනුව කෘෂිකර්මාන්තය කරන්න පුළුවන්ද? අද කෘෂිකර්මාන්තය වැටිලා තිබෙන්නේ. ඒවාට ආණ්ඩුවෙන් සහන දෙන්න ඕනෑ. ඒවා සොයා බලා ගොවි ජනතාවට විශේෂ සහනයක් දෙන්න ඕනෑ. අද එළවලුවල මිල වැටිලා තිබෙන්නේ. එළවලු transport කරන්න බැහැ. Transport සඳහා යන වියදම වැඩි නිසා, ඒ කියන්නේ ඉන්ධන මිල වැඩි නිසා එළවලු අරගෙන යන්නේ නැහැ. ඒ දේවල් හැම තැනම හිරවෙලා තිබෙනවා. ඒ ගැන සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ ප්‍රදේශය වන කල්පිටියේ hospital එකක් තිබෙනවා. ඒ hospital එක අංග සම්පූර්ණ කරලා අවුරුදු ගණනක් නිකම් වසා දමා තිබෙනවා. මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාට කිව්වා, ඒ ගැන සොයා බලා ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන පරිදි කටයුතු කරන්න කියලා. කෝටි ගණනක් වියදම් කරලා ඒක අංග සම්පූර්ණ රෝහලක් බවට පත් කළත්, අපේ ප්‍රදේශයේ සිටින 85,000ක්, 100,000ක් පමණ වන ජනතාවට ඒකෙන් ප්‍රයෝජනයක් නැත්නම් එච්චර මුදලක් වියදම් කරලා හදපු එකේ තේරුමක් නැහැ. ඒ ගැන සොයා බලා කටයුතු කරන්න කියා මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු විපක්ෂ නායකතුමා උත්සවයකට ගිය එක ගැන අද මන්ත්‍රීවරු කිව්වා. විපක්ෂ නායකතුමා එතැනට ගිය එක ඇත්ත. පොතක් එළිදක්වනවා කියලා ඒකට ආරාධනා කළාම, කවුරු වුණත් යනවා. හොඳ නරක මොකක් වුණත්, කවුරු හරි ආරාධනා කළාම එතැනට නවා. එතැනට දේශපාලනඥයන් එන්න පුළුවන්, වෙන කවුරුන් හෝ එන්න පුළුවන්, ඒක ඒ තරම් දෙයක් නොවෙයි. අපේ විපක්ෂ නායකතුමා එතැනට ගියා කියලා මුස්ලිම් ජනතාවට ලොකු ප්‍රශ්නයක් නැහැ. එතුමා එතැනට ගිහිල්ලා බැලුවා, මොකක්ද වෙන්නේ, කවුද ඇවිල්ලා ඉන්නේ කියලා. පොත එළිදක්වන්න ඉස්සෙල්ලා ඒ පොතේ තිබෙන්නේ මොනවාද කියලා එතුමා බැලුවේ නැහැ නේ. එතැනට බොහෝ දේශපාලනඥයන් වාගේම බොහෝ බුද්ධිමතුන් ඇවිල්ලා සිටියා. එතුමාටත් කථා කළාම එතුමා ඒකට සම්බන්ධ වුණා. එතුමා ඒ අවස්ථාවට සම්බන්ධ වුණා කියලා එතුමාට දොස් කියන එක අපි අනුමත කරන්නේ නැහැ. විපක්ෂ නායකතුමා හැටියට, ඒ වාගේම රටේ ප්‍රධාන දේශපාලන පක්ෂයක නායකයකු හැටියට එතුමා හැම තැනකටම යනවා. එතුමා ඒකට ගියත්, ඒ කටයුත්ත හරි කියලා අනුමත කරලාවත්, වැරදියි කියලාවත් නැහැ. එතුමාගේ වගකීම තමයි, යම් කිසි කෙනෙක් ආරාධනාවක් කළා නම්, රටේ විපක්ෂ නායකවරයා හැටියට ඒ කටයුත්තට සහභාගි වන එක. එම නිසා එතුමාගෙන් ඒ ගැන ප්‍රශ්න අහන එක ගැටලුවක් නැහැ. විපක්ෂ නායකතුමා එතැනට ගිය එක අපි අනුමත කරනවා. එතුමා ඒ ගැන දැනුවත් වීම ප්‍රශ්නයක් නැහැ කියන එකත් කියනවා.

ඒ වාගේම අපි තවත් විශේෂ ඉල්ලීමක් කරන්න ඕනෑ. ආර්ථිකය වැටීම නිසා ජනාධිපතිතුමා දෙනවාය කියපු සහන ජනතාවට හරියට ලබා දෙනවා නම් ඉතාම හොඳයි. ජනතාව ග්‍රාම නිලධාරි මහත්මයා ළඟට ගිහිල්ලා, AGA Office එකට ගිහිල්ලා, DFO ළඟට ගිහිල්ලා ඉන්ධන සහනය ඉල්ලනකොට, අර චක්‍රලේඛය තිබෙනවා, මේ චක්‍රලේඛය තිබෙනවා කියලා මිනිස්සු අමාරුවට දාන්නේ නැතුව ඒ කටයුතු සැහැල්ලු කරලා ජනතාවට ඒ සහනයක් ලබා දෙන්න කියලා කරුණාවෙන් ඉල්ලා සිටින අතර, මට කථා කරන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනයේ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.43]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරණා කිහිපයක් පිළිබඳව විවාද කරන මේ වෙලාවේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ යුදමය තත්ත්වය නිසා මේ රටට අත්වුණු දුෂ්කරතා පිළිබඳ කල්පනා කරලා, ඒ වාගේම ඉදිරියේ එන උත්සව කාලය පිළිබඳවත් හිතලා සහන ලැබිය යුතු ජනතාවට සහන ලැබෙන පැකේජයක් ජනාධිපතිතුමා අද හඳුන්වා දුන්නා. ජනාධිපතිතුමා මේ සහන පැකේජය හඳුන්වා දුන්නාට, විපක්ෂ නායකතුමාට ඒක සොච්චමක්. හැබැයි, විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම ආණ්ඩු කළ කාලයේ රටට අර්බුදයක් ආපු හැම වෙලාවකම මොකද කළේ? තමන්ට ඇති වෙන්න බෙදා ගත්ත ඒ පාලකයන් ජනතාවට සොච්චමක්වත් ලබා දුන්නේ නැහැ. ජනතාවට පටි තද කරගන්න කිව්වා; පුළුවන් විධියට ජීවත් වෙන්න කිව්වා. ඒගොල්ලන් පසුගිය කාලයක් පුරා ඇති වෙන්න තමන්ට බෙදාගෙන බොහොම හොඳින් තමන්ගේ ජීවිතය හදාගත්තා. අද මේ ආණ්ඩුව ජනතාවගේ ආණ්ඩුවක් හැටියට, ජනතා රජයක් හැටියට රටට ආපු මේ අර්බුදය තම තමන්ගේ පැත්තෙන් කළමනාකරණය කරගෙන, තමනුත් ඒ අර්බුදයේ කොටසක් විඳගෙන මේ රටේ ජනතාවට සහන දෙන්න කටයුතු කරනවා. විපක්ෂ නායකතුමා එතුමාගේ ඉතිහාසය දෙස බලනවා නම් වඩා හොඳයි කියලා අපි කියන්න කැමතියි.

අපි අද මේ නීති හඳුන්වලා දෙද්දි අපි එක දෙයක් කල්පනා කළා. ආයෝජකයන්ට අපේ රටේ අවස්ථාවක් දෙන්න ඕනෑ. ආයෝජකයන්ට අවශ්‍ය පහසුකම් ටික දෙන්න ඕනෑ. ආයෝජන දිරිගන්වන්න ඕනෑ. ඒ වාගේම මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? පසුගිය කාලය පුරා බදු දැලෙන් පැනලා හිටපු, බදු දැල මඟ හැරලා හිටපු කණ්ඩායම් ඒ අයගේ කැමැත්තෙන් නැවත බදු දැලට එකතු කර ගනිමින් රටේ බදු අය කරගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම අපේ රජයේ එක ක්‍රියාවලියක්. මේ ක්‍රියාත්මක වෙන්නේ අලුත් බදු ක්‍රියාවලියක් නොවෙයි. පසුගිය කාලයේ අපේ රටේ අය වැයත් එක්ක සම්බන්ධ වෙලා ඉදිරිපත් කරපු යෝජනා තමයි මේ ක්‍රියාවට නැඟෙමින් තිබෙන්නේ. එතැනදී විශේෂයෙන් කියන්න ඕනෑකම තිබෙනවා, පසුගිය කාලය පුරාම මේ රටේ ජනතාව මත වක්‍ර බදු විශාල වශයෙන් පනවා තිබුණු බව. සෘජු බදු ක්‍රියාවට නැඟුවේ ඉතාම අඩුවෙන්. තමන්ගේ දේශපාලන හිතවතුන්ට, තමන්ගේ යාළුවන්ට බදු දැලෙන් මඟ හැරලා යන්න පුළුවන් විධියට තමයි අපේ රටේ බදු ක්‍රියාවලිය ක්‍රියාත්මක වුණේ. හැබැයි, රට ඇතුළේ බදු යන්ත්‍රණය ශක්තිමත් කරලා බදු ගෙවීම මඟ හැරලා ඉන්න අය බදු ක්‍රියාවලියට සම්බන්ධ කරගෙන විධිමත් බදු යන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට සහන ලබා දීම තමයි රජයේ අභිප්‍රාය වෙලා තිබෙන්නේ. මම විශේෂයෙන් ඒ කාරණාව මතක් කරනවා.

අපේ රටේ ආණ්ඩුවල ක්‍රියාකාරිත්වය කොහොමද කිව්වොත්, අපේ රටට ආයෝජකයන් ආවාට පස්සේ ආව වේගයට වඩා වැඩි වේගයෙන් පැනලා යන්න තමයි කටයුතු කළේ. මේ රටේ ආණ්ඩු කරපු කට්ටිය, ඇමතිවරු සෘජුවම ආයෝජකයන්ට බලපෑම් කරලා තමන්ගේ ගාණ කීයද කියලා අහන තැනට ඇවිල්ලා අවසානයේ ආයෝජකයන් රට දාලා යන තරමටම මේ රටට එන ආයෝජකයන් අධෛර්ය කරපු තත්ත්වයක් තිබුණේ. අපි දැක්කා, ජපන් තානාපතිතුමා එක වෙලාවක නිමල් සිරිපාල අමාත්‍යවරයාගේ කටයුතු පිළිබඳව, කොමිස් ගැහිලි පිළිබඳව හිටපු ජනාධිපතිවරයාට පැමිණිලි කළ ආකාරය. ආයෝජන අධෛර්වත් කරන්න, ආයෝජකයන් රට දාලා යන තැනට පත් කරන්න මේ රටේ ආණ්ඩු කරපු කට්ටිය කටයුතු කළේ කොහොමද කියලා මතක් කරගන්න.

අපේ රටට ආයෝජන ගෙන්වා ගැනීම, ආයෝජන දිරිමත් කිරීම, ආයෝජකයන්ට අවස්ථා ලබා දෙන්න අවශ්‍ය පහසුකම් සැලසීම ගැනයි අද අපි මේ කල්පනා කරමින් ඉන්නේ. අද අපේ රටේ ආයෝජන දිරි ගැන්වීම වෙනුවෙන් කරන දැවැන්ත කාර්යභාරයේ ප්‍රධාන වැඩක් තමයි අපේ රටේ නීතිය හරියට ක්‍රියාවට නඟන එක. වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් තොරව, කොමිස් ඉල්ලන්නේ නැති ආණ්ඩුවක් ක්‍රියාවට නැඟීමම අපේ රටේ ආයෝජන දිරි ගැන්වීමට විශාල පිටුවහලක්, පිටුබලයක් වෙනවාය කියලා අපි හිතනවා. ඒ විතරක් නොවෙයි. මට කලින් කථා කළ එක මන්ත්‍රීතුමෙක් ඡන්දයක් ඉල්ලුවා. එතුමා මතක තියා ගන්න ඕනෑ, මේ කාරණයත්. එතුමන්ලාගේ කාලයේ මේ රටේ ආර්ථිකය මොන තරම් බංකොලොත් කළාද කිව්වොත්, ඡන්දයක් තියනවා තියා අපේ රටේ ඡන්ද පත්‍රිකාවක් මුද්‍රණය කරන්න කොළයක්වත් තිබුණේ නැහැ. අන්න ඒ ගණනට මේ රට වට්ටලා, ආර්ථික වශයෙන් රට බංකොලොත් කරලා, තමන්ගේ කෙරුවාවන්ට විරුද්ධව මුළු රටේ ජනතාවක් මහ පාරට බහින තැනකට ගෙනාපු නිසා තමයි ඒ අයට පැනලා යන්න සිද්ධ වුණේ. එහෙම තිබුණු රටක් අද වත්මන් ආණ්ඩුව විසින් ආර්ථික වශයෙන් ශක්තිමත් කරගෙන, ජනතාවට ජීවත් වෙන්න පුළුවන්, ආස හිතෙන රටක් බවට පත් කර ගන්න පිළිවෙළින්, පියවරෙන් පියවර ගොඩ නඟාගෙන එනකොට අද විපක්ෂය කියන්නේ මොකක්ද? ඒකට පුළුවන් තරම් අකුල් හෙලනවා. පුළුවන් තරම් බාධා කරනවා. කොහේ හරි යන මිසයිලයක් මෙහෙට කඩා වැටෙයි කියලා ප්‍රාර්ථනා කරන තැනට, ඉතාම බංකොලොත් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක තමයි ඒ ගොල්ලන්ගේ ප්‍රාර්ථනාව. "දිට්වා" වෙන්න පුළුවන්; මොකක් හරි ස්වාභාවික විපතක් වෙන්න පුළුවන්, ලෝකයේ කොහේ හරි යුද්ධයක් නිසා එන මිසයිලයක් හරි කමක් නැහැ මෙහෙට වැටෙනවා නම්, මේ රටේ ජනතාව එයින් පීඩාවට පත් වුණත් කමක් නැහැ, ඒකෙන් තමන්ගේ දේශපාලන අරමුණු ඉටු කර ගන්න පුළුවන් නම් කියලා කල්පනා කරන විපක්ෂයක් තමයි අද ඉන්නේ. ඒක තමයි අද ඒගොල්ලන්ගේ අභිප්‍රාය, බලාපොරොත්තුව බවට පත් වෙලා තිබෙන්නේ. මේ රටත්, ජනතාවත් පිළිබඳව බොරුවට කිඹුල් කඳුළු හෙළන විපක්ෂයක් තමයි අද අපි ඉස්සරහා තිබෙන්නේ. රටක වගකීමක් තේරුම් අරගෙන, රටක් නිවැරදිව ඉස්සරහට පවත්වා ගෙන යන්න අවශ්‍ය සාධනීය විවේචන අද එතුමන්ලාට නැහැ; සාධනීය යෝජනා නැහැ. ජනතාව පීඩාවට පත් වෙයි කියලා බලාපොරොත්තුවෙන්, ඒකෙන් තමන්ට දේශපාලන වාසි ලබා ගන්න පුළුවන්ද කියලා කල්පනා කරමින්, ඒ වෙනුවෙන් කැස කවන විපක්ෂයක් තමයි අද ඉන්නේ. විපක්ෂයේ මේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අපි කනගාටු වෙනවා.

ගරු ජනාධිපතිතුමා, මෙවැනි අර්බුදකාරී තුළ අද රුපියල් බිලියන 100කට වඩා වැඩි මුදලක සහන පැකේජයක් මේ රටේ ජනතාවට හඳුන්වා දුන්නා, ඉදිරි උත්සව සමය ඉතා හොඳින් කළමනාකරණය කර ගන්න පුළුවන් වන විධියට. ඒ නිසා ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා, මෙවැනි අර්බුදකාරී වටපිටාවක් ඇතුළේත් අද ගොවියාට පොහොර සහනාධාරය දෙන්න, ධීවරයන්ට සහනාධාර දීලා ඔවුන් දිරිමත් කරන්න, අපේ රටේ පහළම, අඩු ආදායම්ලාභී ජනතාව සහන පැකේජයක් ඇතුළේ ශක්තිමත් කරන්න කටයුතු කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් ටිකක් මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාවක් තිබුණා නම් හොඳයි. නමුත් කාල වේලාව සීමා වීම පිළිබඳව මම කනගාටු වෙනවා. කොහොම නමුත්, මේ පිළිබඳව අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, ගරු ජනාධිපතිතුමා ගෙනාපු මේ සහන පැකේජය ඇතුළේ රටට, ජනතාවට ලැබුණු වාසි පිළිබඳව එතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අප්‍රේල් මාසයේ 2වැනි දා ලක්විජය බලාගාරය සඳහා ලංකා ගල් අඟුරු සමාගම විසින් ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව වන විශේෂ විගණන වාර්තාව අද සභාවට ඉදිරිපත් කළා. මෙතෙක් මේ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් හිටියා, මේ ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාදාමය පිළිබඳව ස්වාධීන මතයක්. අනුර කුමාර දිසානායක මැතිතුමා මුදල් ඇමතිතුමා සහ රාජ්‍ය නායකයා හැටියට කටයුතු කරන මේ රජයේ වර්තමාන බලශක්ති ඇමතිවරයාගේ නායකත්වය යටතේ බරපතළ වංචාවක් සිදු වෙලා තිබෙනවාය කියලා විගණන වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා, ජනාධිපතිතුමා මේ කථාව අහගෙන ඉන්නවා නම් හොඳයි. මොකද, ජනාධිපතිතුමා ඇහුවා "කාලා බලලාද අපි මේවා ගෙනෙන්නේ?" කියලා. කාලා බලන්න අවශ්‍ය නැහැ. ලේඛන පරීක්ෂාවෙන් හොයා ගන්න පුළුවන්, වංචාවක් තිබෙනවාය කියලා. ලේඛන පරීක්ෂාවෙන් හොයා ගන්න තිබුණා, ජනවාරි මාසයේ ඉඳලා වංචාවක් තිබෙනවාය කියලා. ලේඛන පරීක්ෂාවෙන් විගණකාධිපතිතුමාට හොයා ගන්න පුළුවන්කම ලැබී තිබෙනවා, එතැන වංචාවක් තිබෙනවාය කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ටෙන්ඩරය ලබා දීලා තිබෙන Trident Chemphar Limited කියන ආයතනය, මේ ටෙන්ඩරය ලබා දීපු 2025 අගෝස්තු 18වැනි දාට ලියාපදිංචි නැහැ. ඒ කියන්නේ, Lanka Coal Company එකේ නියමිත පරිදි ලියාපදිංචි වී නැති සමාගමකට තමයි මේ ටෙන්ඩරය දීලා තිබෙන්නේ. ලජ්ජා වෙන්න ඕනෑ. ජනාධිපතිතුමා ඇවිල්ලා කයිවාරු ගහනවා. "අපි කාලා බලන්නද?" කියලා ඇහුවා. කාලා බලන්න නොවෙයි, ලියවිලි බැලුවා නම් තේරෙනවා. පුණ්‍ය කුමාර කියන මීට කලින් දූෂණ චෝදනාවලට ලක්වෙලා තිබෙන මේ පුද්ගලයාට ඇමතිකම දුන්නාම වෙච්ච අපරාධය, මේක. ඒ නිසා අද ජනතාවට දීපු සහනයට වඩා වැඩි හානියක් රටට සිද්ධ වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මෙවැනි ප්‍රශ්නයක් මතු වුණාම, වාර්තා පරස්පරතාවක් ඇති වුණාම, umpire sample එක තිබෙනවා. 6.2.2 නිරීක්ෂණයේ විගණකාධිපති කියන්නේ මොකක්ද? Umpire sample එක පරීක්ෂා කරලා මේ පරස්පරතාව විසඳා ගැනීමට හැකියාව තිබුණත්, අද වෙනකල් umpire sample එක පරීක්ෂා කර නැහැ කියලා විගණකාධිපති කියනවා. ඒක වරදක්, දෝෂයක්, හොරකමක් කියලා නැවත වරක් කියනවා. ඒ විතරක් නොවෙයි. මේ පිළිබඳව මේ ගල් අඟුරු සමාගම පැත්තෙන්, ඒ වාගේම Trident Chemphar Limited වෙනුවෙන් කථා කරන ආණ්ඩුවේ මන්ත්‍රීවරු කියනවා, load port වාර්තාව තිබෙනවා කියලා. Load port වාර්තාව ඉදිරිපත් කරපු සමාගම accredited නැහැ. ඒක accredited නැහැ කියලා කියන්නේ කවුද? මෙහි 6.2.3 නිරීක්ෂණයේ, ලංකාවේ විගණකාධිපති කියන්නේ. විගණකාධිපති කියනවා, ගල් අඟුරු ප්‍රමිති පරීක්ෂාව සඳහා වගකීම පැවරී තිබුණු ඒ සමාගමට accreditation නැත කියලා; PT. Mitra S.K. Analisa Testama, Samarinda, Indonesia කියන සමාගමට ඒ සඳහා accreditation නැත කියලා. මෙච්චර කල් මේ වාර්තා සපයා තිබෙන්නේ accreditation නැති සමාගමක්. මෙච්චර කල් මොනවාද කිව්වේ? විගණකාධිපතිගේ වාර්තාවෙන් මම මේ උපුටා දක්වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විතරක් නොවෙයි. මේ සම්බන්ධව - ගුණාත්මකභාවය පිළිබඳව - ලොකුම ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ දැන් හදිසි මිලදී ගැනීම ගැන. ලක්ෂ 3ක් දීපු මේ හදිසි මිලදී ගැනීම සඳහා වගකීම පවරපු, ඊයේ පෙරේදා ගිවිසුම අත්සන් කරපු සමාගමත් මූලික සුදුසුකම් සපුරා නැහැ. කවුද, එහෙම කියන්නේ? විගණකාධිපති.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩ්ඩක් ඉඩදෙන්න. ඔබතුමාගේ ජීවිතයටත් මේක බලපානවා. මට තත්පර 30ක් දෙන්න.

දැන් මේ හදිසි මිලදී ගැනීම් ලක්ෂ 3 සඳහා අලුතින් ගිවිසුම් අත්සන් කරපු සමාගමටත් මූලික සුදුසුකම් නැහැ, පළපුරුද්ද නැහැ. ඒ වාගේම, Trident Chemphar Limited එකටත් පළපුරුද්ද නැහැ. මේ කාරණය අජිත් පී. පෙරේරා කියනවා නොවෙයි, සමගි ජන බලවේගය කියනවා නොවෙයි, ශ්‍රී ලංකාවේ විගණකාධිපතිගේ 2026.04.02වැනි දා වාර්තාව අනුවයි කියන්නේ. කරුණාකර, මේ ඇමතිට අස්වෙන්න කියන්න. ආණ්ඩුව මේ ගැන සමාව ගන්න. මේ ප්‍රශ්නය විසඳන්න. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගරු ජනාධිපතිතුමා ගල් අඟුරු කාලා බලන්නද කියලා අහලා වැඩක් නැහැ. විගණකාධිපති මේ වාර්තාව සකස් කර තිබෙන්නේ කාලා බලලා නොවෙයි. විගණකාධිපති මේ වාර්තාව සකස් කර තිබෙන්නේ එතුමාට ලැබී තිබෙන නිල ලේඛන අනුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා ආණ්ඩු ද?

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
බොරු නේ කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොරු? විගණකාධිපති බොරු කියනවාද? මේ 103වන පිටුවේ තිබෙන්නේ. උත්තර දෙන්න, දැන් ඒක බලාගෙන. බොරු නම් උත්තර දෙන්න. උත්තර දෙන්න බැරිද? උත්තර දෙන්න.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
බොරුවලට උත්තර දෙන්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
උත්තර දෙන්න පුළුවන්ද? උත්තර දෙන්න. විගණකාධිපතිට උත්තර දෙන්න. විගණකාධිපතිගේ අප්‍රේල් මාසයේ 02වැනි දා වාර්තාවට උත්තර දෙන්න. කයිය විතරයි. ඔය පිටිපස්සේ ඉඳගෙන බොරු, බොරු කියලා හරියන්නේ නැහැ, උත්තර දෙන්න ඕනෑ. ලජ්ජා වෙන්න ඕනෑ, කයිවාරුකාරයෝ.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
අර නැවේ ළමයින් 300ට මොකක්ද දන්නේ නැහැ වුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ கந்தசாமி பிரபு அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருக்கின்றது.

[பி.ப. 3.56]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டத்தின்கீழ் உருவாக்கப்பட்டுள்ள ஒழுங்குவிதிகள் தொடர்பாக இன்றைய தினம் நாங்கள் இந்தச் சபையில் விவாதித்துக்கொண்டு இருக்கின்றோம்.

இந்த நாட்டில் விளையாட்டுத்துறை பாரியளவு முன்னேற்றமடைந்து வருகின்ற ஒரு காலகட்டத்திலே இருந்துகொண்டு இருக்கின்றது. தேசிய ரீதியிலும் சர்வதேச ரீதியிலும் விளையாட்டில் ஈடுபடுகின்ற விளையாட்டு வீரர்கள், தடைசெய்யப்பட்ட ஊக்கமருந்துப் பாவனை தொடர்பான தெளிவைப் பெற்றுக்கொள்ளாத நிலையில், ஊக்கமருந்துகளைப் பாவித்துவிட்டு விளையாட்டில் ஈடுபடுவதால், அவர்களது விளையாட்டு வாழ்க்கை இல்லாமல் செய்யப்படுகின்ற ஒரு நிலைமை ஏற்பட்டுக்கொண்டு இருக்கின்றது. ஆகவே, தடைசெய்யப்பட்ட ஊக்கமருந்துகள் தொடர்பான விடயத்தை நாங்கள் இன்று தெளிவுபடுத்தவேண்டி இருக்கின்றது. தமிழ் மொழி பேசுகின்ற விளையாட்டு வீரர்கள், சிங்கள மொழி பேசுகின்ற விளையாட்டு வீரர்கள் உட்பட அனைத்து வீரர்களும் விளையாட்டின்போது ஊக்கமருந்துகளைப் பயன்படுத்தும்போது, அந்த ஊக்கமருந்து தடைசெய்யப்பட்டதா, தடைசெய்யப்படாததா என்பதை அறிந்துகொள்ள வேண்டும். தடைசெய்யப்பட்ட ஊக்கமருந்து தொடர்பான விபரங்களை மும்மொழிகளிலும் காட்சிப்படுத்தும்போது அவர்கள் அதனை அறிந்துகொள்ளக்கூடியதாக இருக்கும். இதன்மூலம் எமது விளையாட்டுத்துறையை மென்மேலும் வலுப்படுத்தக்கூடியதாக இருக்குமென நான் இந்நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள அதிகமான கிராமங்களில் விளையாட்டுத்துறையை மேம்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. கிரிக்கெட் விளையாட்டில் பிரபல்யமாகவிருந்த விளையாட்டு வீரரான லசித் மாலிங்க அவர்களின் மேற்பார்வையின்கீழ் அண்மையில் இடம்பெற்ற வேகப் பந்துவீச்சாளர்களை இனங்காணும் நிகழ்வில் கலந்துகொண்ட மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த விளையாட்டு வீரர் ஒருவர் அதிவேகமாகப் பந்தை வீசி, அவரை வியக்க வைத்தார். இவர் போன்ற கிராம மட்டத்திலுள்ள பல வீரர்கள் சந்தர்ப்பம் கிடைக்காமையால் தங்களது விளையாட்டுத் திறமையை கிராமத்துக்குள்ளேயே மட்டுப்படுத்திக்கொள்கின்ற நிலைமை காணப்படுகின்றது. அனைத்து விளையாட்டுகளையும் ஊக்கப்படுத்தும் விதமாக அவற்றுக்குத் தேவையான அனைத்து வசதிகளையும் ஏற்படுத்திக் கொடுப்பதற்கான நடவடிக்கைகளை நாங்கள் அரசாங்கம் என்ற வகையில் எடுத்து வருகின்றோம். புதிய விளையாட்டுகளில் ஆர்வம் செலுத்தக்கூடிய வகையில், கிராமங்களில் இருக்கின்ற விளையாட்டு வீரர்கள் தனியே ஒரு விளையாட்டில் மாத்திரம் தங்கிநிற்காமல், ஏனைய விளையாட்டுகளிலும் ஈடுபடும் முகமாக, அவர்களுக்கான பயிற்சிகளையும் ஆலோசனைகளையும் வழங்க வேண்டும். அதனூடாக அவர்களை மென்மேலும் வளர்த்தெடுக்க முடியும்.

எங்களுடைய நாட்டைப் பிரதிநிதித்துவப்படுத்தி ஒலிம்பிக் போட்டிகளில் பங்குபற்றக்கூடிய திறமையான பல விளையாட்டு வீர, வீராங்கனைகள் எமது நாட்டில் இருந்தும், அவர்கள் தொடர்ச்சியாக எந்தவொரு சந்தர்ப்பமும் கிடைக்காத நிலையில் இருந்துகொண்டு இருக்கின்றார்கள். எனவே, அவர்களுக்கான சந்தர்ப்பத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். மேலும், பொருளாதார ரீதியாகப் பின்தங்கிய நிலையில் கிராமங்களில் இருக்கின்ற பல வீரர்கள், தங்களது விளையாட்டுக்குத் தேவையான உபகரணங்கள், சப்பாத்து மற்றும் ஏனைய பொருட்களைப் பெற்றுக்கொள்ள முடியாத நிலையில் இருக்கின்றார்கள். இந்த நாட்டிலுள்ள மக்களில் 25 சதவீதமானவர்கள் வறுமை நிலையில் இருக்கிறார்கள் என்பது உங்களுக்குத் தெரியும்! குறிப்பாக, கிராமப் புறத்தில் அதிகளவு வறுமை நிலை காணப்படுகின்றது. இதனால் அங்குள்ள விளையாட்டு வீரர்களுக்குச் சந்தர்ப்பம் கிடைப்பது அரிதாகிக்கொண்டு செல்கின்றது. எனவே, இது தொடர்பில் விளையாட்டுத்துறைக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் கிரிக்கெட், உதைப்பந்தாட்டம் போன்ற விளையாட்டுகள் அதிகளவான நம்பிக்கையைப் பெற்று வளர்ச்சியடைந்து வருகின்றது. எனினும், அங்கு விளையாட்டு மைதானங்கள் குறைவாகத்தான் இருக்கின்றன. மென்பந்து கிரிக்கெட் விளையாடுவதற்கு ஏற்ற, அரசாங்கத்தால் நிருவகிக்கப்படுகின்ற மைதானங்கள் அங்கு இல்லை. அதற்கான இட ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டு இருந்தாலும், மைதானங்கள் அமைக்கப்படாத நிலையே காணப்படுகின்றது. எனவே, இது தொடர்பாகவும் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

எங்களது விளையாட்டுத்துறையில் உதைப்பந்தாட்டம் மிகவும் முக்கியமானதோர் இடத்தை வகிக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் பல உதைப்பந்தாட்ட வீரர்கள் தொடர்ச்சியாக பயிற்சியில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள். எனினும், அவர்களுக்குச் சந்தர்ப்பம் கிடைப்பதில்லை. அங்கு அவ்விளையாட்டுக்கென சரியானதொரு விளையாட்டு மைதானம் அமையப் பெறாததால், அவர்கள் தங்களது விளையாட்டுத் திறமைகளை தங்களுக்குள்ளே சுருக்கிக்கொண்டு இருக்கின்றார்கள்.

தற்போதும்கூட, மட்டக்களப்பு மாவட்டத்தில் பல வீரர்கள் 40 வயதைக் கடந்த நிலையிலும் விளையாடிக்கொண்டு இருக்கின்றார்கள். அவர்கள் தங்களது திறமைகளை வெளிப்படுத்திக் கொண்டுதான் இருக்கின்றார்கள். மட்டக்களப்பில் பாடுமீன் விளையாட்டுக் கழகம்தான் மிகவும் பிரபல்யமான விளையாட்டுக் கழகமாக இருந்தது. அந்தக் கழக வீரர்களுக்குத் திறமைக்கான சந்தர்ப்பம் கிடைப்பது குறைவாக இருப்பதன் காரணமாக தற்போது அவர்கள் விளையாட்டில் ஈடுபடுவது குறைவாக இருக்கின்றது.

மட்டக்களப்பு மாவட்டத்தில் படுவான்கரை, எழுவான்கரை என இரண்டு பிரதேசங்கள் இருக்கின்றன. அதில் படுவான்கரைப் பிரதேசத்தைச் சேர்ந்த விளையாட்டு வீர, வீராங்கனைகள் தற்போது பாடசாலை மட்ட மற்றும் மாகாண மட்டப் போட்டிகளில் தங்களது திறமைகளை வெளிப்படுத்திக்கொண்டு இருக்கின்றார்கள். அதிலும் வீராங்கனைகள் பல போட்டிகளில் கலந்துகொண்டு, அவற்றில் வெற்றிபெற்று எங்களது மாவட்டத்துக்குப் பெருமை சேர்த்துக்கொண்டு இருக்கின்றார்கள். இருந்தாலும், அவர்களுக்கென தனியான கட்டமைப்பை உருவாக்கிக்கொள்ள முடியாத நிலைமை இருக்கின்றது. ஏற்கனவே, அங்கு football club போன்ற கட்டமைப்புகள் உருவாக்கப்பட்டு இருந்தாலும், படுவான்கரைப் பிரதேசத்தில் தனியானதொரு football club உருவாக்கப்படாதது ஒரு குறையாக இருக்கின்றது. எனவே, அங்குள்ள வீர, வீராங்கனைகளுக்கான விளையாட்டுக் கழகத்தை உருவாக்கிக் கொடுக்க வேண்டும். அதனூடாக அவர்கள் தங்களுக்குத் தேவையான பயிற்சிகளைப் பெறவும் போட்டிகளில் நேரடியாக கலந்துகொள்ளவும் சந்தர்ப்பம் கிடைக்கும் என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்னுமொரு விடயத்தைக் கூறலாமென நினைக்கின்றேன். தற்பொழுது நாட்டில் நிலவும் எரிபொருள் நெருக்கடியை எங்களது அரசாங்கம் சரியான முறையில் கையாண்டு, மக்களுக்குத் தடையின்றி எரிபொருளை வழங்கி வருகின்றது. அத்துடன், விலைக் கட்டுப்பாட்டை மேற்கொண்டு மக்கள் நெருக்குதலுக்கு உள்ளாகாத வகையில் நிலைமையை முகாமைசெய்தும் வருகின்றது.

இன்றைய தினம் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இச்சபைக்கு வருகை தந்து, மக்களுக்கு வழங்கப்படும் நிவாரணங்கள் தொடர்பில் பல விடயங்களைக் குறிப்பிட்டார். அவருக்கு நாங்கள் இந்த நேரத்தில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். அண்மையில் வடக்கு, கிழக்குப் பிரதேசங்களில் இராணுவத்தின் கட்டுப்பாட்டில் இருந்த பல காணிகள் விடுவிக்கப்பட்டன. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தின் முறக்கொட்டாஞ்சேனை பிரதேசத்தில் பாடசாலை அமையப் பெற்றிருந்த காணியில் இராணுவம் மையங்கொண்டிருந்தது. அந்தக் காணியையும் நாங்கள் விடுவித்திருக்கிறோம். அதேபோன்று, பாலையடிவட்டை பிரதேசத்தில் இராணுவ முகாம் அமைந்திருந்த காணியையும் நாங்கள் விடுவித்திருக்கிறோம். மாண்புமிகு சனாதிபதி அவர்களின் ஆலோசனைக்கு அமைய, வடக்கு, கிழக்கு மாகாணங்களில் இராணுவ முகாம்கள் மற்றும் ஏனைய முகாம்கள் அமைந்திருந்த காணிகள் தொடர்ச்சியாக விடுவிக்கப்பட்டு வருகின்றன. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு மட்டக்களப்பு மாவட்ட பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியிலும், அம்மாவட்ட மக்களின் பிரதிநிதி என்ற ரீதியிலும், எனது நன்றிகளை இந்த நேரத்தில் தெரிவித்துக் கொள்கின்றேன். அத்துடன், விடுவிக்கப்படாமல் எஞ்சியிருக்கின்ற, முகாம்கள் அமைந்திருக்கின்ற காணிகள் தொடர்பிலும் கவனத்தைச் செலுத்தி, அவற்றையும் விடுவித்துத் தருமாறு இந்த நேரத்தில் கோரிக்கை முன்வைக்கின்றேன்.

எதிர்க்கட்சியில் இருப்பவர்கள் எங்களுடைய அரசாங்கத்தை எவ்வளவுதான் குறைகூறிக்கொண்டு இருந்தாலும், அவர்கள் எத்தனை பொய்களைக் கூறிக்கொண்டு இருந்தாலும், மக்கள் உண்மை நிலையை நன்கறிவார்கள். இந்த நாட்டு மக்கள் எங்கள்மீது எந்தளவுக்கு நம்பிக்கை வைத்திருக்கின்றார்களோ, அதேபோன்று நாங்களும் அவர்களின் நம்பிக்கை வீண்போகாத வகையில் தொடர்ச்சியாகப் பணிகளை முன்னெடுத்து வருகின்றோம். தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, மக்கள் நேயமிக்க ஓர் அரசாங்கம் என்பதை நாங்கள் தொடர்ச்சியாக நிரூபித்து வருகின்றோம் என்பதைக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ துரைராசா ரவிகரன் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் உண்டு.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[பி.ப. 4.06]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத் தலைப்பு பற்றி உரையாற்றுவதற்கு முன்னர், எமது அத்தியாவசிய தேவை சம்பந்தமாக ஒருசில கருத்துகளைச் சொல்லலாமென நினைக்கின்றேன். தேசிய மற்றும் மாகாண இடமாற்றக் கொள்கைகளுக்கு முரணாக, "சேவையின் தேவை கருதிய இடமாற்றம்" என 2025இல் வட மாகாணக் கல்வித் திணைக்களம் வழங்கிய சுமார் 290 ஆசிரியர்களுக்கான இடமாற்றத்தை, யாழ். மேல் நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்யப்பட்டதைத் தொடர்ந்து அத்திணைக்களம் மீளப் பெற்றுக் கொண்டது.

மீண்டும் இவ்வருடம் அதுபோன்றதோர் இடமாற்றத்தை வருடாந்த இடமாற்றத்துடன் இணைத்து, வட மாகாணக் கல்வித் திணைக்களம் நடைமுறைப்படுத்தத் தொடங்கி,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

தற்போது 193 அளவிலான சேவையின் தேவை கருதிய இடமாற்றத்தை மனித உரிமைகள் ஆணைக்குழு இரத்துச்செய்துள்ளது. இந்த நிலையில், கிளிநொச்சி அடங்கலாக வன்னிப் பெருநிலப்பரப்பில் இருந்து 368 அளவிலான ஆசிரியர்கள் யாழ்ப்பாணம் செல்லவுள்ள நிலையில், யாழில் இருந்து சேவையின் தேவை என்ற இடமாற்ற முயற்சியும் மனித உரிமைகள் ஆணைக்குழுவால் இடைநிறுத்தப்பட்டுள்ளது. இரண்டு ஆண்டுகளாகத் தொடரும் இந்த இடமாற்றத் தோல்விகளுக்கு யார் பொறுப்புக் கூறுவது? போதியளவு ஆசிரியர்கள் இன்றி கல்விக்கான சம அணுகல் மறுக்கப்படும் எமது பிரதேச மாணவர்களுக்கு யார் வகைகூறுவது? இவ்வாறான ஒரு முறைகேடான, சேவையின் தேவை அடிப்படையிலான இடமாற்றத்தை ஆசிரியர்கள்மீது திணித்தது ஏன்? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ பிரதமர் அவர்களே, கல்வியில் சம அணுகலுக்காகத் தொடர்ந்து பசித்திருக்கும் எமது பிள்ளைகளுக்கு உடனடித் தீர்வைத் தருமாறு பணிவாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்றைய விவாதத் தலைப்புக்கு வருகின்றேன். சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீடு, செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டத்தின் கீழான ஒழுங்குவிதி, விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், இலங்கை மத்திய வங்கிச் சட்டத்தின் கீழான விதிகள் தொடர்பான இன்றைய விவாதத்தில், மட்டுப்படுத்தப்பட்ட நேர ஒதுக்கீடு காரணமாக, விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பில் சில கருத்துகளைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

இலங்கையில் வாழும் இளையோர் மற்றும் விளையாட்டுகளின் ஒழுக்கவியலை மேலும் செப்பனிடும் வகையிலே மேற்படி ஒழுங்குவிதிகள் கொண்டுவரப்படுகின்றன. நாட்டின் நலன்கருதி மேற்கொள்ளப்படும் செயற்றிட்டங்கள் எப்போதும் வரவேற்புக்குரியன. ஆனால், எம்மிடம் எப்போதும் எஞ்சுகிற முதன்மைக் கேள்வி, தீவளாவிய சமத்துவ நிலை ஏன் கொள்கை முன்வைப்புகளிலும் நடைமுறைகளிலும் கருத்தில் கொள்ளப்படாதுள்ளன என்பதே! விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டத்தின் கீழுள்ள தடைசெய்யப்பட்ட ஊக்க மருந்துகள் தொடர்பான பன்னாட்டு நியமங்களுடன் இலங்கை ஒத்திசைவது வரவேற்புக்குரியது.

அனைத்துச் சந்தர்ப்பங்களிலும் தடைசெய்யப்பட்ட மருந்துகள், தடைசெய்யப்பட்ட முறைகள், போட்டிக்கு உள்ளே தடைசெய்யப்பட்டவை, போட்டியின்போது தடைசெய்யப்பட்டவை, குறிப்பிட்ட சில விளையாட்டுகளில் தடைசெய்யப்பட்டவை, கண்காணிப்புத் திட்டத்தில் உள்ளடக்கப்பட்டவை எனப் பல்வேறு நிலைகளிலும் ஊக்கமருந்தின் கையாளல், விதிவிலக்கு நிலைகள் தொடர்பான இலங்கை அரசின் 2026.01.16ஆம் திகதிய 2471/51ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி ஊடாகக் குறிப்பிடப்பட்டவை 2026.01.01 தொடக்கம் செயல்நிலைக்கு வருகின்றன. இப்போதே மூன்று மாதங்கள் கடந்துவிட்டன. கடந்த ஆண்டு மார்ச் மாதம் இலங்கையின் ஊக்கமருந்து தடுப்பு முகவராண்மை, உலக ஊக்கமருந்து தடுப்பு முகவராண்மையால் கண்காணிப்புப் பட்டியலில் வைக்கப்பட்டிருந்தது. அதன்பின்னர், 2025.08.19ஆம் திகதியிலிருந்து உலக தர நியமங்களுக்கு இணங்காதோர் பட்டியலில் இலங்கை சேர்க்கப்பட்டிருந்தது. கடைசியில் மேற்படி சட்டமூல முன்வைப்பு முயற்சிகள் ஊடாக மீண்டும் இலங்கை, பன்னாட்டு நியமங்களுடன் சட்ட அடிப்படையில் ஒருங்கிசைகின்றது.

விளையாட்டுப் பயிற்சிகளுக்கான வாய்ப்பு, விளையாட்டுப் பொருட்களுக்கான தட்டுப்பாடு, போதியளவான பயிற்றுவிப்பாளர்கள் இன்மை, வழிகாட்டல்களில் பற்றாக்குறை, விளையாட்டு வீரர்களின் போஷணை மேம்பாட்டுக்கான வழிகாட்டல், தொடர் மருத்துவக் கண்காணிப்பு என்பவற்றில் தீவளாவிய சமத்துவம் பேணப்படாமை வன்னி மாவட்டத்தின் விளையாட்டுத் துறைக்குப் பெரும் சவாலாகின்றது. எந்தெந்த ஊக்க மருந்துகள் தடைசெய்யப்பட்டுள்ளன, எந்த அளவில் தடைசெய்யப்பட்டுள்ளன, ஊட்டச்சத்து நிரப்பிகள் வீரர்களின் விளையாட்டு வாழ்வில் எவ்வாறு தாக்கம் செலுத்தும் என்பன தொடர்பான தெளிவுநிலை மாகாணங்களுக்கு இடையிலும் மாவட்டங்களுக்கு இடையிலும் சரிசம அளவில்தான் நிலவுகின்றதென இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரால் இந்தச் சபையில் உறுதியளிக்க முடியுமா?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute, Sir.

விளையாட்டுத்துறையில் இந்த இடத்தில்தான் வன்னித் தேர்தல் மாவட்டம் சமத்துவ நிலையில் அணுகப்படாதுள்ளது. விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் அங்கீகரிக்கப்படும் இவ்வேளையில், இச்சபை வாயிலாக இவ்வரசிடம் வன்னித் தேர்தல் மாவட்டத்தைச் சார்ந்த பாராளுமன்ற உறுப்பினராக நான் கேட்டுக்கொள்வது இவைதாம்.

மேற்படி வர்த்தமானிக்கு அமைவாகப் போதியளவான விழிப்புணர்வை மாவட்டந்தோறும் விளையாட்டு வீரர்களுக்கும் பாடசாலை மாணவர்களுக்கும் வழங்குங்கள்! போதியளவு விழிப்பூட்டல் இன்றி ஒழுங்குவிதிகளை நடைமுறைப்படுத்தும்போது விளையாட்டு வீரர்கள் பாதிக்கப்படும் நிலை காணப்படலாம். அனைத்து மாவட்டங்களிலும் கட்டாய ஊக்கமருந்து தடுப்பு விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டங்களை ஏற்படுத்துங்கள்! ஏனைய மாவட்டங்களைப் போன்று முல்லைத்தீவு மாவட்டமும் விளையாட்டுத்துறையில் சமத்துவ அடிப்படையிலான அணுகலைப் பெறும் வகையில் வளங்களை ஒதுக்குங்கள்!

மாவட்டந்தோறும் வழங்கப்படும் மாவட்ட விளையாட்டுக் கட்டிடத்தொகுதி முல்லைத்தீவில் இல்லை என்பதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவார். நீச்சல் தடாகம், கரப்பந்து, வலைப்பந்து மற்றும் கூடைப்பந்து விளையாட்டுக்கேற்ற

உள்ளக அரங்கு வசதி, விளையாட்டு வீரர்களுக்கான உடல் வலுவூட்டல் பயிற்சி நிலையம் என்பன இல்லை என்பதையும் அமைச்சர் அறிவார். இவற்றோடு, வழிகாட்டலுக்கான போதியளவு ஆளணி வளம், விளையாட்டு உபகரணங்கள் என்பவற்றிலும் தீவளாவிய சமத்துவ நிலைக்கு முல்லைத்தீவு மாவட்டத்தையும் கொண்டுவாருங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me a few seconds more, Sir.

மேலும், 2471/51ஆம் இலக்க, 2020.01.16ஆம் திகதிய அதிவிசேட வர்த்தமானியில் உள்ள பொருள் பிழை, பக்க வடிவமைத்தல் பிழை, எழுத்துப் பிழை, ஊக்க மருந்துகளின் பெயர்களிலுள்ள பிழை, உள்ளடக்க விடுபாடு, பதிவுகள் இரட்டித்தல் என ஆங்கிலத்திலும் தமிழிலும் காணப்படும் வழுக்களைத் திருத்துவதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு கௌரவ இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன். அந்தப் பிழைகள் அடங்கிய பட்டியலை சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்**. நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම අපි දැක්කා, මීට කලින් ලොකු පොතක් අතේ තියාගෙන බොරු කියපු එක්කෙනා තවත් බොරුවක් පටලවන්න හදපු ආකාරය. මොකද, මෙච්චර කාලයක් කියපු දේවල් බොරු කියලා දැන් ඔප්පු වෙලා තිබෙනවා. අද ඒ පොතෙන් එක ඡේදයක් අරගෙන මෙතැන මැරෙන්න හැදුවා. ලංකාවේ ජනතාවත් මේ දේවල් දැනගන්න ඕනෑ. විශේෂයෙන්ම මේ රට බංකොලොත් කරපු, රාජ්‍ය ආයතන අකර්මණ්‍ය කරපු, බලශක්ති සුරක්ෂිතතාව නැති කරපු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සෙනහ පුරවලා විනාශ කරපු උදවිය අද මෙතැන මර ළතෝනි දෙනවා, "අර්බුදයක්, අර්බුදයක්" කියලා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේගොල්ලන් දවස් 40ක් තිස්සේ අර්බුදයක් ගැන කථා කරනවා. ලෝකයේ අර්බුදයක් තිබෙනවා; යුද්ධයක් තිබෙනවා. මේ යුද්ධය නිසා ලෝකයටම තර්ජනයක් ඇති වෙලා තිබෙනවා. නමුත්, අපි මේ තර්ජනය සහ එන්න පුළුවන් අර්බුදය සම්පූර්ණයෙන්ම කළමනාකරණය කරලා ඉවරයි. මේ දවස් 40 තුළ එක නිෂ්පාදන ආයතනයක් දවසක් වැහුවාද? රැකියාවට යන මනුස්සයෙකුට රැකියාව නැති වුණාද? රැකියාවට යන කෙනෙකුට ගෙදර නවතින්න සිද්ධ වුණාද? අපේ රටේ මිනිසුන්ගේ ජීවන තත්ත්වයට, ජන ජීවිතයට, නිෂ්පාදනයට, අපනයනයට එවැනි දෙයක් සිද්ධ වෙලා නැහැ. ඒ කියන්නේ, මේ රජය ඉතාම සූක්ෂ්මව මේ අර්බුදය ආකාර දෙකකින් කළමනාකරණය කර තිබෙනවා.

එක පැත්තකින් රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් අපි මේ අර්බුදය කළමනාකරණය කර ගත්තා. ඊළඟට, බලශක්ති සම්පාදනය අතින් අඛණ්ඩව ආර්ථිකය පවත්වාගෙන යන්න, අඛණ්ඩව රට පවත්වාගෙන යන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග අරගෙන මේ දින 40ම කිසිම ගැටලුවක් නැතුව මේ රට පවත්වාගෙන ඇවිල්ලා තිබෙනවා. මේ කාලය තුළ එක දවසක් විදුලිය කපලා නැහැ; එක කර්මාන්තයක්වත් වැහිලා තිබුණේ නැහැ. මේක තමයි, ආර්ථික කළමනාකරණය. මේක දරා ගන්න බැරිව තමයි පන්දම් අල්ලාගෙන එළියට පනින්න හදන්නේ. ඇත්තටම අද ජනාධිපතිතුමාත් පැහැදිලි කළා, අප්‍රේල් මාසයේ සිට ජූනි මාසය වෙනකම් අපට බලශක්තිය සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. ඒක හොඳට ඇස් පනාපිට පෙනෙනකොට අද වැටෙයි, හෙට වැටෙයි කියලා සිහින දැක්කාට වැඩක් වෙන්නේ නැහැ.

අපි දැනගන්න ඕනෑ, 2025 අවුරුද්ද වෙනකොට අපි ශක්තිමත් ආර්ථිකයක් ගොඩනහලා තිබුණාය කියන එක. අන්න, ඒ ගොඩනහපු ආර්ථිකය හරහා තමයි අද මේ pressure එක අපි දරාගෙන ඉන්නේ. විශේෂයෙන්ම ඩොලර් බිලියන 7.3ක සංචිතයක් අපට තිබෙනවා. ඒ සංචිතය තිබෙන්නේ ඩොලර් බිලියන 3.9ක් ණය විධියට ගෙවලා, තවත් ඩොලර් බිලියන 1.8ක් වාහන ආනයනය කරන්න දීලා. එහෙම කරලා තමයි මෙච්චර සංචිතයක් අපි ගොඩනහලා තිබෙන්නේ. ඒ වාගේම, පසුගිය මාර්තු මාසය වෙනකම් අපනයන අඩු වෙලාත් නැහැ; විදේශ ප්‍රේෂණ අඩු වෙලාත් නැහැ; කිසිම ආර්ථික හානියක් සිදු වෙලාත් නැහැ. අනෙක් පැත්තෙන් රුපියල් බිලියන 900ක විතර අතිරික්තයක් භාණ්ඩාගාරයේ තිබුණු නිසා තමයි අද ජනාධිපතිතුමා ප්‍රකාශ කරපු ආකාරයට ජනතාවට සහන දෙන්න අපට පුළුවන් වුණේ.

ඒ ශක්තිමත් ආර්ථිකය ගොඩනැඟීම කරගෙන යනකොට අපට පෙනෙනවා, මේ සභාවේ ඉන්න ආර්ථික ඔස්තාර්ලාට ටිකක් හිතට අමාරුයි කියන එක. ඒ වාගේම අද මේ ඉදිරිපත් කරන අණපනත්වලින් විශේෂයෙන්ම මේ ආර්ථිකය තවතවත් ශක්තිමත් කරන්න අපි උත්සාහ කළා. මේගොල්ලන්ට බදු එකතු කර ගන්න බැරි වුණා. නමුත්, අපි බදු එකතු කරනවා. ඊකට මේ අය අඬනවා.

බදු පදනම පුළුල් කරන්න තමයි VAT එකේ සහ SSCL එකේ සීමාව රුපියල් මිලියන 60 ඉඳලා රුපියල් මිලියන 36ට ගේන්න ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තේ. ඒකෙන් අපට වෙන්නේ බදු පදනම පුළුල් වෙනවා; බදු මග හරින අය නැති වෙනවා. මෙන්න මේ ක්‍රියාවලිය හරහා අපි මේ බදු පදනම පුළුල් කරනවා. QR codesවලට ගිහිල්ලා අසංවිධිත ආර්ථිකය සංවිධිත බවට පත් කර ගන්නවා. මේවා දශකයක් කර ගන්න බැරි වෙච්ච දේවල්. QR codesවලින් payment එකක් කරන්න ජනතාවට අවස්ථාවක් සලසන්න හැකි වෙලා තිබෙනවා. මේවා අවුරුදු 15ක් කර ගන්න බැරි වෙච්ච ඒවා. ඉතින් සංවිධිත ආකාරයෙන් අපි මේ බදු පදනම තවත් ශක්තිමත් කර ගත්තොත්, හැමදාම ඉතින් ඔය එහා පැත්තට වෙලා තමයි මේගොල්ලන්ට ඉන්න වෙන්නේ.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

අනික් පැත්තෙන් ගත්තොත්, ආනයනය කරන භාණ්ඩවලට තිබුණු මේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද එකතු කරපු ක්‍රමයේ වෙනසක් කරලා තිබෙනවා. මොකද, දැන් වාහනය ආනයනය කරද්දීම මේක එකතු කර ගන්න පුළුවන්. නැත්නම් වාහනය විකුණනකොට තමයි ඒක තිබ්බේ. ඒක කවදාවත් එකතු වුණේ නැහැ. නමුත් අපේ රටේ එකලස් කරන වාහනයක් තියෙනවා නම්, ඒකට නිෂ්පාදනයේදීම මේ බද්ද වදිනවා. දැන් ආනයනය කරන අවස්ථාවේදීම වදිනවා. සම බිමක් හදලා තිබෙනවා.

ඒ වාගේම මේ ගොල්ලන්, විශේෂයෙන් කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා, මේ පරණ පනතමයි, පරණ ආයෝජන ප්‍රවර්ධන පනතමයි, අපි ඒකට විරුද්ධ වෙලා දැන් ඒකට එකඟ වෙලාය කියලා. නැහැ. සම්පූර්ණයෙන්ම වෙනස්. ගිය අවුරුද්දේ අපි මේක වෙනස් කළා. ඒක වෙනස් කරලා තමයි අපි කිව්වේ, විශේෂයෙන්ම ආයෝජනයක් නැත්නම් උපාය මාර්ගික ආයෝජනයක් ගේනවා නම්, විනිවිදභාවයෙන් දෙන්න පුළුවන් රාමුව මොකක්ද කියන එක. අපි rule-based ක්‍රමයක් දැන් ගෙනැල්ලා තිබෙනවා. ප්‍රසිද්ධියේ දැන් කියලා තිබෙනවා, ඕනෑම ආයෝජකයෙකුට තමන්ගේ ආයෝජනය මොකක්ද, ඒකේ ස්වභාවය මොකක්ද, ආයෝජනයේ ප්‍රමාණය මොකක්ද, ඒකට මොන තරම් බදු සහනයක් හම්බ වෙනවාද කියලා. මීට ඉස්සෙල්ලා මුහුණ බලලයි, අමාත්‍යාංශයේ කාමර ඇතුළෙයි තමයි බදු සහන ගැන කථා කළේ. බදු සහන කථා කරනකොට අත යටින් ගණන කථා කර ගත්තා. ඕනෑ තරම් ආයෝජකයෝ අද ඇවිල්ලා කියනවා, කොච්චරක් මේගොල්ලන් ඉල්ලුවාද කියලා ඒ කාලයේ. හැරිලා ගිය ආයෝජකයෝ ඕනෑ තරම් දැන් ඇවිල්ලා අපට හම්බ වෙනවා.

දැන් ආයෝජකයන්ට ජනාධිපතිතුමාවත්, ඇමතිතුමාවත් හම්බ වෙන්න අවශ්‍ය නැහැ. තමන්ගේ ව්‍යාපාරයේ ස්වභාවය දන්නවා. ඒ ව්‍යාපාරයේ ස්වභාවයට තමන්ට හිමි බදු ප්‍රමාණය දන්නවා. ඒ බදු ප්‍රමාණයට BoI එක හරහා ඉල්ලීමක් කළාම, BoI එක ඒක submit කරනවා, මුදල් අමාත්‍යාංශයට. ඒ ගොල්ලන් feasibility එකක් කරනවා. ඒ feasibility එකෙන් බලනවා, රටට කොච්චර මේ ආයෝජනය සුදුසුද කියලා. අන්න ඒක මත තමයි බදු සහනය සහතික කරන්නේ. එවැනි විනිවිද පෙනෙන, නිරවුල් ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කරලා ඉදිරිපත් කළාම ආයෙත් කියනවා, මේ පරණ එකම ගෙනාවා ලු. මේගොල්ලන් ගිය පාර සම්පූර්ණයෙන් අනික් පැත්ත හරවලායි තිබෙන්නේ.

ඒ වාගේම මේ හෙට අනිද්දාට රාජ්‍ය - පෞද්ගලික අංශයට එකතු වෙලා වැඩ කරන්න PPP Bill එක එනවා. ඒක දැන් ගැසට් කරලා තියෙන්නේ. එතකොට දැන් මේගොල්ලන්ට කාලයක් කර ගන්න බැරි වෙච්ච ආයෝජන ප්‍රවර්ධන කටයුතු අපි කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම සේවා සහ යටිතල පහසුකම්වලට අවුරුදු 6 ඉඳලා අවුරුදු 10 දක්වා බදු සහන තිබෙනවා. නිෂ්පාදන කර්මාන්තවලට අවුරුදු 5 ඉඳලා අවුරුදු 10 වෙනකම් බදු සහන දැන් අපි කියා දීලා තිබෙනවා. ඊළඟට, IT ක්ෂේත්‍රයට සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට විශේෂයෙන්ම තාක්ෂණය පදනම් කර ගත් ක්ෂේත්‍රවලට බදු සහන මේ වෙනකොට පැහැදිලි කරලා තිබෙනවා. එතකොට BoI එක හරහාත්, Port City එක හරහාත් ආයෝජකයන්ට ඉතාම පැහැදිලියි, ලංකාවට කොහොමද එන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අය මෙතැන තව බොරුවක් කිව්වා. දේශීය නිෂ්පාදකයාට, දේශීය කර්මාන්තවලට බදු සහන නැහැ කියලා කිව්වා. ඒක අමූලික බොරුවක්. මේ අය වැයෙන්ම අපි ගෙනාවා, enhanced capital allowance එක. ඒ enhanced capital allowance එක අනුව ඒක දෙස් විදෙස් කියලා නැහැ, ඩොලර් 250,000ක ආයෝජනයක් කරනවා නම්, ඒ කියන්නේ රුපියල් මිලියන 75ක විතර ආයෝජනයක් කරනවා නම්, ඒ ආයෝජනයේ සමස්ත වියදම තමන්ගේ ලාභයෙන් කපා හරින්න පුළුවන් පළමු අවුරුද්දේ ඉඳලා. ඉතින් ඒ වාගේ සහනයක් දීලා තියෙනවා. ඒ වාගේම තමයි දේශීය කර්මාන්තකරුවන්ට BoI status ගන්න පුළුවන්. BoI status ගත්තාම, මේ කියන පහසුකම් ඔක්කෝම ලැබෙනවා. ලංකාවේ ඕනෑ තරම් ආයතන තිබෙනවා, TIEP ක්‍රමයට අපනයනය කරන. එතැනින් එහාට ගිහිල්ලා BoI status ගත්ත. මේක දෙස් විදෙස් කියලා නැහැ. ආයෝජනයේ ප්‍රමාණය අනුව. එතකොට මේ සහනය දෙන්නේ BoI එක. එතකොට ඒ සමාන, equivalent ඩොලර් ප්‍රමාණයක් invest කරනවා නම්, දේශීය ආයෝජකයෙකුටත් මේක තියෙනවා. එහෙම නැතුව විදේශීය ආයෝජකයන්ට විතරක් open කරපු එකක් නොවෙයි.

ඉතින් මෙන්න මේ ක්‍රියාවලිය අපි කරගෙන තිබෙනවා. ඒ වාගේම අප්‍රේල් මාසයේ, මැයි මාසයේ අපි කොහොමද මේ රට පවත්වාගෙන යන්නේ, බලශක්තිය කොහොමද සාක්ෂාත් කරලා තිබෙන්නේ කියලා ජනාධිපතිතුමා පැහැදිලි කළා. ඒ වාගේම මේගොල්ලන්ට කියන්න ඕනෑ, මේගොල්ලන් විනාශ කරපු බලශක්ති ක්ෂේත්‍රය ගැනත්. මොකද, බොහොම අමාරුවෙන් කෑ ගහලා, කෑ ගහලා බේරා ගත්ත විදුලිබල මණ්ඩලයයි, බේරා ගත්ත ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි නිසා තමයි අද මේ ජීවත් වෙන්නේ. පෞද්ගලික අංශයට ඔක්කෝම විකුණලා තිබුණා නම්, අද මොකුත් නැහැ. තිබුණු විදුලිබල පනත තිබුණා නම් එහෙම ජල විදුලිය කාට හරි අයිති වෙනවා; thermal plants ටික තව කාට හරි අයිති වෙනවා. පෞද්ගලික අංශයට generation හම්බ වෙනවා. පෞද්ගලික අංශයට generation තිබුණා නම් අද මේක manage කරන්න වෙන්නේ නැහැ. CPC එක නොතිබුණා නම් මිනිස්සුන්ට අද තෙල් දෙන්න වෙන්නේ නැහැ. මේගොල්ලෝ පිරිපහදුව හදා ගත්තේ නැහැ. බලශක්ති ක්ෂේත්‍රය තුළ බලශක්ති අනාරක්ෂිතතාවක් ඇති කරපු මිනිස්සු දැන් මෙතැන පුප්පා ගෙන කෑ ගහනවා, ජනතාවට සහන දෙන්න කියලා. රාජ්‍ය ව්‍යාපාර බංකොලොත් කරලා විකුණන්න හදපු අය කියනවා, ජනතාවට සහන දෙන්න ලු. ජනතාවට සහන දෙන්න පුළුවන් රාජ්‍ය ව්‍යවසායෙන් විතරයි. ජනතාවට දැන් ඒක පැහැදිලියි.

අනෙක් පැත්තෙන් අපි දැන් dollar bonds issue කරනවා. ඒ සඳහා අපට ශක්තියක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශය ඉතාම හොඳින් ණය කළමනාකරණය කරගෙන යනවා. පසුගිය පාර dollar bond එකට අපට ඩොලර් මිලියන 30ක, 40ක ඉල්ලුමක් තමයි තිබුණේ. අපි මේ පාර ඒක අපනයනකරුවන්ට open කරනවා, තමන් ලංකාවට ගෙනෙන ඩොලර්වලින් සියයට 10ක ප්‍රමාණයක් dollar bondsවල invest කරන්න. ඒ කියන්නේ අපි අපනයනකරුවන්ට තවත් ආයෝජන අවස්ථාවක් මහ බැංකුව හරහා ලබා දීලා තිබෙනවා. මහ බැංකුව මේ වෙනස්කම් කරන්නේ මේ රට අඛණ්ඩව දියුණු මාවතකට ඇවිල්ලා තිබෙන නිසා. මේක බලාගෙන ඉන්න බැරි එකට අපට කරන්න දෙයක් නැහැ.

පසුගිය අවුරුද්දේ සියයට 5ක ආර්ථික වර්ධනයක් ළඟා කර ගත්තා. දැන් ලෝක ආර්ථික අවපාතයක් එනවා. ඒත් අපට විශ්වාසයි, මේ අවුරුද්දේත් අපි සියයට 5 අබිබවා යන ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්නවා කියලා. සංවර්ධන මාවතෙන් එහාට ආවට පසුව අපේ අපනයන ක්ෂේත්‍රය සකස් වෙලා තිබෙන ආකාරය අනුව අපට ලොකු තර්ජනයක් පෙනෙන්නේ නැහැ. මොකද, අපේ යෙදවුම් අමුද්‍රව්‍ය එන්නේ අග්නිදිග ආසියාවෙන්. අපේ නිෂ්පාදිත භාණ්ඩ යන්නේ western hemisphere එකට. ඉතින්, එම නිසා අපට දැනට ගැටලුවක් නැහැ. මැද පෙරදිගට කරන තේ අපනයන මේ වෙනකොට වැඩි වෙලා මීසක් අඩු වෙලා

නැහැ. මෙන්න, මේ ක්‍රියාවලිය හරහා තමයි අපි ශක්තිමත්ව ඉදිරියට යන්නේ. කර්මාන්ත අමාත්‍යාංශයෙන් කරන විවිධ ව්‍යාපෘති සහ සංවර්ධනය සඳහා ඉස්සරහට ගන්න ඕනෑ ක්‍රියා මාර්ග සියල්ලම ගැන අපි IMF එකට පැහැදිලි කළා. ලංකාවත් එක්ක ඔවුන්ගේ ක්‍රියා කලාපය ලබන අවුරුද්දේ මාර්තු දක්වා තිබෙනවා. සියලු සංවර්ධන ආයතන එකතු වෙලා සහයෝගයෙන් යන මේ ගමනින් අපට පුළුවන් වෙයි, මේ තත්ත්වය අතික්‍රමණය කරන්න. ජනතාවට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. මේ ගොල්ලන්ට කරගන්න බැරි වුණු ටික අපි කරනකොට ජනතාව ශක්තිමත්ව ආණ්ඩුව එක්ක ඉන්නවා කියන විශ්වාසය අපට තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.25]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග ගැන අද සාකච්ඡා වනවා. තහනම් උත්තේජක පිළිබඳව ගෙනාපු වැඩ පිළිවෙළත් එක්ක මම හිතන්නේ අපි මේක පටන් ගත්තේ. තහනම් උත්තේජක පිළිබඳ කාර්යාලයක් ලංකාවේ තිබුණේ කුඩා කාමරයක් ඇතුළේ. මට පුළුවන් වුණා, 2016දී අලුත්ම building එකක් හදලා මේ සඳහා අවශ්‍ය කරන සම්පූර්ණ ශක්තිය ලබා දෙන්න. මම අද ඒ ගැන සන්තෝෂ වෙනවා. මම විෂය භාර අමාත්‍යවරයා විධියට වැඩ කරන කාලයේ අපි අලුත් building එකක් හදලා, අලුත් කාර්යාලයක් හදලා ලංකාව ලෝකයට අරගෙන යන වැඩ පිළිවෙළට සම්පූර්ණ නායකත්වය දුන්නා.

අපේ විෂය භාර ඇමතිතුමා මෙතැන නැහැ. නමුත්, මම එතුමාට විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, ක්‍රීඩාව ගත්තොත්, අද වනකොට ඔලිම්පික් කමිටුව ඇතුළේ තිබෙන ප්‍රශ්න ටික ගැන. ඇත්ත වශයෙන් ඔලිම්පික් කමිටුව අප්‍රේල් 25වැනිදා Annual General Meeting එකක් කැඳවා තිබෙනවා. ඒ meeting එක කැඳවනකොට 2025දී ඔලිම්පික් කමිටුවේ වාර්ෂික මහ සභා රැස්වීමක් තිබිලා නැහැ. 2026 Budget එක pass කරලා නැහැ. 2024 වසරේ විගණන වාර්තාව මේ වනතුරු දීලා නැහැ. ඊළඟට, අපි දාපු නීතිමය ක්‍රියා මාර්ගය අනුව සෑම අවුරුද්දකම පෙබරවාරි 28 වැනිදාට කලින් ලංකාවේ සෑම සංගමයක්ම විගණන වාර්තාව අනිවාර්යයෙන් දෙන්න ඕනෑ. හැබැයි, ලංකාවේ සියලු සංගම් නියෝජනය කරන ඔලිම්පික් කමිටුවට බැරි වෙලා තිබෙනවා, මේ වනතුරු ඒ වාර්තාව ලබා දෙන්න. 2025දී වාර්ෂික මහ සභා රැස්වීමක් තිබුණේ නැහැ. 2025දී සම්මත නොවුණු අය වැයක් තමයි 2026ට දැන් ගෙනැල්ලා තිබෙන්නේ. මේ අවුරුද්දේ තමයි ඒගොල්ලන් ඒක සම්මත කරගන්න හදන්නේ. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේ සම්බන්ධව ගන්න පියවර මොකක්ද කියලා. මොකද හේතුව, මේ තත්ත්වය වෙන සංගමයක් ඇති කළා නම් ඒ සංගමය තහනම් කරන්න ඉඩ තිබුණා. හැබැයි, ඔලිම්පික් කමිටුවට ඒ කිසිම දෙයකට අනුව වැඩ කරන්න සූදානම් නැහැ. 2025 අප්‍රේල් 23වැනි දා අමාත්‍යවරයාට මේ සම්බන්ධව; එහෙම නැත්නම් ඔලිම්පික් කමිටුවේ සභාපතිවරයා පිළිබඳව; සුරේෂ් සුබ්‍රමනියම් මහත්මයා ගැන "Grave Concerns Regarding the Conduct of Mr. Suresh Subramanium - President, NOCSL" **යන** ශීර්ෂය යටතේ ලිපියක් දීලා තිබෙනවා, වහාම ක්‍රියා කරන්න කියලා. අද වනකොට අවුරුද්දකට වැඩියි. නමුත්, ඒකට අත තියලාවත් නැහැ, කථාවත් කරලා නැහැ. ඒ වාගේම එතුමා දුන්නා, පෞද්ගලික ත්‍යාගයක්. ලංකාවට ආපු ආසියානු ඔලිම්පික් කවුන්සලයේ අධ්‍යක්ෂ ජනරාල් Capt. Husainට දීපු ඒ ත්‍යාගයට අදාළ මුදල් ටික ආපහු ඔලිම්පික් කමිටුවෙන් ලබා ගන්නවා. ඒකට අදාළ හඬපටය මා ළඟ තිබෙනවා. මම ඒක සභාගත කරන්නම්.

ඒ වාගේම, අලුත් Ethics Committee එකක් හදලා නිලවරණයට ඉල්ලන්න බැරි වන විධියට තමන්ට විරුද්ධ අයගේ නම් ඔක්කෝම ඒකට දමනවා. මේ ආණ්ඩුවේ බලශක්ති ඇමතිතුමාට දැන් අධිචෝදනා ගොනු කරලායි තිබෙන්නේ. එතුමා තවම ඇමති ධුරයේ ඉන්නවා. හැබැයි ඔලිම්පික් කමිටුව, චෝදනා තිබෙනවා කියලා ඒ අයට නිලවරණයට ඉල්ලන්න දෙන්නේ නැහැ. මේක සම්පූර්ණයෙන්ම වැරැදියි. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මා කලින් කියපු කාරණා වාගේම තවත් විශාල දූෂණ සංඛ්‍යාවක් අපේ ඔලිම්පික් කමිටුවේ සිද්ධ වෙමින් තිබෙන බව. මට ඒ එකින් එක මෙතැන කියන්න බැරි වෙයි. රුපියල් මිලියන 100ක deposit එකක් තිබුණා. ඒ රුපියල් මිලියන 100න් රුපියල් මිලියන 80කට වඩා අරගෙන තිබෙනවා. ඒ මුදල් අරගෙන තිබෙන්නේ, AGM එකක් තියලා කිසිදු approval එකක් අරගෙන නොවෙයි. ඒ විතරක් නොවෙයි. තවත් විශාල ප්‍රශ්න ගණනාවක් එහි ඇති කරලා තිබෙනවා. මේ ඔලිම්පික් කමිටුවේ සභාපතිවරයාට සහ දැනට එම කමිටුවේ ඉන්න අනෙකුත් අයට විරුද්ධව අතිවිශාල දූෂණ චෝදනා ගණනාවක් තිබෙනවා. නමුත් ඒවා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වෙනුවට අද මේ කරන්න හදන්නේ, නිලවරණයට ඉදිරිපත් වෙන්න ඉන්න අයට - විශේෂයෙන්ම Football Federation එකේ සභාපතිට, අනෙකුත් අයට - විරුද්ධව විවිධ චෝදනා එල්ල කරලා Ethics Committee එකට දමන එකයි, ඒ අය නිලවරණයට ඉදිරිපත් වන එක ඒ වැඩ පිළිවෙළ හරහා නතර කරන එකයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ සම්බන්ධව පරීක්ෂණයක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු වහාම සිදු කරන්න කියලා.

අද අපේ ක්‍රීඩාවට වෙලා තිබෙන දේත් මම කියන්න කැමැතියි. කාන්තා හොකී කණ්ඩායමට පිටරට යෑම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ, අපට ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් කණ්ඩායමක්. ඒ වාගේම, තායිලන්තයේ පැවැත්වීමට නියමිත ආසියානු ක්‍රීඩා උළෙලට සුදුසුකම් ලබා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන හොකී තරගාවලියේදී semi-final එකෙන් අපේ තරුණයෝ දිනුවා; ඔවුන් අවුරුදු 20කට පස්සේ බංග්ලාදේශය පරාජය කළා. අපි ඔවුන්ට සුබ පතනවා. ඒ වාගේම, 21වන දා කාන්තා හොකී කණ්ඩායම ඉන්දුනීසියාවට යෑමට නියමිතව තිබෙනවා. හැබැයි, වෙනදා කවදාවත් නොකරපු අලුත් වැඩ පිළිවෙළක් දැන් පටන්ගෙන තිබෙනවා. මම ක්‍රීඩා අමාත්‍යවරයා විධියට වැඩ කරපු කාලයේ සෑම කණ්ඩායමකටම අවශ්‍ය කරන ගුවන් ටිකට්පත් ටික ලබා දුන්නා, නවාතැන් පහසුකම් ලබා දුන්නා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද reimburse කරනවා. ක්‍රීඩක ක්‍රීඩිකාවන්, අම්මලා තාත්තලාගේ කන කර ආභරණ උකස් කරලා සල්ලි හොයාගන්න ඕනෑ, ගුවන් ටිකට්පත් ගන්න. රට ගිහිල්ලා ඇවිල්ලා මාස ගණනකට පසුව තමයි ඒ ළමයින්ට ගුවන් ටිකට් පත්වලට අදාළව සල්ලි දෙන්නේ. අපි එහෙම ඒවා කළේ නැහැ. මා විෂය භාර අමාත්‍යවරයා හැටියට වැඩ කරපු කාලයේ සෑම අවුරුද්දකම මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා කියනවා, ඔලිම්පික් තරග තිබෙනවා, විදේශ රටවල මේ මේ තරග තිබෙනවා, ලංකාවේ මේ මේ තරග තිබෙනවා, ගුවන් ටිකට් පත්වලටද ඇතුළුව මේවාට අවශ්‍ය කරන මුදල් ටික වෙන් කර ගන්න ඕනෑ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තවත් විනාඩි කිහිපයක් තිබෙනවා.

මා ඉහතින් කියපු ගැටලුකාරී ක්‍රියාදාමය අද දිගින් දිගටම සිදු වෙනවා. මම ක්‍රීඩා අමාත්‍යාංශය ගැන වැඩිය කථා කරන්නේ නැතිව හිටියේ, මම ඇමතිවරයා හැටියට වැඩ කරපු අමාත්‍යාංශ ගැන කථා කරන එක හොඳ නැති නිසා. නමුත් මම වත්මන් ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ කියපු කාරණා සම්බන්ධව ක්‍රියා කරන්න කියලා.

අද අපේ ජනාධිපතිතුමා මේ සභාවට ආවිල්ලා මොකක්ද කළේ? සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේදී තමයි "ආවා, ආවා, අවුරුදු මහා සේල්!" කියලා කියන්නේ. අද ජනාධිපතිතුමා ඇවිල්ලා සහන දෙන්න කථා කළා. ලංකාවේ පවුල් ලක්ෂ 55ක්, 57ක් අතර ප්‍රමාණයක් ජීවත් වෙනවා. හැබැයි, පවුල් ලක්ෂ 16ක්, 17ක් පමණ තමයි "අස්වැසුම" ප්‍රතිලාභය ගන්නේ. එතුමා අස්වැසුම ප්‍රතිලාභීන්ට සහනයක් ලබා දුන්නා. ඒකට කමක් නැහැ. මොකද, ඒක කළ යුතුයි. හැබැයි, ඉතිරි පවුල් ලක්ෂ 42ට මොකද වෙන්නේ? ඒ අයට දීලා තිබෙන සහනය මොකක්ද? ඩීසල් ලීටරයට රුපියල් 100ක් බැගින් ආණ්ඩුව දරා ගන්නවා කියලා එතුමා කියනවා. හැබැයි, ගොඩබෑමේ ගාස්තුව පිළිබඳව කිසිම තොරතුරක් නැතිව කීයක් ගන්නවාද කියලා අපි කොහොමද දන්නේ. මොකද, තමුන්නාන්සේලා මේ වනතුරු ඒ මිල සූත්‍රය ඉදිරිපත් කළේ නැහැ. තෙල් මිල මාර්තු මාසයේ 01වන දා වැඩි කළා; මාර්තු 09වන දා වැඩි කළා; මාර්තු 21වන දාත් වැඩි කළා. ඊට කලින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා කිව්වා, දින 37කට අවශ්‍ය කරන තෙල් ලංකාව තුළ තිබෙනවා කියලා. ඒ කියන්නේ අද වනකල්. එහෙම නම් අද - 07වන දා - වනකල් තෙල් මිල වැඩි කරන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, මාසයක් ඇතුළත තුන් පාරක් තෙල් මිල වැඩි කළා.

ඇත්තටම අද මොකක්ද කරලා තිබෙන්නේ? ජනාධිපතිතුමා කියනවා, සෑම ඩීසල් ලීටරයකටම රුපියල් 100ක වියදමක් ආණ්ඩුව දරා ගන්නවා කියලා. අපි දන්නේ නැහැ, කොහෙන්ද දරා ගන්නේ කියලා. මොකද, ගොඩ බෑමේ ගාස්තුව අපටත් ගණනය කර ගන්න මිල සූත්‍රය තිබෙන්න ඕනෑ. ඒක නැතුව අපට ගණන් මිම් සොයා ගන්න බැහැ. දැන් මොකක්ද කළේ? ආණ්ඩුව ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනයක් අපට දෙනවා කිව්වාට ආණ්ඩුව ඇත්ත වශයෙන්ම අනෙක් පැත්තෙන් රුපියල් 50ක් අපෙන් පික්පොකට් ගහ ගන්නවා. පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක සහනයක් දෙනවා කිව්වාට රුපියල් 50ක් අපෙන් කපා ගන්නවා. එතකොට අපට රුපියල් 30ක් පාඩුයි. මම දන්නේ නැහැ ආණ්ඩුවේ මේ සූත්‍රය කොහෙන් ගෙනාවාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ක්‍රීඩාව ගැන කථා කරන කොට, විශේෂයෙන්ම අද මම ස්තුතිවන්ත වෙනවා ගැරී කර්ස්ටන් මැතිතුමාට. මොකද, එතුමා අපේ ක්‍රිකට් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු තනතුරට පත් වෙලා තිබෙනවා. අද ක්‍රිකට් සම්බන්ධයෙන් විවිධ ගැටලුකාරී කාරණා ගණනාවක් මතු වෙලා තිබෙනවා. එකක් තමයි fitness පිළිබඳව ඉදිරිපත් කරපු කාරණාව. Fitness තිබෙන ක්‍රීඩකයන්ගේ නම් පවා ඉවත් කරන්න වැරදි විධියට අර්ථ නිරූපණය කිරීම් කර තිබෙනවා. ඒ පිළිබඳව මම බෙහෙවින් කනගාටු වෙනවා. ඒ හරහා ක්‍රිකට් ක්‍රීඩාවේ දක්ෂයින්ට තිබෙන තත්ත්වය නැති කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් තවත් විනාඩියක කාලයක් ඉල්ලනවා, ඒ නම් ටික කියවන්න. ඒක විශාල කුමන්ත්‍රණයක්. සමහර අයගේ නම් දාලා තිබුණා. Fitness test එක pass වෙච්ච playersලා ගණනාවක් ඉන්නවා. මම ඒ අයගේ නම් ටික කියවන්නම්. ඒකයි මට තවත් තත්පර කීපයක් දෙන්න කියලා මම කිව්වේ. දිනේෂ් චන්දිමාල්, චරිත් අසලංක, ධනංජය ද සිල්වා, මහීෂ් තීක්ෂණ, ප්‍රභාත් ජයසූරිය, අකිල ධනංජය, ළහිරු උදාර යන අය fitness test එක pass වෙච්ච කට්ටිය. හැබැයි, ඒ අය එය ෆේල් කියලා වෙනම මතයක් අරගෙන යන්න හදනවා. හරිම කැත වැඩක් ඒ කරන්නේ. සමහර අය ඒ පරීක්ෂණයට තවම සහභාගි වෙලාත් නැහැ. වනිඳු හසරංග, මතීෂ පතිරණ, භානුක රාජපක්ෂ, බිනුර ප්‍රනාන්දු, ළහිරු කුමාර යන අය තවම ඒ පරීක්ෂණයට ඉදිරිපත් වෙලාත් නැහැ. ඒ ක්‍රිකට් ක්‍රීඩකයන් අතරින් සමහර අයගේ fitness නැහැ කියලා මතයක් හදලා ඒ අයගේ මුළු ක්‍රීඩා ජීවිතයම විනාශ කරන වැඩ පිළිවෙළකුත් අද ක්‍රියාත්මක කරගෙන යනවා.

විශේෂයෙන් ගැරී කර්ස්ටන් මැතිතුමාට මම නැවතත් ස්තුතිවන්ත වෙනවා, අපේ ක්‍රිකට් පුහුණුකරු වෙලා පැමිණීම ගැන. Fitness ගැන මම ඒ කාලයේ කථා කළාම කට්ටියම මා වට කරගෙන මඩ ගැහුවා, fitness ගැන කථා කළා කියලා. ශ්‍රී ලංකා ක්‍රිකට් එකේ හැම තැනකම අද කථා වෙනවා, fitness නැතුව ක්‍රීඩා කරන්න බැහැ කියලා. මම නැවතත් ගරු ක්‍රීඩා ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් නිවැරැදිව ක්‍රියා කරන්න කියලා. මොකද, අපට අවශ්‍ය වෙලා තිබෙනවා, දක්ෂතාව වාගේම, ක්‍රීඩා කරන්න පුළුවන් ශක්තිය තිබෙන ක්‍රීඩකයන් පිරිසක්. එවැනි ක්‍රීඩකයන් බිහි කර ගැනීම සඳහා කැප වෙන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.35]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමට, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන නියෝගය, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වන රීති ආදිය අනුමත කිරීමට ඉදිරිපත් කර තිබෙනවා. ඊට අදාළව මේ සාකච්ඡාව සිදු වන අද දවසේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මේ සුන්බුන් විපක්ෂයේ සමහර උදවිය දිගින්

දිගටම රටේ ජනතාව අතරට තව තවත් වැරැදි තොරතුරු, වැරැදි මතවාද, බොරු ගෙන යන්න උත්සාහ කරමින් ඉන්නවා. විපක්ෂයේ කිහිපදෙනෙක් රටේ ජනතාවට තහවුරු කරන්න හදන ඒ බොරුවලට, මේ ආණ්ඩුව සම්බන්ධයෙන් ගහන මඩවලට ආණ්ඩුව විධියට අපි දවසෙන් දවස උත්තර දෙන්නත් සමත් වෙලා තිබෙනවා.

මෙහිදී මීට පෙර කථා කරපු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කියපු කාරණා කීපයක් ගැන කියන්න ඕනෑ. හැබැයි මම ඒ අයගේ නම් කියන්න යන්නේ නැහැ. මොකද, ඒ සමහරු ආයෙත් වෙලාවක මේ සභා ගර්භයට ඇවිල්ලා, තමන්ගේ නම කිව්වා කියලා එල්ලෙන්න හදනවා නේ. මා අහගෙනයි එක මන්ත්‍රීවරයෙක් එක වෙලාවක කියනවා, "ඇහේ මාළු නටනවා" කියලා. ඒ, ආණ්ඩු පක්ෂයේ කට්ටියගේ කියලා තමයි එතුමා කියන්න හැදුවේ. ලෝක පරිමාණයේ යුද්ධය හේතුවෙන් මේ රටේ ජනතාව විපතට පත් වනකොට, රටක් විධියට ඒ අභියෝග අභියෝග ලෙස භාර ගෙන රටේ ජනතාවට පහසුකම් සපයමින් ඒ අභියෝග ජයග්‍රහණය කර ගනිමින් ඉන්න මොහොතක, එතුමන්ලා කියන ඒවා මේ සමාජය ඉස්සරහ බොරු වනකොට බොහෝ දෙනෙකුගේ ඇහේ මාළු නටනවා තමයි, සුන්බුන් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුව, ආණ්ඩුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු, මන්ත්‍රීවරියන් ඉලක්ක කරලා ගහන මඩ බොරු වනකොට එතුමන්ලාට සමාජය ඉස්සරහට යන්න බැරුව ඇහේ මාළු නටන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

2025 වර්ෂය අවසන් වනකොට රටක් විධියට බරපතළ ස්වාභාවික විපතකට අපි මුහුණ දුන්නා. ඒ ස්වාභාවික විපත මේ ආණ්ඩුව ඉතා කෙටි කාලයක් තුළ හොඳින් කළමනාකරණය කරලා ඒක ජයග්‍රහණය කරමින් ඉන්න මොහොතක තමයි, අපට දැන් මේ අභියෝගය ඇවිල්ලා තිබෙන්නේ. මේ තිබෙන තත්ත්වයත් අපි හොඳින් කළමනාකරණය කරමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය අතරේ මම පොඩ්ඩක් වැඩිපුර අවධානය යොමු කරන්න කැමැතියි, මෙන්න මේ කාරණයට. අද දවල් ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණිලා මේ රටට ලබාදෙන සහන පැකේජය ගැන - මේ අමාරු තත්ත්වය ඇතුළේ ජනතාවට ලබා දෙන සහන මොනවාද කියලා - හොඳින් පැහැදිලි කළා. ඒ අතරින් විශේෂයක් ලෙස අරගෙන මම කථා කරන්න කැමැතියි, ඒ සහන පැකේජය ඇතුළේ ගොවි ජනතාවට ලබා දුන් සහන මොනවාද කියන එක ගැන. මේ යුදමය තත්ත්වය ඇතුළේ අපට රටක් විධියට ඉන්ධන සම්බන්ධයෙන්, බලශක්තිය සම්බන්ධයෙන් ගැටලුවක් ඇවිල්ලා තිබෙනවා. ඒ බලශක්තිය කළමනාකරණය කරන්නේ කොහොමද කියන කාරණයට මේ වනකොට අපි හොඳින් මැදිහත් වෙමින් තිබෙනවා. ඉන්ධන පිරිමසාගෙන, මේ තිබෙන අමාරුකම් දරාගෙන ඉදිරියට පියමං කරන්නේ කොහොමද කියන එක ගැන අපි කථා කරමින් ඉන්නවා. ඒ අතරේ අපට රටක් විධියට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, මේ රටේ දෙකෝටි විසිලක්ෂයකට ආසන්න ජනතාවට අවශ්‍ය ආහාර ටික නිෂ්පාදනය කර ලබාදෙන ගොවි ජනතාවට ආපු ප්‍රශ්නය. දැන් යල කන්නයේ වගා කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මේ වනකොට සමහර තැන්වල යල කන්නයේ වගා ආරම්භය අවසන් කරමින් තිබෙනවා. ඒ ගොවි ජනතාව ඒ වගා කරන්න යනකොට ඉන්ධන ප්‍රශ්නයක් ආවා. ඒක ගොවි ජනතාව මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වුණා. ඔවුන්ගේ කුඹුරු ටික හා ගන්න ඉන්ධන ලබා ගැනීමේදී ගැටලුවක් නිර්මාණය වුණා. අපි ආණ්ඩුවක් විධියට ඒ ප්‍රශ්නයත් හොඳින් කළමනාකරණය කළ නිසා මේ වෙනකොට ගොවි ජනතාව වගා කටයුතුවල නියැළෙමින් ඉන්නවා. ඒ වාගේම අස්වැන්න නෙළා ගන්න යනකොටත් බරපතළ ප්‍රශ්නයක් ආවා. ඔවුන් වගා කරපු අස්වැන්න නෙළා ගන්න බැරි විධියට ඉන්ධන ප්‍රශ්නයක් ආවා. ඉන්ධන නැතුව ඔවුන් අමාරුවක වැටුණා. ආණ්ඩුව ඒකට අවශ්‍ය පියවර ගත්තා; ක්‍රියාමාර්ග හැදුවා. ඒ තත්ත්වය ඇතුළේ ඒ ප්‍රශ්නයත් විසඳලා තිබෙනවා.

ඊළඟට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, පොහොර ප්‍රශ්නය. මේ ප්‍රශ්නය එනකොට කෘෂිකර්ම අමාත්‍ය කේ.ඩී. ලාල් කාන්ත මැතිතුමාත්, නියෝජ්‍ය ඇමතිවරුත් සමඟ පොහොර සපයන සමාගම් ටික, ජාතික පොහොර ලේකම් කාර්යාලය යන මේ සියලු ආයතන එකතු වෙලා සාකච්ඡා කරලා තීරණයක් ගත්තා, ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා අපේ ගොවි ජනතාවට පොහොර ටික ලබා දෙනවා කියලා. අපි ඒක ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අපේ රටේ පොහොර අවශ්‍යතාව මේ විධියට තිබෙනවා. මේ කන්නයට යූරියා මෙට්‍රික් ටොන් 125,000ක, TSP මෙට්‍රික් ටොන් 19,000ක, MOP මෙට්‍රික් ටොන් 38,000ක අවශ්‍යතාවක් තිබෙනවා. මේ වනකොට තොග හැටියට තිබෙනවා, යූරියා මෙට්‍රික් ටොන් 60,000ක්. TSP මෙට්‍රික් ටොන් 28,000ක් තිබෙනවා. MOP මෙට්‍රික් ටොන් 26,500ක් තිබෙනවා. මේ වනකොට වරායට ඇවිල්ලා තිබෙනවා, මෙට්‍රික් ටොන් 25,000ක යූරියා පොහොර නැවක්. අපි ආණ්ඩුවක් විධියට ගොවි ජනතාවට පණිවුඩයක් ලබා දෙනවා, ඔබ භය වෙන්න එපා, ඔබ වගාවට යන්න, වගාව ආරම්භ කරන්න කියලා. මේ යල කන්නයට අවශ්‍ය පොහොර ටික මේ වනකොට ප්‍රශ්නයකින් තොරව ගොවි ජනතාවට ලබා දීමට අදාළ මැදිහත් වීම කරමින් ඉන්නවා. රට පුරා දිස්ත්‍රික්ක 25ම නියෝජනය වන පරිදි ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා මේ රටේ ගොවි ජනතාවට අවශ්‍ය පොහොර ටික අවශ්‍ය ප්‍රමාණයට ලබා දීමට අපි මැදිහත්වීම් කරමින් ඉන්නවා. අවස්ථා දෙකකදී ගොවි ජනතාවට පොහොර ටික ලබා දෙන්න ඕනෑ වැඩ පිළිවෙළ අපි සකස් කරලා තිබෙන්නේ. විපක්ෂය හැම දාමත් ගොවි ජනතාව බිය වැද්දුවා. අප්‍රේල් වෙනකොට ජනාධිපති වෙන්න හීන දකින මේ විපක්ෂය ඔය වාගේ දේවල් තමයි කරන්නේ.

දැන් ප්‍රශ්නයක් තිබෙනවා නේ, සමාජය ඉස්සරහට ගිහිල්ලා කථා කරන්නේ AI විපක්ෂ නායකයාද, එහෙම නැත්නම් සැබෑ විපක්ෂ නායකයාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
හොඳයි.

විපක්ෂ නායකතුමා පව්. විපක්ෂ නායකතුමාට තිබුණු පෞරුෂයත් විපක්ෂ කඳවුරේම සමහරු බිඳලා තිබෙනවා, මේ AI කථා කියලා.

මේ සුන්බුන් විපක්ෂය ගොවි ජනතාව බිය වද්දලා ඒ අය වගාවට බහින එක නවත්වන්න හදනවා නම් ඒවාට බය වෙන්න එපා. අපි ගොවි ජනතාවගෙන් ඉල්ලනවා ඔබ බය නැතිව වගාවට යන්න, වගාවට මැදිහත් වෙන්න කියලා. ඒ මැදිහත්වීම ඇතුළේ අපි ආණ්ඩුවක් විධියටත් මේ රටේ ආහාර අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අදාළ මැදිහත්වීම දිගටම කරමින් ඉන්නවා. අපි ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ටික ප්‍රශ්නයකින් තොරව සැපයීමට අදාළ නායකත්වය ලබා දෙමින් සිටිනවා. ඒ නිසා බය නොවී වගාවට බහිමු, මැදිහත් වෙමු කියන ඉල්ලීම ගොවි ජනතාවගෙන් කරමින් මම නවතිනවා.

මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කෙටි කාලයයි තිබෙන්නේ කථා කරන්නට. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සිටිය නිසා දැන් තමයි සභාවට එන්න ලැබුණේ.

අදට නියමිත විෂය කාරණා ගැන කථා කරන්න කලින් අපේ මේසය උඩ තිබෙන විගණන වාර්තාව ගැන යමක් කිව යුතුයි. ඒකේ තිබෙන සාරාංශයට අනුව, මේ ගල් අඟුරු මිලදී ගත්ත ආයතනය පිළිබඳ ගැටලු ගොඩක් තිබෙන බව තමයි විගණකාධිපති කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ ඒගොල්ලන්ට ලියාපදිංචියවත් - register වීමක් - නැහැලු.

අනෙක් කාරණය හැටියට, ඒ කට්ටියට ගුණාත්මකභාවයකින් යුක්තව අපට ගල් අඟුරු ලබා දෙන්න හැකියාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය විගණකාධිපති අහලා තිබෙනවා. එහෙම නේද ගරු ඇමතිතුමා? මම දැන් තමයි මේ සභාවට ආවේ. මම මේ වාර්තාවේ විධායක සාරාංශයෙන් තමයි ඒ කරුණු කිව්වේ. එහෙම තමයි මම දකින්නේ. මම වැරදි නම් කවුරු හරි කියනවාද එහෙම දෙයක් මේ වාර්තාවේ කියලා නැහැයි කියලා? මම විනාඩි දෙකෙන් මේ වාර්තාව බැලුවේ.

මම ඒක කියන්න හේතුවක් තිබෙනවා. 2022දීත් මෙවැනි ප්‍රශ්නයක් පැන නැඟුනා. ඒ අවස්ථාවේ මුදල් කාරක සභාවේ සභාපති හැටියට මට තමයි ඒ ගැන සොයන කාර්යභාරය පැවරුණේ. එතැනදී අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවේ ඉතාම පැහැදිලිව කිව්වා එවැනි suppliersලා තෝරා ගන්නකොට නියම කරලා තිබෙන අවම සුදුසුකම් පැහැර හරින්න ඉඩ දෙන්න එපා කියලා. මට මතක හැටියට මෙට්‍රික් ටොන් ලක්ෂ 10ක් යම්කිසි කාල පරිච්ඡේදයක් ඇතුළතදී සපයපු ආයතනවලට විතරයි ඒ supply contract එකට ඇතුළු වෙන්න ඉඩ දීලා තිබුණේ. ඒ අවස්ථාවේදී ඒ තීරණ ගන්න සම්බන්ධ වුණු නිලධාරින්ට වසරක් - මාස 12ක් - කිසිම ටෙන්ඩර් කොමිටියක වාඩිවීමට සුදුසු නැහැ කියලා මම අත්සන් කරපු නිර්දේශයක් ලබා දුන්නා. එවකට සිටි ආණ්ඩුව ඒ ගැන මාත් එක්ක බොහොම ලොකු ප්‍රශ්නයක් ඇති කර ගත්තා. හැබැයි දැන් මේ තිබෙන වාර්තාවට අනුව පේන්නේ එවැනිම වැරැද්දක් නැවතත් සිද්ධ වෙලා තිබෙනවා වාගෙයි. එහෙම වෙන්නේ කොහොමද නේද? එහෙම වෙන්න බැහැ නේද? එහෙම වෙලා මහ විශාල පාඩුවකුත් වෙච්ච බව විගණකාධිපතිගේ මේ වාර්තාවේ තිබෙනවා. දැන් මේක කවුරු හරි ගෙවන්න එපායැ. මේ පාඩුව කවුරු හරි ගෙවන්න ඕනෑ. ආයතනය කොච්චර පාඩුවක් ගෙවනවාද කියන එක පිළිබඳ යම් ගණනය කිරීමක් තියෙයි. ඒ ගොල්ලන්ගෙන් යම් කිසි ප්‍රමාණයක් ගත්තා කියමු. හැබැයි, ඉතුරු ටිකට මොකද වෙන්නේ? අපට උත්පාදනය කර ගන්න බැරි වුණු කිලෝවොට් පැය ප්‍රමාණය අපි වෙන තැනකින් ගත්තා නම් - ගත්තා නේ - ඩීසල්වලින් ගත්තා නම්, ඒකේ කිලෝවොට් පැයක් නිෂ්පාදනය කරන්න ගිය පිරිවැය කොච්චරද? ඒක ගෙවන්නේ කවුද? අවසානයේ අපි තමයි ගෙවන්නේ. ජනතාවගේ කර මතට තවත් බදු පනවන්න හේතුවක් තමයි මේක. සල්ලි අවශ්‍යයි නේ ගෙවන්න. එහෙම නැතුව කවුරුවත් පැලවත්තෙන් මේ සල්ලි ගේන්නේ නැහැ නේ.

ඊයේ අපේ කණ්ඩායම කථා කරපු දෙයක් තමයි, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සියයට 2.5ක් කියලා කිව්වාට, ඇත්ත වශයෙන්ම අගය එකතු කිරීමේ බද්දක් හැටියට ගත්තොත්, ඒක ඊට වඩා දෙගුණයක වාගේ ප්‍රමාණයක් වෙනවා කියන එක. මොකද, GST කියන්නේ cascading tax එකක්. Value-added tax එකක් නොවන නිසා, එතකොට මේ බදු හරහා ජනතාවගෙන් ලබා ගන්නා ප්‍රමාණය වැඩි කර ගන්න එක තමයි මේ සිද්ධ වෙන්නේ.

අපි IMF එකත් එකක් එකඟ වෙලා තිබෙනවා නම් පිරිවැයට අනුව තමයි බිල නියම කරන්නේ කියලා, එහෙම නම් පිරිවැය වැඩි වෙනකොට විදුලි බිල වැඩි වෙනවා. ඒ ගැන අහන්න දෙයක් නැහැ නේ. එහෙම නම් පිරිවැය අඩු කර ගන්න ඕනෑ. පිරිවැය අඩු කර ගන්න තමයි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත ගිය අවුරුද්දේ ගෙන ආවේ. ඒකේ තිබුණා, පෞද්ගලික ආයෝජන ජනනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට සහ බෙදා හැරීමට එකතු කර ගන්නේ කොහොමද කියලා. ඒක නිසා තමයි ඒකට අනුයුක්ත වෙන්න පෞද්ගලික අංශයට යම් අවස්ථාවක් දීලා තිබුණේ. හැබැයි, සියයට 100ක් රජයේ අයිතිය තියා ගැනීම හරහා ඒ සියලු ඉඩ කඩ වහලා තිබෙනවා. එතකොට විදුලිය උත්පාදනය කිරීමේදී, සම්ප්‍රේෂණය කිරීමේදී සහ බෙදා හැරීමේදී පිරිවැය වැඩි වෙනවා නම්, කරන්න දෙයක් නැහැ ඒක ජනතාව මත පටවන්නම වෙනවා. දැන් IMF එකත් එක්ක කථා කරනකොට ඒගොල්ලෝ ඒක තමයි කියන්නේ. Subsidy එකක් එහෙම දෙන්න බැහැ, අය කර ගන්න වෙනවා. ඒ නිසා තමයි අපි දිගින් දිගටම කිව්වේ, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවට යම් සහනයක් දිය යුතුයි කියලා.

අද ජනාධිපතිතුමා ඇවිල්ලා යම් යම් ඉලක්කගත කණ්ඩායම්වලට සහන ලබා දීලා තිබෙනවා. ඒකේ වරදක් නැහැ. හැබැයි, ඒ සඳහා මගේ ගණන් බැලීමට අනුව රුපියල් බිලියන 80ක්, 90ක් විතර යනවා. ඒක කොහෙන්ද ලබා ගන්නේ කියලා අපිට පැහැදිලි කරන්න ඕනෑ. ඒ සඳහා අලුතින් මුදල් එකතු කිරීමක් කරන්නේ නැත්නම්, ඒක reclassify කරනවා නම්, අඩු කරන්නේ කොතැනින්ද කියන එක කියන්න වෙනවා; පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. මොකද, අපට cash buffer එකක් තිබෙන එක ඇත්ත. ඒ cash buffer එක රුපියල් බිලියන 800ට වාගේ අඩු වුණාම tightness එක වැඩි වෙනවා. දැනට මාස කිහිපයකට කලින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඔවුන් ඇවිල්ලා ඒක පැහැදිලි කළා. සතියකට වරක් ආණ්ඩුව ණය ගන්නවා. ඒ ණය ගන්නා විට පොලිය වැඩි වෙන ප්‍රවණතාවක් තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, ගිය සතියේ සහ ඊට කලින් සතියේ රජය විසින් ණය ලබා ගන්න ඉදිරිපත් කරපු භාණ්ඩාගාර බිල්පත් සම්පූර්ණයෙන්ම අළෙවි වුණේ නැහැ, ඉල්ලුම තිබුණේ නැහැ. රජයට අවශ්‍ය පොලී අනුපාතය යම් කිසි සාමාන්‍ය මට්ටමක තබා ගත යුතු නිසා, කොටසක් විතරයි ලබා ගත්තේ. ඒ නිසා, කොතැනින් අඩු කරලාද මේ සහන දෙන්නේ කියන එක අපට දැන ගන්න අවශ්‍ය වෙනවා. මේක දිය යුතුයි. අපි නැහැ කියන්නේ නැහැ. හැබැයි, මාසයක් මේ සහනය ලබා දීම ඇතිද කියන එක පිළිබඳව නැවත ප්‍රශ්න කරන්න වෙනවා. මොකද, අප්‍රේල් මාසයට විතරයි මේ අස්වැසුම දීමනාව වැඩි කිරීම කරලා තිබෙන්නේ. රුපියල් බිලියන 8.5 අප්‍රේල් මාසයට විතරයි. මාසයකින් මේ ප්‍රශ්නය විසඳෙනවාද? ඉහළට ගිය බඩු මිල මාසයකින් පහළට එනවාද? ඒක කරන්නේ කොහොමද?

අනෙක් කාරණය මේකයි. විදුලි බිලට දීලා තිබෙන සහනය දීලා තිබෙන්නේත් මාස තුනකට විතරයි. ඊළඟට, ඉන්ධනවලට දීලා තිබෙන සහනය දීලා තිබෙන්නේත් මාස තුනකට විතරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි, මම අවසන් කරන්නම්.

අස්වැසුම දීමනාව මාසයකට, විදුලි බිලට දීලා තිබෙන සහනය මාස තුනකට සහ ඉන්ධනවලට දීලා තිබෙන සහනය මාස තුනකට වශයෙන් තමයි දීලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, ජනාධිපතිතුමා ඒ ගැන පැහැදිලි කළාද, නැද්ද කියලා. නමුත්, මාස තුනෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න, ජනතාවගේ බඩු මිල ඒ තිබුණු තැනට ගෙන එන්න පුළුවන් කියලා ආණ්ඩුවට යම් කිසි සහතිකයක් දෙන්න පුළුවන්ද? එහෙම කරන්න බැහැ. මොකද, ආර්ථික විද්‍යාව තුළත් කියනවා, "prices are sticky downwards" කියලා. ඒ කියන්නේ, මිල ඉහළ යනවා. තේ කෝප්පයේ සිට අනෙක් හැම දේකම මිල ඉහළ යනවා. හැබැයි, පහළ එන්නේ නැහැ. පහළ ආවත් බොහොම හෙමිහිට තමයි පහළට එන්නේ. ජනතාව ගැන තෙතමනයක් තිබෙන ආණ්ඩුවට ජනතාවගේ දුක තේරුම් ගියා කියලා අපි විශ්වාස කරනවා. ඒ අනුව යම් කිසි විධියකට ඒ අයට ඉලක්කගත සහනයක් දීමේ වරදක් නැහැ කියන කාරණයත් සඳහන් කරන ගමන්, මේ මුදල් ලබා දෙන්නේ කොහොමද කියන එක පිළිබඳව විශ්ලේෂණයක් ලබා දිය යුතුයි කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.54]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මෙම විවාදය සිදු කරන්නේ දෙවන වර කියවීමට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්බන්ධව සහ අනුමැතියට ඉදිරිපත් කර තිබෙන නියෝග සහ රීති පිළිබඳවයි. විශේෂයෙන්ම බාහිර කම්පනයක් නිසා; ලෝක යුද්මය තත්ත්වය නිසා මේ රටට ඇති වෙලා තිබෙන ආර්ථිකමය බලපෑම පිළිබඳවත් සැලකිල්ලට අරගෙන අප ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනවල තිබෙන වැදගත්කම ගැනත් මෙම සාකච්ඡාවේදී විමසා බැලීම වටිනවා කියා මම හිතනවා. මොකද, අපි ආණ්ඩු බලය ගත් දා ඉඳලාම අපට තිබුණු අභියෝගවලින් පළමුවැනිම අභියෝගය විධියට තිබුණේ බිඳ වැටී තිබුණු රට ස්ථාවර කරගන්නේ කොහොමද කියන කාරණයයි. එසේ රට ස්ථාවර කිරීමේදී විවිධ වූ බාධක මැද තමයි එම කටයුත්ත කරන්න සිදු වුණේ. "රට එහෙම ස්ථාවර කර ගන්න බැහැ, ආණ්ඩු කරන්න බැහැ, බිඳ වැටෙනවා" කියා සිදු කළ විවේචන ඉදිරියේත් අපි 2025 වර්ෂයේදී ඉතාම සාර්ථකව ආර්ථික ස්ථාවරත්වය අත්පත් කර ගත්තා. පොදුවේ පිළිගන්නා ඕනෑම ආර්ථික දර්ශකයක් අනුව ගත්තත්, ඒවා ඉතාම විශිෂ්ට මට්ටමක තිබෙනවා. එවැනි තත්ත්වයක් පැවතියදී තමයි අපි කවුරුවත් අපේක්ෂා නොකළ ආකාරයට අපේ රටේ ජනතාවට "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒක බාහිර සාධකයක්. හැබැයි, එමඟින් විශාල ව්‍යසනයක් රටට සිද්ධ වුණා. ඒ සඳහා විසඳුම් ගෙන ඒමට ආණ්ඩුවේ මැදිහත්වීම සිදු කිරීමේදී භාණ්ඩාගාරයට විශේෂ බරක් පටවන්නේ නැතුව එම ජනතාව ඒ තැන්වලින් මුදා ගැනීමේ වැඩසටහනට අපට ප්‍රවිෂ්ට වෙන්න හැකි වුණේ අපි අනුගමනය කළ මූල්‍ය විනයත්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව නිසි පරිදි පවත්වා ගැනීමත් නිසායි. අපේ සාමාන්‍ය වියදම්වලට - ප්‍රාථමික වියදම්වලට - වෙන් කර තිබුණු සියයට 13ට අමතරව රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් අපට ඒ සහන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණා.

මේ මොහොතේදී ජාත්‍යන්තර වශයෙන් ඇති වී තිබෙන යුද තත්ත්වය හමුවේ ආර්ථිකයට ඇති වන කම්පනය ලෝකයේ හැම රටකටම බලපානවා වාගේම අපේ රටටත් බලපානවා. හැබැයි, මේ විශේෂිත තත්ත්වය ගෑස්, ඉන්ධන වාගේ බලශක්ති ක්ෂේත්‍රයටත්, පොහොර වාගේ දේවල්වලටත් තමයි බලපාන්නේ. ඒ අනුව අපි මේ වෙනකොට විවිධ වූ වැඩසටහන් ඒ සඳහා ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ වාගේම මේ හේතුව නිසා පීඩනයට පත් වන සාමාන්‍ය ජනතාව වෙනුවෙන්, ආර්ථිකමය වශයෙන් අපහසුතාවට පත් වන ජනතාව වෙනුවෙන් සහනයක් ලබා දීම සඳහා මැදිහත් වෙමින් ඉලක්කගත මුදල් වෙන් කිරීමක් පිළිබඳවත් අපි සාකච්ඡා කළා.

මට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීතුමා මතු කළා, මේ සඳහා මුදල් හොයා ගන්නේ කොහොමද කියන කාරණය. ඒ සඳහා අතිරේක ඇස්තමේන්තුවක් ගන්නේ නැහැ. අපිට තිබෙනවා, Budget එකෙන් වෙන් වෙලා තිබෙන Budget reserve එකක්. නමුත් ඒ Budget reserve එක මේ සඳහා සියයට 100ක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ සඳහා අපි ඉදිරිපත් කරන සටහනේම - ඉදිරියේදී අපි මේ කරුණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අපි පැහැදිලිව කියා තිබෙනවා, - *[බාධා කිරීමක්]* ඒක තමයි, එය ප්‍රමාණවත් නැහැ කියලා මම කිව්වේ. Budget reserve එක පාවිච්චි කරනවා. නමුත් එය ප්‍රමාණවත් නැති නිසා අපි වෙනත් වැය ශීර්ෂ මාර්ගයෙන් තමයි එම කළමනාකරණය සිදු කරන්නේ. එය සිදු කරන ආකාරය පිළිබඳව විග්‍රහයක් අපි ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

විශේෂයෙන්ම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන නියෝගය පිළිබඳවත් සාකච්ඡා කරන මේ අවස්ථාවේ මම සඳහන් කරන්නට ඕනෑ, පනත් කෙටුම්පත් හදනකොට, ඒවාට සංශෝධන ගෙනෙනකොට ඒ සම්බන්ධව න්‍යායයක් නැති බව. ඒ කියන්නේ අවශ්‍යතාව මත අලුතින්ම දේවල් ගෙනෙන්න පුළුවන්. ආණ්ඩුකරණයක් කියන්නේම මෙසේ එකට ගලා ගෙන යන ක්‍රමවේදයක් තමයි. ආණ්ඩු බලය ලබා ගත්තාට පසුව අපිට ඒ මොහොතේ තිබෙන තත්ත්වයට අනුව වාගේම ඉදිරියේදී ඇති වන තත්ත්වයන් අනුව වඩාත් උචිත දේ කිරීමට සිද්ධ වෙනවා. විශේෂයෙන්ම අණ පනත්වලට සිදු කර තිබෙන සංශෝධනවල තිබුණු අඩුපාඩු, ගැටලු විසඳා ගැනීම සඳහා තමයි මේ කටයුත්ත කර තිබෙන්නේ. ඒ අනුව අපි වඩාත් හොඳ සංශෝධනයක් ඒ සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මේකේ තව අඩුපාඩු තිබෙනවා නම් ඒවා ඉදිරියේදී හදා ගන්න පුළුවන්.

ඒ වාගේම මේක මේ පනතට ගෙන එන අවසාන සංශෝධනය නොවෙයි. අපි කවුරුත් දන්නවා, මේවා නිරන්තරයෙන් සංශෝධනයට ලක් වන බව. එය සිදු විය යුතු වන්නේ යහපත්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ආණ්ඩුකරණයේ දිශාව සහ මහජනතාවගේ ඇල්ම වෙනුවෙන්. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ ප්‍රධාන අරමුණ වන්නේ, විශාල පරිමාණයේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම. එහිදී යම් ආකාරයකට සැලකිය යුතු බදු සහන ලබා දීමත්, පරිපාලන පහසුව ඇති කර ගැනීමත් තමයි අපි බලාපොරොත්තු වන්නේ.

ඒ වාගේම ක්‍රමෝපාය සංවර්ධනය කියන්නේ මොකක්ද? විවේචනයක් ඉදිරිපත් කළා, ඒකට නිර්වචනයක් නැහැ, කොහොමද බදු සහන දෙන්නේ, හිතුමතේද බදු සහන දෙන්නේ කියලා. එහෙම නැහැ. ඇත්තටම අපි මේ සංශෝධනයෙන් කරන්නේ මෙයයි. මීට කලින් තිබුණු පනත අනුව BoI එකට හෝ අමාත්‍යවරයාට යම් ඉඩකඩක් තිබුණා, යම් ආකාරයකට discretion එක පාවිච්චි කරන්න. අපි අන්න ඒ discretion එක අයින් කරලා රීති පාදක - rule-based - system එකක් තමයි දැන් හදලා තිබෙන්නේ. එහිදී අපි අවධානය යොමු කරන ප්‍රධාන කාරණා 4ක් තිබෙනවා. ඒ අනුව මේ ආයෝජන ව්‍යාපෘතිවලින් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය සැලකිල්ලට භාජන කරනවා. දැනට ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලදී ක්ෂේත්‍ර තුනටම ඇමෙරිකානු ඩොලර් මිලියන 50 සිට ඇමෙරිකානු ඩොලර් මිලියන 300 දක්වා වූ විදේශ විනිමය ගලා ඒමක් අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම දේශීය රැකියා උත්පාදනයත් මෙහිදී අපි සැලකිල්ලට භාජන කර තිබෙනවා. ඒ වාගේම තාක්ෂණික හුවමාරුව මොන ආකාරයටද සිද්ධ වන්නේ කියන කාරණයත්, යටිතල පහසුකම් සංවර්ධනයත් මෙහිදී සැලකිල්ලට භාජන කරනවා.

ඒ වාගේම මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කලින් පනතට සාපේක්ෂව විශේෂ කොටස් දෙකක් මම ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ තමයි, *ex ante* cost-benefit analysis සහ *ex post* cost-benefit analysis. මෙතැනදී සිදු කරන කාරණය මෙයයි. මුදල් අමාත්‍යාංශය විධියට අපි ස්වාධීනව මෙතැනට මැදිහත් වනවා, ඒ ව්‍යාපෘතිය ගෙන එන අමාත්‍යාංශය හෝ අමාත්‍යවරයා හෝ වෙනත් කෙනෙක් මැදිහත් වනවා වෙනුවට. මේ ව්‍යාපෘතිය පටන් ගන්න කලින්ම මූල්‍ය පිරිවැයත්, ප්‍රතිලාභත් විශ්ලේෂණය කරලා සමාජයීය හා සංස්කෘතික වශයෙන් ගණනය කිරීමකට ලක් කරලා තමයි ඒ අවසරය ලබා දෙන්නේ. ඒ විතරක් නොවෙයි. ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළාට පස්සේ අඛණ්ඩව ඒ සඳහා විමර්ශනය කිරීම් සිදු කරමින් යනවා. අනිවාර්යයෙන්ම වසර 5ක් ගියාට පස්සේ මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා ඒ ගැන විමර්ශනයක් කරන්න ඕනෑ. අදාළ නිර්ණායකවලට ළඟා වෙලා නැත්නම්, ඔවුන් එකඟ වූ දේවල් ඉෂ්ට කරලා නැත්නම් අදාළ ක්‍රියාමාර්ග ගැනීමටත්, ඒ ව්‍යාපෘති නවතා දැමීමටත් කටයුතු කිරීමේ ඉඩකඩ අපට තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අපි දිගින් දිගටම ප්‍රශ්න කළා, "strategic" කියන එකේ definition එක මොකක්ද කියලා. ඒ කියන්නේ අපි technologyවලට ප්‍රමුඛතාව දෙනවාද, වෙන මොනවාට හරි ප්‍රමුඛතාව දෙනවාද කියන එක. ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙන්නේ invest කරන මුදල් ප්‍රමාණය සහ hire කරන labour විතරයි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ උපාය මාර්ග කියන කරුණ ගැන. උපාය මාර්ග කියන්නේ ඉතාම පුළුල් එකක්. ඒකට නිශ්චිතවම නිර්වචනයක් ගෙන එන්න බැහැ. මෙතැනදී ඒ නිර්වචනයට අපි පාදක කර ගන්නේ මෙයයි. ඒකට යම් ආකාරයක subjectivity එකක් තිබෙනවා. ඇත්තටම අවස්ථානුකූලව national interest එක පාදක කරගෙන තමයි මේ කටයුත්ත කරන්නේ. ඒ කටයුත්ත කිරීමේදී අවශ්‍ය කරන නිර්ණායක 4 තමයි මම ඉදිරිපත් කළේ. ඒවා තමයි, විදේශ විනිමය ප්‍රමාණය, රැකියා ප්‍රමාණය, තාක්ෂණික හුවමාරුව සහ යටිතල පහසුකම්. එතකොට යම් subjectivity එකක් තිබෙනවා, ඒ අනුව තමයි තීරණය කරන්නේ national interest එක.

ඊළඟට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ලබා දෙන සහන මොනවාද කියලා අපි අවධානය යොමු කරලා බැලුවොත්, බදු සහන කියන එක පිළිබඳව විවාද තිබෙනවා. ඒ අනුව බදු සහන ලබා දිය යුතුද, ලබා දෙනවා නම් මොන ආකාරයටද දෙන්නේ කියන එක සාකච්ඡා වනවා. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට අනුව මේ බදු සහන සම්බන්ධයෙන් flat තත්ත්වයක් තිබුණා. ඒ කියන්නේ වසර 25ක් සඳහා බදු සහන ලබා දීම කියන එක පොදුවේ තිබුණා. එතකොට ඒ සම්බන්ධව සමාජයේ සාකච්ඡාවක් ගොඩනැඟුණා. එක් අවධියකදී ආයෝජන කැන්දා ගැනීමට බදු සහන ලබා දීම උපාය මාර්ගයක් වෙන්නට පුළුවන්. නමුත් අද තිබෙන තත්ත්වයේදී බදු සහන ලබා දිය යුතු වනවා. නමුත් එය ලබා දිය යුතු වන්නේ යම් නිර්ණායක පාදක කර ගත් ක්‍රමවේදයකට මිස හිතුමතේ විශාල ප්‍රමාණයකින් නොවෙයි. මෑතකදී කරන ලද පර්යේෂණ ගණනාවකදී හොයාගෙන තිබෙනවා, මහා පරිමාණ ආයෝජනයක් සිදු කළාම ඒ සඳහා යන වියදම break even කරගන්න, එහෙම නැත්නම් ආයෝජනය සඳහා වියදම් කරන මුදල සාමාන්‍යයෙන් අවුරුදු 10කින් ආවරණය කරගන්න පුළුවන් කියන කාරණය. ඒ කරුණුත් සැලකිල්ලට භාජන කරලා තමයි ඒ වෙනුවෙන් ගෙවන්න ඕනෑ නැහැ කියලා උපරිම අවුරුදු 10ක බදු සහන කාලයක් අපි ලබා දී තිබෙන්නේ.

ඒත් එක්කම ලෝකයේ මේ වනකොට දියුණු වෙලා තිබෙනවා, යම් නීති-රීති රාමු ගණනාවක්. බදු අය කිරීමේදී මොන රටේද තම ව්‍යාපෘතිය කරන්නේ කියන එක වැදගත් වන්නේ නැහැ. මොකද, ඔවුන්ගේ ආදායම් ලෝකය පුරාම විහිදෙනවා. ඔවුන්ට බහුජාතික සමාගම් තිබෙනවා. ජාත්‍යන්තර මට්ටමින් ඒවා ක්‍රියාත්මක වනවා.

ඒ නිසා වඩාත් සාධාරණයි කියලා අපි යෝජනා කරලා තිබෙනවා, OECD සාමාජික රටවල ලාභය තවත් රටක ඉඳලා තව තැනකට මාරු කර ගැනීම වළක්වා ගැනීමේ අටියෙන් අවම වශයෙන් සියයට 15ක බදු අනුපාතයක් අය කරන එක. අපි එයට කියනවා, BEPS - Base Erosion and Profit Shifting - කියලා. ලෝකයේ පැවතුණු මේ වාගේ තත්ත්වයනුත් සැලකිල්ලට භාජන කරලා තමයි මේ බදු සහන ලබා දීලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සංශෝධනයේ තව විශේෂත්වයක් තිබෙනවා. ඒ තමයි, අදාළ කාල සීමාව ඉක්ම ගියාට පසුව කිසිදු ආකාරයකින් ඒ සහන කාලය දීර්ඝ නොකිරීම.

මොකද, ඒ අවුරුදු 10 ඉක්ම ගිය පසු ඒ අදාළ ව්‍යාපෘතිය විසින් ලාභ පෙන්වන්න ඕනෑ. ඉන් පසු ඒ ලාභ මත අපට ගෙවිය යුතු බදු අනුපාත ටික අපි අය කර ගත යුතු වනවා.

මෙම සංශෝධන පනත් කෙටුම්පත තුළින් අපි වඩාත් අවධානය යොමු කර තිබෙන්නේ, රට අත්පත් කරගෙන තිබෙන තත්ත්වය පිළිබඳවයි. රීති පාදක - rule-based - ආයෝජන ප්‍රවර්ධනයේදී බදු සහනවලට වඩා ඉතා වැදගත් වනවා, ඒ රට අත්පත් කරගෙන තිබෙන තත්ත්වය. විශේෂයෙන්ම දේශපාලන ස්ථාවරත්වය - political stability - මෙහිදී වැදගත් වනවා. අපි කවුරුත් දන්නවා, රට ඇතුළේ ඒ දේශපාලන ස්ථාවරත්වය දැන් ඇති වෙලා තිබෙන බව. ඒ වාගේම ගනුදෙනු කිරීමේදී, ආයෝජනය කිරීමේදී පාරදෘශ්‍යභාවය අවශ්‍යයි. දැන් එය ඉතාම ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ඉතා වැදගත් වන අනෙක් කාරණය තමයි, ව්‍යාපාර කිරීමේ පහසුව - Ease of Doing Business - කියන එක. මෙවැනි කාරණාවලටත් අවශ්‍ය පසුබිම අපි නිර්මාණය කරලා තිබෙන තත්ත්වයකදී තමයි මේ අණ පනත් ඉදිරිපත් කරනු ලබන්නේ.

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - Social Security Contribution Levy එක - සම්බන්ධයෙනුත් සමාජයේ වැරදි අදහසක් පවතිනවා. පොදුවේ ගත්තාම, සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පතේ cascading effect එකක් තිබෙන බව ඇත්ත. නමුත්, වාහන ආනයනයේදී ඒ cascading effect එක එන්නේ නැහැ. ඒකට හේතුව, වාහන ආනයනය කරන අවස්ථාවේදී පමණයි මේ බද්ද පනවන්නේ. ඊට පසුව නැවත මේ බද්ද ගණනය කිරීමක් සිදු වන්නේ නැහැ. කලින් සිද්ධ වුණේ ද්විතීයික වෙළෙඳ පොළේ වාහනය විකුණන අවස්ථාවේදී මේ බද්ද පැනවීම. දැන් ඒක අයින් කරලා, බදු ගණනය කිරීමේ පහසුව ඇති කරලා තිබෙනවා. ඒ වාගේම වෙළෙඳ පොළේ ඇති විය හැකි විකෘති තත්ත්වය අයින් කිරීමත් මේ හරහා සිදුව තිබෙනවා.

ඒ වාගේම අද සම්මත වන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ඉදිරිපත් කළ රීති අනුව, දේශීය ඩොලර් බැඳුම්කර සඳහා අපනයනකරුවන් උපයාගත් මුදල් යෙදවීමේ අවස්ථාව නිර්මාණය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් කරන සංශෝධනවලින් ඇත්තටම සිදු වන්නේ, අපි ලබා ගත් ස්ථාවරත්වය, මූල්‍ය විනය, මූල්‍ය කැපවීම, ඒ වාගේම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව තවදුරටත් ඉදිරියට අරගෙන යෑමට අවශ්‍ය වන පිටුවහල ලබා දීම, ඒ වාගේම ඒ පාරදෘශ්‍යභාවය පෙන්වන ඕනෑම ආයෝජකයෙකුට තමන්ගේ ආයෝජන පිළිබඳව විශ්වාසය ගොඩනඟා ගත හැකි පරිසරයක් නිර්මාණය කිරීම කියන කාරණායි. එයත් සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමකට අවස්ථාව දෙන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කෙටි වෙලාවක් ගන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, SSCL එක වාහනවලට cascade වෙන්නේ නැහැ කියලා. ඒක හරි, ඒකේ අවුලක් නැහැ. අපි අහන්නේ, ඒවා ගැන නොවෙයි. දැන් මේ තිබෙන SSCL එක VAT එකත් එක්ක compare කළොත්, ඔබගේ ගණනය කිරීමට අනුව SSCL එක සියයට 2.5ක් කියන්නේ, VAT එක හැටියට ගත්තොත් කීයක් විතර වෙයි කියලාද ඔබතුමා හිතන්නේ? VAT එක කියන්නේ, value-added. SSCL එක PST එක වාගේ ගෙවන්න ඕනෑ එකක්. එතකොට අපි compare කරන්න ඕනෑ, අඹ සහ අඹ නේ. අඹ සහ අන්නාසි compare කරන්න බැහැ. අඹ කියන එක VAT එක නම්, එතකොට සියයට 2.5 කියන්නේ, VAT එක හැටියට කීයක් වාගේද? ගරු ඇමතිතුමනි, මම අහන්නේ සරල ප්‍රශ්නයක්.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමා, VAT එකයි, මේකයි පටලවා ගන්න එපා. සම්පූර්ණ VAT යන්ත්‍රණය ඇතුළේ value addition එක මත තමයි VAT එක ගණනය කරන්නේ. VAT එක එකතු කර ගන්න ස්ථාන අනුව එය වෙනස් වනවා. විශේෂයෙන්ම SSCL එකේ ප්‍රශ්නය ආවේ වාහනය ආනයනය කිරීමේදීයි. මොකද, තනි තනි පුද්ගලයන් වාහන ආනයනය කරනවා, පුද්ගලයින් කිහිප දෙනෙක් එකතු වෙලා එය ව්‍යාපාරයක් විධියටත් කරනවා. ඒ කියන්නේ, ද්විතියික විකුණුම් වෙළෙඳ පොළේ. විශේෂයෙන්ම අපි ඒ අයත් එක්ක කළ සාකච්ඡාවක ප්‍රතිඵලයක් විධියට පරස්පරයක් නිර්මාණය වෙලා තිබුණා, වෙළෙඳාමේදී.

විකුණුම් අවස්ථාවේදී එය අය නොවන නිසා තමයි අපි මේ ආනයන අවස්ථාවේදී එකතු කර ගැනීම කරන්නේ. ඒ මඟින් අපි ඇත්තටම බලාපොරොත්තු වෙන්නේ බදුකරණය පිළිබඳ සාධාරණත්වයත්, සමතුලිතභාවයත් ආරක්ෂා කර ගැනීමයි.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE. HON. PRESIDING MEMBER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1, ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (2022 අංක 25 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 2.- (2022ஆம் ஆண்டின் 25ஆம் இலக்க சட்டத்தின் 4ஆம் பிரிவினைத் திருத்துதல்)

CLAUSE 2.- *(Amendment of section 4 of Act, No. 25 of 2022)*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
' "2026 ජූලි මස 1 වන දිනට පෙරාතුව" යන වචන' "

(2) "1 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'(ඇ) 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට' "

(3) "2 වන පිටුවේ, 7 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 5ஆம் பிரிவினைத் திருத்துதல்)

CLAUSE 3.- *(Amendment of section 5 of the principal enactment)*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'වන දින හෝ එදිනට පසු සහ 2026 ජූලි මස 1' "

(2) "3 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
ජූලි මස 1 වන දින හෝ එදිනට පසු' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, as amended, ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම)

வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் முதலாம் அட்டவணையைத் திருத்துதல்)

CLAUSE 4. - *(Amendment of the First Schedule to the principal enactment)*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "3 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
' "කරනු ලබන" යන වචන වෙනුවට, "2026 මැයි මස 1" ' "

(2) "4 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'7. 2026 මැයි මස 1 වන දින සිට ක්‍රියාත්මක' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

***5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත: නියෝග

## விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டம்: ஒழுங்குவிதிகள்

## CONVENTION AGAINST DOPING IN SPORTS ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 2026 සම්බන්ධයෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 16 දිනැති අංක 2471/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත: නියෝගය

## செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்: ஒழுங்குவிதி

## STRATEGIC DEVELOPMENT PROJECTS ACT: REGULATION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 4ඊ වගන්තිය සමඟ කියවිය යුතු 3 වගන්තිය යටතේ සුදුසුකම් නිර්ණායක සහ බදු නිදහස් කිරීම් හෝ බදු දිරි ගැන්වීම් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 පෙබරවාරි 08 දිනැති අංක 2474/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා මහ බැංකු පනත: රීති

## இலங்கை மத்திய வங்கிச் சட்டம்: விதிகள்

## CENTRAL BANK OF SRI LANKA ACT: RULES

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 7(1)(ඇ) වගන්තිය සහ VI වන කොටස සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 ජනවාරි 30 දිනැති අංක 2473/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.17 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

න්‍යාය පත්‍රයේ විෂය අංක 5 අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම

## பாராளுமன்ற நிலையியற் கட்டளைகளைத் திருத்துதல்

## AMENDMENTS TO THE STANDING ORDERS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:-

දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:-

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතළ මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:-

[ගරු බිමල් රත්නායක මහතා]

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතළ මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විවාදය ආරම්භ කිරීම, ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියටත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල යම් වෙනස්කමක් විශේෂයෙන්ම අපේක්ෂා කරන කණ්ඩායමක් විධියටත් අද දවසේ මේ සාකච්ඡාව සම්බන්ධයෙන් අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය වසරකට වැඩි කාලයක් විශේෂයෙන්ම මගේ සභාපතිත්වය යටතේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස් වුණා. ඒ අනුව කමිටු වාර 29ක විතර ප්‍රමාණයක් ඇතුළත විවිධ ආකාරයේ විගණන නිරීක්ෂණ මත පදනම්ව දැනට ආයතන 21ක විතර ප්‍රමාණයක් පිළිබඳව විමර්ශනය කරලා තිබෙනවා. විශේෂයෙන්ම 2022, 2023 වාගේ වර්ෂවල සහ 2024 වර්ෂයේ තිබෙන විගණන නිරීක්ෂණ සහ විගණන වාර්තා මත පදනම් වෙලා අපි ඒ ආයතනවල නිලධාරින් කැඳවා පාර්ලිමේන්තුව තුළ විවිධාකාරයේ සාකච්ඡා මෙහෙයවා තිබෙනවා. ඒ ගැන ජන සමාජයත් දන්නවා. එලෙස ජන සමාජය ඒ ගැන දන්නේ ඒ සාකච්ඡා වීඩියෝ ආශ්‍රයෙන් විකාශනය වන නිසායි. මේ ක්‍රියාවලිය තුළ තිබෙන යම් අනාවරණය වීම් නිසා මේ නිලධාරින්, එහෙම නැත්නම් දේශපාලනඥයන් විශේෂයෙන් පොදු ව්‍යාපාර ප්‍රමාණය මත ක්‍රියා කරපු ආකාරය සම්බන්ධව ජන සමාජයටම අදහසක් තිබෙනවා. ඒ, මේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විධියටයි.

විශේෂයෙන් මෙහිදී අපට නිරීක්ෂණය වන කරුණක් තිබෙනවා. හැම විටම මහජන බලය -මහජනතාව තමන් වෙනුවෙන් තීන්දු තීරණ ගැනීමේ බලය- එහෙම නැත්නම් මේ ආයතන පද්ධතිය මෙහෙයවීමේ බලය මැතිවරණයකදී පාර්ලිමේන්තුවට පවරා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළින් තමයි මහජන බලය නියෝජනය වෙන්නේ. ඒ මහජන බලය ඇසුරෙන් තමයි කැබිනට් මණ්ඩලයක් පත් වෙලා, ඒ කැබිනට් මණ්ඩලය හරහා ලේකම්වරුන්ට, එහෙම නැත්නම් එතැනින් එහා සිටින රාජ්‍ය නිලධාරින් කරා බලය ගමන් කරන්නේ. මහජනතාව විසින් ලබා දීපු බලය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවට ලැබෙනවා. පාර්ලිමේන්තුව සතු ඒ බලය අනුව යම් තීන්දු තීරණ ගනිමින් ඒ ක්‍රියාවලිය කිරීම සඳහා වූ වගකීම ලේකම්වරුන්ගෙන් ආරම්භ වන නිලධාරින් මණ්ඩලයක් වෙත පැවරෙනවා. මේක තමයි ස්වභාවය. මෙන්න මේ ක්‍රියාවලිය තුළ නිලධාරින් බොහෝ විට බැඳෙනවා, තමන් වටා තිබෙන ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වාගේම යම් නීතිරීති පද්ධතීන් සහ චක්‍රලේඛවලට. ඒ නිසා දූෂණ, වංචා සහ නාස්ති වැනි දේවල්වලදී නිලධාරීන්ගේ අතින් සිදු වන වැරදි සමාජය බොහෝ විට දකිනවා. නමුත් ප්‍රශ්නය වුණේ මෙයයි. ඒ ගැන මීට කලිනුත් මේ පාර්ලිමේන්තුව තුළදී අපි නොයෙක් විට ප්‍රකාශ කරලා තිබෙනවා. අද දවසේදීත් ඒ කරුණු මතු වුණා. ඒ වාගේ ආයතන තුළ සිදු වන මූල්‍ය කටයුතු සම්බන්ධවත්, දූෂණ, අක්‍රමිකතා සහ වංචා වැනි ක්‍රියා සම්බන්ධවත් විමර්ශනය කිරීම හෝ දඬුවම් පැමිණවීමේ ක්‍රියාවලියක් තුළින් ඒ නිලධාරින් අධෛර්යට පත් වෙනවා කියලා සාකච්ඡාවට ගන්නවා.

මේක ඉතාම වැරදි සහගත ප්‍රකාශයක්. ඒකට හේතුව මෙයයි. මේ රටේ තිබෙන මේ ආයතන පද්ධතිය තුළ ඉන්න බොහොමයක් නිලධාරින් අන්න අර කියපු තමතමන්ට නියම වුණු සීමා තුළ වැඩ කරමින් ඉන්නවා. පසුගිය දවස්වල අපි කරපු සියලුම පාහේ විමර්ශනවලදී බොහෝ විට දකින්න ලැබුණා, එලෙස ලැබී තිබෙන බලය භාවිත කරන ආකාරය සම්බන්ධව ඒ නිලධාරින්ට නිවැරදි අදහස තිබුණත් ඔවුන්ව සමහර අවස්ථාවලදී වෙනත් තීන්දු තීරණ මඟින් මෙහෙයවා තිබෙනවාය කියන එක. ඒ කොටස හෙළිදරව් වෙන්නේ නැහැ, සාමාන්‍ය විගණන ක්‍රියාවලියක් තුළ. ඒ නිසා තමයි COPE, COPA වාගේ කමිටු මේ පිළිබඳව විමර්ශනය කරලා ඒ හෙළිදරව් කිරීම් කරන්නේ.

ඒ නිසා, එවැනි දේවල් නිරාවරණය වන අවස්ථාවලදී කටයුතු කිරීම සඳහා අපට යම් නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමේ පහසු ඉඩකඩක් අවශ්‍ය වෙලා තිබෙනවා. මෙන්න මේක අත්‍යවශ්‍ය කාරණයක්. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. ඒ විධියට බලය හුවමාරු වෙනකොට, එහෙම නැත්නම් නිලධාරින් කරා බලය හුවමාරු වෙද්දී, එසේ බලය ලැබෙන නිලධාරින් තමන්ගේ බලයේ සීමාවන් ඇතුළේ කටයුතු කරනවාද, නැද්ද කියන එක හොයා බලා එසේ කටයුතු කිරීම සඳහා promote කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ සඳහා ධෛර්යවත් කළ යුතුයි. ඔවුන් ඒ සීමාවන් ඇතුළේ වැඩ කරන්න ඕනෑ. එතකොට තමයි ඔවුන්ගේ ආරක්ෂාවත්, මේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවත් කියන දෙකම රැඳෙන්නේ.

ඒ වාගේම, විශේෂ අවස්ථාවලදී නිලධාරින්ට යම් කටයුත්තක් ඊටත් වඩා වැඩි කාර්යක්ෂමතාවකින් හෝ වෙනත් ආකාරයකින් හෝ කරන්න අවශ්‍ය නම් ඔවුන්ට ඒ සඳහා බලය ලැබෙනවා; ඒ සඳහා අවස්ථාව හිමිවෙලා තිබෙනවා. ඒ නිසා ඕනෑම නිලධාරියෙකු තමන්ට ලැබෙන බලයේ සීමාව තුළ කටයුතු කිරීමේ කිසිදු ගැටලුවක් නැහැ. ඔවුන්ට කිසිදු ආකාරයේ ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ වාගේම තමන්ට බලය ලැබෙන සීමාව තුළ වැඩ කරන එක සම්බන්ධයෙන් ඔවුන් කිසිදු ආකාරයේ ගැටලුවක් තමන්ගේ හිතේ ගොඩ නඟා ගන්නේ නැහැ. ඔවුන් ඒකට තමයි කැමැති. යම් නිලධාරින් අතළොස්සක් ඉන්න පුළුවන්, තමන්ට ලැබෙන බලය, ලැබී තිබෙන බලය හෝ ලැබිය යුතු බලයක් අයුතු ලෙස භාවිත කරන්න, එහෙම නැත්නම් අවභාවිත කරන්න පෙලඹෙන. නමුත්, ඒක හැම කෙනා අතින්ම වෙන්නේ නැහැ. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනෑ දේ තමයි, එවැනි අය සුළු පිරිසක් ඉන්න පුළුවන්; නමුත් බහුතරයක් නිලධාරින් තමන් බැඳී සිටින වගකීමට අනුව, ඒ සීමාවන් ඇතුළේ නිසි ලෙස වැඩ කරන්න එකඟයි කියන එක. නමුත් ඔවුන්ව මෙහෙයවන, ඔවුන්ව පොලඹවන දේශපාලන යන්ත්‍රණ තිබිය හැකියි. ඒක තමයි පසුගිය කාලයේ අපිට දකින්න තිබුණේ. පසුගිය අවස්ථාවල විමර්ශනය කරපු ආයතන 21 ඇතුළේ අපි දැක්කා, සමහර චක්‍රලේඛවලින් පවා, Cabinet Papersවලින් පවා ලබා දෙන්න බැරි බලයක් ඔවුන්

වෙත පැවරීම, එහෙම නැත්නම් නොකළ යුතු දෙයක් පැවරීම වාගේ කාර්යයන්. විශේෂයෙන්ම procurement කටයුතුවලදී ඒවා නියමිත ක්‍රමවේදයන්ට පිටින් කරපු, දේශපාලන තීන්දු ලබා දීලා කටයුතු කරපු අවස්ථා අපි දැක්කා. මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය. මිලදී ගැනීමක් වෙන්න පුළුවන්, සේවා සපයා ගැනීමක් වෙන්න පුළුවන්, යම් procurement එකක් ක්‍රියාත්මක කිරීමේදී දේශපාලනමය වශයෙන් මැදිහත් වෙලා නියමිත පටිපාටියෙන් පරිබාහිර ලෙස පවත්වාගෙන යන්න කටයුතු කළ අවස්ථා තිබෙනවා. පසුගිය දවස්වල කරපු විමර්ශන ඇතුළේ ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. එම නිසා, එවැනි අවස්ථා තවදුරටත් මේ රටේ ඇති වීම වැළැක්විය යුතුයි කියලා අපි හිතනවා. ඒ ගැන හිතලා තමයි අපි කටයුතු කරන්නේ.

COPE එකේදී, ඒ වාගේම COPA එකේදී, ඒ සෑම තැනකදීම අනාවරණය වන කරුණු පිළිබඳව සෘජුව, කල්ගත නොවී - හැකි ඉක්මනින් - තවදුරටත් පරීක්ෂා කොට විමර්ශනය කළ හැකි නිලධාරි යන්ත්‍රණ සහිත ආයතනවලට භාර දී ඒ කරුණු පැහැදිලි කර ගන්න ඕනෑ. අපි දන්නවා, CID එක, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වැනි ආයතන මෙවැනි පරීක්ෂණ සිදු කිරීම සඳහා වෙන් කර තිබෙන ආයතන. එම නිසා පාර්ලිමේන්තු කමිටුවලදී අනාවරණය වන කරුණු මත පදනම් වෙලා, අපරාධමය වරදක් සිදුවෙලා තිබෙනවා නම්, එහෙම නැත්නම් වංචාවක් හෝ දූෂණයක් සිදුවෙලා තිබෙනවා නම්, ඒ සම්බන්ධ කරුණු එම ආයතනවලට භාර දීලා තවදුරටත් පරීක්ෂණ කිරීමේ සහ විමර්ශන කටයුතු කිරීමේ හැකියාවක් රාජ්‍යයට තිබෙන්නට ඕනෑ.

මේ දසවැනි පාර්ලිමේන්තුවට කලින් තිබුණු සෑම පාර්ලිමේන්තුවකම ක්‍රියාත්මක වුණු කෝප් කමිටුවලදී විවිධ විමර්ශන සිදුවෙලා තිබෙනවා. ඒ විමර්ශනවල ප්‍රතිඵලයක් විධියට අඩුම වශයෙන් මාස තුනකට වරක් ඊට අදාළ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ලැබුණාට පස්සේ සිදු වන ක්‍රියාවලිය තමයි, එය අධ්‍යයනය කරලා, චෝදනාවක් තිබෙනවා නම් නඩු මහට යන්න හෝ ඉදිරි පරීක්ෂණ සඳහා යොමු කරන්න එය නීතිපතිවරයාට යවන එක. නමුත්, ඇත්තම කාරණය තමයි, මෙතෙක් කල් එසේ නොවීම. ඒ නිසා තමයි මහජනතාව අහන්නේ, "ඔය COPE එකෙන් පරීක්ෂණ කළාට, නිරීක්ෂණ කරලා මාධ්‍ය සන්දර්ශන පැවැත්වූවාට කිසිම දෙයක් වෙන්නේ නැහැ නේ" කියන කාරණය.

ඕක තමයි ප්‍රධානම දේ. ඒ නිසා මේ ක්‍රියාවලිය ආරම්භ කරපු දවසේ ඉඳලා අපි හිතුවා මෙය අත්‍යවශ්‍යම කාරණයක් හැටියට. මහජනතාව බලාපොරොත්තු වන මෙවැනි කමිටු හරහා හෙළිදරව් වන කරුණු පිළිබඳව නිසි විමර්ශන සිදු කළ යුතු වෙනවා. විමර්ශන සිදු කරලා වැරදි කරන නිලධාරින් හෝ දේශපාලනඥයන් නිශ්චිත ලෙස අදාළ අධිකරණ ක්‍රියාමාර්ග කරා යොමු කළ යුතුව තිබෙනවා. ඒක මහජන බලය ලැබුණු ආණ්ඩුවක වගකීමක්. ඒ නිසා තමයි අපි විශ්වාස කරන්නේ මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හරහා ඒ ප්‍රවේශය ලබාගත යුතුයි කියලා. පාර්ලමේන්තුවේ දැනට පවත්නා 119, 120 යන ස්ථාවර නියෝග වෙනසකට ලක් කරලා අපි විසින් හෙළිදරව් කරගන්නා කරුණු පාර්ලිමේන්තුවේ අනුමැතියකින් පසුව, - සෘජුව නොවෙයි - CID එකට හෝ Commission to Investigate Allegations of Bribery or Corruption වෙත තවදුරටත් විමර්ශනය කිරීම සඳහා යොමු කළ යුතුව තිබෙනවා කියන එක තමයි අපේ යෝජනාව. ඒක තමයි කළ යුතු හොඳම දේ. එහෙම නැත්නම් කාලයේ වැලිතලාවත් එක්ක හැංගිලා යන, එහෙම නැත්නම් මාධ්‍යවල, එළියේ සාකච්ඡා කරලා තවදුරටත් සාකච්ඡා නොකරපු,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම පොඩි වෙලාවකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එළියේ සාකච්ඡා කරලා මාධ්‍යවලට යම් කරුණු ප්‍රමාණයක් ගිහිල්ලා අසම්පූර්ණ කරුණු විධියට තියනවාට වඩා, ඒ සියලුම අයගේ පැත්තෙන් ඔවුන්ව පූර්ණ විමර්ශනයකට ලක් කරන එක ඉතාම හොඳ බව අපි විශ්වාස කරනවා. ඒ සඳහා කාලය ගත වීම අපරාධයක්. ඒ නිසා තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේ හරහා ලැබෙන කෙටි කාලය ඇතුළත අපේ නිරීක්ෂණ මත පදනම් වෙලා වාර්තාව සකස් කරනකොට ඒ මතු වෙන ඒ ආයතනවලට භාර දිය හැකි කරුණු සම්බන්ධව සටහන් කරලා ඒක පාර්ලිමේන්තුවේ සභාගත කරලා පාර්ලිමේන්තුවේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කරලා ඒ කරුණු CID එකට හෝ Commission to Investigate Allegations of Bribery or Corruption වෙත භාර දෙන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඔවුන් ඒ ගැන තවදුරටත් පරීක්ෂණ කරාවි.

මොකද, පාර්ලිමේන්තුවේ COPE එකවත්, COPA එකවත් මේ ආයතන සම්බන්ධව පූර්ණ විමර්ශන කරන ආයතන නොවෙයි. අපි කරන්නේ විගණන නිරීක්ෂණ මත පදනම් වෙලා ඒ ආනුෂංගික කරුණු පිළිබඳ කරන අධීක්ෂණයක්. එතකොට අපට මේක මත පදනම් වෙලා ඒ තැන්වලට යන්න පුළුවන්. ඒක කාටවත් බාධාවක් නොවෙයි. මූල්‍ය පාඩුවක් කරපු, එහෙම නැත්නම් විනය විරෝධී ආකාරයට වැඩ කරපු, අපරාධමය කාරණාවකට සම්බන්ධ වෙච්ච තීන්දු තීරණ තිබෙන්න පුළුවන්. එවැනි කාරණාවලට හයිය දීපු, එවැනි කාරණාවලට තීන්දු දීපු දේශපාලනයත් නිශ්චිත වශයෙන් හෙළිදරව් වෙනවා, එවැනි ක්‍රියාවලියක් හරහා. ඒ නිසා අපි හිතනවා, ඒක අත්‍යවශ්‍යයි කියලා. ඒ නිසා තමයි අපි පාර්ලිමේන්තුවට මේ යෝජනාවලිය ගෙනාවේ. කිසිම නිලධාරියෙක් කිසිසේත්ම මෙම කාර්යයට බිය විය යුතු නැහැ කියන අදහස අපි නැවතත් දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමන්ට බලය පැවරුණු සීමාව ඇතුළේ, අණපනත්, නීති රීති - ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි - සීමා ඇතුළේ හරි විධියට වැඩ කරන, කැපවීමෙන් වැඩ කරන සියලුම නිලධාරින්ට ඔවුන්ගේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන්න, ඒ වෙනුවෙන් කැප වෙන්න, පෙනී සිටින්න උපරිම අවස්ථාවක් මේ සංශෝධනය හරහා අපි රටට ඉදිරිපත් කරනවා කියන කාරණය මතක් කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! විවාදයේ කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.28]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ මේ සභාවේ 225දෙනා වෙනුවෙන්මයි. මාහට සංවිධානාත්මක අපරාධකරුවන්ගෙන් මරණීය තර්ජන පවතින බව මා පවසන කරුණක් නොව, පොලිස් දෙපාර්තමේන්තුව විසින්ම ලිඛිතව තහවුරු කරන ලද කරුණකි. 2025 සැප්තැම්බර් 11වැනි දින පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද, SD/IG/OUT/S-04/02/3647/2025 දරන වාර්තාවෙන් සහ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ වාර්තාවෙන් මා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක් පවතින බව නිල වශයෙන් පිළිගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂය කරුණුවලට අදාළව කථා කරන්න.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිශ්චිත කරුණට අදාළව තමයි දැන් මේ කථා කරන්නේ. මේ තිබෙන්නේ, පොලිස්පතිතුමාගේ නිවේදනය. මේ නිවේදනය අනුව මට පොලීසියෙන් ආරක්ෂාවක් දුන්නා. මේක වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කළා, පොලිස්පතිතුමා ඇවිල්ලා. ඊට පස්සේ පසුගිය 24වන දා ඒ ආරක්ෂාව ඉවත් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ඉවත් කිරීම තුළින් මොකද වෙන්නේ? ඒ සංවිධානාත්මක අපරාධකරුවන් කවුද කියලා පැහැදිලිව කියා තිබෙනවා. මාව ඝාතනය කරන්න ඉන්න කණ්ඩායමේ නම පවා කියා තිබෙනවා. මම **සභාගත*** කරනවා, පොලිස්පතිතුමාගේ ඒ නිවේදනය.

ඒ නිසා මේ වෙලාවේ- [බාධා කිරීමක්] ඒ ගමන, මම ඇහුවා- [බාධා කිරීමක්]

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔය ගැන දැනුවත් කරලායි තිබෙන්නේ.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
පොලිස්පතිතුමා මට ඍජුවම සම්බන්ධ කළා,-*[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණාව සම්බන්ධව පොලිස්පතිතුමා දැනුවත් කරලා තිබෙනවා ලු.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
දැනුවත් කරලා තිබෙනවා. මමත් දැනුවත් කළා. මමයි, නායකතුමායි, පොලිස්පතිතුමායි conference call එකක් දාලා කථා කළා. කථා කළාම එතුමා කිව්වා, ගරු ඇමතිතුමා, bus strike එක මම මෙහෙයවපු හින්දාලු, මේ තීන්දුව ගත්තේ. ඇත්තටම bus strike එක මම මෙහෙයවූයේ නැහැ, ගරු ඇමතිතුමා. තෙල් මිල සියයට 30කින් වැඩි වුණාම ස්වයංක්‍රියව බස් ටික නැවතුණා. එක රැයකින් සියයට 12.1කින් බස් ගාස්තු වැඩි කළාට පස්සේ අපි ආපහු ක්‍රියාත්මක වුණා, ගරු ඇමතිතුමා; ඔබතුමාත් දන්නවා. මොකද, මම ඔබතුමාගේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ඉන්නවා. ගමනාගමනය පිළිබඳව පහසුකමක් දෙන්න කථා කරනවා මිස මම කිසිම දවසක - කවදාවත් - ඒවාට විරුද්ධව කථා කරලා නැහැ. නමුත් මේ කරපු දේ තුළින් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද, කථානායකතුමාගේ නියෝගය, ආරක්ෂක ඇමතිතුමාගේ නියෝගය ඍජුවම උල්ලංඝනය කළා; මගේ ඉන්න ආරක්ෂකයන් දුරකථනය ඔස්සේ අයින් කළා, පිට රටක ඉඳලා. ඒ නිසා මේක අප සියලුදෙනාටම වෙච්ච දෙයක් සේ සලකන්න. මොහොතකටවත් හිතන්න එපා, මම මේ ආරක්ෂාව ඉල්ලා බැගෑපත් වෙනවා, මට ආරක්ෂාව නැතුව ගමේ යන්න බැහැ කියලා. එහෙම හිතන්න එපා. එතුමාගේ නියෝගය අනුව තමයි මට ඒක ලැබුණේ.

මේ වෙලාවේ මට කියන්න තිබෙන්නේ මේකයි. මේ සම්බන්ධයෙන් මම FR application එකක් දැම්මා; චන්දි නඩුවක් දැම්මා. ඒ දෙකම විභාග වෙනවා. FR application එකට leave to proceed හම්බ වෙලා තිබෙන්නේ. ඒක විභාග වෙනවා. ඒවා විභාග වෙන හින්දා දෝ මෙහෙම කරන්නේ කියලා මට සැකයක් තිබෙනවා.

අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා ගැන අපට හරි ආඩම්බරයි. එතුමා අපේ විද්‍යාලයේ. එතුමා මා ගැන කළ ප්‍රකාශයක් මෙන්න තිබෙනවා. මම චන්දි ඉල්ලලා එතුමාට නඩුවක් දාලා තිබෙනවා. ඒ නඩුව කැඳවීමට නියමිත වෙලා, දැනට තුන් වතාවක් කැඳෙව්වා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
රටේත් නැහැ.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ඉන්න වෙලාවක් බලාගෙන ඉන්න අපට බැහැ නේ, ගරු ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සල්ලිත් නැහැ.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
සල්ලි නැත්තේ කොහේද? අර වත්කම් ලේඛනය බැලුවාම පෙනෙනවා නේ, ඕනෑ තරම් සල්ලි තිබෙන බව. එතුමා අපේ විද්‍යාලයේ - අපි එකට ඉගෙන ගත්තු ඉස්කෝලේ - විදුහල්පතිතුමිය ඇදලා දැම්මා, එළියට. අන්න ඒ විදුහල්පතිතුමිය - දුල්මිණී සේනානායක - දැන් pool එකේ. වැරැද්දක් හිතා ගන්න බැහැ. ඉස්කෝලෙට විදුහල්පතිකෙනෙක් නැහැ දැන්. ඒක වෙනම කාරණයක්.

මට කියන්න තිබෙන්නේ මේකයි. මෙතැනදී මම කියනවා, මේක අප සියලුදෙනාගේම වරප්‍රසාද උල්ලංඝනය වීමක් බව. මේ ගැන පරීක්ෂණයක් කරන්න තිබුණා; මම බස් වර්ජනයක් කළාද කියලා ඇමතිතුමාගෙන් අහන්න තිබුණා; එහෙම නැත්නම් කථානායකතුමාගෙන් අවසරයක් ගත යුතුව තිබුණා. අපට ආරක්ෂාව දීපු දෙදෙනාව දුරකථනයෙන් ගෙන්වා ගන්න තරමට, එහෙම කරන තරමට පොලිස් රාජ්‍යයක් බිහි වෙන්න ඉඩ දිය යුතුද? මම පොලීසියේ දඩයමක් වෙන්න එපා. මම මේ පාර්ලිමේන්තුව විශ්වාස කරනවා. අපි 225දෙනෙක් මෙතැනට ඇවිල්ලා ඉන්නවා. අපි ඇවිල්ලා ඉන්නේ මහජන ඡන්දයෙන්. එහෙම නැතුව, වෙනත් හොර පාරකින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා නොවෙයි නේ. තර්ක විතර්ක කළාට අපි සහෝදර මන්ත්‍රීවරු. අපට තවත් අවුරුදු 4ක් තිබෙනවා, එකට ඉන්න. මාව ඝාතනය කළොත් එහෙම්? මොකද, සංවිධානාත්මක අපරාධකරුවෝ දැන් දන්නවා, මා අනාරක්ෂිතයි කියලා. මට ඒ ආරක්ෂාව නොදී සිටියා නම්, වෙනම කථාවක්. ආරක්ෂාව දීලා එක පාරට අයින් කළාට පස්සේ මිනිස්සු දන්නවා, 'මෙයාට කවුරුවත් නැහැ, මෙයාට වැඩක් දෙන්න පුළුවන්" කියලා. ඉතින් එහෙම වෙන්න බැරිද? මගේ ළඟ අදාළ වාර්තා තිබෙනවා; recordings තිබෙනවා. මම ඒවාත් දෙන්නම්. මේ වාර්තා ටිකත් දෙන්නම්. මම මේ අවස්ථාවේ ඒවා **සභාගත*** කරනවා.

මේ කාරණය ගැන පරීක්ෂණයක් කරලා සුදුසු දෙයක් කරන්න, මට නොවෙයි, වෙන කාටවත් මේ වාගේ දෙයක් නොවෙන්න. මට ආරක්ෂාව ඕනෑ නැහැ. මට තනියෙන් යන්න පුළුවන්, ඕනෑම තැනක. මොකද, මම හුඟක් වැඩ කරලා තිබෙනවා. ඒ නිසා තනියෙන් යන්න පුළුවන්. ආසියාවේ උසම පිළිමය හදලා තිබෙනවා. ඉගෙන ගත්තු ඉස්කෝලෙට swimming pool එකක් දීලා තිබෙනවා; බස් රථ දීලා තිබෙනවා. ගරු ඇමතිතුමා, අදත් මම වතුර බවුසරයක් අරගෙන ගිහිල්ලා ප්‍රාදේශීය සභාවට භාර දුන්නා, "මෙන්න මේක ප්‍රාදේශීය සභාවේ පරිහරණයට තියා ගන්න" කියලා. බවුසර් එකක් නැහැ ප්‍රාදේශීය සභාවට. නොමිලේයි වතුර සැපයුවේ. මගේ ළඟ වතුර තිබෙනවා ඇති වෙන්න. ලක්ෂයක් ගත්තත් අහලක්වත් හිඳෙන්නේ නැති ළිං තිබෙනවා මට. ඉතින් මම අද උදේ 9.00ට ගිහිල්ලා ඒක භාර දීලා ආවේ. එහෙම කරන දේශපාලනඥයෙකුට මොකක් හරි සහනයක් ලබා දෙන්න බලන්න. ඒ කියන්නේ, සල්ලි නොවෙයි. මම මෙතැනින් ගන්න සල්ලි ටිකවත් කවදාවත් සාක්කුවේ දමා ගත්තේ නැහැ. මම ඒවාත් ජනතාව වෙනුවෙන් වියදම් කළා. මම තමයි නැඟිටලා පළමුවෙන්ම කිව්වේ, Double Cab එක මට එපා කියලා; ගෙන්වන්නත් එපා කිව්වා මගේ නමින්, Double Cab එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක කියන්නේ සද්භාවයෙන්.

මගේ පුතා බන්ධනාගාරගත වුණා. ඔහු බන්ධනාගාරගත වුණේ මොකද? රෝහිත අබේගුණවර්ධනගේ දුවගෙන් වාහනයක් ගත්තා කියලායි. ඒ වාහනය සද්භාවයෙන් ගත්තේ.

එතකොට එතුමන්ලා Sri Lanka Customs එකට ගිහිල්ලා කට උත්තරයක් දෙනවා, "මේක හොර වාහනයක්, අපි ලියාපදිංචි කළා, RMV එකට ලක්ෂ 30ක් දුන්නා" කියලා. දැන් මාව ගන්න ඕනෑ එකට පුතාව අරගෙන බන්ධනාගාරගත කළා. මගේ කරුමයට හරි හොඳට හරි පොලිස්පතිතුමා ගමේ; අපේ ඇමතිතුමා ගමේ. ඒ ප්‍රබලයෝ ගමේ ඉන්නේ. ඒ අසහනයට, ඒ පීඩාවට මම ලක් වෙලා ඉන්නවා. මට මේක කියන්න වෙන තැනක් නැහැ. ඒ නිසා කරුණාකර මේවා පිළිබඳව විමර්ශනයක් කරන්න. අපව කැඳවන්න. කැඳවලා විමර්ශන කටයුතු කරන්න. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට තවත් වැඩිපුර විනාඩියක් ද, දෙකක් ද ඕනෑ කිව්වා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කාලය පාවිච්චි කරන්න. වරදවා හිතන්න එපා, bus strike එක මෙහෙයවූයේ මම නොවෙයි. පොලිස්පතිතුමා එහෙම තීරණය කරපු එක පිළිබඳව මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.35]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

මම මේ කථා කරන්නේ අවුරුදු 28ක් පාර්ලිමේන්තුවේ සිටීමෙන් ලද අත්දැකීමෙන් උත්තරයක් දීම සඳහායි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීමට අදාළ මේ අදහස යම් විධියකින් හොඳ වුණාට මෙය කරන්න යන ආකාරය එතරම් නිවැරැදියි කියලා මම හිතන්නේ නැහැ. මොකද, ස්ථාවර නියෝග අනුව Committee on Public Accounts සහ Committee on Public Enterprises තුළ ඒ අයට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්. ඒ කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 ව්‍යවස්ථා යටතේ පාර්ලිමේන්තුවට තිබෙන මූල්‍ය බලය සම්පූර්ණයෙන් පාවිච්චි කරන්න කටයුතු කරන්න පුළුවන්. ඒකෙන් ලැබුණු බලය අනුව මෙතෙක් දුර Auditor-General හෝ CIABOC හෝ නීතිපති තුළින් තමයි කටයුතු කළේ.

අද මේ ගෙනැල්ලා තිබෙන යෝජනාව විපක්ෂයේ අපි අනුමත කරනවා. මොකද, ඉදිරියට යම් විධියකින් මේ කටයුතු සිදු වෙනවා. ඒත් මම කියනවා, මේක ඇඟට එතරම් හොඳ දෙයක් නොවෙයි කියලා. මීට පෙර තිබුණු ස්ථාවර නියෝග නිවැරැදි කරලා, ඒක ඉක්මන් කිරීමේ වැඩ කටයුත්තක් කළා නම් මම හිතනවා පාර්ලිමේන්තුවේ පද්ධතියට ඒකෙන් හොඳක් වෙනවා කියලා. මම නිදසුනක් කියන්නම්. මම හිතන විධියට, දක්ෂ නියෝජ්‍ය ඇමතිවරයෙක් තමයි ප්‍රසන්න ගුණසේන කියන්නේ.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

2026 අප්‍රේල් 06වැනි දා "අරුණ" පත්තරයෙන් මම දැන් උපුටා ගැනීමක් කරනවා. එතුමා කියනවා, "වංචා හේතුවෙන් ලංගමට දිනකට කෝටියක පාඩුවක්" කියලා. ඒ කියන්නේ, දැන් සිදු වෙලා තිබෙන දේ අනුව එය බංකොලොත් වීගෙන යනවා. කබීර් හෂීම් මන්ත්‍රීතුමා සභාපති ධුරය දරන Public Accounts Committee එකෙන් මේ ගැන හොයන්න කියලා කෙළින්ම CID එකට කිව්වොත්, මම හිතන විධියට ඒක එච්චර ඔබින්නේ නැහැ. මම මේක ප්‍රායෝගික අත්දැකීමෙන් කියන්නේ. සාමාන්‍යයෙන් විගණකාධිපති වාර්තාව අනුව මේ කටයුත්ත ඉදිරියට ගෙන යනවා නම්- ඒක දැනුත් වෙනවා කියන එක නේ කියන්නේ. ඒ කියන්නේ, අවුරුදු 76ක සාපයට පසුව සිද්ධ වෙන එකක් ගැනයි මේ කියන්නේ. ඕනෑ විධියට නීති රීති ගෙනෙන්න. අපි එපා කියන්නේ නැහැ. හැබැයි, මම කියන්නේ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පාර්ලිමේන්තුවේ කටයුතුවලට මීට වඩා- අපි මේක අනුමත කරන්න බැහැ කිව්වොත් හිතයි අපි මේකට අවසර දෙන්නේ නැහැ කියලා. ඒක නොවෙයි අපි කියන්නේ. මේක නිවැරදි කරන්න. හැබැයි, මේ වාගේ ගෙනෙන්න එපා කියන එක තමයි අපේ ඒකමතික මතය. හැබැයි, සම්පූර්ණයෙන්ම මේක කරන්න ඕනෑ නම් කරන්න. මේක කරන්න එපා කියන එක නොවෙයි අපි කියන්න හදන්නේ. තවත් නිවැරදි කරන්නයි කියන්නේ.

Then, Hon. Presiding Member, I want to speak about an even more important issue, about what is going on today and its impact on government servants. අද රජයේ සේවකයන් ඉතාම භයානකකාරී තත්ත්වයක් තුළින් ගමන් කරන්නේ. රජයේ සේවකයාට අද අභිමත පරිදි වැඩ කිරීමේ අයිතිය - discretionary power එක - සම්පූර්ණයෙන් නැති වෙලා තිබෙනවා. ඔහුට සිදුව තිබෙනවා Auditor-Generalට උත්තර දෙන්න, CIABOC එකට උත්තර දෙන්න, පොලීසිය හා CID එකට උත්තර දෙන්න. මම මේ කියන්නේ, Secretary or Chief Accounting Officer ගැන. AR and FR අනුව කටයුතු කරන්න, Minister සහ Secretary දෙන නියෝග, අණ පනත් ක්‍රියාත්මක කරන්න, උසාවිවලින් දෙන නියෝග අනුව කටයුතු කරන්න ඔහුට සිදු වෙනවා. මෙහෙම වුණාම රජයේ සේවකයා - ඒ මනුස්සයා - බය වෙවී, මොකටද මෙච්චර මේවා කරන්නේ කියලා. වැඩ කරන්නේ නැතිව සිටියොත් කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා හිතාවි. මෙන්න මේක තමයි අද සිදු වෙමින් යන දේ. ඒ නිසා තමයි කියන්නේ IMF එක ඇවිල්ලා කිව්වත්, World Bank එක ඇවිල්ලා කිව්වත් ඒවා ඒ විධියටම කරන්න එපා කියලා. ඒවා ගැන කියන එක හොඳයි. ඒවා අපේ ලංකාවේ තිබෙන දේවලට අනුගත වන විධියට අරගෙන නීති හදන්න ඕනෑ. ඒ මිසක් ඒ සුද්දෝ ඇවිල්ලා කිව්වා කියලා කිසිසේත්ම ඒවා ඒ විධියටම පාවිච්චි කරන්න එපා. අනාථ වෙන දේවල් ගෙනැල්ලා දමනවා. ඔවුන් ඔය අප්‍රිකානු රටවල test case එකක් ගෙනැල්ලා මෙහේ ක්‍රියාත්මන කරනවා.

Sir, now, I want to speak about a much more important matter. But, as a responsible Member of Parliament and a former Minister of Finance, I would refrain from speaking about the financial situation of any bank; there is no need to target any bank and that is not my intention. My intention is to purify the Central Bank, the breaches of which I have personally been taking on. Today, you have the report from the NDB and I must salute them. They have as Chairman, Mr. Sriyan Cooray, a very knowledgeable person and as CEO, Mr. Kelum Edirisinghe, another knowledgeable person. Sir, I am taking this up only for the collective good of the country's banking sector. At the beginning of April, it was revealed that there had been a breach and they reported to the Securities and Exchange Commission that there had been a Rs. 380 million fraud. That Rs. 380 million, by Monday, became Rs. 13.2 billion. That is the reason why I want to highlight this because it is a necessity for the country. And, I say it again, there is no need for me to target any bank at all, but I only want to highlight the operations or the bank supervision of the Central Bank.

Sir, I was even more shocked today. We had the Central Bank before the Committee on Public Finance, and the information they gave us was paltry and it was dangerously placed with no responsibility being taken by them. This is the same Central Bank which dealt with the impact of the Pramuka Bank, Seylan savings and others before. Not only that, even on 12th April, 2022, the country, which was supposed to be sound one week before, suddenly went into a bank delinquency. That same Central Bank states today that they cannot answer Members of Parliament on certain matters, simply because they want to protect the depositor. I am looking at the aspect of protecting the entire banking sector of this country; it is not only the aspect of the depositor that I looking at, but at the entire country's economy.

Now, the most important aspect of all that is this. Where are the oversight committees that are there? There are Board Members in the Central Bank who are independent. Where are the audit committees that are there? Who is the external auditor there? Then, the Central Bank has had online supervision for the last four to five years. That online supervision by the Central Bank is required, they said, because they need to investigate any company at any given time. Now, that same situation is there.

While mentioning former President Ranil Wickremesinghe, who had done a hell of a lot of work, I must say that the independence of the Central Bank is something that this Government must relook at seriously. It is not personal.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මිනිත්තු 3ක කාලයක් අරගෙන මේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේක බොහොම වැදගත් දෙයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලයෙන් විනාඩියක් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ලබා දී තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I sincerely look at this particular issue for the collective good of the country. You have given them independence without any collective responsibility. There

is no growth factor; there is no job creation; there is nothing to say how you are going to lend to important sectors that are there.

So, on that particular basis, the NDB reported a loss of Rs. 380 million, which later became Rs. 13.2 billion. The Central Bank which handles the EPF is investing in that same NDB; the independent Central Bank is basically going and banking its funds in that.

So, where is the Oversight Committee? Where is the internal audit? Where is the internal control? The Central Bank's Bank Supervision Department had been established under the Central Bank of Sri Lanka Act, No. 16 of 2023. Section 82(a), bank supervision. And, banks have a normal rotational principle. Normally, banks are very concerned that no one person would go through the same situation. So, there is a rotational principle. And, that particular principle has been breached. Even the IMF has a concern that the Central Bank's internal bank supervision is very weak. They have mentioned it in the Governance Diagnostic Assessment, 2023 as one of the grave concerns. So, on that particular basis, I want you to ensure that the banking sector is protected. Once again, the media should not use this in the wrong way because the banking sector is very safe. This is one bank where such an incident had been reported and they must be congratulated for bringing it out without fear.

I am only referring to the Central Bank. Look at their AGM Reports. Sir, I am **tabling*** these documents and I want, with your permission, to print these.

This is page 347 of the Financial Report of the NDB. They have mentioned that in the year 2024, the gross financial assets were Rs. 3.1 billion. This particular one had been further qualified in to 2025. They say those have gone up to Rs. 12.2 billion or twelve billion and two hundred million rupees.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, on that particular basis, what has the Central Bank's Bank Supervision Department done? What have the internal auditors done on this matter? The reason why I am bringing this out is, this had been stealthily swept under the carpet. However, when we asked about this from the Central Bank officials today, they said they do not want to open it because they do not want to divulge.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
They are only ensuring that their incompetency is not highlighted. That is the reason. So, I want to tell the most senior Minister here, the Hon. Bimal Rathnayake, please look into that. I am saying with all sincerity that I am not concerned about the Opposition or Government, but in this matter, I am more concerned about the economy of this country. I have been fighting for this passionately. There has been personal battering, but that does not matter. I only say, protect Sri Lanka.

The Hon. Eranga Weeraratne is here. I mentioned that the Cargills Bank had a cyberattack and Hon. Weeraratne, look into that.

Another one is the Sampath Bank. The forensic department has stated that Sampath Bank has indulged in forgery of documents. Due to lack of time, I would like to get your permission to print these entire documents in the Hansard. **table*** these with your permission, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I do not want to labour the point any further. I wanted to speak in the morning, but there was a time constraint. However, I thought, with this opportunity I had in this Debate on Amendments to the Standing Orders, of bringing up both aspects. Please ensure that the banking sector is protected; please take it up in the Cabinet and ensure that you do it. I have no need to target any bank at all. But, we need to strengthen the balance sheets of all banks and the Central Bank's Bank Supervision Department. If not, close it down and get a better system to be operative.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Finally, Sir, thanking you for giving me this opportunity, I would say, together, let us strengthen the banking system and the economy, bring out the incompetency or inefficiency of the Central Bank and make it a running system.

We met the IMF delegation last week in Parliament. We asked them, "You are concerned about collecting revenue; the Central Bank is concerned about maintaining rupee

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවී කරුණානායක මහතා]

stability and who is there to ensure growth of this country?" මේ රටේ වර්ධන වේගය කවුද බලන්නේ? ඒක ආණ්ඩුව බලන්න ඕනෑ. මේකට කවුරුත් ඉඩ දුන්නේ නැති වුණාම ප්‍රශ්නය එන්නේ අන්න එතැනටයි. අන්න ඒ හැඟීම ඇතිව අපට රටේ ආර්ථිකය හදන්න අවශ්‍යතාව තිබෙන නිසා මම කාරුණිකව ඉල්ලනවා, මේ රටේ ආර්ථිකය හදන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.46]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ඉතාම වැදගත් තීරණාත්මක කාරණාවක් පිළිබඳව අද අපි විවාද කරනවා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 සහ 120 යටතේ පිහිටුවා තිබෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් ඒ සභාවලට පැවරෙන වගකීම අනුව අදාළ ආයතනවල විගණන වාර්තා පරීක්ෂා කරලා, ඒ ඒ ආයතනවල ඇතිවෙලා තිබෙන යම් යම් ගැටලු, මූල්‍ය අකාර්යක්ෂමතා, මූල්‍ය වංචා පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කරනවා. ඒ සඳහා මේ කාරක සභාවලට බලය පවරා තිබෙනවා. මට අදාළව ගත්තොත්, විශේෂයෙන්ම රජයේ ආයතන 830ක් කැඳවීමේ හැකියාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අපට තිබෙනවා. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළු ආයතන 830ක් මේ කමිටුව හමුවට කැඳවන්න අපට පුළුවන්.

මේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය පිළිබඳව සමාජයේ තිබෙන්නේ වෙනම අදහසක්. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා COPA එකේ වගකීම අපි ගත්තාට පස්සේ, මේ පිළිබඳව අවධානය යොමු කරපු රාජ්‍ය නිලධාරින්, ඒ වාගේම සමාජයේ වග කිවයුතු පුරවැසියන් දශක ගණනාවක් පුරාවට මේ කමිටු පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරලා අපට දැනුම් දුන්නා, මේ කමිටු කියන්නේ තවත් එක් කථා සාප්පුවක් විතරයි කියලා. වංචා, දූෂණ දිනෙන් දින වැඩි වෙලා, හොරකම, වංචාව සමහර පුද්ගලයන්ගේ ලේවලට කිඳා බැහැලා තිබුණු රටක් මේක. ඒ නිසා මේ කමිටුවලට ලොකු චෝදනාවක් සමාජයේ තිබුණා, කථා කරනවා, සාකච්ඡා කරනවා විතරයි, රටේ ධනය විනාශ කරනවා විතරයි, එතැනින් එහාට යම් ක්‍රියා මාර්ගයක් ගන්න සමත්වෙලා නැහැ කියලා. අපි බලය ගනිද්දීත්, බලය ගත්තාට පස්සේත් දරපු ස්ථාවරය තමයි හොරකම, වංචාව, දූෂණය නතර කරන්න ඕනෑය කියන එක. ඒ සඳහා රාජ්‍ය ආයතන ටික ඉතාම හොඳින් කළමනාකරණය කර මෙහෙයවා ගත යුතුයි කියන ස්ථාවරයක අපි ආණ්ඩුව විධියට ඉන්නවා. ඒ අනුව තමයි අපි මේ සෑම කමිටුවකටම මැදිහත් වෙමින් තිබෙන්නේ. විපක්ෂය ප්‍රතික්ෂේප කළාට පස්සේ COPA එකේ සභාපති ධුරය මම බාර ගත්තේ පුංචි කාලයකට.

ආයතන කිහිපයක් කැඳවනු ලැබුවා. රටේ කීර්තිමත් ආයතන කිහිපයක් අපි කැඳවනු ලැබුවා. වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ ආයතනවල ක්‍රියාවලීන් ගත්තාට පස්සේ සමහර රාජ්‍ය නිලධාරින් තමන්ගේ විෂය පථය ඉක්මවා වැඩ කරපු අවස්ථා තිබුණා. ආයතන සංග්‍රහය, චක්‍රලේඛ, මූල්‍ය රෙගුලාසි පිළිබඳ අවධානය යොමු කරන්නේ නැතුව එවකට තිබුණු ආණ්ඩුවල දේශපාලනඥයන්ගේ වුවමනාවන් වෙනුවෙන් ඒ සියල්ල වෙනස් කරලා කටයුතු කරලා ඒ ආයතන ලොකු අපහසුතාවකට පත් කරපු අවස්ථා තිබුණා. ඒ වාගේම ඒවාට මැදිහත් වෙච්ච දේශපාලනඥයෝ රුපියල් මිලියන ගණන් නාස්ති කරපු අවස්ථා අපි හඳුනා ගත්තා. අපේ රටේ තිබෙන පැරණිම ආයතනයක්, පාර්ලිමේන්තුවේ තිබෙන පැරණිම කමිටුවක් තමයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව. ඉතිහාසයේ කවදාවත් මේ කමිටුව හරහා කරපු විගණන වාර්තා නිරීක්ෂණය ඇතුළේ කමිටුව නිර්දේශ කරලා, පාර්ලිමේන්තුවට ඒ වාර්තාව ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවේ වාද විවාද කරලා ගත් තීන්දුවක් තිබුණේ නැහැ. හැබැයි, මේ වෙලාවේ අපට සතුටින් කියන්න පුළුවන් මෙන්න මේ කාරණය. අපි මේ කමිටුවල වාඩි වෙලා පුංචි කාලයක් වෙනවා. ඒ අවුරුද්දයි මාස 5ක ආණ්ඩුව ඇතුළේ ඉතිහාසයේ පළමුවෙනි වතාවට දේශපාලකයෙකුට එල්ල වෙච්ච චෝදනාවක් මත සබරගමු පළාත් සභාවේ හිටපු මහ ඇමතිවරයෙක් තමන්ගේ සීමාව ඉක්මවා ඉන්ධන පරිභෝජනය කරපු එකේ මුදල නැවත පළාත් සභාවට ගෙවන්න කටයුතු කරනු ලැබුවා, පසුගිය දවසේ COPA එකේ කාර්යභාරය නිසා. ඒ වාගේම හිටපු ආණ්ඩුකාරවරයෙක් තමන් අයථා ලෙස පරිහරණය කරපු ඉන්ධන වෙනුවෙන් ගෙවීමක් කරන්න COPA එකේ නිර්දේශ මත කටයුතු කරලා තිබුණා. මෙන්න මේ වාගේ කටයුතු කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. එහෙම නැතුව රාජ්‍ය නිලධාරින් කොටු කරන්න මේ කමිටු කැඳවනවා නොවෙයි.

රාජ්‍ය නිලධාරින්ට, ආයතනවලට උදවු කිරීම සඳහා මේ විගණන වාර්තාව අනුව තිබෙන චෝදනා ටික නිවැරදි කරගෙන ඉතාම හොඳ රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා තමයි මේ කමිටු ක්‍රියාත්මක කරමින් ඉන්නේ. හැබැයි, තමන්ගේ විෂය පථය ඉක්මවා වැඩ කරපු සමහර නිලධාරිනුත් හිටියා. වාහන ගෙන්වද්දී, අත් ට්‍රැක්ටර් ලංකාවට ගෙනැල්ලා ඒකේ number එකට බෙන්ස් රථ ලියාපදිංචි කරපු සමහර ආයතන තිබුණා. අත් ට්‍රැක්ටරය ගෙනැල්ලා තිබෙනවා. වරායෙන් එළියට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, එහි chassis number එකට ලියාපදිංචි කරලා තිබෙන්නේ ප්‍රාඩෝ එකක්. ඒවා මේ දූෂිත නිලධාරින්ගේ ගනුදෙනු. මේවා නතර කිරීම සඳහා තමයි පාර්ලිමේන්තුවේ කමිටු හඳුන්වා දීලා තිබෙන්නේ. රාජ්‍ය මූල්‍ය විනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ මූල්‍ය විනය රකිමින් රටේ ජනතාවගෙන් එකතු කරන බදු මුදල් ටික නිසි ආකාරයෙන් කළමනාකරණය කරන එක සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න පාර්ලිමේන්තුවට හැකියාව තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරද්දී, එහිදී සිදු වන අඩුපාඩු හඳුනා ගැනීම සඳහා තමයි රාජ්‍ය යන්ත්‍රණය විධියට විගණකාධිපතිතුමාගේ මූලිකත්වයෙන් විගණන දෙපාර්තමේන්තුව තිබෙන්නේ. ඒ විගණන වාර්තාව තමයි අපි පරීක්ෂා කරන්නේ. එහිදී හසුවන යම් යම් ගැටලු නිරාකරණය කරන්න අපි කටයුතු කරනවා.

හැබැයි, ඉතිහාසයේ පළමුවෙනි වතාවට පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු ආදර්ශයට යමින් මේ ස්ථාවර නියෝග වෙනස් කරලා කටයුතු කරන්න මෙවර අපි සූදානම් වෙලා තිබෙනවා. COPA කමිටුවේදී සාකච්ඡා කරලා නිර්දේශ ඉදිරිපත් කරලා, එම වාර්තාව පාර්ලිමේන්තුවට දැම්මාට පසුව විෂය බද්ධ ඇමතිවරයාගේ නිර්දේශත් ලැබුණාට පස්සේ පාර්ලිමේන්තුවේ ඒ සම්බන්ධයෙන් විවාදයක් කරලා වංචාවක්, දූෂණයක් සිදු වෙලා කියන නිගමනයකට එනවා නම්, නැවත කමිටුවට පවරලා කමිටුව හරහා අදාළ ආයතන - නීතිමය ආයතන - දැනුවත් කරන්න පාර්ලිමේන්තුව නිගමනය කරනවා. මෙතැන වැරදි අදහසක් කියැවුණා කමිටුවෙන් තමයි එකපාරම නීතිමය ආයතනවලට

පවරන්නේ කියලා. නැහැ, වැරදියි. මේ හදලා තිබෙන වෙනස ඇතුළේ අපි ස්ථාවර නියෝග වෙනස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තුවේ විවාද කරනවා. ආණ්ඩු පක්ෂය, විපක්ෂය අදහස් ඉදිරිපත් කරලා නිගමනයකට එනවා නම් මේක ඇතුළේ වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා කියලා, එම වංචාව පිළිබඳව සොයා බැලීම සඳහා නීතිමය ආයතනවලට - CID එකට වෙන්න පුළුවන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට වෙන්න පුළුවන් - පවරන්නට පාර්ලිමේන්තුව තීන්දු කරනවා නම්, නැවත කමිටුවට පවරලා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටුව හරහා තමයි එම අදාළ ආයතන දැනුවත් කරන්නේ. මේක ලංකා ඉතිහාසයේ ස්වර්ණමය අවස්ථාවක්. ඒ වාගේම අද දවස ඉතාම වැදගත්. අවුරුදු 100කට වැඩි COPA ඉතිහාසයේ මෙවැනි අවස්ථාවක් උදා කර ගන්න රටේ පුරවැසියන්ට නොහැකි වුණා. ඒ නිසා අපි සතුටු වෙනවා, රටේ පුරවැසියන් දේශපාලන භේදයකින් තොරව ආණ්ඩු බලය දීලා, සමාජ වෙනසක් ඇති කිරීම සඳහා ජාතික ජන බලවේග ආණ්ඩුව ගෙනැල්ලා, ඔවුන් බලාපොරොත්තු වෙච්ච ඒ සිහිනය, එනම් වංචා, දූෂණ නැති රටක් හදන්න ගත් ඒ තීන්දුව අපි මේ වෙනකොට පාර්ලිමේන්තුව ඇතුළේ ක්‍රියාත්මක කරමින් ඉන්න එක ගැන.

වංචා, දූෂණ කරන දේශපාලනඥයන්ට, චක්‍රලේඛ, රෙගුලාසි, මූල්‍ය රෙගුලාසි උල්ලංඝනය කරමින් කටයුතු කරන ඉතා සීමිත - සියයට එකක්, දෙකක් වෙච්ච - රාජ්‍ය නිලධාරින් පිරිසකට අදාළව කටයුතු කරන්න පුළුවන් වන ආකාරයට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වෙනස් කර ගන්නට ලැබීම රටක් විධියට ඉතිහාසයේ පළමුවෙනි වතාවට අපි ලබපු ජයග්‍රහණයක්. පාර්ලිමේන්තුව ඉතාම තීරණාත්මක ජයග්‍රහණයක් අත් කරගෙන තිබෙන මේ වෙලාවේ අපි රටට, ආදරණීය පුරවැසියන්ට පණිවුඩයක් දෙනවා. ඉතිහාසය පුරා 77 අවුරුද්දක් තිස්සේ තිබුණු පාර්ලිමේන්තු වාගේ නොවෙයි, මේ පාර්ලිමේන්තුව ජනතාව වෙනුවෙන් වග කියන පාර්ලිමේන්තුවක්. ජනතාව ප්‍රාර්ථනා කරපු රට හදද්දී වංචා, දූෂණ අවම කිරීම සඳහා ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගැනීමට කමිටුව විධියට අපිත්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවත් සූදානම් කියන පණිවුඩය තමයි අවසාන වශයෙන් අපට දෙන්න පුළුවන් වන්නේ. මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.55]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග පිළිබඳව සාකච්ඡා කරන්න කලින් මා පළමුවෙන්ම මේ කාරණය ගැන කියන්න ඕනෑ. රවී කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා, ලංකාවේ බැංකුවක සිදු වී තිබෙන වංචාවක් පිළිබඳව. එම වංචාව පිළිබඳව හෙළිදරව් කරගෙන තිබෙනවා. ඒ අනුව එහි වැඩ කරන ලද සේවකයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් දැනට බිලියන 13.2ක පමණ වංචාවක් සිදු වෙලා තිබෙනවා කියන එක දැනට ඔප්පු වී තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගරු ජනාධිපතිතුමාත් මැදිහත් වී සිටින බව අපි වගකීමෙන් කියන්න කැමැතියි. මේ බැංකුවේ මුදල් තැන්පත් කර තිබෙන තැන්පත්කරුවන්ට කිසිම ආකාරයකින් බලපෑමක් සිදු වන්නේ නැහැ. බැංකුව පවත්වාගෙන යද්දී යම් ආකාරයකට ඔවුන් තබාගත යුතු ප්‍රාග්ධනයක් තිබෙනවා. මට මතක හැටියට, සාමාන්‍යයෙන් ඒගොල්ලන්ගේ මූලික capital එකෙන් සියයට දහතුනයි දශම ගණනක් තබාගත යුතුයි. මේ බැංකුවේ සියයට 16කට ආසන්න මුදලක් තිබෙනවා. එම නිසා බැංකුවට කිසිම බලපෑමක් ඇති වෙන්නේ නැහැ. තැන්පත්කරුවන්ට අදාළව ගත්තොත්, ඔවුන්ගේ තැන්පතුවලට බාධාවක් ඇති වෙන්නෙත් නැහැ. අපි මේ රටේ මූල්‍ය විනය නියමිත ආකාරයට පවත්වාගෙන යනවා. එතුමා බය වෙනවා වෙන්න පුළුවන්. මොකද, එදා එතුමා මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දී තමයි මහ බැංකු මංකොල්ලය සිද්ධ වුණේ. එතුමාගේ නායකයා වන රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැතිවරයා වශයෙන් සිටියදී තමයි මහ බැංකුව කැඩුවේ. නමුත්, අපේ ආණ්ඩුව යටතේ එහෙම වෙන්නේ නැහැ. බැංකුවල සිද්ධ වෙන දූෂණ සම්බන්ධව බැංකුවල අයිතිකරුවන් සහ ප්‍රධාන නිලධාරින් වග කියන්න ඕනෑ. එතැන අභ්‍යන්තර විගණනවල යම්කිසි ගැටලුවක් තිබෙනවා නම් ඒක මහ බැංකුවේ මැදිහත් වීමෙන් විසඳා ගන්න අවශ්‍යයි. නමුත් බැංකුවට අදාළව ගත්තොත්, බැංකුවේ කඩා වැටීමක් නැහැ. ඒක තමයි අපට දෙන්න තිබෙන පළමුවැනි පණිවුඩය.

වහපු තෙල් ෂෙඩ් එකක photo එකක් දාලා, ලංකාවේ කටයුතු කරන foreign media දෙකක් අනවශ්‍ය විධියට messages දාලා තිබෙනවා මම දැක්කා, ලංකාවේ economy එක paralyse වෙලා කියලා. මේ වනවිට ලෝකයේ යම්කිසි යුද්ධමය තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා අපි කවුරුත් දන්නවා. ඒ ලෝක තත්ත්වය අනුව තෙල් මිල වැඩි වීමත් එක්ක රටවල ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. නමුත් ලංකාව ඇතුළේ ෂෙඩ්වල පෝලිම් තිබෙන්නේ කොහෙද? ෂෙඩ් වහලා තිබෙන්නේ කොහේද? අපි කියන්න කැමැතියි, මාධ්‍යවේදය යොදා ගෙන රටට එරෙහිව කටයුතු කරන මේ වැඩසටහන වැරැදියි කියන එක. බැංකු කඩාගෙන වැටෙනවා කියලා මතයක් හදන්න පුළුවන්. කවදා හරි වහපු ෂෙඩ් එකක photo එකක් දාන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ලෝකයේම තිබෙන තත්ත්වයක් බව ඔබතුමාත් දන්නවා. මම හිතන විධියට, පසුගිය දවස්වල ඕස්ට්‍රේලියාවේ විතරක් ෂෙඩ් එකසිය ගාණක් වහලා තිබුණා. කොහේ හෝ වෙනත් රටක ෂෙඩ් වැහුවාට අපි වහලා නැහැ. ඇත්තටම ගත්තොත්, ලංකාවේ පෝලිම් නැහැ. තෙල් සැපයුම sure නිසා තමයි අපි බදාදා නිවාඩු දවසත් නැති කළේ. එහෙම තිබෙද්දී, එකක් AFP, අනෙක් එක Al Jazeera ඒ ආකාරයෙන් කටයුතු කරලා තිබෙනවා මම දැක්කා; මම ඒක quote කරලා තිබුණා. මම ඇත්තටම කනගාටු වෙනවා, ලංකාවේ ආර්ථිකය සියයට 5.2කින් වර්ධනය වෙද්දී ඉතාම negative පින්තූර දමමින්, කරුණු - facts - මත පදනම් නොවී මෙහෙම කටයුතු කරන එක ගැන. මේ කාගේ වුවමනාවද ඉටු කරන්නේ? සමහර විට පරණ පාලකයා නැවතත් බලයට ගෙනෙන්න ආසාවක් තිබෙනවාද දන්නේ නැහැ. ඒවා නැවත මේ රටේ වෙන්නේ නැහැ. මේ රටේ ජනතාව අපට වඩා හොඳ ආණ්ඩුවක් මිසක්, අපට වඩා නරක ආණ්ඩුවක් නැවත ගෙනෙන්නේ නැහැ. ඒක මතක තබාගන්න. අපට වඩා හොඳ ආණ්ඩු එන්න පුළුවන්. එකේ ප්‍රශ්නයක් නැහැ. ආයෙත් රාජපක්ෂලා, රනිල්ලා එන්නේ නැහැ. ඒවා ඉවරයි. ඒක කවුරුත් මතක තබාගත්තොත් හොඳයි කියලා මම හිතනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, මේ ස්ථාවර නියෝග වෙනස් කිරීමට කටයුතු කළේ මේ පාර්ලිමේන්තුවේ එදා මෙදා තුර COPE එකේ සහ COPA එකේ හිටපු, දූෂණයට විරුද්ධව කටයුතු කරපු මන්ත්‍රීවරු රාශියක් දරපු අදහසක් මත බව. මොකද, COPE එක, COPA එක, Auditor-General's Department එක සහ පාර්ලිමේන්තුවේ නිලධාරින් මේ investigations කරන්න විශාල මහන්සියක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හොඳින් ම දන්නවා, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, විජයදාස රාජපක්ෂ හිටපු ඇමතිතුමා, අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා මේ කටයුත්ත සඳහා ලොකු මහන්සියක් දරපු බව. (වෛද්‍ය) නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමාත් එහෙමයි. COPE එක පැවැත්වෙන පැයක, දෙකක වැඩේ විතරක් නොවෙයි මෙහි තිබෙන්නේ. ඒ වෙනුවෙන් අතිවිශාල කාලයක් මේ අය වැය කරනවා. මට හිතෙන විධියට Dr. Nishantha Samaraweera, MBBS එකට වඩා COPE එකේදී මහන්සි වනවා, හොරකම් අල්ලන්න, ඒ reports ලබා ගන්න. ඒවා ලෙහෙසි නැහැ. අද සිටින හොරුන් smart. ඒගොල්ලන් ගැන්සි පිටින් තමයි හොරකම් කරන්න plan කරන්නේ. මේ අය investigation arm එකකුත් නැතිවයි මේ වැඩ කරන්නේ. COPE එකට investigation arm එකක් නැහැ. එවෙලේම තමයි ප්‍රශ්න අහන්නේ. Auditor-General තමයි එතැනට යමක් දෙන්නේ. Auditor-General වාගේම මේ පාර්ලිමේන්තුවේ නිලධාරිනුත් ඒ වෙනුවෙන් අතිවිශාල මහන්සියක් දරනවා.

අපි පැහැදිලිව දන්නවා, අපේ රටේ රාජ්‍ය නිලධාරින්ගෙන් සැලකිය යුතු යම් ප්‍රමාණයක් අතිවිශාල ලෙස දූෂණයේ යෙදෙන බව. ඒ වාගේම නොසැලකිලිමත් ලෙසත් කටයුතු කරනවා. එහෙම කරන්නේ දේශපාලනඥයින්ට බයේ විතරක්ම නොවෙයි. ඒගොල්ලන්ගෙන් කොටසක් දූෂිතයි, කොටසක් කම්මැළියි, කොටසක් නොසලකා හරිනවා, කොටසක් දැක්කේ නැහැ වාගේ ඉන්නවා. ඒවා බොරු නොවෙයි. මමත් COPE එකේ ඉඳලා තිබෙනවා. Central Bank එකේ වංචාව බලන්න, ඒ සමහර දේවල් අපි දැකපු දේවල්. ඇස් පනාපිටම වැරදිවලට උදවු කරනවා. ඒ නිසා රජයේ නිලධාරින් සියලු දෙනාටම දෙවිවරු වාගේ, නැත්නම් වෙනත් විධියකට සලකන්න ඕනෑ නැහැ. ඒගොල්ලන් අතරත් වැරදි කරන පිරිසක් ඉන්නවා. COPE එකේදියි, COPA එකේදියි මේ අය දරන මහන්සියෙන් රටට යම් ප්‍රයෝජනයක් ලැබිය යුතුයි. මේවා විශාල පොත් විධියට අච්චු ගහලා දැම්මාට වැඩක් නැහැ. කරු ජයසූරිය හිටපු කථානායකතුමාගේ කාලයේදී Standing Orders amend කරද්දි පවා අපි මේ යෝජනා ඉදිරිපත් කළා. ඒ වෙලාවේ අන්ත දූෂිත ආණ්ඩුවක් තිබුණු නිසා ඒ යෝජනා අනුමත කරන්න ඉඩ දුන්නේ නැහැ. මමත් හිටියා, Standing Orders වෙනස් කරන්න පත් කරපු ඒ Committee එකේ. ඒ වෙලාවේ ඒකට අවසර දුන්නේ නැහැ. නමුත් දැන් අපි අවසර දීලා තිබෙනවා, ආණ්ඩු පක්ෂයත් එක්ක එකතු වෙලා. මේකේ තිබෙන්නේ, *ad hoc* විධියට COPE එකෙන්, COPA එකෙන් නීතිපතිතුමාට යොමු කරන එකක් නොවෙයි. COPA එක, COPE එක තීන්දු කරන විශේෂ වංචාවක්, දූෂණයක් තිබෙනවා නම් ඒක යෝජනාවක් විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවෙන් තීන්දු කරන වෙලාවට තමයි ඒක නීතිපතිතුමාට යොමු කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා මතු කරන කාරණය මෙහිදී වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුව තීන්දු කරන දෙයක් තමයි වෙන්නේ.

අද ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා ගැනත් කිව්වා. එතුමා කිව්වේ, බස්වල කොන්දොස්තරලා, ඩ්‍රයිවර්ලා - විශේෂයෙන්ම ලංගමයේ කොන්දොස්තරලා - තවමත් හොරකම් කරනවා කියලායි. ඒක ඇත්ත. ඒ, අපි දාපු කොන්දොස්තරලා නොවෙයි. මේ වාගේ තැන්වල අන්ත දූෂිත තත්ත්වයක් හදලා තිබෙනවා. අපි ඒක අඩු කරගෙන යනවා. නමුත් තවමත් ඒ දෙය සිදු වනවා. ඒක තමයි ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ. එහෙම නැතිව ලංගමයේ සභාපති හෝ වෙනත් කවුරුහරි හොරකම් කරනවා කියලා නොවෙයි එතුමා කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

මේක, පාර්ලිමේන්තු ක්‍රමය ශක්තිමත් කිරීමක්. අනෙක් පැත්තෙන්, ජන වරම ශක්තිමත් කිරීමක්. මොකද, හොරකම් අල්ලන්න දරන ශ්‍රමයට, මහන්සියට ප්‍රතිඵලයක් තිබෙන්න ඕනෑ. අපට ඉන්නේ විගණකාධිපතිතුමියක්. එතුමිය වාගේ ධෛර්යවන්ත කාන්තාවක් තවත් කණ්ඩායමක් එක්ක එකතු වෙලා දරන මේ මහන්සියේ ප්‍රතිඵල රටට අරගෙන දිය යුතුයි. පරීක්ෂණ කියන්නේ, පොත් ගහන එක නොවෙයි. ඒවායේ ප්‍රතිඵල ගෙනැල්ලා දෙන්න ඕනෑ. ඒ අර්ථයෙන් ගත්තොත්, මේ Standing Orders වෙනස් කිරීම අපේ පාර්ලිමේන්තුව, මහ ජනතාවගේ වගකීම පැත්තට තබන අඩියක් බවට පත්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභා අවස්ථාව.

***[පාර්ලිමේන්තුව කාරක සභාව බවට පරිවර්තනය විය.]***
*[பாராளுமன்றம் குழுவாக மாறியது.]*
*[Parliament resolved into a Committee.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පළමුවැනි සංශෝධනය ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "දැනට පවත්නා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4)හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් නව ඡේදය ඇතුළත් කළ යුතු ය."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දෙවැනි සංශෝධනය ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4)හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් නව ඡේදය ඇතුළත් කළ යුතු ය."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව යළි එක්රැස් විය.***
*[பாராளுமன்றம் மீண்டும் கூடியது.]*
*[Parliament resumed.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 5හි සඳහන් ස්ථාවර නියෝග 119(4) හා 120(4) ට අදාළ සංශෝධන කාරක සභාවේදී සලකා බලා යථා පරිදි සම්මත කළ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ සංශෝධිත ස්ථාවර නියෝගයන්හි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වූ යෝජනා" පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 6 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ලංකා ධීවර සංස්ථාව: වාර්ෂික වාර්තාව (2018)
## இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2018)ர் அஅர் அஅன
## CEYLON FISHERIES CORPORATION: ANNUAL REPORT (2018)

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2025.02.14 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.09.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.06ට, 2026 අප්‍රේල් 08වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.06க்கு, பாராளுமன்றம் 2026 ஏப்பிரல் 08, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.06 p.m. until 9.30 a.m. on Wednesday, 08th April, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## ණය සහනදායක ආඥාපනත සමාලෝචනය කිරීම සඳහා වූ කමිටුවේ වාර්තාව: නිර්දේශ
## கடன் இணக்கக் கட்டளைச் சட்டத்தை மீளாய்வு செய்வதற்கான குழுவின் அறிக்கை: விதப்புரைகள்
## REPORT OF COMMITTEE TO REVIEW DEBT CONCILIATION ORDINANCE: RECOMMENDATIONS

1849/2026

**1.ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ණය සහනදායක ආඥාපනත සහ එහි කාර්ය පටිපාටිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ 2025.07.15 දිනැති වාර්තාව ලැබී තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයින් කවුරුන්ද;

(iii) එම කමිටු වාර්තාවේ සඳහන් ප්‍රධාන නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ අනුව මේ වනවිට සිදු කර ඇති පරිපාලන වෙනස්කම් කවරේද;

(v) කමිටු වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීමට අපේක්ෂිත නීතිමය සංශෝධන කවරේද;

(vi) එම සංශෝධන සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ණය සහනදායක මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ණය සහනදායක මණ්ඩලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(iv) 2026 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලය වෙනුවෙන් රජය විසින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடன் இணக்கக் கட்டளைச் சட்டம் மற்றும் அதன் நடவடிக்கைமுறைகளை மீளாய்வு செய்வதற்காக நியமிக்கப்பட்ட குழுவின் 2025.07.15ஆம் திகதிய அறிக்கை கிடைக்கப் பெற்றுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி குழுவின் அங்கத்தவர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி குழுவின் அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள பிரதான விதப்புரைகள் யாவை என்பதையும்;

(iv) அவ்விதப்புரைகளின் பிரகாரம், இதுவரையில் மேற்கொள்ளப்பட்டுள்ள நிருவாக மாற்றங்கள் யாவை என்பதையும்;

(v) குழுவின் அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள விதப்புரைகளின் பிரகாரம், மேற்கொள்வதற்கு உத்தேசித்துள்ள சட்டரீதியான திருத்தங்கள் யாவை என்பதையும்;

(vi) அத்திருத்தங்கள் தொடர்பாக தற்போது நிலவும் முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடன் இணக்க சபை அங்கத்தவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) கடன் இணக்க சபைக்குச் சேவை இணைப்புச் செய்யப்பட்டுள்ள பணியாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) கடன் இணக்க சபைக்கு அரசாங்கத்தால் ஒதுக்கப்பட்டுள்ள 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீட்டின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether the report dated 15.07.2025 of the Committee appointed to review the Debt Conciliation Ordinance and its procedures has been received;

(ii) if so, the members of the said Committee;

(iii) the main recommendations contained in the report of the said Committee;

(iv) the administrative changes that have been made so far in accordance with the recommendations of the said Committee;

(v) the legal amendments expected to be made, in accordance with the recommendations of the Committee report; and

(vi) the current progress regarding the said amendments?

(b) Will he also inform this House -

(i) the number of members of the Debt Conciliation Board;

(ii) their names;

(iii) the number of staff attached to the Debt Conciliation Board; and

(iv) the amount of provisions allocated by the Government for the Debt Conciliation Board for the year 2026?

(c) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

(අ) (i) ඔව්.

(ii) 1. අයිරාංගනී පෙරේරා මිය - සභාපති
(සභාපති - ණය සහන මණ්ඩලය)

2. සුභාෂිණී දයානන්ද මිය - සාමාජික
(ලේකම් - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව)

3. බී.ඩී.වයි.ආර්. විමලරත්න මිය - සාමාජික
ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්(ආයතන), අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

4. රසික දිසානායක මයා - සාමාජික
(නීතිඥ)

(iii) 2025.07.15 දිනැතිව ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිරීක්ෂණ සහ යෝජනා ඉදිරිපත් කර ඇති අතර එය **ඇමුණුම*** මගින් දක්වා ඇත.

(iv) එම කමිටු වාර්තාවේ නිරීක්ෂණ සහ යෝජනා ක්‍රියාත්මක කිරීම සලකා බැලීමට තවදුරටත් ණය සහනදායක මණ්ඩලීය කාර්යය පරිපාටි සහ සංශෝධන පිළිබඳ පවත්නා වාර්තා සමාලෝචනය කොට අවසන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට 2025.09.22 දින, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ ලේකම් විසින් පහත තාක්ෂණික කමිටුව පත් කර ඇත.

1. ටී.ජී. සුමිත් අරුණ පෙරේරා මයා - සභාපති
2. එන්.එස්. හපුආරච්චි මයා - සාමාජික
3. ආර්.එම්.පී.එස්.කේ. රත්නායක මයා - සාමාජික
4. ජී.එම්.ඩබ්ලිව්. ප්‍රදීප් ජයතිලක මයා - සාමාජික
5. දිලිනි දයාරත්න මිය - සාමාජික
6. අයිරාංගනී පෙරේරා මිය - සාමාජික
7. රසික දිසානායක මයා - සාමාජික
8. සුභාෂිණී දයානන්ද මිය - සාමාජික

(v) ඉහත ivහි පරිදි නීති සංශෝධන ද සිදු කිරීමට අපේක්ෂිතය.

(vi) ඉහත iv සහ v පිළිතුරු අදාළ වේ.

(ආ) (i) 19යි.

(ii)

| | | | |
|---|---|---|---|
| 1 | ප්‍රධාන | ටී.ජී. සුමිත් අරුණ පෙරේරා මයා | සභාපති |
| 2 | | කැලුම් කුමාරසිංහ මයා | සාමාජික |
| 3 | | එච්.යූ. කාරියවසම් මයා | සාමාජික |
| 4 | | ඩබ්ලිව්.පී. සිත්තම්පලම් මයා | සාමාජික |
| 5 | | කේ.එස්. පතිරණ මිය | සාමාජික |
| 6 | | සෝමසිරි පල්ලත්රගේ මයා | සාමාජික |
| 7 | | ඩබ්ලිව්.එන්. ප්‍රියදර්ශනි හේරත් මිය | සාමාජික |
| 1 | කොළඹ | නිශාන්ත ශාන්තිලාල් හපුආරච්චි මයා | සභාපති |
| 2 | | එන්.පී.කේ. ලොකුගේ මිය | සාමාජික |
| 3 | | ඉන්ද්‍රා බදුගේ මිය | සාමාජික |
| 1 | ගම්පහ | ඩී.ඒ. රුවන් පතිරණ මයා | සභාපති |
| 2 | | සී.ඩබ්ලිව්. සෙනෙවිරත්න මිය | සාමාජික |
| 3 | | ආර්.එස්. අබේවික්‍රම මිය | සාමාජික |
| 1 | ගාල්ල | ද.එස්.එම්.ඩී.එස්. දයාරත්න මිය | සභාපති |
| 2 | | කේ.පී.ඩී. ගුණරත්න මයා | සාමාජික |
| 3 | | ජානි නානායක්කාර මිය | සාමාජික |
| 1 | කුරුණෑගල | ආර්.එම්.පී.එස්.කේ. රත්නායක මයා | සභාපති |
| 2 | | ජේ.පී.එන්. තිලකරත්න මයා | සාමාජික |
| 3 | | එස්.ඩී. සෙනෙවිරත්න මයා | සාමාජික |

(iii) 40යි.

(iv) රුපියල් 98,000,000යි.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) 1. திருமதி ஐராங்கனி பெரேரா - தவிசாளர்
(தவிசாளர் - கடன் இணக்க சபை)

2. திருமதி சுபாசினி தயானந்த - உறுப்பினர்
(செயலாளர் - கடன் இணக்க சபைத் திணைக்களம்)

3. திருமதி பீ. டி. வை. ஆர். விமலரத்ன - உறுப்பினர்
சிரேஷ்ட உதவிச் செயலாளர் (நிருவாகம்), நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சு

4. திரு. ரசிக்க திஸாநாயக்க - உறுப்பினர்
(சட்டத்தரணி)

(iii) 2025.07.15ஆம் திகதியன்று சமர்ப்பிக்கப்பட்ட அறிக்கையின் அவதானிப்புகள் மற்றும் முன்மொழிவுகள் ***இணைப்பு1**இன் மூலம் காட்டப்பட்டுள்ளது.

(iv) குறித்த குழுவினது அவதானிப்புகள் மற்றும் முன்மொழிவுகளைச் செயற்படுத்துவதைக் கவனத்தில் கொள்வதற்கு மேலும் கடன் இணக்க

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

சபையின் நடவடிக்கைமுறைகளையும் திருத்தங்களையும் உள்ளடக்கிய அறிக்கையை மீளாய்வு செய்து, இறுதி அறிக்கையைச் சமர்ப்பிப்பதற்கு 2025.09.22ஆம் திகதியன்று நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சின் செயலாளரால் பின்வரும் தொழில்நுட்பக் குழு நியமிக்கப்பட்டுள்ளது.

1. திரு. சுமித் அருண பெரேரா - தவிசாளர்
2. திரு. என். எஸ். ஹப்புஆரச்சி - உறுப்பினர்
3.திரு. ஆர். எம். பி. எஸ். கே. ரத்னாயக்க - உறுப்பினர்
4.திரு. ஜீ. எம். டப்ளியூ. பிரதீப் ஜயதிலக்க - உறுப்பினர்
5. திருமதி திலினி தயாரத்ன - உறுப்பினர்
6. திருமதி ஐராங்கனி பெரேரா - உறுப்பினர்
7. திரு. ரசிக்க திஸாநாயக்க - உறுப்பினர்
8. திருமதி சுபாசினி தயாநந்த - உறுப்பினர்

(v) மேற்படி IVஇன்படி, சட்டத் திருத்தங்கள் மேற்கொள்ள எதிர்பார்க்கப்படுகிறது.

(vi) மேற்படி IV மற்றும் V பதில்களுடன் தொடர்புடையதாகும்.

(ஆ) (i) 19 ஆகும்.

(ii)

| | | | |
|---|---|---|---|
| 1 | பிரதான | திரு டீ. ஜீ. சுமித் அருண பெரேரா | தவிசாளர் |
| 2 | | திரு. கெலும் குமாரசிங்க | உறுப்பினர் |
| 3 | | திரு. எச். யூ. காரியவசம் | உறுப்பினர் |
| 4 | | திரு. டப்ளியூ. பி. சித்தம்பலம் | உறுப்பினர் |
| 5 | | திருமதி கே. எஸ். பத்திரண | உறுப்பினர் |
| 6 | | திரு. சோமசிரி பல்லத்ரகே | உறுப்பினர் |
| 7 | | திருமதி டப்ளியூ. என். பிரியதர்ஸனி ஹேரத் | உறுப்பினர் |
| 1 | கொழும்பு | திரு. நிஸாந்த சாந்திலால் ஹப்புஆரச்சி | தவிசாளர் |
| 2 | | திருமதி என். பி. கே. லொக்குகே | உறுப்பினர் |
| 3 | | திருமதி இந்திரா பதுகே | உறுப்பினர் |
| 1 | கம்பஹா | திரு. டி. ஏ. ருவண் பத்திரண | தவிசாளர் |
| 2 | | திருமதி டி. டப்ளியூ. செனவிரத்ன | உறுப்பினர் |
| 3 | | திருமதி ஆர். எஸ். அபேவிக்கிரம | உறுப்பினர் |
| 1 | காலி | திருமதி த. எஸ். எம். டி. எஸ். தயாரத்ன | தவிசாளர் |
| 2 | | திரு. கே. பி. டி. குணரத்ண | உறுப்பினர் |
| 3 | | திருமதி ஜானி நாணாயக்கார | உறுப்பினர் |
| 1 | குருநாகல் | திரு. ஆர். எம். பி. எஸ். கே. ரத்னாயக்க | தவிசாளர் |
| 2 | | திரு. ஜே. ஜீ. என். திலக்கரத்ன | உறுப்பினர் |
| 3 | | திரு. எஸ். செனவிரத்ன | உறுப்பினர் |

(iii) 40.

(iv) ரூ. 98,000,000

(இ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

(ii) 1. Mrs. Irangani Perera - Chairman
(Chairman - Department of Debt Conciliation Board)

2. Mrs. Subhashini Dayananda - Member
(Secretary - Department of Debt Conciliation Board)

